77 වන කාණ්ඩය
13 වන කලාපය

ඉරිදා
1968 මාර්තු 24

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

1968 මාර්තු 23 වන සෙනසුරාදා

[වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම]

**රජය කෙරෙහි විශ්වාස භංගය : විශේෂ බදුකර යටතේ රජයේ ඉඩම් පවරා දීම—**
විවාදය කල් තබන ලදී.

**කල් තැබීමේ යෝජනාව**

**ලිඛිත පිළිතුරු**

**පරිශිෂ්ඨය**

---

1968 මාර්තු 24 වන ඉරිදා

**Wild Life Protection Society of Ceylon (Incorporation) Bill :**
වාර්තාව පිළිගන්වන ලදී.

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**රජය කෙරෙහි විශ්වාස භංගය : විශේෂ බදුකර යටතේ රජයේ ඉඩම් පවරා දීම—**
විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 13

ஞாயிற்றுக்கிழமை
24 மார்ச் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

**(பிழை திருத்தப்படாதது)**

பிரதான உள்ளடக்கம்

**சனிக்கிழமை, 23 மார்ச் 1968**
[நிகழ்ச்சித் தொடர்]

அரசாங்கத்தின் மீது நம்பிக்கையின்மைப் பிரேரணை : முடிக்குரிய காணிகளை விசேட குத்தகைக்குக் கொடுத்தல்
*விவாதம் ஒத்திவைக்கப்பட்டது*

ஒத்திவைப்புப் பிரேரணை

விஞக்களுக்கு எழுத்து மூலவிடைகள்

அனுபந்தங்கள்

---

**ஞாயிற்றுக்கிழமை, 24 மார்ச் 1968**

WILD LIFE PROTECTION SOCIETY OF CEYLON (INCORPORATION) BILL :
*அறிக்கை சமர்ப்பணம்*

விஞக்களுக்கு வாய்மூல விடைகள்

அரசாங்கத்தின் மீது நம்பிக்கையின்மைப் பிரேரணை : முடிக்குரிய காணிகளை விசேட குத்தகைக்குக் கொடுத்தல்
*விவாதம் தொடர்கிறது*

---

Volume 77
No. 13

Sunday
24th March 1968

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

**(Uncorrected)**

PRINCIPAL CONTENTS

**Saturday, 23rd March 1968**
[*Continuation of Proceedings*]

MOTION OF NO CONFIDENCE IN GOVERNMENT : LEASE OF CROWN LANDS
**Debate adjourned**

ADJOURNMENT MOTION

WRITTEN ANSWERS TO QUESTIONS

APPENDICES

---

**Sunday, 24th March 1968**

WILD LIFE PROTECTION SOCIETY OF CEYLON (INCORPORATION) BILL :
*Report presented*

ORAL ANSWERS TO QUESTIONS

MOTION OF NO CONFIDENCE IN GOVERNMENT : LEASE OF CROWN LANDS
*Debate continued*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1968 මාර්තු 23 වන සෙනසුරාදා**

*சனிக்கிழமை, 23 மார்ச், 1968*

*Saturday, 23rd March 1968*

---

[1968 මාර්තු 23 වන සෙනසුරාදා නිල වාර්තාවේ 1908 වන තීරයේ සිට ඉතිරි වැඩ කටයුතු]

[1968 மார்ச் 23, சனிக்கிழமை அதிகார அறிக்கை 1908 ஆம் பத்தியிலிருந்து நிகழ்ச்சித் தொடர்]

[*Continuation of Proceedings from Col. 1908 of* OFFICIAL REPORT *for Saturday, 23rd March, 1968.*]

---

## රජය කෙරෙහි විශ්වාස භංගය: විශෙෂ බදුකර යටතේ රජයේ ඉඩම් පවරා දීම

*அரசாங்கத்தின் மீது நம்பிக்கையின்மைப் பிரேரணை : முடிக்குரிய காணிகளை விசேட குத்தகைக்குக் கொடுத்தல்*

## MOTION OF NO CONFIDENCE IN GOVERNMENT: SPECIAL LEASES OF CROWN LANDS

අ. භා. 5.10

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කළ දොම්පේ ගරු මන්ත්‍රීතුමාගේ (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) සහ යෝජනාව ස්ථිර කළ අනුරාධපුරේ ගරු මන්ත්‍රීතුමාගේ (කේ. බී. රත්නායක මයා.) කථාවලින් පසු පිළිතුරු දෙන්නට අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. මා හිතන පිළිවෙළට මේ ගරු සභාවේ විරුද්ධ පාර්ශ්වයේ උදවියගේ හදවත් තුළ මේ අවස්ථාවේ විශේෂ සන්තෝශයක් හටගෙන ඇති, අද නම් වැඩේ හරිය කියා. උන්නැහෙලා මේ විවාදයේදී ඉදිරිපත් කළ කරුණුවලට මා තව සුළු වේලාවකින් පිළිතුරු දෙනවා; ඒවා කොයි තරම් සත්‍යද කියා මා පෙන්වා දෙනවා. හැන්සාඩ් වාර්තාවේ පළ වීම සඳහාත්, ප්‍රවෘත්ති පත්‍රවල පළ වීම සඳහාත් ඒ මගින් මහජනයාගේ දැනගැනීම සඳහාත්, මේ ගරු සභාවේදී යම් මන්ත්‍රීවරයකු තමන්ගේ හෘදය සාක්ෂ්‍යයට විරුද්ධව කථා කරනවා නම්, 'මා පිළිගත් කරුණු අනුව එසේ කිරීම, මහාත්මගතියට සම්පූර්ණයෙන්ම විරුද්ධ බව මා පළමුවෙන්ම ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් කිසි රජයක් යම් ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් ඒ ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පටන් ගත් දා පටන්ම ඒ රජය එම ප්‍රතිපත්තිය ලුහුබැඳ යනවා; අදහස් කළ පිළිවෙළට ඒ ප්‍රතිපත්තිය අනුගමනය කරනවා. දෙපැත්තක් තිබෙන පාර්ලිමේන්තුවක විරුද්ධ පාර්ශ්වය ඒ ප්‍රතිපත්තියට විරුද්ධ වීම සාධාරණ කරුණක්. ඒ ගැන අප විරුද්ධ පාර්ශ්වයට දොස් කියන්නෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සමසමාජ කොමියුනිස්ට් තුන් හවුලේ අදහස් අනුව, ජාතික රජය ගෙන යන විශේෂ බදු ක්‍රමයටත්, මේ රටේ දැනට ගෙන යන කෘෂිකර්ම ව්‍යාප්ත වැඩ පිළිවෙළටත් ඒ අය සම්පූර්ණයෙන්ම විරුද්ධ බව පමණක් නොව ඒ ගැන භයකින් සිටින බවත් අප දන්නවා.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

නැහැ, නැහැ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඒක සාධාරණ භයක්. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ බව මම තව ටිකකින් ඔප්පු කරන්නම්. එහෙත් මේ විවාදයට අවශ්‍ය කරුණු කියන්නට පෙර මා පළමුවෙන්ම අහන්නට කැමතියි, පෞද්ගලික අංශය මගින් මේ රටේ සංවර්ධනය ඇති කිරීම සඳහා පෞද්ගලික අංශයත් කෘෂිකර්මයට ඇතුළත් කර ගත යුතුය කියා දොම්පේ ගරු මන්ත්‍රීතුමා 1960-61 දී ඉදිරිපත් කළ ප්‍රතිපත්තිය මෑතකදී වෙනස් කළාද. එසේ වෙනස් කළා නම් කළේ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ජාතික රජය විසින් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම නිසාද, කියා. උන්නැහේ කථා කරන අවස්ථාවේදී මා කීවා, මා පිළිතුරු දෙන විට ගරු සභාවේ ඉන්නය කියා. එදා උන්නැහෙට අවස්ථාවක් ලැබුණා, නිරපරාදේ මට පෞද්ගලික චෝදනාවක් ඉදිරිපත් කරන්නට. ඒ අවස්ථාවේදී පිළිතුරු දෙන්නට මට අවස්ථාවක් ලැබුනෙ නැහැ. මේ ගරු සභාවේත් මහජනතාවගේත් දැන ගැනීම සඳහා පිළිතුරු දෙන්නට මට අද හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේම නිපදවන්නට පුළුවන් අතිරේක ආහාර ද්‍රව්‍ය පිටරටින් මේ රටට ගෙන්වීමට අවුරුද්දකට රුපියල් ලක්ෂ 1,750 ක් පිට රටට යනවා. මේ තත්ත්වය අද ඊයේ ඇති වූ එකක් නොවෙයි. අවුරුදු 10 ක 12 ක කාලයක් තිස්සේ මේ ප්‍රශ්නය ක්‍රම ක්‍රමයෙන් උග්‍ර වී අද ඒ තත්ත්වයට පත් වී තිබෙනවා. මිරිස්, අර්තාපල්, රතු ළූනු, බොම්බයි ළූනු, පරිප්පු, සූදුරු, කොත්තමල්ලි, ඉරිඟු——

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කළුකුම්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

සමා වෙන්න මට ඇහුනෙ නැහැ. ඒක කෙසේ හෝ වේවා, මේක අප දෙගොල්ලන්ම පිළිගත් කාරණයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයත්, මීට පෙර එක්සත් ජාතික පක්ෂයේ රජයත්, එසේම අපේ ජාතික රජයත් සොයා බැලුවා, මේ රටේ දුප්පත් ගොවි ජනතාවට ඉඩම් දී, ණය දී, පිටරටට ඇදී යන මේ ධනය මේ රටේම නවත්වා ගැනීම සඳහා යම් කිසි සුළු කාල සීමාවක් තුළ සාර්ථක කර ගත හැකි ක්‍රියා මාර්ගයක් ඇති කරන්නට පුළුවන්ද කියා. ඉතා සුළු කාල සීමාවක් තුළදී, මේ රටේ ගොවි ජනතාව මාර්ගයෙන් පමණක් රට සංවර්ධනය කර මෙරටින් පිටරට ඇදී යන ධනය නවත්වා ගන්නට බැරි බව බුද්ධිමත් ලෙස කල්පනා කරන කවුරුනුත් පිළිගන්නවා. එහෙම පිළිගන්නේ නැත්නම් ඔහු හෘදය සාක්ෂියට විරුද්ධවයි, කටයුතු කරන්නේ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) ඔළුව වනනවා. උන්නැහේ ශබ්ද නොකළත්, එක ප්‍රශ්නයක් අහන්නම්. එහෙම බැරි නම්, මේ තත්ත්වයෙන් රට බේරා ගැනීම සඳහා අවුරුදු නවයක් තිස්සේ තමුන්නාන්සේලා ප්‍රතිපත්තියක් ඉදිරිපත් නොකළේ ඇයි ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කියන්නම්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ජාතික රජයේ නායකත්වයත්, කැබිනට් මණ්ඩලයත් කල්පනා කළා, අපේ ප්‍රතිපත්තිය අනුව මේ ක්‍රියා මාර්ගය ගනිමු, කියා. මේ ප්‍රතිපත්තියට, මේ ක්‍රියා මාර්ගයට තමුන්නාන්සේලා විරුද්ධයි. ඒ පිළිබඳව තමුන්නාන්සේලා තුළ තිබෙන සාධාරණ බිය ගැන අපට කරන්නට දෙයක් නැහැ. එහෙත් කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව, ඒ සඳහා නිත්‍යානුකූල වැඩ පිළිවෙළක් ඉඩම් ඇමතිතුමා මාර්ගයෙන් ගත්තා, පළමු වැනි පියවර වශයෙන්.

කැබිනට් මණ්ඩලයේ ඒ තීරණය මොකක්ද ? පළමුවෙන්ම ඒ ඒ පළාත්වල ඒජන්තවරුන්ට 1965 සැප්තැම්බර 2 වැනිදා චක්‍ර ලේඛ ලිපියක් යැව්වා. ඒ ලිපිය තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. එදා සිට, විශේෂ බදු ක්‍රමය ගෙන යන අවස්ථාව වන අද වනතුරු අකුරක්වත් ඉලක්කමක්වත් නැර නිත්‍යානුකූලව කටයුතු කළ බව ඔප්පු කරන්නටයි, මා සූදානම් වන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

හොඳට පෙනෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෙනවිරත්න මයා.**
*(திரு. ரி: பி. எம். ஹேரத்)*
(Mr. Seneviratne)

මා මෙහෙම හිටියාම පෙනෙන්නේ නැහැ. මේවා මම කියා දෙන්නම්.

The Government——

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සිංහලෙන් කියන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

හොඳයි, ඉංග්‍රීසියෙන් නොකියා එහි අනුවාදය කෙටියෙන් සිංහලෙන් කියන්නම්. රජය තීරණය කර තිබෙනවා, විශේෂ බදු ක්‍රමය අනුව——

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

චක්‍ර ලේඛ රාජ්‍ය භාෂාවෙන් නොයවන්නේ ඇයි?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

රාජ්‍ය භාෂාවෙන් තිබෙනවා. ඒ ලිපි ගොනුව අර නිලධාරි මහතුන් ළඟ තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒකෙන් කියවන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

පොඩ්ඩක් ඉන්න.

"1. The Government has decided that lands not required for peasant settlement should be made available, after careful scrutiny, for development by private enterprise. The Cabinet has approved the setting up of a Special Development Leases Board to provide an effective and quick means of leasing land to persons and organisations who are willing and capable of developing the available lands with their own resources.

2. It was decided at a meeting of the Special Leases Board that the lists of land enumerated in the attached schedules should be further examined by you and modified by additions and deletions having special regard to the need of the peasants of the district. These lists should then be placed before the D.A.C. and its views obtained on the proposal to make these lands available for development by private enterprise.

3. Please summon a special meeting of the D.A.C. within two weeks and send me the recommendations of the committee with your own observations on the availability or not of these lands.

4. The D.A.C. may be invited to consider the following:

(*a*) The lands to be made available will be lands not immediately required for peasant settlement and further expansion, say, for 25 years;

(*b*) The leases will be generally for a duration of 25 years and the Government have the option to resume possession on the expiry of this period;

(*c*) The limited period of the lease will be advantageous to the peasantry because when the lease expires the developed land will be available for alienation to peasants if required.

(*d*) This scheme is a swift means of developing the backward areas in your district;

(*e*) It will increase the national production and will also considerably help to ease the unemployment problem.

5. Your report on the observations of the D.A.C. should reach me before the 1st October, 1965.

6. In the meanwhile, the Land Commissioner will advertise this new scheme in the daily newspapers and in the Government Gazette in the first week of September.

7. Please make special arrangements in the Land Branch of your Kachcheri for information to be made available to intending applicants regarding the availability of land for development in the different parts of the district under this scheme. It should be made clear to the applicants that any information given by you at this stage is of a tentative nature and is subject to final approval after consideration by the Special Leases Board.

8. All applications for land will be made on forms which would be supplied to you shortly. The white forms should be issued to individuals only and the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

coloured forms to companies, co-operatives and group applicants. These forms will only be released if the applicants deposit a sum of Rs. 250 in your favour. This sum should be placed in Deposits Miscellaneous. If alternative blocks of land are applied for, separate applications should be made in respect of each block of land and separate deposits should be made in respect of each application......

9. The completed forms in sextuplicate will then be despatched by the applicant direct to the Secretary, Special Leases Board, Ministry of Land, Irrigation and Power. The Secretary of the Leases Board will then issue a copy of each to the different heads of departments for report within 6 weeks. The G.A. will locate the land and report whether it is within the schedule of land reserved for development by private enterprise with any other relevant observations that will enable the Leases Board to make the recommendation to the Hon. Minister of Land, Irrigation and Power.

10. When the reports are received they will be examined at a meeting of the Leases Board. The board will consider the merits of each applicant and decide whether it should recommend to the Hon. Minister that the land should be released to the applicant. If the Hon. Minister approves the recommendation of the board that the land should be released to the applicant, the Land Commissioner will be requested to release the land and place the applicant in possession of the land, subject to the terms and conditions specified by the Minister.

11. A copy of the press notice is also attached for your information".

එයයි, රජය ගත් පළමු වැනි පියවර. ඒ ඒ පළාත්වල දිසාපතිවරුන්ට චක්‍රලේඛයක් යැව්වා, පෞද්ගලික අංශය මාර්ගයෙන් රට සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කොම්පැණිවලට, සමුපකාර සමිතිවලට——

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை)*
(Mr. T. B. Tennekoon—Dambulla)
මන්ත්‍රීවරුන්ට.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

තව පොඩ්ඩකින් මන්ත්‍රීවරුන් ගැනත් කියන්නම්; තමුන්නාන්සේ ගැනත් කියන්නම්. මන්ත්‍රීවරුන් [illegible] ගොවිතැන් කර, මේ රජය ගෙන යන කෘෂිකර්ම ව්‍යාප්තියට අත දෙන්නට කැමැත්තක් හා දක්ෂකමක් ඇත්නම් ඒ අයට, ඉඩම් දෙන්නට තීරණය කළා. ඒ සඳහා, ගැමි පුනරුත්ථාපනය හෙවත් ගම් පුළුල් කිරීම සඳහා ලබන අවුරුදු 25 තුළ අවශ්‍ය නොවන ඉඩම්, වියළි කලාපයේ වාරිමාර්ග පහසුකම් නැති ඉඩම්, ඔබේ පාලන දිස්ත්‍රික්කය තුළ තිබෙනවා නම් සති දෙකක් ඇතුළත දිස්ත්‍රික්ක කෘෂිකර්ම සභා කැඳවා ඒවා පිළිබඳව ඒ සභාවේ තීරණය දන්වන්නැයි දිසාපතිවරුන්ට නියම කළා. ඒ දිස්ත්‍රික් කෘෂිකර්ම සභාවලට දොම්පේ ගරු මන්ත්‍රීතුමාත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාත් (කේ. බී. රත්නායක මයා.) ගියාද නැද්ද කියන්න මා දන්නේ නැහැ.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

එකම දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවක් වත් කැඳෙව්වේ නැහැ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඒ කමිටු පැවැත්වූ බව අප දන්නවා. පාර්ලිමේන්තු ලේකම්වරු වුණත් අපත් ඒවාට ගිහින් තිබෙනවා. ඒ, පළමු වැනි පියවරයි. [බාධා කිරීම්] දෙම්පේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී විශේෂයෙන්ම මේ ගරු සභාවට පෙන්නුම් කරන්න තැත් කළා මේ විශෙෂ බදු ක්‍රමය පිළිබඳව නීති විරෝධී ක්‍රියා මාර්ගයක් ගෙනගොස් තිබෙනවාය කියා. එතුමාට කියන්නට තිබෙන දේවල් කියා කථාව අවසානයේ දී කිව්වා එතුමන්ලා බලයට පැමිණි දිනක නම් ඒවා ආපසු ගන්නවාය කියා. එතුමා පමණක් නොවෙයි එතුමාගේ වම් පැත්තේ සිටිනායළුවොත් පසුගිය අවුරුදු 30 තිස්සේම කිව්වා ඔවුන් බලයට පැමිණි දිනක අර රබර් වත්ත ගන්නවාය කියා. බලයට පැමිණීමට පසුව රබර් වත්ත නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගත්තේ නැහැ; අරුන් ඉල්ලූ ඉල්ලීම් 21 ත් දෙන්නට බැරිය කියා පටි තද කර ගන්නය කිව්වා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කාටද අරුන් කිව්වේ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
අරුන් නොවෙයි අර අය.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කිව්වෙ අරුන් කියලයි.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
සමා වන්න. මා ඒක ඉල්ලා අස් කර ගන්නවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා සිංහල ඉස්කෝලෙ මහත්මයෙක්නේ. මට වඩා හොඳින් දන්නවානේ. ඒ නිසා ඒ මන්ත්‍රීතුමාගේ කීමට මා ගරු කර නවා.

දොම්පේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ඔප්පු කරන්න වීර්ය කළේ කුමක්ද? රජයක ඇමතිවරයෙක් වශයෙන් සිටියාවූ වගකිවයුතු මන්ත්‍රීවරයෙක් මෙවැනි ගරු සභාවක මන්ත්‍රීවරුන් රාශියක් නොමග යැවීමට තැත් කරනවා නම් ගම්වලට ගොස් මොනවා නොකියාවිද? ඉඩම් ආඥපනතේ 6 වැනි වගන්තියෙන් එතුමා කියෙව්වේ මෙපමණයි. ඒ කොටස මම කියවන්නම්.

"A special grant or lease of Crown land may be made at a nominal price or rent or gratuitously for any charitable, educational, philanthropic, religious or scientific purpose, or for any other purpose which the Governor-General may approve."

එච්චරයි කියෙව්වේ. ඒ අනුව අග්‍රාණ්ඩුකාරතුමාට පමණයි දෙන්නට පුළුවන්. එහි පහත තිබෙන ටික එතුමා කියෙව්වේ නැහැ. 1950 ජූලි 21 වැනිදා ගැසට් නිවේදනයක් මගින් ඇමතිවරයාට ඒ බලය පවරා තිබෙන බව එතුමා කීවේ නැහැ. එය කීවොත් අවාසියිනේ. ගරු ඉඩම් ඇමතිතුමා නීති විරෝධි ක්‍රියා මාර්ගයක් ගත්තාය කියා පළමුවෙන්ම ජනතාව නොමග යැවීමට වෑයම් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් ඇමතිවරයා ගත් ක්‍රියා මාර්ගය සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉල්ලුම් පත්‍ර කැඳවීමෙන් පසුව ඒවා ගැන සොයා බැලුවේ අර විශේෂ බදු මණ්ඩලයයි. ඒ මණ්ඩලයත් නීත්‍යානුකූල නැහැ කියා එතුමා කිව්වා. අපත් එය පිළිගන්නවා. විශේෂ බදු මණ්ඩලය නීත්‍යානුකූල මණ්ඩලයක් වන්නට වුවමනාවකුත් නැහැ. එය උපදේශක මණ්ඩලයක් පමණයි. ඒ ඒ අයට අද විදේශ විනිමය දෙන ප්‍රමාණයත් වෙන් කරන්නටත් මණ්ඩලයක් සිටිනවා. ඒ මණ්ඩලය ඇමතිතුමාට උපදෙස් දෙනවා. අහවල් අයගේ ඉල්ලුම් පත්‍ර බැලුවා, ඒ ඒ අයගේ දක්ෂකම් අනුවත්, තත්ත්වයන් අනුවත්, ඒ ඒ අය ගෙන්වන්නට අදහස් කරන බඩුවල අවශ්‍යතාවය අනුවත් ඒ ඒ අයට විදේශ විනිමයත් මේ මේ ප්‍රමාණයත් වෙන් කළ යුතුයි කියා නිර්දේශ කරනවා. ඒ ඒ මණ්ඩලයේ වාර්තාව ඇමතිතුමාට බාර දුන්නාම ඒ නිර්දේශයත් අනුව ඒ ඒ අයට දිය යුතු විනිමය ප්‍රමාණයත් සඳහා අනුමතය දෙන්නේ ඇමතිතුමායි. ඒ මණ්ඩලයේ ඉන්නෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ස්ථිර ලේකම්වරුන් වැනි අයයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඇමතිතුමා නොමග යවනවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு செனெவிரத்ன)*
(Mr. Seneviratne)
නොමග යවන අයත් සිටිනවා. එහෙත් විශේෂ බදු මණ්ඩලයට පත් කළ අය අතර එවැනි අය සිටියේ නැහැ. එම මණ්ඩලයේ එක්කෙනෙක් දෙන්නෙක් නොවෙයි දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ස්ථිර ලේකම්වරුන් ඇතුළුව කීප දෙනෙක්ම සිටියා. මේ විශේෂ බදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

මණ්ඩලයේ ලොකු වැදගත්කමක් නැත් නම් වගකීමක් තිබෙනවා. ඒ අයට ලොකු වගකීමක් තිබෙනවා. ඒ අය ගන්න තීරණය අනුවයි ගරු ඇමතිතුමා බලපත්‍ර වලට අත්සන් කරන්නේ. ඒ වාගේම බදු ඉල්ලුම්කරුවන් වෙත ලියුම් යවන්න ටත් ඕනෑ. මේ තරම් අක්කර ප්‍රමාණයක් දෙන්නට තීරණය කර තිබෙනවායයි දන්වන්නට ඕනෑ. ඒ නිසා මොන විධියේ අය තෝරන්නට ඕනෑද යන්නත් තීරණය කරන්නට ඕනෑ. මේ කරුණු සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව මුලින්ම තීරණය කළා. මම ඒවා මොනවාදැයි විස්තර වශයෙන් කියන්නම්. මා සඳහන් කරන්නේ අපේ ආණ්ඩුව තීරණය කළ දේවල් ගැනයි. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා ඒවා නොපිළිගත්තාට අපට ඒ ගැන කරන්නට දෙයක් නැහැ. මේ හදිසි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යන්නට—ගලා යන මේ ජලස්කන්ධය මේ රටේ නවත්වා ගන්නට—මුදල් තිබෙන උදවිය ඉදිරියට ඇවිල්ලා රජයට අත දෙන්නට ඕනෑ. ඒ, පළමුවැන්නයි. දෙවැන්න, එසේ පැමිණෙන උදවිය යම් කිසි ප්‍රමාණයකින් කෘෂිකාර්මික දැනුමක් හෝ පළපුරුද්දක් හෝ තිබෙන අය වෙන්නට ඕනෑ. ඒ අය වැඩි වශයෙන්ම ලාංකිකයන් වෙන්නට ඕනෑය යන්න තුන්වැන්නයි. එතකොට, ඔය වැදගත් ප්‍රතිපත්ති තුන උඩයි වැඩ කටයුතු කර ගෙන යන්නට තීරණය කළේ. ඒවා අනුව වැඩ කටයුතු කරගෙන යන්නට සකස් වන අවස්ථාවේ සිදු වූ දේවල් මා දන්නවා. මේ සම්බන්ධයෙන් අනුරාධපුර යේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්න යට එදා මා පිළිතුරු දුන්නා. මා පිළිතුරු දෙන අවස්ථාවේ ගරු අගමැතිතුමා අතිරේක වශයෙන් පිළිතුරක් දෙමින් මේ ගරු සභාවේ නැඟිට කියා සිටියේ මුදල් තිබෙන උදවියම සොයන්නට වුවමනා වක් නැති බවයි. මේ වැඩ පිළිවෙලට සාර්ථක ලෙස සහභාගි වන්නට පුළුවන් කමක් ඇතැයි ඔප්පු කරන්නට පුළුවන් හැම දෙනාටම පාරේ අවසථාවක් දිය යුතු යයි එතුමා කිව්වා. ඒ අනුව විශේෂ බදු මණ්ඩලය තීරණයක් ගත්තා. විශේෂ බදු මණ්ඩලය දිස්ත්‍රික් කෘෂිකාර්මික කොමිටි වලින් කරන ලද තීරණයන් පිළිගත්තා පමණක් නොව ඊටත් වඩා විශේෂ කැමැත්තක් පෙන්නුම් කරමින් එක් වැදගත් තීරණයක් ගත්තා. මොකක්ද එය? ගම්බද පෙදෙස්වලින් යම්කිසි පුද්ගලයෙක් හෝ ගම්බද සමුපකාර සමිති යක් හෝ ගම්බද කණ්ඩායමක් හෝ ඉල්ලුම් පත්‍ර එව්වොත් ඒවා ගැනත් සැල කිල්ලක් දක්වා ක්‍රියා කරන්නට තීරණය කළා. එහෙම කිහිප දෙනකුටම දී තිබෙනවා. මේවා වසංගන්නට බැහැ. ඒ හා සම්බන්ධ චක්‍රලේඛන යම් තරමක් නිකුත් කළා නම් ඒ හැම එකක්ම අප ළඟ තිබෙනවා.

දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කථා කරද්දී නොයෙක් ප්‍රශ්න ඇහුවා. කොහෙන් ඉඩම් දුන්නාද, කොයි කාලයේ ඉඩම් දුන්නාද, කොයි කොයි පුද්ගලයන් කැදෙව්වාද යනාදී ප්‍රශ්න එතුමා ඇහුවා. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරන අවසථා වේත් එසේම කිව්වා. ඉල්ලුම් පත්‍ර කැඳවන අන්තිම ගැසට් නිවේදනය නිකුත් කළේ පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ දීයි. ඊට පසු කැඳව්වේ නැහැ. දොම්පේ ගරු මන්ත්‍රීතුමා අගෝස්තු මාසයේදී මේ ගැන ඇසූ අවස්ථාවේදීත් ඒ බව කියා තිබෙනවා. අවසාන ගැසට් නිවේදනය නිකුත් කරන ලද්දේ අප්‍රේල් මාසයේ දීයි. ඒ සම්බන්ධයෙන් යම් යම් ගරු මන්ත්‍රීන් තුළ වෙනස් වෙනස් හැඟීම් තිබුණු බව මා දන්නවා. ඒ ගැන පසුව කථා කරන්නම්. ගරු මන්ත්‍රීවරුන්ටත්, රජයේ නිලධාරීන්ටත්, විශාල සමිති සමා ගම්වලටත් මෙයින් වාසියක් ලබා දෙන් නට හොඳ නැතැයි කිව්වා. ඒ නිසා ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයත් සමග සාකච්ඡා කර තීරණ යක් ගත්තා. ඒ අනුව කටයුතු කරන්නට පටන් ගත්තා. ඒ අවස්ථාව වන විට ඉඩම් බෙදා නොදී තිබුණු අයට—ඉඩම් සංවර්ධනය කිරීම සඳහා යම්කිසි ප්‍රමාණයක වියදමක් දරා තිබුණු අයට—කුමක් කළ යුතුදැයි තීරණය කරන්නට සිදුවුණා. අනෙක් අය ගේ කටයුතු සඳහා වෙන් කර තිබුණු ඉඩම් අහෝසි කළා. ඒ නිසා දැන් අප ළඟ තිබෙන ලැයිස්තු මීට පෙර තිබුණු ලැයිස්තු වලට වඩා වෙනස්, සම්පූර්ණයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනස්. අද ඒක තමයි වෙලා තියෙන් නේ. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා ලඟ දැන් තිබෙන්නේ පස් මාසයක් පරණ ලැයිස්තුවක්. අද තිබෙන තත්ත්වය ඊට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්. එතුමා එදා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රමාද වීමට හේතුවත් කියන්නට ඕනෑ. ඔය වැඩ කටයුතු කරගෙන යන අවස්ථාවේදී චක්‍ර ලේඛනය ආදිය සොයා ගන්නට ටිකක් අමාරු වුණා. අදත් ඒ තත්ත්වය තිබෙනවා. සෑමදාම පොදුවේ නීතිය ක්‍රියාවේ යෙදෙනවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
එහෙම නම් අපට දුන් ලැයිස්තුව අසත්‍ය එකක්ද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
එහෙම නොවෙයි මා කිව්වේ. දැන් ඒ ලැයිස්තුව සම්පූර්ණයෙන්ම වෙනස්වෙලා තිබෙන බවයි. එය දැන් යල්පැනලා. out of date.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එතැන වගකීමක් ඇති පලානයක් කෙරෙන්නේ නැද්ද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
එතැන එහෙම වගකීමක් නැහැ. මෙය ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළක්. යම්කිසි ප්‍රතිපත්තියක් සකස් කළාම එය ක්‍රියාත්මක කරනවා. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අප විසින් ක්‍රියාවේ යොදනු ලබනවා එය අපේ වැඩක්. විරුද්ධ පාර්ශ්වයෙන් මොනවා කිවත් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීමයි ආණ්ඩුවේ කාර්යය. එහෙත් ඒවා විවේචනය කිරීමේ අයිතිය විරුද්ධ පාර්ශ්වයට තිබෙනවා. අප ගන්නා ක්‍රියා මාර්ගයේ යම් වැරදි තැනක් විරුද්ධ පාර්ශ්වයෙන් පෙන්නුවොත් ඒ ගැන කල්පනා කර බලා අවශ්‍ය ක්‍රියා මාර්ගයක් ගන්නට ආණ්ඩුව බසුබට වන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
එතකොට වැරදි තැන් හරිගස්සනවාද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කා අතින්ද වැරදි සිදුවෙන්නෙ නැත්තෙ ? වැරදි පෙන්වා දුන්නාම ඒවා හරිගැස්සීම අපේ යුතුකමක් හැටියට අප සලකනවා. විශේෂ බදු ක්‍රමය පළමුවන වරට ක්‍රියාවේ යෙද වුණේ ඒ අවස්ථාවේ දීයි. මීට පෙර කවදාවත් එය ක්‍රියාවේ යොදවා නැහැ. හදිසි වැඩ පිළිවෙළ යටතේ විශාල ඉඩම් ප්‍රමාණයක් බෙදා දී ඉක්ම ණින් ගොවිතැන් කරන්නට කටයුතු යෙදුවා. පුළුවන් තරම් ඉක්මණින් වැඩ කටයුතු කරගෙන යනවා. පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේදීත් "සීමාන්තික" ඉඩම්—ආණ්ඩුවේ ඉඩම්—පෞද්ගලික අංශ යටත් දුන්නා. මන්ත්‍රීවරුන්ටත්, රජයේ නිලධාරීන්ටත්, සමිති සමාගම්වලටත් අක්කර දහස් ගණනක් දුන්නා. එහෙත් ඒ ප්‍රතිපත්තිය යටතේ වුවත් අද අප ගෙන යන ප්‍රතිපත්ති යටතේ කෙරෙන ප්‍රමාණයෙන් සියේට එකක්වත් සාර්ථක වුණේ නැහැ. ඊට හේතුව කුමක්ද යන වග මම කියන්නම්. එදා ඉඩම් දුන්නේ මෙවැනි මණ්ඩලයකින් තීරණය කර නොවෙයි. මෙම ඉඩම් සම්බන්ධව තීරණ ගැනීම අතින් එදා තිබුණාට වඩා වැදගත් තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. විශේෂ බදු මණ්ඩලය ගරු ඇමතිතුමාට යම් යම් වැරදි අදහස් දෙනවායයි ගරු මන්ත්‍රීවර යකු කිව්වා. එය නම් මා කෙසේවත් විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, මෙය පෘථග්ජන මිනිසුන් කණ්ඩායමක් විසින් කෙරෙන කටයුත්තක් නිසා යම් යම් වැරදි සිදු වෙනවා ඇති. එවැනි වැරදි සිදු වී තිබෙනවා නම් අප ඒවා හරි ගස්සන්නට ඕනෑ. එහෙත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් රටේ ජනතාවට පෙන්වන්නට යන පින්තූරය සම්පූර්ණයෙන්ම ඊට වඩා වෙනස්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශේෂ බදු ක්‍රමය පටන් ගත්තේ 1965 දීයි. එසේ පටන් ගෙන ඉඩම් දීගෙන යන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]
අවස්ථාවේදී අමාත්‍යාංශයට ඒ සම්බන්ධව යම් යම් කරදර ඇති වුණා. අක්කර හත් අට දාහ, විසි තිස්දාහ එක් වර්ෂයක් තුළ බෙදා දීමට කටයුතු කරන විට ඉල්ලුම් කරුවන්ගේ අවශ්‍ය හා අනුව අවශ්‍ය කාල සීමාව තුළ ඒ ඉඩම බෙදා දීමට බැරි වෙනවා. යම් විධියකින්, වර්ෂයේ මැදදී, ජූනි, ජූලි මාසලින් පසු ඉඩම් දුන්නොත් ඊළඟ මාස් කරන්නය සඳහා එම ඉඩම් එළි පහළි කොට පුච්චා සකස් ගන්නට බැරි වෙනවා. එවිට ඒ කටයුතු සම්පූර්ණයෙන්ම දෙවැනි අවුරුද්දට යනවා. එවැනි ප්‍රමාදයක් නිසා ඇති වුණු අතපසුවීම් හැරුණු විට අනෙක් සියල්ලම—සියයට 75 ක් පමණ—අවංකව, ඉඩම් ලැබූ අය විසින් දෙන ලද ඉලක්කයන් අනුව වැඩ කරගෙන යනවා. මා තව ටිකකින් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නම්. 1966 දී අප බලාපොරොත්තු වුණු ඉලක්කය සියයට 50 කින් වැඩි වී තිබෙනවා. 1967 ප්‍රතිඵල තවම අපට ලැබී නැහැ. විශේෂ බදු ක්‍රමය විසින් කරන ලද සංවර්ධනයේ 1966 ඉලක්කය සියයට 150 ක්ව තිබෙන බව විශේෂයෙන් කියන්නට කැමතියි.

විශේෂ බදු ක්‍රමය යටතේ දෙනු ලබන්නේ, වියළි කලාපයේ වාරිමාර්ග පහසුකම් නැති, ලබන අවුරුදු 25 ඇතුළත මහජනතාවට අවශ්‍ය නොවන ඉඩම් බව මා මීට කලිනුත් කියා තිබෙනවා. ඒ ප්‍රතිපත්තියේ කිසිම වෙනසක් සිදු වී නැහැ. රජයේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින දුප්පත් මිනිසුන් ඒවායින් පන්නා ඇමූ බව මෙම ගරු සභාවට ඔප්පු කරන්නට විරුද්ධ පාර්ශ්වයෙන් මෙතෙක් කථා කළ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනා ලොකු උත්සාහයක් දැරුවා. ඒ වාගේම, මහජනතාව රජයේ ඉඩම් ලබා ගැනීමට පුලපුලා සිටියදී වෙනත් අයට ඒ ඉඩම දුන්නායයිද ඒ ගරු මන්ත්‍රීවරුන් කිව්වා. ඒ ප්‍රකාශ දෙකම සම්පූර්ණයෙන්ම සත්‍යයෙන් තොරයි.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
නෑ, නෑ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ටිකක් නොවෙයි, සියයට සියයක්ම සත්‍යයෙන් තොරයි. යම් දුප්පතකු රජයේ ඉඩමකින් ඉවත් කරන්නට යන අවස්ථාවක් යම් මන්ත්‍රීවරයකු විසින් අපට දැනුම් දුන්නා නම් වහාම ඒ ගැන ක්‍රියා කොට එය නතර කිරීමට අප කටයුතු කළ බව ඉඩම් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්වරයා හැටියට මා ප්‍රකාශ කරන්නට කැමතියි. එකම පුද්ගලයකුවත් අස් කරන්නට ඉඩ දුන්නේ නැහැ. [බාධා කිරීමක්] අවස්ථාව ආවහාම කථා කරන්න. රජයට අවශ්‍ය යම් ඉඩමක් කිසියම් දුප්පත් මනුෂ්‍යයකු විසින් අල්ලාගෙන සිටින අවස්ථාවක එම ඉඩම රජයට ගන්නට පෙර ඒ මනුෂ්‍යයාට වෙනත් ඉඩමක් දෙන හැටියටයි අප ඒජන්තවරුන්ට නියෝග කර තිබෙන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කියන්නෙ එහෙමම තමයි, කෙරෙන්නෙ අනෙක් පැත්ත.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කෙරෙන්නෙත් එහෙම තමයි. තමුන්නාන්සේලා අපට එවැනි අවස්ථා දැනුම් නුදුන්නාට වැරදිකරුවන් අප නොවෙයි. අප ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ඒ මිනිසුන් රතු පාටද කොළ පාටද නිල් පාටද යන වගක් බැලුවේත් නැහැ, බලන්නේත් නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ගරු පවුල් පිටින් එළියට දැම්මා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

1963 කතරගම අලුත් නගරය හදද්දී මැෂින්වලින් තල්ලු කර එළියට දැමූ හැටි අප දන්නවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
කවුද දැම්මේ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කැබිණට් මණ්ඩලය දැම්මේ. [බාධාකිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ බදු ක්‍රමය සම්බන්ධයෙන් පවතින්නෙ ඔය තත්ත්වයයි. අද මහජනතාව බෝහොම දුකෙන් සිටින බවත්, හැරෙන්නටවත් ඉඩක් නැතිව සමහරුන් අක්කර කාලේ ඉඩම් කෑලිවල පදිංචි වී සිටින බවත්, මේ ගරු සභාවට පෙන්නීමට අනුරාධපුර යේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා) බොහොම වීර්ය කළා. ඒ ජත්ත වරුන්ගේත් යම් යම් අඩුපාඩුකම් තිබෙනවා. නමුත් අපේ ප්‍රතිපත්තිය කුමක්ද? රජයේ ඉඩම් බලෙන් අල්ලා ගෙන පදිංචිවීම නැති කිරීම සඳහා ළඟිළඟියේ ඉඩම් කච්චේරි පැවත්වීමයි. එසේ ඉඩම් කච්චේරි පවත්වා ඉක්මණින්ම ඒවාට බලපත්‍ර දීමයි අපේ ප්‍රතිපත්තිය. පසුගිය අවුරුදු තුන තුළ රජයේ ඉඩම් බලෙන් අල්ලා ගෙන පදිංචි වී සිටියවුන් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සිටියා නම් එයින් දෙතුන් දෙනෙකුවත් එළියට දැම්මාය කියා මා සිතන්නේ නැහැ. එළියට දැමූවන්ගේ ගණන ඊට වැඩිය කියා යමෙකු කියනවා නම් එය සම්පූර්ණ අසත්‍යයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ බලාපොරොත්තුව කුමක්ද? මහියංගන ප්‍රදේශයේ උදවිය මේ විශේෂ බදු ක්‍රමය කුමක්ද කියා දන්නවා. ඒවාගේම අනුරාධපුරයේ, පුත්තලමේ උදවියත් මේ විශේෂ බදු ක්‍රමය කුමක්ද කියා දන්නවා. නමුත් කොළඹ අය, ගාල්ලේ අය බොහෝ දෙනා මේ විශේෂ බදු ක්‍රමය කුමක්ද කියා දන්නේ නැහැ. රුවන්වැල්ලෙ අයත් දන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වය මේ උත්සාහ කරන්නේ අන්න ඒ ප්‍රදේශවල ජනතාව තුළ වැරදි හැඟීමක් ඇති කරවීම ටයි. "හරි වැඩේ නේද, මුන් දිගට හරහට, ඇමතිතුමාට ඕනෑ හැටියට, ඉඩම් දී තිබෙ නවා නේද" යන හැඟීම ඇති කරවීමටයි. ඇයි මේ අපරාධය? ඇයි මේ බොරුව? අප විරුද්ධ පාර්ශ්වයේ නිසා නුඹලාගේ කුමන ප්‍රතිපත්තිවලට වුවත් අප විරුඩය කියා විරුද්ධ පාර්ශ්වය කියනවා නම් අප එය පිළිගන්නවා. මේ බොරු බේගල් නැතිව විරුද්ධ පාර්ශ්වයේ නිසා අප මේ ප්‍රතිපත්තිවලට විරුද්ධ වෙනවාය කියනවා නම් අප එය පිළිගන්නවා. නමුත් කවුරු මොනවා කිව්වත් මේ රජයේ ප්‍රතිපත්තිය අප දිගමට ගෙන යනවා. පිටරට ගලා යන ලක්ෂ 1,750 න් කොටසක් මේ කාල සීමාව තුළදී කෙසේ හෝ මේ රටේම රඳවා ගැනීමට අප ක්‍රියා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ගණනක් රක්ෂා නැතිව සිටිනවා. විරුද්ධ පාර්ශ්වය අවුරුදු නවයක් තිස්සේ පොල් ගා දැන් කෙහෙල් මල් කථා කරනවා. තමුන්නාන්සේලා මොනවාද කළේ? ලක්ෂ හයක් අද රක්ෂා නැතිව සිටිනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ය ඇතුළු තුන්හවුලට අද මේ ප්‍රශ්න අසන් නට අයිතිවාසිකමක් තිබෙනවාද කියා මා ප්‍රශ්න කරනවා. මහජනතාව එදා තමුන් නාන්සේලා ප්‍රතික්ෂේප කළේ තමුන් නාන්සේලාගේ ප්‍රතිපත්ති මහජනතාව පිළිනොගත් නිසයි. අපේ ප්‍රතිපත්ති එදා මහජනතාවට ඉදිරිපත් කළා. ඒ ප්‍රති පත්ති තමයි දැන් මේ ක්‍රියාත්මක කරන් නෙ. ඒ ප්‍රතිපත්තිවලට තමුන්නාන්සේලා කොයි තරම් විරුද්ධ වුණත් අපට කරන් නට දෙයක් නැහැ. ඒ ප්‍රතිපත්ති සාර්ථක වේවිය කියා තමුන්නාන්සේලා කොයි තරම් භය වුණත් අපට කරන්නට දෙයක් නැහැ. තමුන්නාන්සේලාගේ ඒ භය ගැන අප කණගාටු වෙනවා. ඒක සාධාරණ භයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වන තෙක් මේ විශේෂ බදු ක්‍රමය යටතේ අක්කර පණස් දෙදාස් ගණනක් දී තිබෙනවා. අපේ ඉල්ලීම් අනුව ඒ ඉඩම් සංවර්ධනය නොකරනවා නම් අපි ඒ බදුත් අහෝසි කරනවා. ඒක කළයුතු දෙයක්. ඊළඟට, පසුගිය වර්ෂය තුළ පමණක් ගැමි ජනතාව වෙනුවෙන් දී තිබෙන ඉඩම් බලන්න. ජනපද ව්‍යාපාර යටතේ අක්කර 15,780 යි. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර යටතේ අක්කර 65,262 යි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
කොහේද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
බලෙන් අල්ලා ගෙන සිටි අක්කර 2,03,500 ක් නීත්‍යානුකූලව භාර දී තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අක්කර 50,000 ක් ආපසු අරන් තිබෙනවා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
බලෙන් ඉඩමක් අල්ලා ගත් දුප්පත් ගැමියකුට උසාවියක් මාර්ගයෙන් හෝ ආදායම් පාලක නිලධාරි මාර්ගයෙන් හෝ දඩ ගසන වැඩිම මුදල ශත 50 යි නැත්නම් රුපියලයි. එවැනි දඩයක් නියම කළාට පසු ගන්නා පියවර කුමක්ද? සම්පූර්ණයෙන්ම ඒ ඉඩම ඔහුට බදු ඔප්පුවකින් පවරා දෙනවා. ඇත්ත වශයෙන්ම අද ගැමි ජනතාව එය සිරිතක් කරගෙන තිබෙනවා. "කොහොම හරි ග්‍රාම සේවක මහත්මයාට කියා අයි. සී. ආර්. එකක් සාදවා ගනිමු. ඒක ගත් හැටියෙ වැඩේ හරි" කියා ගැමි ජනතාව කල්පනා කරනවා. ඒකයි තත්වය. අර ශත පනහ හෝ රුපියල දඩ ගැසුවාට පසු ඉඩම නිකම්ම ඔහුට ...

මේ අමාත්‍යාංශය භාර උප ඇමතිවරයා හැටියට මට එක් කාරණයක් කියන්නට පුළුවනි. අර බලෙන් අල්ලා ගෙන සිටි අක්කර දෙලක්ෂ ගණන නීත්‍යානුකූල කිරීමේ දී දෙදෙනෙකුවත් ඒ අයගේ ඉඩම්වලින් නෙරපුවාය කියා මා සිතන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අක්කර 50,000ක් ආපසු අරන්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
තමුන්නාන්සේගේ අවස්ථාව ආවාම ඔය බේගල් ටික ඉදිරිපත් කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේක "සේසත."

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඊළඟට මේ දැන් ප්‍රශ්නය ගැන කථා කළා. දොම්පේ ගරු මන්ත්‍රීතුමා (ඩයස් බණ්ඩාරනායක මයා.) ඇසූ ප්‍රශ්නයක් තමයි, විශේෂ බදු ක්‍රමය වැරදිය කියා දැන් එය අහෝසි කරන්ට ගරු ඇමතිතුමා ක්‍රියා කරනව නම් මේ කාලසීමාව තුළ ඉඩම්වලින් ඇව කපා විකුණා ගත් බදුකරවන්ට කරන්නෙ මොකක්ද කියන එක. මේ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම් හැටියට මම ඒ සම්බන්ධයෙන් මේ කාරණය මතක් කරන්ට කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ බදු ක්‍රමය යටතේ බෙදා දෙන ලද ඉඩම් දිසාපතිතුමාට අයිති ඉඩම්. අපි කැලෑ දෙපාර්තමේන්තුවට අයිති එක ඉඩම් අක්කරයක්වත් මේ විශේෂ බදු ක්‍රමය යටතේ දීල නැහැ. ඉංග්‍රීසියෙන් කියනව නම්, "We excise Forest Department jungles and hand them over to the G. A. in the first instance. එහෙම නම් මේ අන්දමට බෙදා දී තිබෙන්නේ දිසාපතිතුමාට අයිති කැලෑ ඉඩම්. ප්‍රතිපත්තියක් වශයෙන්, සෑම අවුරුදු ... අටකට වරක්ම වාගේ ඒ ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැලෑ දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත් දීල ඒවායේ දැව කප්පවනව. අන්තිමට ඒ ඉඩම්වල ඉතුරු වෙන්නෙ වට අඩි 3 ට අඩු ගස් පමණයි. මේ විශේෂ බදු ක්‍රමය යටතේ බෙදා දුන්නෙ කැලෑ දෙපා දෙපාර්තමේන්තුවට අයිති රක්ෂිත ඉඩම් නම්, අන්න පුපුළුවනි ඉතා වටිනා දැව කපා ගත්තා යයි කියන්න. මේ බදු දුන්න ඉඩම්වල වට අඩි 3 ට වැඩි ගහක් ඉතුරු වෙලා නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
ඒක විශ්වාස කරන්න බැහැ. ඒ බොරු.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කරුණාකර මට කියන්න ඉඩ දෙන්න. සමහර විට කොන්ත්‍රාත්කාරයො කපන්ට ගිහින් බෙණ නිසා නොකැපු වට අඩි හත අටේ ගස් ඉතුරු වෙලා තිබෙනව. ඒව කැපුවොත් කොන්ත්‍රාත්කරුවන්ට පාඩුයි. තවත් නුග ගස් එහෙම තියෙනව.

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.** (හපුතලේ)
*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*
(Mr. W. P. G. Ariyadasa—Haputale)
ඉඩම්වල ගස් කපා ගත් අයට මොකද කරන්නේ ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
හපුතලේ ගරු මන්ත්‍රීතුමනි, අපි දෙගොල්ලම සිංහල මිනිස්සු. අපේ පුරුද්දක්ව තිබෙනව, අල්ලපු ගෙදරට වැඩිපුර තව කාමරයක් ගන්නව නම් අපි මෙහෙ ඉඳල ඔවුන්ට ගල් ගසන එක. ඒක තමුන්නාන්සේගේත් මගේත් ප්‍රතිපත්තියක්. ඉතින් මේ විශේෂ බදු ලබාගත් මිනිහෙක් වට අඩි 3 ට අඩු මේ කුඩා ගස් ටික කපල ඒ ඉඩමේ ගෙයක් හදා ගන්නව පමණක් නොව පිටත ගෙන යන්ට බලපත්‍රයකුත් ලබා ගන්නව. එවිට ඒක බලා ඉන්න මිනිහ හිතනව, " යකෝ මූ හම්බ කරන්නට යන්නෙ " කියා. මෙන්න විශේෂ බදු ක්‍රමය යටතේ බෙදා දී තිබෙන ඉඩම්වල ගස් කපා ගන්න උදවියගෙන් අය කර ගන්න " රෝයල්ටි " හෙවත් රජයේ ගාස්තුව. සාමාන්‍ය ගණනට වඩා එකට එකක් විතර වැඩිපුර ගන්නව.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
වගා නොකර ඉඩම්වල ගස් පමණක් කපා ගත්ත උදවියට මොකද කරන්නෙ කියන එකයි ප්‍රශ්නය.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
මේක ඉවර වෙලා ඒ අය ගැන මම පසුව කියන්නම්. කොස්, බුරුත, තේක්ක ආදි පළමුවෙනි පන්තියේ දැවවලට ඝන අඩිය කට මේ විශේෂ බදු ක්‍රමය යටතේ රජයේ ගාස්තුව වශයෙන් අය කරනව රු. 20 ක්. දිවුල්, ඇටඹ, හල්, දුනුමඩල ආදී තුන් වෙනි පන්තියේ දැව සඳහා රජයේ ගාස්තුව වශයෙන් ඝන අඩියකට අය කර නව, රු. 1.60 ක්. සාමාන්‍යයෙන් දෙගුණයක් තරම අය කරනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
හල්මිල්ල ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
හල්මිල්ලවල සාමාන්‍ය මිළ රුපියල් 3ක් පමණ වෙන නමුත් මේ විශේෂ බදු ක්‍රමය යටතේ රුපියල් 6 ක් අය කරනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කළුවර ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කළුවරවල මිළත් දමා තිබෙනව. ඝන අඩියකට රුපියල් 20 ක් අය කරනව. එහෙත් අපේ කැලෑවල අද කළුවර ගස් නැති බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]
කවුරුත් වගේ දන්නා දෙයක්. මේ විශේෂ බදු ක්‍රමය යටතේ නිකුත් කළ රජයේ ගාස්තු පිළිබඳ ලැයිස්තු ගරු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා සහ ප්‍රසිද්ධ වීම සඳහා මම සභාගත කරනවා.* මේ විවාදයේදී මේ කරුණු සියල්ලම ඉදිරිපත් කළ යුතුමයි.

හපුතලේ ගරු මන්ත්‍රීතුමා (ආරියදාස මයා.) ඇහුව, මේ ඉඩම්වල ගස් කපා ගත් උදවියට මොකද කරන්නෙ කියා. අපි උදාහරණයක් ගනිමු. විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් 500 ක් බෙදා දුන්න යයි හිතමු. එයින් ඉඩම් ලබා ගත් දහ දෙනකු තරම ගස් කපල ඉවරයි, වගා කරල නැහැ. ඒ උදවියගේ බදු අපි අහෝසි කළා. එහෙත් ඒ උදවියගෙන් ගස් වෙනුවෙන් අපි රජයේ ගාස්තුව අය කරගෙන තිබෙනව. ඒ එකක්. ඒ වගේම ඒ ලී ඉන්දියාවට හෝ ඇමෙරිකාවට යවන්ට ඉඩ දුන්නෙ නැහැ. මේ රටේ කොහේ හරි ඒවා තිබෙනව. බැරිවෙලාවත් මේ ගස් රජයේ කැලෑ දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුවකු ලවා කැප්පුවා නම් ඒත් රජයට ලැබෙන්නෙ මේ සමාන මුදලක්. මේ ගස් කපා ගත් උදවිය ඒ ලී ඉන්දියාවට, ජපානයට නැත්නම් ඇමෙරිකාවට යැව්ව නම් අන්න ඒක වරදක්. ඒ ලී මේ ලංකාව තුළ කොහේ නමුත් තිබෙනවා. ඒවායේ වටිනාකම රජයට අරගෙන තිබෙනවා. එහෙත් එක වරදක් කර තිබෙන බව ඇත්තයි. ඒ උදවිය භාර ගත් වගකීම ඉටු කර නැහැ. මෙවැනි විශාල ව්‍යාපාර කරන්නට යන විට මෙවැනි දේ සිදු වන බව අප දන්නවා. අප බලා ගන්නට ඕනෑ මින් ඉදිරියට එවැනි දේ සිදු නොවන හැනට කටයුතු යොදන්නට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඇවවලින් කොතරම් හම්බ වෙලා තිබෙන වාද?

*සභාගත කරන ලද ලැයිස්තුව අද දින වැඩ කටයුතු අවසානයේදී පරිශිෂ්ටය අංක 2 වශයෙන් මුද්‍රණය කර ඇත.

*சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் இன்றைய நடவடிக்கைகளினிறுதியில் அநுபந்தம். இல. 2 ஆகத் தரப்பட்டிருக்கின்றது.

* *The list tabled is reproduced as Appendix No. 2 at the end of this Day's Proceedings.*

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ලැබී තිබෙන සංඛ්‍යා ලේඛනවලට අනුව රුපියල් එක්ලක්ෂ පනස් දහසක පමණ මුදලක් රජයට ඇවිත් තිබෙනවා. [බාධා කිරීමක්] හොරෙන් ගන්නවා, ඒවායිනුත්, අනික් ඒවායිනුත්. ඒවාට ඔයගොල්ලො උදව් දෙනවා.

ලීවල තත්ත්වය ඒකයි. ඒ පිළිබඳව අවිශ්වාසයක් තබා ගන්නට වුවමනා කරන්නේ නැහැ. තර්ක කරන්නට වුවමනා කරන්නේ නැහැ. මේ රටේ දැව අඟලක්වත් නැති වෙලා නැහැ. නැති වෙන්නෙත් නැහැ. අපතේ යන්නේත් නැහැ.

මේ විශේෂ බදු ක්‍රමයෙන් අපට වැදගත් යහපත් කටයුතු කීපයක් සිදු වී තිබෙනවා. විරුද්ධ පාර්ශ්වය ඒවා පිළි නොගත්තාට අපට කරන්නට දෙයක් නැහැ. එහෙත් ඒවා මෙහිලා සඳහන් කරන්නට ඕනෑ. පළමුවන වැදගත් ප්‍රයෝජනය මෙයයි: මේ රටේ කැලෑ මැද පිහිටි ගම් ප්‍රදේශවල ජනතාවට විද්‍යානුකූලව කෘෂිකර්ම ප්‍රතිපත්ති ඉගෙනගන්නට පළමුවන වතාවට අවසථාව සැලසී තිබෙනවා. ඇතැම් දෙනා කට කොණින් සිනා සෙන බව පෙනෙනවා. මා නිදර්ශනයක් වශයෙන් පෙන්වන්නම්, මහියංගනය ප්‍රදේශය. විද්‍යානුකූල කෘෂිකර්ම ප්‍රතිපත්ති මොනවාද යන්න බලා ගන්නවත් ඒ ගැමි ජනතාවට අවස්ථාව සැලසුනා.

අපේ ප්‍රතිපත්තිවලට අනුවයි, අපි මේ කතා කරන්නේ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිවලට අනුව නොවෙයි. අද ඒ විශෙෂ බදු කාරයන් ඒ ප්‍රදේශවල විශාල පර්යේෂණ පවත්වනවා. අයි. ආර්. 8 වී වර්ගයට වතුර කොච්චර වුවමනා කරනවාද, පොහොර කොච්චර වුවමනා කරනවාද, කොතරම් කලකින් අස්වැන්න ලබා ගත හැකිද, යනාදී කරුණු දැන ගැනීම පිණිස පර්යේෂණ පවත්වනවා. ඒ, ඉන් සිදු වූ දෙවන යහපතයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
පර්යේෂණ වලටත් සමගද ඉඩම් දුන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඒකටත් එක්ක තමයි.

පර්යේෂණ පවත්වන්නේ සංවර්ධනය කරන ගමන්මයි. ඒ සඳහා ඔවුන්ගේ විශෙෂඥයන් සිටිනවා. ලංකාවේ හොඳ තරුණ පිරිස් පිටරටවලට ගොස් විභාග සමත් කර පැමිණ සිටිනවා. ඒ උදවිය හොඳ පඩි ක්‍රම යටතේ එම වැදගත් කට යුතු සඳහා පත් කර සිටිනවා. අපේ අතිරේක ආහාර ද්‍රව්‍ය අවශ්‍ය කරන ප්‍රමාණය නිපදවීම සඳහා හැකි පමණ මහන්සි වී ඒ උදවිය උදව් දෙනවා. දහස් ගණන් තරුණයන්ට ඒ අනුව රක්ෂා ලැබී තිබෙනවා. [බාධාකිරීමක්] උගත් තරුණ යන්ට.

මහියංගනයේ අක්කර නව දහස් ගණනක් දී තිබෙනවා, විශෙෂ බදු ක්‍රමය යටතේ වගා කරන්නට. තමුන්නාන් සේලා කොච්චර හිනා වුණත් ඒ පළාත් වල ජනතාව ඕවා පිළිගන්නේ නැහැ. ඒ ජනතාවට ඕවා පෙනෙන දේවල්. මහියංගන ප්‍රදේශයෙන් 50ක් වත් එම රක්ෂාවලට අර ගෙන නැහැ. ඒ ඇයි? ඒ උදවිය ඒවාට යන්නේ නැහැ. එහේ කුඹුරු වල ඔවුන්ට රක්ෂා තිබෙනවා. පිට පළාත් වල තරුණයන්ට එම නිසා රක්ෂාව ලැබෙනවා. ඔය විශෙෂ බදු ක්‍රමය යටතේ ගම් ප්‍රදේශවලට බොහොම ඈතිනුයි, ඉඩම් දී තිබෙන්නේ. මහවැලි ගඟ අයිනේ එහෙම ගණ මූකලාන් තිබෙන ප්‍රදේශ වලිනුයි, දී තිබෙන්නේ. මාත් සාමාන්‍ය වශයෙන් වැඩක් කරන්නට මහන්සි ගන්නා පුද්ගලයකු හැටියට ටික දෙනෙකු වත් පිළිගන්නවා. එහෙත් මංවත් තව අවුරුදු 30ක් 40ක් යන තුරු ඒ අක්කර නවදාහේ කැලේ සංවර්ධනය කරන්නට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. මහ වැලි ගඟේ ජලය පොම්ප මාර්ගයෙන් අඩි 25, 30 උඩට අරගෙන ඇළවල් මාර්ගයෙන් ගෙනැවිත් පයිප්ප දමා වතුර ලබාගෙනයි ඔය මිරිස් වැනි දේ වවන්නේ. හැබැයි, ඔය ඉඩම් අතිරේක බෝගවලට දුන්නාට මොකද ඒවායේ වීත් වවනවා. එය නවත් වන්නට බැහැ. ඇයි ඒ? සෑම අක්කර ගණනකටම සියයට 25ක් 30ක් වගුරු ඉඩම් තිබෙනවා. මාස් කන්නයේ දී ඒවායේ අතිරේක බෝග වවන්නට බැහැ. වී පමණයි වගා කළ හැක්කේ. එහෙත් සියයට 50ක, 60ක, 70ක පමණ අතිරේක බෝග වවන්නට පුළුවනි. සමහරු කියනවා ඒවායේ වවන්නේ විය කියා.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
ඒත් හොඳයිනෙ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
පාර්ලිමේන්තු ලේකම්තුමාත් කියනවා, හොඳයි කියා. වගුරු ඉඩම්වල වී වවනවා. සෑම කොටසකම අක්කර විසිපහක්, තිහක් වගුරු ඉඩම් තිබෙනවා. මාස් කන්නයේ දී ඒවායේ වවන්නට පුළුවන් වී පමණයි. ඉතින් ඔය ආකාරයටයි, ඔය කෘෂිකාර්මික කටයුතු කෙරීගෙන යන්නේ.

මොරටුවේ ගරු මන්ත්‍රීතුමාට (එම්. රස්කින් ප්‍රනාන්දු මයා.) ඉඩම් අක්කර තුන්දාහක් දීම පිළිබඳව මහ හයියෙන් කථා කළා. එය පෞද්ගලික වශයෙන් ඒ ගරු මන්ත්‍රීතුමාට දෙන ලද දෙයක් හැටි යටයි, පෙන්වන්නට උත්සාහ කළේ. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රී වරුන්ට පමණක් මෙම ඉඩම් දී තිබෙන බව ලැයිස්තුවලින් ඔප්පු වන බවත් විරුද්ධ පාර්ශ්වයෙන් කියැවුණා. ඇත්ත කියනවා නම් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඔය ඉඩම් ඉල්ලීමට පෙළඹුණේ නැහැ. ඊට හේතුව ඒ අය මෙම රජයේ වැඩ පිළිවෙළට විරුද්ධ වීමයි. රට දියුණු කිරීමට ආශාවක් තිබෙන අය පමණයි, මේ ඉඩම් ඉල්ලුවේ. ඒ වාගේම මෙම රජයේ ප්‍රතිපත්තිය අනුමත කරන අයයි මේ ඉඩම් ඉල්ලුවේ. හැබැයි මේ අතර මහර ගරු මන්ත්‍රීතුමාත් (එස්. කේ. කේ. සූරියාරච්චි මයා.) ඉඩම් අක්කර දෙ සීයක් ලබා ගෙන තිබෙනවා. දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. ජී. සේනා නායක මයා.) නෝනා මහත්මියත් ඉඩම් අක්කර පන්සීයක් ලබා ගෙන තිබෙනවා. දෙවිනුවර ගරු මන්ත්‍රීතුමාත් (ආර්. ජේ. ජී. වික්‍රමසිංහ) ... මෙල් මයා.) ඉඩම් කොටසක් ලබා ගෙන තිබෙනවාලු. දඹදෙණියේ ගරු

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

මන්ත්‍රීතුමාගේ නෝනා මහත්මිය තමන් ලබා ගත් ඉඩම්වල හොඳින් ගොවිතැන් කර පසුගිය කන්නයේ දී දැනටමත් රුපියල් හැත්තෑ පන්දාහක, ලක්ෂයක, පමණ මුදලක් උපයාගෙන ඇතැයි මා හිතනවා. ඒ වැඩ පිළිවෙළට අපගේ උදව්ව ලැබෙනවා. එහෙත් දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) වැරදි පින්තූරයක් මවා පාන්නට හදනවා. මා මෙම අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්වරයා වන නිසා මගේ භාර්යාවට ඉඩම් අක්කර ප්‍රමාණයක් දී තිබෙන බවට එතුමා චෝදනා කළා. මගේ තත්ත්වය පාවිච්චි කර මා මගේ භාර්යාව ගේ නමින් ඉඩම් ගත්තාලු. එහෙත් මෙය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. ඇත්තෙන්ම දොම්පේ ගරු මන්ත්‍රීතුමා මහත්මයකු නම් මේ ගැන මෙම ගරු සභාවේදී කෑ ගසන්නට පෙර මගෙන් අසන්නට තිබුණා. මගේ භාර්යාවගේ විශේෂ බද්දු ඉඩම් පිළිබඳව තීරණයක් නොකළ නිසා මා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාට කෑ ගැසුවාලු. පළමුවැනි වතාවට මා මෙම ප්‍රශ්නය ගැන ස්ථිර ලේකම්තුමාට කථා කෙළේ දොම්පේ ගරු මන්ත්‍රීතුමා ඔය ප්‍රශ්නය මෙම ගරු සභාවේදී ඉදිරිපත් කළාට පසුවයි. මහ ලොකු වැදගත්කම මේ මිනිසුන් ලජ්ජා නැතිව මේවා ප්‍රකාශ කරනවා. මගේ භාර්යාව වේවා, දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමාගේ භාර්යාව වේවා මහර ගරු මන්ත්‍රීතුමා වේවා මෙම රජයේ මේ වැදගත් ප්‍රතිපත්තියට එකඟව ක්‍රියා කරන්නට කැමති නම් එහි ඇති වරද මොකක්ද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ගරු මන්ත්‍රීවරුන් පොහොසත් වන ක්‍රම කීපයක් තිබෙනවා. පගා ගැසීම ඉන් එකක්. මේ විශේෂ බද්දු ක්‍රමයෙන් අක්කර සියයක් ලබාගෙන පොහොසත් වන්නට පුළුවන් වෙතැයි යමකු සිතනවා නම් ඔහු මෝඩයකු බව වියලි කලාපයේ බුරුත ගස් යට අවුරුදු 17 ක් තිස්සේ නිදාගත් කෙනෙකු හැටියට මට කියන්නට පුළුවනි. මේ අවුරුද්දේ වැස්සොත් හොඳයි. හැබැයි අනෙක් අවුරුද්දේ නොවැස්සොත් ඔක්කොම ඉවරයි. නැවතත් පුළුවන් තරම් වියදම් කොට කොණක සිට වැඩ කරගෙන යන්නට සිදු වෙනවා. මදුරුවන්ගෙන් පීඩා ලබන්නට සිදු වෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්නට තිබෙනවා. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මෙම ගරු සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන්ට ලොකු චෝදනාවක් ඉදිරිපත් කළා. පගා ගසා සමහර මන්ත්‍රීවරුන් පොහොසත් වෙනවාලු. කරුණාකර ඒ විධියට පොහොසත් වුණු මන්ත්‍රීවරුන්ගේ නම් කියන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මා නම් කියන්නේ නැහැ. [බාධාකිරීමක්] මන්ත්‍රීවරුන් පොහොසත් වන ක්‍රම කීපයක් තිබෙන බවයි, මා කීවේ. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා තම කථාවේදී මා ගැන ඕනෑ දෙයක් කියන්න. දැන් මා මගේ කථාව කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහරුන් මුට්ටි කාසි වලින් පොහොසත් වෙලා ලොකු වතු ගන්නවා. සමහර අය අල්ලස් ගෙන ජීවත් වෙනවා. අවංකව මහන්සි වී මෙම මාතෘ භූමියෙන් යමක් උපයා ගන්නා එක ඊට වඩා හොඳ නැද්ද ? හොරකම් නොකර මහන්සි වී පොළොවෙන් යමක් උපදවා ගන්නට පුළුවන් නම් එහි ඇති වරද මොකක්ද ? කිසිම වරදක් නැහැ. එහෙත් මේ කාරණ යේ මුවාවෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ජනතාවට පෙන්වන්නට හැදුවේ මොකක්ද ? "මේක උන්ගේ ආණ්ඩුව ; උන් ඉඩම් ගත්තා " යන්නයි. විදේශ විනිමය සම්බන්ධයෙනුත් මේ අය මහජනතාවට වැරදි අවබෝධයක් දෙන් නට උත්සාහ කරනවා. මොරටුවේ ගරු මන්ත්‍රීතුමාට රුපියල් එක්ලක්ෂ පණස්දහක විනිමය දුන්නාලු. මේ කියමන පත්තරවල පළ වුණු විට ගැමි ජනතාව කල්පනා කරන්නේ, "යකෝ, ආණ්ඩුව මුන්ට නිකම් සල්ලි දීල නොවැ ? " කියලයි. ඔව් ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මේ අප්පලා හොඳට දන්නවා, ඔය සෙල්ලම. පත්‍රයේ පළ වන්නට ඕනෑ නිසා කියනවා. පත්‍රකාරයනුත් ඕක දන්නවා. එහෙත් නොදන්න අය මේ රටේ ඉන්නවා. මේ විශේෂ බදුකාරයන්ගෙන් යම් කිසි රුපියල් ගණනක් අරගෙන ඒ වෙනුවට අපේ රන් පවුම් අරමුදලෙන් එක්තරා මුදලක්, ඒ අයට අවශ්‍ය බඩු ගෙන්වා ගැනීම සඳහා දීමයි, මේ විදේශ විනිමය දීමය කියන්නෙ. එහෙත් පෙන්වන්නට වීරිය කරන්නේ, විශේෂ බදු සහනයකුත් දුන්නා, ජීප් රථයක් ගෙන්වා ගන්නට රුපියල් 50,000 කුත් දුන්නාය කියායි. "බලාපල්ලා, විදේශ විනිමය රුපියල් 50,000 ක් දීලා නේ." ඔහොමයි කියන්නෙ. මේ අය හරි සෙප්පඩ විජ්ජාවල් දන්නවා. අපත් ඕවා දන්න නිසා හොඳයි, ඕවායින් බේරෙන්නට.

අප, සංවර්ධනය කිරීම සඳහා අක්කර 52,000 ක් දී තිබෙනවා නම්, ඒ අක්කර 52,000 සංවර්ධනය කිරීමෙන් රුපියල් ලක්ෂ 1,750 ක් බේරා ගන්නට අප බලාපොරොත්තු වෙනවා නම් ඒ කටයුත්ත සඳහා අවශ්‍ය යන්ත්‍ර ආදිය ගෙන්වා ගැනීමට රුපියල් ලක්ෂ 4 ක විනිමය දුන්නම ඇති වැරද්ද මොකක්ද? රුපියල් ලක්ෂ 1,750 ක් බේරා ගන්නට අප බලාපොරොත්තු වෙනවා. සමහරවිට ඒක කර ගන්නට බැරි වන්නට පුළුවන්. එයින් අටෙන් එකක්වත් බේරා ගන්නට පුළුවන් වෙයි නේද? අපේ ප්‍රතිපත්තිය අනුව අපි අක්කර 1,000 ක් දුන්නා, 1,500ක් දුන්නා 2,000ක් දුන්නා. ඒක ඇත්තයි. ඒවා සංවර්ධනය කරන්නට වුවමනා යන්ත්‍රෝපකරණ, නිපදවන දේ වෙළඳපොලට ගෙන යන්නට, වැඩ පොළ වල් පරීක්ෂා කිරීම සඳහා යන්නට, කම්කරුවන් එහා මෙහා ගෙන යන්නට, ඇට ජාති සහ බෝග ජාති එහා මෙහා ගෙන යන්නට අවශ්‍ය වාහන, ඉඩම් එළි කිරීමට අවශ්‍ය යන්ත්‍ර පිටරටින් ගෙන්වා ගැනීමට ඒ සුළු විදේශ විනිමය අප දිය යුතුමයි, අපේ ප්‍රතිපත්තිය අනුව. මේ මුදල් නිකම් කාටවත් දුන්නා නොවෙයි. ඒ කොම්පැනි කාරයන්ගෙන්, ඒ විශේෂ බදු කාරයන්ගෙන් දෙන විදේශ විනිමය ප්‍රමාණයට සමාන රුපියල් ගණනක් අරගෙනයි, ඒ මුදල දී තිබෙන්නේ. මා විශේෂයෙන්ම මේක කියන්නේ රටේ ජනතාවගේ දැනගැනීම සඳහායි. "ඇත්ත" පත්‍රයේ මේක එක එක විධියට වැටෙන්නට පුළුවන්. රජයේ දේ නිකම් දීමක් නොවෙයි. කරන්නේ. ඒ අය ඕක කීමෙන් බලාපොරොත්තු වන්නේ අර සෙප්පඩ විජ්ජාවයි. දොම්පේ ගරු මන්ත්‍රීතුමා තමයි, ඒ සෙප්පඩ විජ්ජාව ගෙනිච්චේ.

ඊ ළඟට මාලේවන ඥානිස්සර හාමුදුරුවන්ට ඉඩම් දුන්නාය කියා විශාල වශයෙන් කෑගැහුවා. මාලේවන ඥානිස්සර හාමුදුරුවන්ට වේවා, වෙනත් ආගමක පූජකතුමකු වේවා, විශේෂ බදු මණ්ඩලය සලකන්නේ මේ රටේ පුරවැසියන් හැටියටයි. උන්වහන්සේ වැරදි පියවරක් ගත්තා නම් ඒ ආගම අනුව උන්වහන්සේ ඒකට ප්‍රතිඵල භුක්ති විඳියි. විශේෂ බදු මණ්ඩලය උන්වහන්සේගේ ඉල්ලුම් පත්‍රය සලකා බලා අක්කර සියයක් දුන්නලු.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒකත් ස්ථිර නැහැ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඒකට කරන්නට දෙයක් නැහැ. අස්ථිර වන්නට පුළුවන්. අපි ස්ථිරද? පුළුවන් තරම් කෑගහනවා, ඇණ කොටා ගන්නට හදනවා. අපි ස්ථිරද? නැහැ? මොනවද ස්ථිර?

අනික් කාරණය බදු සහනය ගැනයි. ඒක ගැන විශාල කෑගැසීමක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු පතා රුපියල් ලක්ෂ 1,750 ක් රන් පවුම් මුදල්වලින් මේ රටින් පිටරටට ඇදී යන විට එයින් අඩකින් අඩක්වත් මෙහි රඳවා ගැනීමට අප වීරිය කරනවා නම් එය රඳවා ගැනීමට අපට සහයෝගී වන පුද්ගලයන්ට ඔවුන්ගෙන් ලැබෙන ඒ සහයෝගය නිසා බදු සහනයක් දීම සාධාරණ බව ආණ්ඩු පක්ෂය පිළිගත්තා. විරුද්ධ පාර්ශ්වය එයට විරුද්ධ වීම ගැන අපට කරන්නට දෙයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දොම්පේ ගරු මන්ත්‍රීතුමා ඕවා කියලා පැනලා ගියා. උන්නැහේ අර විධියේ පෞද්ගලික චෝදනාවක් මට එල්ල කළා. මා සමාජ සේවයට කැප වී පිරිසිදු අවංක ජීවිතයක් අවුරුදු 25 ක් තිස්සේ ගෙන ගොස් තිබෙන බව මේ ගරු සභාවේදී කියන්නට සතුටුයි. යම් යම් අවස්ථාවල දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ පෘථග්ජන අපෙන් වැරදි සිදු වන්නට පුළුවනි. එහෙත් දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කථා කරන්නේ කැඩපතකින් තමාගේ මුහුණ බලන්නේ නැතිවයි. අගෝස්තු මාසයේදී උන්නැහේ මට දොස් කීවා. එහෙත් උන්නැහේ මොකක්ද කළේ ? "මා ජීප් රථයක් ගත්තා, එය සාධාරණයි" කියනවා. උන්නැහේ ඒක ගත්තේ මොකකටද ? "මා කිසිම බලපෑමක් කළේ නැහැ, අවුරුද්දකට කිරි පයින්ට් 40,000 ක් බෙදා හැරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් දැම්මා" යැයි උන්නැහේ කියනවා. මා ගණන් හදා බැලුවා. අවුරුද්දකට කිරි පයින්ට් 40,000 යි කියන්නේ දවසකට කිරි බෝතල 82 යි. කිරි බෝතල 82 ක් බයිසිකල් දෙකකින් වුණත් ගෙන යන්නට පුළුවනි. ඇමති ධුරයක් දැරූ කෙනකු වෙලාත් එතුමා මෙතැන ඇවිත් බෙගල් ඇදබානවා. ලජ්ජා නැතිව රජයට බොරු කියා රථයක් ලබාගෙන පාවිච්චි කරනවා. එතුමා කෘෂිකර්ම ඇමතිතුමා වශයෙනුත් කටයුතු කර තිබෙනවා. උන්නැහේ දවසකට කිරි බෝතල 82 ක් බෙදා හරිනවාය කියන එකත් මට නම් අවිශ්වාසයි. ඒ මොකද ? මා දන්නවා, උන්නැහේගේ එළදෙනුන්ට කිරි නැති බව. වඳ එළදෙනුන්ට කොයින්ද කිරි ? ලජ්ජා නැතිව බොරු කියනවා. රබර් කිරි ගෙන යන්නට වෙන්නට ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary should not say that the member said a lie. He must withdraw that.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

No, Sir. What I said was that I doubt that his cows have any milk. A cow can only have milk if it produces a calf.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please ! He should not say that.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

හොඳයි, එහෙම නම් "අසත්‍යයක්" කියන්නද ? තමුන්නාන්සේගේ නියෝගය අනුව "බොරු" කියන වචනය මා ඉල්ලා අස් කර ගන්නවා.

වැඩිම වුණොත් එක බෝතලයකට සත 10 බැගින්, කිරි බෝතල 82 කට දවසකට රුපියල් 8.20 ක ශුද්ධ ලාභයක් ලැබෙයි. උදේට හැනැප්ම කීපයක් කිරි බෝතල ගෙන ගොස් දවසකට රුපියල් 8.20 බැගින් උපයන්නද, මේ රජයට බොරු කියා විදේශ විනිමය වැය කොට රථයක් ලබා ගත්තේ ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඇයි දුන්නේ ? දෙනවා නම් කවුද නොගන්නේ ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ටැලිෆෝන් කර, "මටත් දීපන්" කියන්න අමාත්‍යාංශයේ කවුරු හෝ ඇති. උන්නැහේ ඒ රථයෙන්, ගිය මාසයේදී කිරි මණ්ඩලයට කොපමණ කිරි දුන්නා දැයි මා දැන ගන්න කැමතියි.

"කරුණාකර මා පිළිතුරු දෙන විට මේ ගරු සභාවේ ඉන්නැයි" උන්නැහේ කථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරද්දී කියන්නට මට එඩිතරකමක් තිබුණා. එහෙත් එතුමා කථා කර අවසාන යේදී පැන ගියා.

"He who fights and runs away
Lives to fight another day"

රජයට විරුද්ධ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරමින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනාට මගේ කථාවෙන් නිසි පිළිතුරු ලැබුණා යැයි මා හිතනවා. ඒ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනා කළේ සම්පූර්ණයෙන්ම අසත්‍ය චෝදනාවලින්, අසත්‍ය කරුණුවලින් ගැබ් වුණු කථා දෙකක්. අසත්‍යයෙන් සම්පූර්ණ වූ එවැනි කථාවලින් රටට ඔප්පු කරන්නට වීරිය කළේ, වැරදි හැඟීමක්. ඒ වැරදි හැඟීමේ තත්ත්වය කුමක් දැයි පෙන්වා දීම අපේ යුතුකමක්.

මේ විශේෂ බදු ක්‍රමය ගැන විරුද්ධ පාර්ශ්වය මොනවා කීවත්, එය ක්‍රියාවේ නොයෙදවෙන කොළඹ, දොම්පේ ආදි ප්‍රදේශවලදී මොන පිළිවෙළේ බොරු පින්තූරයක් පෙන්වන්නට හැදුවත්, එම විශේෂ බදු ක්‍රමය සාධාරණ බවත්, ගැමියන්ට එයින් සෙතක් විනා පහරක් නොවදින බවත්, එය ක්‍රියාවේ යෙදවෙන පළාත්වල වාසය කරන මහජනතාව හොඳින්ම දන්නා බව මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා රජය ගෙන යන මේ ක්‍රියාමාර්ගය ගැන විරුද්ධ පාර්ශ්වයට කොයි අන්දමේ සාධාරණ බියක් තිබුණත් ඒ ප්‍රතිපත්තිය තව තවත් පුළුල් කර අපි ඉදිරියටම ගෙන යනවා.

**එල්. බී. දසනායක මයා.** (ප්‍රවාහණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. எல். பி. தசநாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. L. B. Dassanayake—Parliamentary Secretary to the Minister of Communications)

ආණ්ඩු පක්ෂයේ අය ගත් ඉඩම් ගැන පමණයි ඒ අය කිව්වේ; විරුද්ධ පක්ෂයේ අය ගත් ඉඩම් ගැනත් තමුන්නාන්සේ කියන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඔව් නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය නැඟූ නිසා මා එයත් අහනවා. වීදුරු ගෙවල්වල ඉඳගෙන ඇඳුම් ගලවන්න හොඳ නැත කියා කථාවක් තිබෙනවා. ඇයි, පිටින් සිටින අයට පෙනෙනවා නේ. විරුද්ධ පාර්ශ්වය ආණ්ඩු කරද්දී මාවතගම හිටපු මන්ත්‍රී ඩී. පී. වික්‍රමසිංහ මහතාට කුරුණෑගලින් අක්කර 45 රූඩ් 2 පර්චස් 12 ක් ලැබුණේ කොහොමද :?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඔය ඇමතිතුමාමයි දුන්නේ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

නැහැ, ඇමතිතුමා නොවෙයි. ඉඩම් දෙන්නේ කැබිනට් මණ්ඩලය නැත්නම් රජය. එදා තමුන්නාන්සේලාගේ පක්ෂයේ සිටි ලීලානන්ද වීරසිංහ මහතාට අක්කර 41ක් දුන්නේ කොහොමද ? එල්. බී. ජයසේන සහ තවත් 20 දෙනකුගෙන් යුත් සමූහයකට අක්කර 70 ක් දුන්නේ කොහොමද ? ටී. බී. තෙන්නකෝන් මහතාට මාතලෙන් අක්කර 43 ක් දුන්නේ කොහොමද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

දී තිබෙන්නේ කවදාද කියා කරුණා කර කියන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

බාර දී තිබෙන්නේ 1967 අප්‍රේල් මාසයේ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

හොඳයි, දැන් ඉතින් ඒ ගැන කියන්න මෙතන අවස්ථාව ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Are you prepared to give way ?

සෙනෙවිරත්න මයා.
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
No, Sir. I will give further particulars. මා ඉදිරිපත් කරන්නේ චෝදනාවක් වශයෙන් නොවෙයි.

ටී. බී. තෙන්නකෝන් මයා.
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ඒක හරි. එහෙත් සත්‍ය පැහැදිලි කරන්නට අවස්ථාව ඕනෑ.

සෙනෙවිරත්න මයා.
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
He can reply later. I am not giving way.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
I am sorry, he is not giving way.

ටී. බී. තෙන්නකෝන් මයා.
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
පෞද්ගලිකව කරුණු පැහැදිලි කිරීමට ඉඩ දෙන්න.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Order, please! Is the hon. Parliamentary Secretary prepared to give way for a personal explanation to be made ?

සෙනෙවිරත්න මයා.
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
No, Sir, not now.

රාජා වෙලේගම මයා. (මොනරාගල)
*(திரு. ராஜா வெலேகம—மொனறாகலை)*
(Mr. Raja Welegama—Moneragala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,, රීති ප්‍රශ්නයක් මතු කළ යුතුව තිබෙනවා. අප සාකච්ඡා කරන මේ ගරු සභාව ඉදිරියේ තිබෙන විශ්වාස භංග යෝජනාව නම් 1965 න් පසුව ඇති කරන ලද විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දීමේදී ඇති වූ අක්‍රමිකතා සම්බන්ධවයි. එහෙත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා සඳහන් කරන්නේ ඊට පෙර තිබුණු දේවල් ගැනයි. ඒවා මේ ප්‍රශ්නයට කිසිසේත්ම අදාළ නැති නිසා ඒවා ගැන සඳහන් කරන්නට ඉඩ දිය යුතු නැත කියා මා කියනවා.

සෙනෙවිරත්න මයා.
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කලින් ගැසූ ගැඟිලි ගැන කියන්න හොඳ නැ නේද ?

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Order, please! I will give a ruling. One of the allegations is that under the Special Leases, Members of Parliament have been given land. The hon. Parliamentary Secretary is stating what other lands were given at other times to Members of Parliament.

සෙනෙවිරත්න මයා.
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Seneviratne)
1964 දී කේ. බී. රත්නායක මහතාට අක්කර 10 ක් දී තිබෙනවා. ඔවාට අපි විරුද්ධ නැහැ. මේ රටේ සිටින මන්ත්‍රීවරුත් මේ රටේම පුරවැසියන්ගෙන් කොටසක්. සාධාරණ ඉල්ලීම් අනුව, සාධාරණ අයිතිවාසිකම් අනුව, ඔවැනි දේවල් ලබා ගැනීම හොරකම් කිරීම මිනී මැරීම වැනි අපරාධ කරනවාට වඩා හොඳයි. මුට්ටිකාසිවලින් වතු ගන්නවාය කියා මා කිව්වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary should not repeat those words like "*mutti kasi*" and so on.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

තමරා කුමාරි ඉලංගරත්න මැතිනියට පුත්තලමෙන් අක්කර 25 යි. තේරුණාද ? එපමණක් නොවෙයි අනුරාධපුර නගර යෙන් අක්කර දෙකක් විරුද්ධ පක්ෂයේ නායිකාවටත් මෛත්‍රීපාල සේනානායක මන්ත්‍රීතුමාටත් ලැබුණේ කොහොමද කියා මා අහනවා. අනුරාධපුර නගර සීමාවේ අද එක අක්කරයක වටිනාකම රුපියල් ලක්ෂ යකටත් වැඩියි. එමෙන්ම ඒ අය ඒවා ගත් කාලයේ එකම දුප්පත් ගැමියකුටවත් අක් කර අරික්කාලක්වත් ගන්නට පුළුවන්කම තිබුණාද කියලත් මා අහනවා. බද්දටත් නොවෙයි, සින්නක්කරයට, මේ රටේ ජනතාවට වැරදි අවබෝධයක් දී, ඔවුන් නොමඟ යවා, අපේ ප්‍රතිපත්ති කඩා කප්පල් කර දමන්නට උත්සාහ කරන අවස්ථාවකටයි දැන් අප ඇවිත් සිටින්නේ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රී තුමන්ලා මොන විධියට සෙප්පඩවිජ්ජා කරන්නට උත්සාහ කළත් අපේ ප්‍රති පත්තිවලට අනුව අපේ වැඩ කටයුතු කර ගෙන යැමට අප ගන්නා වෑයම වෙනස් වන්නේ නැහැ. අපේ ප්‍රතිපත්ති අවංකයි. ඒ අනුව අපේ වැඩ කරගෙන යනවා. හැබැයි, ඒ සමගම තවත් එකක් කියන් නට කැමතියි. පාර්ලිමේන්තු ක්‍රමය යටතේ සකස් වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයක් හැටියට අපේ වැඩ කරගෙන යන අවස්ථාවේ විරුද්ධ පාර්ශ්වයෙන් ඕනෑම වෙලාවක අපේ වැරදි පෙන්වා දුන් නොත් ඒවා සාධාරණයයි අපට පිළිගැනී මට පුළුවන් නම් හැකිතාක් ඉක්මනින් ඒ ගැන සොයා බලා ක්‍රියා කිරීම අපේ යුතු කමක් හැටියට අප කල්පනා කරනවා. එහෙත් අප කරගෙන යන ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් වැරදි අවබෝධයක් දී ජනතාව නොමග යවන්නටත්, ආණ්ඩු පක්ෂයේ පසුපස බංකුවල සිටින අපේ මන්ත්‍රීන් නොමඟ යවා ඇස්ගෙන්නටත් ලෑස්ති වුණොත් අප කවදාවත් ඊට ඉඩ දෙන්නේ නැහැ. අපේ වැඩ ටික පිරිසිදුයි. අපේ ප්‍රතිපත්ති පිරිසිදුයි. ඒවා පැහැදිලියි. ඒ නිසා අපේ ප්‍රතිපත්ති අනුව අපේ වැඩ කටයුතු නොනවත්වාම ඉදිරියටම ගෙන යනවා. ඒ නිසා අපේ වැඩ පිළිවෙළින් සාර්ථක ප්‍රතිඵල ලැබෙන බවට අප තුළ කිසිම අවිශ්වාසයක් නැති බව ප්‍රකාශ කර මින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Dambulla can now make his personal statement.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලිකව කරුණු පැහැදිලි කරන්නට මා බලාපොරොත්තු වන්නේ අක්කර 43 සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශය නිසා ඇති වූ ප්‍රශ්නය ගැනයි. ඔය අක්කර 43 ඉඩම අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී මා ගත් දෙයක් නොවෙයි. මම ඒ ප්‍රශ්නය පිළිබඳ නියම තත්ත්වය පැහැදිලි ලෙස කියන්නම්. අපේ ඇටෝරා කියන ගමේ ඉනාමලුවේ කැලෑවක් තිබෙනවා. එයින් මිනිසුන්ට ඉඩම් කොටස් බෙදා දෙන්නට වැඩ පිළිවෙළක් එක්තරා කාලයකදී ඇති වුණා. මිනිසුන්ට කොටස් වශයෙන් බෙදා දී අන්තිමේදී අක්කර 43 ක බිම් ප්‍රමාණ යක් ඉතිරි වුණා. ඒ ටිකත් මිනිසුන්ට බෙදා දී ඉවර කළොත් කෝටු කෑල්ලක් කපා ගන්නටවත් තැනක් නැති වෙනවා නොවේදැයි ඒ ප්‍රදේශයේ මිනිසුන් කියන්නට පටන් ගත්තා. ඒ නිසා ඒ ඉඩම් පිටතින් කාටවත් නොදී සිටින ලෙස ඒ උදවිය ඉල්ලා සිටියා. ඒ උදවිය තදින්ම එසේ කියා සිටියා. ඉතින්, එහෙම නම්, ඒ ඉඩම් කොටස මගේ නමින්වත් වෙන් කර තබන්නැයි මා කිව්වා. [බාධාකිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කලබල වෙන්නට එපා. මා තවම කාරණය පැහැදිලි කළේ නැහැ. තවත් ස්වල්ප වේලාවක් ඉවසා සිටින්න. මම සම්පූර්ණ විස්තරය දෙන්නම් [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The hon. Member for Negombo must please keep Order.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අක්කර හතළිස් තුනෙන්, අක්කර පහළොවක්ම දැනටමත් එක්කෙනාට අක්කරය බැගින් මිනිසුන් පහළොස් දෙනකුට බෙදා දී තිබෙනවා. ඔය ඉඩමේ එකම එක ගහක්වත් කපලා නැහැ. ඉඩම තිබුණු හැටියට එහෙමම දැනටත් තිබෙනවා. ඉතිරි ඒවාත් බෙදා දෙන්නට වැඩ පිළිවෙළ යොදා තිබෙනවා. දැන් වුණත් ඕනෑම කෙනකුට ගිහිල්ලා බලන්නට පුළුවනි. දැනටමත් කොටසක් මිනිසුන්ට දී තිබෙනවා. ඉතිරි ටිකත් දෙනවා. අපි එකම එක ගහක්වත් කපා ගත්තේ නැහැ. එහෙම දෙයක් කරලා නැහැ. හෙට වුණත් ගරු ඇමතිතුමාට හෝ එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට හෝ එහාටම ගිහිල්ල බලන්නට පුළුවනි. ඒ ගම්වල මිනිසුන් ඉල්ලා සිටි පරිදි ඒ ඉඩම එසේම තිබෙනවා. වෙන් කළ ඉඩම ඒ හැටියටම ආරක්ෂා වන හැටියට වැඩ පිළිවෙළ යොදා තිබෙනවා. ඉනාමලුව ඉඩමෙන් අක්කර 15 ක් ඒ ගමේ මිනිසුන් පහළොස් දෙනකුට දී තිබෙනවා. ඉතිරි හරියත් දෙන්නට ලෑස්තියි.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

දුන්නට කමක් නැහැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඉඩම් දෙන්නේ මා නොවෙයි. පළාතේ ඒජන්තතුමාගේ මාර්ගයෙන් එතුමාගේ කැමැත්ත අනුවයි දෙන්නේ. නියම විධියට කොටස්වලට කඩා දෙන්නට කියා තිබෙනවා. පිටින් එන අයට අක්කර දහය, පහළොව, විස්ස, තිහ ආදි වශයෙන් දී තිබුණු නිසයි පළාතේ මිනිසුන් විරුද්ධ වී සිටියේ. ඒ ඉඩම් ගම්මුන්ට ලැබෙන ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කළේ ඒ නිසයි.

අ. භා. 6.17

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී ඉඩම් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවෙන් පසු කථා කරන්නට අවස්ථාවක් මට ලැබීම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. එතුමා මහත් වේදනාවකින් තමයි කථා කළේ. බොහොම ලොකු අමාරුවකින්, බොහොම ලොකු වේදනාවකින් සහ වේගවත් හැඟීම්වලින් යුක්තවයි එතුමා කථාව කළේ. එතුමා කථා කළේ එතුමාගේ නිර්දෝෂත්වය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නටයි. එතුමා එය කළේ කෙසේද? මිනී මරාපු කෙනෙක් අධිකරණය ඉදිරිපිටට ගෙන ගොස් ඔහුට විරුද්ධව ඇති ඒ බරපතල චෝදනාව ඉදිරිපත් වුණාම තමන්ගේ නිර්දෝෂත්වය පළ කරමින් ඒ චෝදනාවෙන් ගැලවෙන්නට කෑ ගහනවා වාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා එක් අතකින් ගරු මන්ත්‍රීවරුන්ටත් අනෙක් අතින් මේ රටේ පොදු මහජනතාවටත් නින්දා වන විධියට කථා කළා. ඒ වාගේම වෘත්තීය සමිතිවල සාමාජිකයන්ටත් නින්දා වන විධියට එතුමා කථා කළා. එතුමා මේ තරම් පහත් තත්ත්වයකට වැටී මේ විවාදයට සහභාගි වේයැයි මා කල්පනා කළේ නැහැ. ඒ කාරණය බලවත් කනගාටු වෙන් කියන්නට සිදු වී තිබෙනවා. දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කළා. ඒ කථාවල් දෙකට පස්සේ ඉඩම් ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කථා කරන්නට පටන් ගත් විට අප බලාපොරොත්තු වුණේ ඒ කථා දෙකින් ඉදිරිපත් කරන ලද තර්ක බිඳ හෙලන්නට ශිෂ්ට සම්මත විධියට කරුණු ඉදිරිපත් කරනු ඇත කියායි. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මෙම ගරු සභාවෙහිදී හැසිරුණු ආකාරයත් එතුමා යම් යම් වචන පාවිච්චි කළ ආකාරයත් දෙස බලන විට, නවක මන්ත්‍රීවරයකු වන මට බලවත් කණගාටුවක් ඇති වුණා. ලංකාවේ නොයෙක් දිශාභාගයන්ගෙන් මෙම ගරු සභාවෙහි කෙරෙන වාද විවාද නැරඹීමට පැමිණෙන මහජනතාව—අපගේ ඡන්දදායකයන්—බලා සිටියදීවත් අපේ ගරු මන්ත්‍රීවරුන්ට, පාර්ලිමේන්තු ලේකම්වරුන්ට, ශිෂ්ට සම්මත විධියට කථා කරන්නට, හැසිරෙන්නට, බැරි නම් ඇත්ත වශයෙන්ම එය මෙම ගරු සභාවේ අගෞරවයට කාරණයක් නොවෙයිද ?

අද මේ රජය විසින් ගෙන යන කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරයට අප බිය වී සිටිනවායයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා. අප ඊට කිසිම බියක් නැහැ. අප ඊට එකඟයි. ඊට ආධාර කරන්නටත් අප ලැහැස්තියි. මේ රට තමුන්නාන්සේලාට පමණක් නොව අපටත් අයිතියි. මහජන නියෝජිතයන් වශයෙන් අපටත් මේ රට ගැන වගකීමක් පැවරී තිබෙනවා. මේ රටේ ජනතාව බඩගින්නෙන් මුදවා ගැනීමේ ව්‍යාපාරයකට අපගේ සම්පූර්ණ ආධාරය දීමට අප ලැස්ති බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ආණ්ඩුව කර ගෙන යන්නේ රට සංවර්ධනයද, ධනපති සංවර්ධනයද ? අප විරුද්ධ වන්නේ ධනපති සංවර්ධනයටයි. අපේ බිය ඒකයි. රජය මේ ව්‍යාපාරය ආරම්භ කර තිබෙන්නේ, රට සංවර්ධනය කරනවායයි කියමින් රට වැසියන් අතුරින් තෝරා ගන්නා ලද හත් හවුල් ගැත්තන් කීප දෙනකු පමණක් සංවර්ධනය කිරීමටයි. මේ ව්‍යාපාරයට අප විරුද්ධ වන්නේත් බිය වන්නේත් ඒ නිසයි. නියම කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරයකට අපේ කිසිම බියක් නැහැ. අප දේශපාලන වශයෙන් ඒ තරම් බංකොලොත් වුණු අය නොවෙයි. නියම විධියට රට සංවර්ධනය කරන්නට පුළුවන් දේශපාලන ප්‍රතිපත්තියක් තිබෙන්නේ හත් හවුලේ නොව තුන් හවුලේ බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි. ධනපති ක්‍රමයෙන් මිදී නියම සමාජවාදී සැලැස්මක් මත කෘෂිකාර්මික සංවර්ධනය හෝ වේවා, කාර්මික සංවර්ධනය හෝ වේවා, සලසා ගන්නට පුළුවන් තත්ත්වයත්, ශක්තියත්, තිබෙන්නේ විරුද්ධ පාර්ශ්වයටයි. තමුන්නාන්සේලා ඒ සියල්ල කරන්නට යන්නේ තමුන්නාන්සේලා පිළිගන්නා ධනපති ක්‍රමය මගිනුයි. ඒකයි අපට තිබෙන බිය. ඒ ක්‍රමය තුළින් මේ රට සංවර්ධනය කරන්නට තමුන්නාන්සේලාට කවදාවත් බැහැ. ඒ නිසයි අප ඊට විරුද්ධ වන්නේ. එසේ නැතිව, කෘෂිකාර්මික සංවර්ධනය ගැන අප දක්වන විරුද්ධත්වයක් උඩ නොවෙයි.

ඉඩම් බෙදන අවස්ථාවලදී ඒ ඒ ප්‍රදේශවල දිස්ත්‍රික්ක කෘෂිකර්ම සභාවලට කරුණු ඉදිරිපත් කොට, ඒවාට ලියකියවිලි හා චක්‍රලේඛන ආදිය යවා, ඒ මාර්ගයෙන් ඉඩම් ලැබිය යුත්තන් තෝරා ගත් බවක් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කියා සිටියා. එහෙත් අපේ කෘෂිකර්ම කාරක සභාවට නම් එවැනි චක්‍රලේඛනයක් කවදාවත් ලැබී නැති බව, මාතර දිස්ත්‍රික් කෘෂිකර්ම සභාවක හැම රැස්වීමකටම නොකඩවා සහභාගි වන සාමාජිකයකු වශයෙන් මට කියන්නට පුළුවනි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මාතරට නෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මාතරට නෑ. හොඳයි, එහෙම නම් තමුන්නාන්සේ අම්පාරේට ඒ චක්‍රලේඛනය යවා තිබෙනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)

අම්පාරෙටත් නෑ. [බාධාකිරීම්]

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු ඇමතිතුමා කියන දේ මා අවිශ්වාස කරනවා නොවෙයි. එම චක්‍රලේඛන අපේ පළාත්වලටත් යැව්වායයි තමුන්නාන්සේ හිතාගෙන සිටියත් එසේ යවා නැහැ. සමහරවිට, නිලධාරීන් ඒවා නොයැව්වා වෙන්නට පුළුවනි. [බාධාකිරීම්]

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

යාපනේ, කුරුණෑගල, මාතලේ, මොනරාගල, මන්නාරම, රත්නපුර, ත්‍රිකුණාමලේ, වවුනියාව, යන දිස්ත්‍රික්කවලට යවා තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අප දන්නා හැටියට නම් මේ රටේ මන්ත්‍රීවරුන් වන අපටත් ඉඩම් බෙදීම පිළිබඳ ඒ කරුණු දැනුම් දීමට තමුන්නාන්සේට යුතුකමක් තිබුණා. අපට කිසිම දැන්වීමක් නැහැ. ඒ නිසයි මා ඒ කරුණු ඉදිරිපත් කෙළේ.

රජයේ ඉඩම් අල්ලාගෙන සිටි දුප්පත් මිනිසුන් කිසිවකු එම ඉඩම්වලින් ඉවත් කෙළේ නැතැයි ඊළඟට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වා. අස් කරන ලද අයට වෙනත් ඉඩම් දුන් බවත් එතුමා ප්‍රකාශ කළා. එහෙත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රචාරක පත්‍රය වන "සේසත" කියන්නේ ඊට වෙනස් දෙයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මොකක්ද පත්තරය?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේලාගේ "සේසත". "ඇත්ත" හේම නොවෙයි. තමුන්නාන්සේලාගේ පත්‍රයක් මේක. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන පත්‍රයක්. 1968. 1. 1 දින දරණ මේ "සේසත" පත්‍රයේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"පුද්ගලයන් විසින් බලෙන් අල්ලා ගෙන තුබූ රජයේ ඉඩම් අක්කර 50,000 ක්ම ගිය වර්ෂයේදී රෙගුලාසි වලට යටත් කොට ආපසු ගන්නා ලද්දේ ය."

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herath—Hiriyale)

ඒ මුදලාලිවරුන්ගෙන් වෙන්න ඇති.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේ එහෙම නම් ලියන්න ඕනෑ මේකෙ මුදලාලිවරුන්ගෙන් ගත්තාය කියා. එහෙම එකක් නැහැ නොවැ මේකෙ. කිසිම ඉඩමක් ආපසු ගත්තේ නැත කියා තමුන්නාන්සේලා දැන් කිව්වා [බාධාකිරීමක්] තමුන්නාන්සේලාගේ "සේසත" පත්‍රයේ තමයි මේක තිබෙන්නෙ. "සේසත" පත්‍රයේ තිබෙන්නේ ඇත්තද නැත්තද කියා මා දන්නේ නැහැ.

ඒවාගේම අපේ අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) එදා ඇසූ ප්‍රශ්නයට දුන් උත්තරය වැරදි උත්තරයක්ය, එය යල් පැනපු උත්තරයක්ය කියා උප ඇමතිතුමා කිව්වා. ඒ කථාවේ තේරුම කුමක්ද කියා මට තේරෙන්නේ නැහැ. එදා තිබුණු තත්ත්වය අනුව තමයි ඉඩම් ඇමතිතුමා ඒ උත්තරය මේ ගරු සභාවට ඉදිරිපත් කළේ. නමුත් පාර්ලිමේන්තු ලේකම්තුමා කියනවා ඒ දුන් උත්තරය වැරදිය ,ඒ දුන් උත්තරය අද තත්ත්වයට වෙනස් කරන්නට සිද්ධ වී තිබෙනවාය කියා. මේ කථාවේ තේරුම කුමක්ද කියා මා දන්නේ නැහැ. මේ ගරු සභාවේ අපට යම් යම් ප්‍රශ්න අසන්නට අවස්ථාව දී තිබෙනවා. මේකෙන් අපට තේරුම් ගන්නට තිබෙන්නේ මේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාවේ අප අසන ප්‍රශ්නවලට ආණ්ඩුව හරි උත්තර නොදෙන බවයි. ඒ කියන්නෙ අප අසන ප්‍රශ්නවලට මේ ආණ්ඩුව බොරු උත්තර දෙන බවයි. ඒ හැර වෙන මොකක් ද මේවායින් අපට සිතා ගන්නට තිබෙන්නේ ? මේවා කාටවත් විශ්වාස කරන්නට පුළුවන් දේවල් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව කෙරෙහි ගරු සභාවේ විශ්වාසයක් නැත යන්න පෙන්නුම් කිරීමටයි අද දින මේ විශ්වාස භංග යෝජනාව විරුද්ධ පක්‍ෂය විසින් ඉදිරිපත් කර තිබෙන්නෙ. මේ ආණ්ඩුව කෙරෙහි අපේ විශ්වාසයක් නැහැ. නමුත් ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව සමහර විට මේ ගරු සභාව ඇතුළතදී පරාජය වෙන්නට පුළුවනි. නමුත් පාර්ලිමේන්තුවෙන් පිටත මහජනතාව කිහිප වරක්ම මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැත යන්න පැහැදිලිවම පෙන්නුම් කර දී තිබෙනවා. වැඩි කාලයක් ගතවී නැහැ, කල්මුණේ අතුරු මැතිවරණයේදී මේ මුළු හත් හවුල් ආණ්ඩුව කෙරෙහිම, ෆෙඩරල් යූ. එන්. පී. හවුල කෙරෙහිම මහජනතාව තුළ විශ්වාසයක් නැත කියා කල්මුණේ මහජනතාව විශ්වාස භංග යෝජනාවක් සම්මත කර තිබෙනවා. ඊට වැඩිය මොනවාද ? පාර්ලිමේන්තුව තුළදී තමුන්නාන්සේලා මේ යෝජනාව දිනයි. තමුන්නාන්සේලාගේ වැඩි ඡන්ද නමැති ගල් රෝල දමා මේ විශ්වාස භංග යෝජනාව තළා දමාවි. නමුත් මේ විශ්වාස භංග යෝජනාව පාර්ලිමේන්තුවෙන් පිටත මහජනතාවට ඉදිරිපත් කළොත් මහජනතාව විසින් අත් දෙකම ඔසවා මේ යෝජනාවට පක්‍ෂපාතිත්වය ප්‍රකාශ කරනවා ඇති. මේ විශ්වාස භංග යෝජනාව මහජනතාව අතරට දමා මහජනතාවගේ ඡන්දයෙන් දිනන්නට පුළුවන්ද කියා බලන්න. තමුන්නාන්සේලා මොන මොනවා හරි මේ පාර්ලිමේන්තුව ඇතුළතදී, මේ බිත්ති සතර ඇතුළතදී කියා කෑගසාවි. නමුත් මහජනතාව ඉදිරියට ගොස් මේවා කියා බේරෙන්නට තමුන්නාන්සේලාට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ බදු මණ්ඩලය පිහිටුවීම 1965 රාජාසන කථාවෙන් ඉදිරිපත් කළ අදහසක් ය කියා ආණ්ඩුව කියනවා. 1965 [illegible] විශේෂ බදු මණ්ඩලය පිහිටුවා ආණ්ඩුව බලාපොරොත්තු වුණේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳව දැනීමක් තිබෙන උදවියට, මුදල් හදල් තිබෙන උදවියට, ඉඩම් සංවර්ධන සඳහා යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන්නට පුළුවන් උදවියට, සත්ව පාලනය ගැන දැනීමක් තිබෙන උදවියට මේ ඉඩම් දෙන්නටයි. නමුත් ඇත්ත වශයෙන්ම මේ ඉඩම් දී තිබන්නේ එවැනි උදවියටද ? පොන්නම්බලම් මහත්මයාට මේ ඉඩම් දී තිබෙනවා. ඒ මහත්මයාට කෘෂිකාර්මික දැනීමක් තිබෙනවාද ? ජී. ජී. පොන්නම්බලම් නමැති මහත්මයෙකුටත් මේ ඉඩම් දුන්න බව කිය වුණා. ඒ මහත්මයාට මේ එක දැනීමක්වත් තිබෙනවද ? කෘෂිකම් දැනීමක් හෝ සත්ව පාලනය පිළිබඳ දැනීමක් තිබෙනවාද ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

උන්නැහේ කෘෂිකර්මය පිළිබඳ ශිෂ්‍යත්වයක් ලබාගෙන තිබෙනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කෘෂිකම්ය පිළිබඳ ශිෂ්‍යත්වයක් එතුමාට තිබෙනව යයි කියනව. ඒ ගැන සන්තෝෂයි. ගරු අගමැතිතුමාගෙන් මා අහන්ට කැමතියි, මේ ඉඩම් ලබා ගත් අනිකුත් උදවියටත් ඒ විධියේ ශිෂ්‍යත්ව තිබෙනවද කියා. තමුන්නාන්සේට පෙන්වන්ට පුළුවන්කම තිබෙන්නෙ පොන්නම්බලම් මහත්මයාට තිබෙන ශිෂ්‍යත්වයයි. මහජනයාගේ ඇස්වලට වැලි ගහන්ට මේ අදහස් ඉදිරිපත් කළාට ඉඩම් බෙදා දීමේ දී එක්සත් ජාතික පක්ෂයටත්, ආණ්ඩුවටත් ආධාර කරන ගැතිකම් කරන උදවියට විශේෂ සැලකිලි දක්වා තිබෙන බව, මේ ලැයිස්තු දෙස බලන විට අපට පෙනී යන කරුණක්. මේක අළුත් ආණ්ඩුවේ අළුත් ක්‍රියා මාර්ගයක්ය, වෙන කිසිම ආණ්ඩුවකින් මේ විධියේ විශේෂ බදු මණ්ඩලයක් පිහිටෙව්වෙ නැත කියා කියනවා. ඇත්ත තමයි, මේ ආණ්ඩුව විශේෂ බදු මණ්ඩලයක් පිහිටෙව්වෙ මොකටද ? ධනපතියන්, ධනපති කොම්පැණිකාරයින්ත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

සනසන්න. මේ උදවිය රටට ජාතියට ආදරයක් ඇති, ජාතික කැක්කුමක් ඇති දේශ ප්‍රේමීන් හැටියටයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් පෙන්වා දෙන්ට යෙදුනෙ. ධනපති පන්තිය රටට ආදරයෙන් වැඩ කරන පන්තියක් හැටියට අපි අහල නැහැ. දේශීය හා විදේශීය කොම්පැණිකාරයින් ජාතික කැක්කුමක් ඇතිව වැඩ කරන ආකාරයක් අපි දැක නැහැ. ලංකාවේ නොවෙයි, ලෝකයේ කිසිම රටක ධනේශ්වර පන්තිය හෝ ධනේශ්වර කොම්පැණිකාරයින් කවදාවත් රටට ජාතියට ආදරයෙන් වැඩ කරල නැහැ. කිසිම රටක ධනපති පන්තිය රට සංවර්ධනය කරන්ට ක්‍රියා කර නැහැ. ඔවුන්ගේ සංවර්ධනයට තමයි, ඔවුන් හැමවිටම කටයුතු කරන්නෙ. ඇත්ත තමයි, අළුත් ආණ්ඩුව අළුත් මාර්ගයක් ඇති කර තමන්ගේ මිත්‍රයන්ට තමන්ගේ හවුල්කාරයන්ට අවස්ථාව සලසා දී තිබෙනව, රටේ මහජනයාට අයිති දේපොළ, රටේ මහජනයාට අයිති කැලෑ හූරා කන්න. ඒ වගේම රටේ උගත් තරුණ තරුණියන් හූරාගෙන කන්ට මේ කොම්පැණිකාරයින්ට බොහොම හොඳින් අවසථාව සලසා දී තිබෙනව මේ ආණ්ඩුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් අක්කර 89,272 ක් අනුමත කර තිබෙන බවත් එයින් ඉඩම් අක්කර 56,263ක් දැනටමත් බෙදා දී තිබෙන බවත් ඉඩම් වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා. මේ ඉඩම් ගොවි ජනතාවට බෙදා දුන්නා නම් නරකද? මේ ඉඩම් අපේ රටේ රැකීරක්ෂා නැති තරුණ තරුණියන්ට බෙදා දුන්නා නම් නරකද? තරුණ තරුණියන්ගේ සමූපකාර සමිති පිහිටුවල ඒ මාර්ගයෙන් මේ රට සංවර්ධනය කිරීමේ ව්‍යාපාර ආරම්භ කළොත් නරකද? ඇයි, මේ ආණ්ඩුව ධනපති ක්‍රමය වම යන්නෙ? රැස්වීම්වලදී මහජනයා ඉදිරියේ නම් කියනව, "අපිත් සමාජවාදයට යනව" කියා. "අපේ අදහසත් සමාජවාදි වැඩ පිළිවෙලක් ඇති කරන්ටයි" කියනව. එහෙම කියා මහජනයා රවටමින් ආණ්ඩුව ධනපති ක්‍රමය තුළින්ම තමයි රට සංවර්ධනය කරන්ට බලාපොරොත්තු වෙන්නෙ. එසේ නැත්නම් ධනපතීන්ට බෙදා දුන්න මේ ඉඩම් සමූපකාර පද්ධතිය මත මේ රටේ රැකීරක්ෂා නොමැති තරුණ තරුණියන් යොදවා සංවර්ධනය කරන්ට මේ ආණ්ඩුව ක්‍රියා නොකළේ ඇයි? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව හා සභාග ආණ්ඩුව තරුණ තරුණියන්ගේ ප්‍රශ්න විසඳන්නට මොකවත් කළේ නැහැ කියා පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්ව. ඒක පාර්ලිමේන්තු ලේකම්තුමා නොදන්නවට රටේ ජනතාව දන්නව. රැකීරක්ෂා නැති අය හය ලක්ෂයක් සිටින බව කිව්ව. ඇත්ත තමයි. 1971 වන විට මොකද වෙන්නෙ? තමුන්නාන්සේලාගේ විශේෂඥයන්ගේ සංඛ්‍යා ලේඛන අනුව මොකක්ද පෙනී යන්නෙ? නව අවුරුදු 4 කින් මේ හය ලක්ෂය දශ ලක්ෂය වෙනව යයි විශේෂඥයන් කියා නැද්ද? මහ ලොකුවට පුරසාරම් දොඩවනවා, කෑ ගහනවා. 1971 අවුරුද්ද වන විට මේ රටේ දස ලක්ෂයක් තරුණයන්ට රක්ෂා නැති බව විශේෂඥ වාර්තා අනුව පෙනෙනවා. මෙම ප්‍රශ්න විසඳන්නට තිබෙන මාර්ග මොනවා ද? උගත් තරුණ තරුණියන් ධනපති කොම්පැනිකාරයන්ගේ කුලී කාරයන් බවට පත් කිරීමෙනුයි, මෙම ආණ්ඩුව ඒ ප්‍රශ්නය විසඳන්නට වෑයම් කරන්නේ. මේ ආණ්ඩුව ඉතාම සාධාරණ අන්දමට ඉඩම් දුන්නාය කියා පෙන්වන්න ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා උත්සාහ දැරුවා. එය පුදුමයක් නොවෙයි.

මේ රටේ මිනිසුන් ඉදයාකාරයකට වෙන් කරන්නට පුළුවනි. සමහර උදවිය යම්කිසි වරදක් කළ විට එය පිළිගන්නවා. සමහර උදවිය එය පිළිගන්නේ නැහැ. ඒ උදවිය උත්සාහ කරන්නේ ඥසේ හෝ වරද වරදක් නොවේය කියා පෙන්වන්නටයි. එය මේ රටේ හැටියි. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයට තිබෙන ලෙඩක් තමයි ඒක. ඕනෑම නොහොබිනා ක්‍රියාවක් කොට කලින් සිටි ආණ්ඩුවේ කොණක නැතිනම් වලිගයක එල්ලිලා, "ඒ ආණ්ඩුව මෙහෙම කර තිබෙනවා; එම නිසා අපිත් මෙහෙම කරනවා" යනුවෙන් කියන්නට උත්සාහ දරනවා. කොතරම් කැත ප්‍රකාශයක්ද මේක? මේ ආණ්ඩුව බලයට පත් වුණේ කුමන අරමුණක් ඇතුවද? මේ රටේ යම් යම් දූෂණ ක්‍රියා සිදු වී තිබෙනවා නම් ඒවා මැඩ පවත්වා මේ රට තුළ සම්පූර්ණයෙන්ම පිරිසිදු දේපාලන ජීවිතයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනවාය කියා නේද මේ ආණ්ඩුව බලයට පත් වුණේ? එහෙම නම් ඇයි මෙසේ කරන්නේ? මේ වැරදි කරන ගමන් කියනවා, "අපි පමණක් නොවෙයි, මේ අයත් දීලා තිබෙනවා" යනාදී වශයෙන්. විශේෂ බදු ඉඩම් ක්‍රමය යටතේ කතා කරන්නට ගිහින් කලින් වෙනත් ක්‍රමවලට දෙන ලද ඉඩම් ගැනත් කියනවා. පාර්ලිමේන්තු ලේකම්තුමාට කරන්නට තිබෙන්නේ, විශේෂ බදු ඉඩම් මණ්ඩලය යටතේ දී තිබෙන ඉඩම් පිළිබඳව කතා කරන්නටයි. අපි කියන්නේ නැහැ, මේ ආණ්ඩුව විතරක් එය කරන එක වැරදියි කියා. අපි කියන්නේ නැහැ, විරුද්ධ පාර්ශ්වයේ අය අරගත්තු එක හරිය කියා. කවුරු ගත්තත් වැරදියි. කාට දුන්නත් වැරදියි. අප කියන්නේ මේ ආණ්ඩුව ඉඩම් බෙදීමේදී පදනම් කර ගන්නා ලද ප්‍රතිපත්තිය වැරදි බවයි. මේ ආණ්ඩුවට තිබුණා, ඊට වඩා සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට. ඇයි එසේ නොකළේ? අප දන්නවා, එසේ නොකළේ? මන්ද කියන කාරණය. එසේ නොකළොත් ඒ උදවියගේ මිත්‍රයන් සතුටු කරන්නට බැහැ. තමුන්නාන්සේලාට මැතිවරණවලදී ආධාර දුන් ධනපති මිත්‍රයන්, ධනපති කොම්පැනිකාරයන් සතුටු කරන්නට බැහැ, එසේ කරන්නේ නැතුව, ඒ උදවිය තමුන්නාන්සේලාට මුදල්වලින් ආධාර දුන් උදවියයි. මේකත් එක විධියක අල්ලස් ක්‍රමයක්. ඉඩම් අත් කර ගණන් දෙනවා. මැතිවරණවලදී ඒ උදවියගෙන් ආධාර ලබා ගැනීමේ ක්‍රමයක් තමයි, මේක.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මොනවා කළත් ඔහොමයි කියන්නේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ අන්දමේ ජාවාරමක් තමයි, අද මේ විශේෂ බදු මණ්ඩලය ක්‍රියාවට පරිවර්තනය කර ගෙන යන්නේ. කොතරම් ඉව බව නැතුව මේ ආණ්ඩුව මෙම බදු ඉඩම් බෙදා දුන්නාද කීවොත් එක්තරා උඩරට මන්ත්‍රීවරයකුට අක්කර 500 ක් දුන්නා. එ මන්ත්‍රීවරයා එහි කටයුතුවලටය ක්‍රියා ලොරියක් ගත්තා; ජීප් රථයක් ගත්තා; ලයිටිං ප්ලාන්ට් එකක් ගත්තා; ට්‍රැක්ටර් එකක් ගත්තා. අන්තිමේදී සිදු වී තිබෙන්නේ කුමක් ද? අන්තිමේදී එම අක්කර 500 ඔහුට දුන්නොත් මහවැලි ගඟ යෝජනා ක්‍රමය ක්‍රියාවේ යොදවන්නට බැරි වෙන බව පෙනී ගියා. මේක ඉඩම් ඇමතිතුමාගේ මහවැලි ගඟ යෝජනා ක්‍රමයට හරස් වෙනවා. එසේ හෙයින් අවසාන මොහොතේ දී මේ වැඩ පිළිවෙළ නවත්වන්නට සිදු සිදු වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ට්‍රැක්ටර් එක එහෙම?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක එයා ගත්තා. එවැනි කටයුතුවලට විදේශ විනිමය ලැබුණා. විදේශ විනිමය ලැබුණු නිසා ඒ රථ වාහන සියල්ල ලබා ගත්තා. එයින් පෙනෙනවා, මෙම ආණ්ඩුව කොතෙක් දුරට ඉව බව නැතුව වැඩ කරනවාද යන්න. තමන්ගේම යම් යම් සංවර්ධන යෝජනා ක්‍රමවලට අවහිර වන අන්දමට ඉඩම් බෙදීමේ කටයුතු පවා කර තිබෙන බව පෙන්වන්නටයි මා එම නිදසුන පෙන්නුම් කළේ. රජය වෙනුවෙන් කතා කළ පාර්ලිමේන්තු ලේකම්තුමා මිනිමෝක් රථ, ජීප් රථ ගැන එහෙම වැඩිය කතා කළේ නැහැ. එතුමා එය ටිකක් හංගලයි කතා කළේ. තමුන්නාන්සේලා, දන්නවා, මේ දුව පිළිබඳව. දුව කපමින් ගෙන යන මංකොල්ලය ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. එක්සත් ජාතික පක්ෂය ඇතුළු ඔය හත් හවුලේ මංකොල්ලය තමයි, දුව කපා ගැනීමේ ව්‍යාපාරය. මේ රටේ ඕනෑ තරම් මංකොල්ලකාරී ක්‍රියා තිබෙනවා. එහෙත් ඒවා නවත්වන්නට මේ ආණ්ඩුවට පුළුවන්ද? ආණ්ඩුවම මංකොල්ලකාරී ක්‍රියාවල යෙදෙන විට අනෙක් අය කරන මංකොල්ලකාරී ක්‍රියා නැවැත්වීමට ආණ්ඩුවට පුළුවන්ද? මේ රටේ තිබෙන කැළෑ මේ රටේ සිටින පොදු මහජනයාගේ වස්තුවයි. එසේ නැතිව මෙම හත් හවුලේ පෞද්ගලික දේපලක් නොවෙයි. ජනතාවට අයිති වන සම්පත හත් හවුලේ පෞද්ගලික බූදලයක් හැටියට සලකා ක්‍රියා කරනවා. හත් හවුල මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

රටේ තිබෙන කැළෑ තමන්ගේ හිතවතුන්ට දුන්නා. ඒ මාර්ගයෙන් ඒවායේ තිබෙන දව කපා ගත්තා. දව කපා හැනීමේ කටයුතු සඳහා එහාට මෙහාට යන්නට වුවමනා නිසා ජීප් රථ දුන්නා; මිනිමෝක් රථ දුන්නා; වෑන් රථ දුන්නා. ජාවාරම් කාරයන් මේ වාහනවල ගමන් කරමින් තමන්ගේ ජාවාරම නියම අන්දමට කර ගෙන ගියා. සමහර කැළෑවල තිබුණු දව කපා ගත්තා පමණක් නොව ඒවායේ ගංජා වවා තමන්ට ලැබුණු අර වාහන වලින් ඒවා අනෙක් පළාත්වලට ගෙන ගියා. ගංජා වැවීම අනෙක් සියලුම වැවිලි ව්‍යාපාරවලට වඩා හොඳ එකක්. එයින් බොහොම ලාභ ලැබෙනවා. මේ ආණ්ඩුව ඒ වාගේ ව්‍යාපාරවලටත් අනුබල දුන්නා. මේවා ගැන ප්‍රවෘත්ති පත්‍රවල පැහැදිලිව කරුණු ප්‍රකාශ වුණා. දැන් මිනිමෝක් රථ පාවිච්චි කරන්නේ මිනි ගවුම් ඇඳගෙන සිනමා බලන්නට යෑම සඳහායි. එසේ නැත්නම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨශාලාවලට ගෙන යෑම සඳහායි. මෙම වාහන වැඩි වශයෙන්ම පාවිච්චි කරන්නේ ළමයින් පාඨශාලාවලට ගෙන යෑමටත් සිනමා බැලීම සඳහා යෑමටත් බව ගරු කෘෂිකර්ම ඇමතිතුමාම "ඩේලි නිව්ස්" පත්‍රයෙන් ප්‍රකාශ කර තිබුණා. ගරු කෘෂිකර්ම ඇමතිතුමා මෙම ප්‍රකාශය කර ඇත්තේ වගකීමක් ඇතිවයි. ඇත්තෙන්ම මෙම රථ වාහන අනිසි අන්දමට පාවිච්චි වුණා නම් ඒවා ආපසු ලබා ගන්නට ආණ්ඩුව මේ තරම් මැළිවන්නේ ඇයි? හදිසි නීති පාවිච්චි කරමින් මෙම ආණ්ඩුව පසුගිය කාලය තුළ ඉතාමත්ම නිර්ලජ්ජි විධියට යම් යම් කටයුතු කර තිබෙනවා. පසුගියදා වැලිගම් කෝරළේ සමූපකාර සමිති සංගමයේ නිලධාරීන් දෙදෙනකු අස් කිරීම සඳහාත් හදිසි නීති පාවිච්චි කර තිබෙනවා. ඒ නිලධාරීන්ට චෝදනා පත්‍ර ඉදිරිපත් කරන්නේ නැතිව, ඒවාගේම ඒ චෝදනා සඳහා ඔවුන්ට කියන්නට තිබෙන කාරණා කියන්නට අවස්ථාවක් දෙන්නේ නැතිව, හදිසි නීතිය පාවිච්චි කරමින් එක වරටම ඒ දෙදෙනා සේවයෙන් පහ කළා. මීට විරෝධය දැක්වීමක් වශයෙන් වැලිගම් කෝරළේ සමූපකාර සමිති සංගමයේ නිලධාරීන් සියලු දෙනාම වැඩ වර්ජනයක් කළා. ධනපති පංක්තියේ [illegible] සතුටු කිරීම සඳහා සමූපකාර ව්‍යාපාරය තුළ හරියාකාරව වැඩ කරන නිලධාරීන් පන්නා ගැනීම පිණිස හදිසි නීතිය පාවිච්චි කරනවා. වැලිගම් කෝරළේ තිබෙන කළුකඩ කාරයන්, ජාවාරම්කාරයන් සතුටු කරන්නටයි, අර නිලධාරීන් දෙදෙනා පන්නා ගත්තේ. හැම දේකටම පාවිච්චි කරන මේ හදිසි නීති අණපනත් ප්‍රයෝජනයට ගනිමින් මහජන දේපල වංචා කරගත්තවුන් උසාවියට ගෙන ඉදිරිපිට නොපමුණුවන්නේ ඇයි? ඇත්තෙන්ම මේ ආණ්ඩුව මහජන දේපල කොල්ලකා ගැනීමේ ක්‍රියාවලට අනුබල දෙනවා. දුප්පත් මනුෂ්‍යයකු ධනපතියකුට අයිති පොල් ගසකින් ගෙඩි කීපයක් කඩා ගතහොත් ඔහු අධිකරණය ඉදිරිපිටට පමුණුවා දඬුවම් ලබා දෙනවා. එහෙත් රුපියල් ලක්ෂ ගණන් වටිනා කැළෑ විනාශ කරන්නවුන් උසාවිය ඉදිරිපිටට පමුණුවන්නට මේ ආණ්ඩුව සූදානම් නැහැ. මොකක්ද මේකේ තේරුම? මේ ජාවාරම්කාරයෝ මේ ආණ්ඩුවේ යහළුවෝ; මේ ආණ්ඩුවේ දේශපාලන ගැත්තෝ; ඒ නිසා ඔවුන් සතුටු නොකර බැහැ. ඒ අයට විරුද්ධව කටයුතු කළහොත් ලබන මැතිවරණයේදී වැඩක් ගන්න සිටින මිනිසුන් ටිකත් නැතිව යනවා. ඒ නිසා කෙසේ හෝ ඒ අය සතුටු කර තබා ගන්නට ඕනෑ. අන්න ඒ නිසයි, මේ වගේ ව්‍යාපාර මේ ආණ්ඩුව ගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශේෂ බදු ක්‍රමය යටතේ ගෙන යන ව්‍යාපාරයේ තවත් පැත්තක් තිබෙනවා. මේ කොම්පැනිකාරයන්—විශාල ජාවාරම්කාරයන්—අපේ ගම්බද තරුණ තරුණියන්ගේ ශ්‍රමය සූරාගෙන විශාල ධනයක් ලබා ගන්න බව තමුන්නාන්සේ දන්නවා. ඒ තරුණ තරුණියන්ට නියම අන්දමට පඩි නඩි ගෙවන්නෙ නැහැ. විශාල පඩි නඩි ගෙවා මේවා කරන බව දැන් කියන්නට යෙදුණා. එහෙත් මට දැන ගන්නට ලැබී තිබෙන අන්දමට ගොවීන්ට, ලිපිකරුවන්ට, වෙනත් සේවකයන්ට සාධාරණ වැටුපක් ගෙවා නොවෙයි, මේ කොම්පැනිකාරයන් ධනපති ජාවාරම්කාරයන්—මේ ව්‍යාපාරය කරගෙන යන්නේ. මේ අයට දෙයාකාරයකින් රට සූරා කන්නට මේ ආණ්ඩුව ඉඩ දී තිබෙනවා. එක පැත්තකින් මහජනයාගේ දේපල සූරා කනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් පැත්තෙන් මහජනයාගේ ශ්‍රමය සූරා කනවා. ඒ දෙකටම මේ ආණ්ඩුව ඉඩ දී තිබෙනවා. ධනපති ක්‍රමය අනුගම නය කරන ආණ්ඩුවක් ඔය විධියට ක්‍රියා කිරීම පුදුමයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉඩම් දී තිබෙන ආකාරය පැහැදිලි කර තිබෙන නිසා ඉඩම් ලැබුණු උදවියගේ නම් නැවතත් කීම අවශ්‍ය නැහැ. සත්ව පාල නය යටතේ අක්කර 1,000 ක් දී තිබෙ නවා, සිලෝන් ටර්ෆ් ක්ලබ් එකට, අශ්ව යන් ඇති කිරීමට. අශ්වයන් ඇති කර අශ් වයන් විකුණා සල්ලි හම්බ කිරීමට අක් කර 1,000 ක් දී තිබෙනවා. අශ්වයන් ඇති කරනවාට වඩා හොඳයි, බූරුවන් ඇති කරනවා නම්, බූරු ගාල් ඇති කරනවා නම්. එතකොට මේකෙ ඉන්න බූරුවන් ටික ඒකෙ දමන්නට පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඉන්න ටික ඇති.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක තමයි, තමුන්නාන්සේලාට කරන්නට තිබෙන්නෙ, ඒ වගේ බූරු ගාලක් ඇති කර ගැනීමයි. ලංකාවේ බූරුවන් කියා වැඩි ගණනකට පිටරටවලට විකුණන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුවට විරුද්ධව අප මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීමට ලෑස්ති වන විටම මේ ආණ්ඩුව සෑහෙන තරමකට මානසික පරාජයකට පත් වුණා. එසේ මානසික පරාජයකට පත් වෙලා තමයි, අද මේ විශ්වාස භංග යෝජනාවට මුහුණ දෙන්නේ. අප මේ යෝජනාව ඉදිරිපත් කළාට පසු—අද විවාදයට ගන්නට පෙර—පසුගිය 20 වැනිදා "ඩේලි නිව්ස්" පත්‍රයේ මේ ගැන මොනවද කියා තිබුණේ ? පෞද්ගලික අංශයේ ආහාර වගාව සඳහා දුන් අවසර පත්‍ර 57ක් අවලංගු කර තිබෙන බවත්, කෘෂිකර්මය සඳහා ලබා ගත් රථ වාහන වාහන වැරදි විධියට පාවිච්චි කරන අයට වඩා බරපතළ දඩ නියම කිරීමට කට යුතු කිරීම සඳහා සංවිධානයන් සලසා ඇති බවත් ඒ පත්‍රයේ කියා තිබුණා. ඒ අවලංගු කරන ලද අවසර පත්‍ර 57ට ඇතුළත් ඉඩම් ප්‍රමාණය අක්කර 12,179ක් බවත්, ඒ ප්‍රමා ණය පසුගිය කාලයේ දුන් ඉඩම් ප්‍රමාණ යෙන් සියයට 20 ක් පමණ වන බවත් ඒ සමගම කියා තිබුණා. එපමණක් නොවෙයි. ආහාර වගාව සඳහා දුන් වාහන වැරදි ලෙස පාවිච්චි කරන පෞද්ගලික අංශයේ උදවි යට රුපියල් 15,000 ක ඉහළම දඩයක් නියම කිරීමට කටයුතු සංවිධානය කර තිබෙන බවත්, මේ රථ වාහන වැරදි විධි යට පාවිච්චි කරන අය කව්දැයි සොයා බලා වගා කිරීමේ කටයුතු සඳහා ඒ රථ වාහන පාවිච්චි කරන බව ඔප්පු කරන්නටය කියා ඒ අයට නියම කරන ලෙස චක්‍ර ලේඛයක් මෝටර් රථ කොමසාරිස්වරයාට යවා තිබෙන බවත් ඒ පත්‍රයේ කියා තිබුණා. ඒ වාගේම, වගා කරන්නට දුන් ඉඩම් ප්‍රමාණයත්, සත්ව පාලනය යටතේ දුන් ඉඩම් ප්‍රමාණයත්, ඒ සම්බන්ධයෙන් වියදම් කළ විදේශ විනිමය ප්‍රමාණයත් ගැන එහි සඳහන් කර තිබෙනවා. එය "ඩේලි නිව්ස්" පත්‍රය හරිගැස්සූ ප්‍රවෘත්ති යක් නොව රජය දුන් ප්‍රකාශයක්.

විරුද්ධ පාර්ශ්වය ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවේ සාධාරණත්වය පිළිගන්නට, ඒ පිළිබඳව ප්‍රකාශයක් කරන්නට රජයට සිදු වුණා. විරුද්ධ පාර්ශ් වය සිය යෝජනාව මඟින් ඉදිරිපත් කළ කරුණු සත්‍ය බව පිළිගන්නට සිදු වුණු නිසා තමයි, ඇමතිතුමා එවැනි චක්‍ර ලේඛ යක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ට යැව්වේ; ඒ ගැන සොයා බලන්නැයි අනෙක් අයටත් කීවේ. නොඑසේ නම් බල පත්‍ර 57 ක් අවලංගු කළේ ඇයි ? විරුද්ධ පාර්ශ්වය මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන තුරු එය කරන්නට එතුමාට පුළුවන්කමක් තිබුණේ නැහැ.

**ගරු සි. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
කරුණු පරීක්ෂා කර, විභාග කර ලැබුණු රිපෝර්තු අනුවයි, එසේ කටයුතු කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කෙසේ වෙතත්, 23 වැනි දා රජයට විරුද්ධව මේ සම්බන්ධයෙන් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන බව 20 වැනි දා දැන ගත් වේලාවේ තමයි, මේ රටේ මහජනතාවට මේ සම්බන්ධයෙන් ඇත්ත තත්ත්වය දැන ගන්නට ලැබුණේ. විපක්ෂය ඉදිරිපත් කර ඇත්තේ සාධාරණ යෝජනාවක් බව පිළිගන්නට සිදු වී තිබෙන නිසා, දැන් රජයට හොඳටම රත් වී තිබෙනවා. ඒ නිසා තමයි, බලපත්‍ර 57ක් අවලංගු කොට, ඉඩම් අක්කර 12,179 ක් ආපසු ලබා ගන්නට කටයුතු කළේ. [බාධා කිරීම්]

තමුන්නාන්සේ ශීලාචාර විධියට හැසිරෙන්නේ නැත්නම් එය තමුන්නාන්සේගේ පක්ෂයටත් ලොකු අවනම්බුවක්.

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)
රජය කිසි බයක් නැතිව ඉන්නවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සේටයි, රත් වී තිබෙන්නේ. තමුන්නාන්සේත් රජයේ කොටසක්.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මට නම් රත් වී නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සේ රත් කරනන්ටත් අමාරුයි. ඇත්ත හෝ වේවා නැත්ත හෝ වේවා මොන විධියේ විවේචනයක් කළත් එය ඉවසාගෙන සිටීමේ ශක්තියක් තමුන්නාන්සේට තිබෙනවා. තමාගේ වැරද් දක් පෙන්වා දුන්නාම හෘදය සාක්ෂ්‍යයට අනුව තමා එය පිළිගෙනත් ඊට ඔරොත්තු දෙන්නට පුළුවන්කමක් තිබෙනවා නම් එයත් හොඳ ගතියක් නොවෙයි. වරදක් පෙන්වා දුන්නාම එය පිළිගන්නවා නම් රත් වන්න ඕනෑ. මහජන මතයට භය නම් රත් වන්න ඕනෑ. තමුන්නාන්සේලා තුළ මහජන මතයට භයක් නැහැ. තමුන්නාන්සේලාට මොනවා කීවත්, එය ගොනා පිට හකුරු පටවන්නා වාගේ වැඩක්. මේ සෙල්ලම, මේ මංකොල්ලය නැවැත්වීමේ අදහසක් ඉඩම් ඇමතිතුමා තුළ නැතැයි මා හිතනවා. ඒ නිසා තවත් අක්කර 90,000ක් බෙදා දෙන්නට යනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කොහේද ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ලංකාවේ. දැනටමත් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 150 ක් උතුරු මැද පළාතට යවා තිබෙනවා. එය ඇත්තක්ද, නැත්තක්ද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මෙවැනි නැත්තක් කියන නිසා තමයි, මට රත් වන්නෙ නැත්තේ. මෙය සම්පූර්ණ නැත්තක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මා කථා කර අවසාන වුණාට පසුව තමුන්නාන්සේ උත්තර දෙන්න. ඉඩම් ඇමතිතුමාගේ විශේෂ නියමය උඩ, ධනපතියන්ට අක්කර 90,000 ක් බෙදා දෙන්නට ලෑස්ති කරගෙන යන බවට මට ආරංචි ලැබී තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
Encroachments. බලහත්කාරයෙන් අල්ලා ගත් පොඩි ඉඩම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අක්කර 90,000 ක් බෙදා දීම සඳහා නිලධාරීන් 150 ක් යවා තිබෙන නිසා, නාරාහේන්පිට තිබෙන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වැඩ කර ගන්නට බැරිව ඒ අය කෑ ගහනවා. තමුන්නාන්සේ එය පිළිගන්නවාද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
නැත්තක් කියන නිසා තමයි, මට කිසි ගණනක් නැත්තේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සේට හැම එකක්ම නැත්තක්.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
තමුන්නාන්සේ කාගෙද දිරච්ච ලණුවක් කාලා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මේ ඉඩම් බෙදා දෙන්නට යන්නේ මොන දිස්ත්‍රික්කයෙන්ද? අක්කර 90,000 ක් නැවත බෙදා දෙන්නට යන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයෙන්. ඒ වාගේම මේ වර්ෂය තුළ තවත් ඉඩම් අක්කර ගණනාවක් බෙදා දෙන්නට ලෑස්ති කර තිබෙනවා. මම ඒවා කියවන්නම් :

මොණරාගල දිස්ත්‍රික්කයේ අක්කර 20,233 යි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අක්කර 9,075 යි. බදුල්ල දිස්ත්‍රික්කයේ අක්කර 7,532 යි. මහනුවර දිස්ත්‍රික්කයේ අක්කර 6,135 යි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
Encroachments.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අනුරාධපුර දිස්ත්‍රික්කයේ අක්කර 4,457 යි. වවුනියාව දිස්ත්‍රික්කයේ අක්කර 3,700 යි. කෑගල්ල දිස්ත්‍රික්කයේ අක්කර 3,663 යි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
On a point of explanation, Sir, ——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Is the hon. Member giving way ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අපේ කාලිකයින්ට නම් ඉඩ දුන්නේ නැහැ. එහෙත් ගරු ඇමතිතුමාට අවස්ථාව දෙන්න මා කැමතියි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඔය කියන සංඛ්‍යා ලේඛනවල හැටියට පෙනී යන්නේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන්නේ බලහත්කාරයෙන් අල්ලාගත් ඉඩම් සම්බන්ධවයි කියලයි. එවැනි ඉඩම් මනින්නට විශේෂයෙන් මිනින්දෝරු මහත්වරුන් යවා සිටිනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඒ අයටම දෙනවාද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඔව්. ඒ ඉඩම් ඒ අයටම දෙන්නයි යන්නේ. මාතර ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ඉලක්කම් අනුව නම් පෙනී යන්නේ එතුමා කාගෙද දිරච්ච ලනුවක් කාලා කියලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නම් දිරච්චි ලනු කන්නේ නැහැ. දිරච්ච ලනු කාලා තිබෙන්නේ ඇමතිතුමායි. ඒ නිසා තමයි මේ පැත්තේ සිට ඔය පැත්තට ගියේ. [බාධා කිරීමක්] අපි කවදාවත් පැත්ත වෙනස් කරන්නේ නැහැ. අපි ස්ථිරයි. හරි දේශපාලන ප්‍රතිපත්තියක් තෝරා ගන්නට අපට පුළුවන්. ගරු ඇමතිතුමාට නම් ඒ ශක්තිය නැහැ. එතුමා එක දවසකට මේ පැත්තේ, තවත් දවසකට අර පැත්තේ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මම මෙතනමයි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අයියෝ, අපේ ඉඩම් ඇමතිතුමා පොඩි ළමයෙක් වගේ කථා කරනවා. ගරු ඉඩම් ඇමතිතුමා කියනවා "මම මෙතනමයි" කියා. ඒක ඇත්ත. ඔය ඇත්ත වගේ තමයි අනික් ඇත්තවලුත්. එතුමා කියනවා එතුමා ප්‍රතිපත්ති මාරු කළේ නැත කියා. එතුමා කියනවා එතුමා පැත්ත මාරු කළේ නැත කියා. එතුමා කියනවා එතුමා ඉන්නේ එක තැනමයි කියා. එහෙත් 1970 වන විට ඔතන ඉන්න එතුමාට පුළුවන් වන්නේ නැහැ. [බාධාකිරීම්] හැමදාම කළ සෙල්ලම් 1970 දී කරන්න ලැබෙන්නේ නැහැ. පොළොන්නරුවෙන් අක්කර 90,000 ක් බෙදුවත් ලබන වර පොළොන්නරු ආසනයෙන් මෙතැනට එන්න ලැබෙන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මා එන්නේ මින්නේරියෙන්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මින්නේරියෙන් හෝ පොළොන්නරුවෙන්.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
එදා සිටම ඕක කියනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඉඩම් ඇමතිතුමා පොඩි ළමයෙක් වගේ කථා කරනවා. ඉතින් එතුමා කියන ඒවා අපි බාර ගන්නේ කොහොමද? එතුමා ඉඩම් සංවර්ධනය ගැන කියනවා. ඔබතුමාගේ දැනගැනීම සඳහා කරුණක් සඳහන් කරන්නට කැමතියි. උඩලවේ වම් ඉවුරේ සංවර්ධන වැඩවලට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කම්කරුවන් 63 දෙනෙක් පිටත් කළා. ඒ කම්කරුවන්ට වතුර ලබා දෙන තුරු ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු මුදල් දෙන්නට ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. අන්තිමේදී ඒ පොරොන්දුව ඉටු නොකර ඔවුන්ගේ වැටුපත් රුපියල් 67 ට බැස්සුවා. ඊටත් පසුව පසුගිය දෙසැම්බර්වල එය රුපියල් 32 ට බැස්සුවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මා තවම ඕවා දන්නේ නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) මාත් ඒ කම්කරු සමිතිවල සහෝදරයිනුත් පැමිණ ගරු ඇමතිතුමා හමු වී මේ කරුණු ඉදිරිපත් කළා. එහෙත් එතුමා එය අබමල් රේණුවක තරමටවත් ගණන් ගත්තේ නැහැ. ඇමතිතුමා කිව්වේ ඒ ගැන සොයා බලා අප කී කරුණු ඇත්ත නම් ඒ අයට වැටුප් දෙන බවයි. දැන් මාස දෙකකුත් ගත වී තිබෙනවා. එහෙත් එය ලැබුණේ නැහැ. ඒ දුප්පත් කම්කරුවන් තමන්ගේ ළමා ළපටින්ට කන්න දෙන්න ක්‍රමයක් නැතිව බඩගින්නේ සිටිනවා. ඇමතිතුමා මෙතන ඉඳගෙන "කරන්නම්", "කරන්නම්" කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒ අය සමසමාජ පක්ෂයේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කොයි පක්ෂයේ වුණාම මොකද ? ඇමතිතුමා සමසමාජකාරයින්ට වැඩ කරන්නේ නැද්ද ? වැඩ කරන්නේ යූ. එන්. පී. කාරයින්ට පමණක් ද ? සමසමාජකාරයින් මනුෂ්‍යයින් නොවෙයිද? ඇමතිතුමාගේ දේශපාලන ප්‍රතිපත්තිය බාර නොගන්න නිසා ඒ අයට වැටුප් දෙන්නත් ඕනෑ නැත කියා ඇමතිතුමා කියනවා. ලැජ්ජ නැති ප්‍රකාශ. අස් කර ගන්න ඒ ප්‍රකාශය.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ගරු මන්ත්‍රීතුමා කොහොම තේරුම් ගත්තාද මා දන්නේ නැහැ. ඒ අය සමසමාජ පක්ෂයේ සාමාජිකයින්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
හරි. මෙතැනට එහි තිබෙන සම්බන්ධය කුමක් ද ? [බාධාකිරීමක්] ඒ කම්කරුවන්ගේ දේශපාලන අදහස්වල මේ කරුණට ඇති සම්බන්ධය කුමක් ද ? ඒ කම්කරුවන්ට වතුර දෙනවාය කියා ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. වතුරත් නැහැ ; පඩිත් නැහැ ; ඔවුන් අද බඩගින්නේ. ඇමතිතුමාගේ ඉඩම් සංවර්ධන කාර්යාලය වට කරන්න ඒ අය ලැහැස්ති වුණා. අපයි එය නවත්වා ගත්තේ. පුළුවන් නම් ඒ පළාතට යන්නය කියා ඇමතිතුමාට මා කියනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඔව්, යනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඔව් පොලිස් භට හමුදාව වට කරගෙන යාවි. පුළුවන් නම් නිකම් යන්න.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Please address the Chair.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියා සිටියේ කම්කරුවන්ට කරන ලද බලවත් වරද ගැනයි. වගා කරන්නටය, රට සංවර්ධනය කරන්නටය කියා උඩ වලවේ ප්‍රදේශයට ගෙන ගිය කම්කරුවන් එහි ගෙන ගොස් දැම්මා මිස ඔවුන්ට නිසි පරිදි සැලකිල්ලක් ලැබෙනවාද නැද්ද කියා හෝ නිදහසක් ලැබෙනවාද නැද්ද කියා හෝ හරියට පඩියක් ලැබෙනවාද නැද්ද කියා හෝ නොබැලීම බලවත් වැරැද්දක්. දෙවැනි පරාක්‍රමබාහු කෙනෙක් ය කියලා විරුදාවලියක් ලබාගෙන ඉන්න ගරු ඇමතිතුමා ඒ විධියේ භයානක වැරැද්දක් කරනවා. එය මහා පරාක්‍රමබාහු නාමයටත් නින්දයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක පරාක්‍රමබාහුගෙන් අහන්න.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මේ ඉන්නේ දෙවැනි පරාක්‍රමබාහු කෙනෙක්ය කියලා පත්‍රවල තිබුණේ. [බාධාකිරීම්] අනේ ඔහොම පරාක්‍රමබාහුලා අපට ඇති වුණොත් මුළු රටටම ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 1968 මාර්තු 24 වන ඉරිදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7 மணியாகி விடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

*விவாதம், 1968 மாச் 24, ஞாயிற்றுக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Sunday, 24th March 1968.*

## කල් තැබීම

### *ஒத்திவைப்பு*

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

"**මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය**".—[ගරු සී. පී. ද සිල්වා].

*"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ சீ. பீ. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.*

*Motion made, and Question proposed.* "That the House do now adjourn".—[*The Hon.* C. P. DE SILVA].

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෞද්ගලික පැහැදිලි කිරීමක් සඳහා ඔබතුමාගේත් මේ සභාවේත් අවසරය පතමි. මෙම පැහැදිළි කිරීම අවශ්‍ය වී ඇත්තේ මක්නිසාද කිවහොත් මම අද මේ සභාවේ නැගී සිටින්නේ, දිවංගත ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාත් සමග එකට එක්ව 1951 වැනි කාලයේදී මම ගොඩ නැගීමට ක්‍රියා කළ, මෙතෙක් මෙම සභාව තුළ වසර 16ක් මුළුල්ලේම නියෝජනය කළ පක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු ලෙස තව දුරටත් පෙනී නොසිටින බව ප්‍රකාශ කිරීමටය.

මෙම පක්ෂයෙන් මෙසේ වෙනස් වීමට හේතු සාධක වූයේ මක්නිසාද යන්න මෙම සභාවටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටින මගේ පැරණි මිත්‍රයින්ටත්, මගේ ආසනයේ සිටින ජනතාවටත්, පොදුවේ රටේ ජනතාවටත් පැහැදිළි කිරීම මා විසින් කළ යුතුව ඇති යුතුකමක් ලෙස සිතමි. ඒ සමගම මා අද මෙම සභාව තුළ ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයකු ලෙස පෙනී සිටින්නේ මන්ද යන්නත් පැහැදිළි කිරීම මගේ යුතුකමක් ලෙස සිතමි. ලංකා කොමියුනිස්ට් පක්ෂය යැයි මා කියන විට එය එම නම ඉතාම වැරදි ලෙස පාවිච්චි කරන, එම නම පිටුපස වෙස් මුහුණු දමාගෙන සිටින නූතන සංශෝධනවාදී කල්ලිය නොවන බවත්, මම අද සිට නියෝජනය කරන පක්ෂය හුදෙක් අව්‍යාජයෙන්ම මාක්ස්-ලෙනින්වාදී වූ ලංකා කොමියුනිස්ට් පක්ෂය බවත් පැවසීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය සහ මා අතර ආරවුලට බඳුන් වූ කාරණය හුදෙක් විනය පිළිබඳ ප්‍රශ්ණයක් නොවීය. එය මේ රටේ ප්‍රතිගාමීත්වය සදහටම පරාජය කිරීම උදෙසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ සෙසු ප්‍රගතිශීලී බලවේග විසින් අනුගමනය කළයුතු නිවැරදි ප්‍රතිපත්තිය පිළිබඳ වූ ප්‍රශ්නයකි.

ලෝක බැංකුවේ නියෝජිත මණ්ඩලයක් විසින් මෑතකදී අපගේ ආර්ථිකය පිළිබඳව පින්තාරු කර දක්වීමට උත්සාහ ගත් වැරදි සහගත සුන්දර පින්තූරය කුමක් වුවත්, ලංකාව අද, මෙතෙක් මුහුණ පෑ දරුණුම අර්බුදයක් තුළින් ගමන් කරන බව කවුරුත් දන්නා කරුණකි. ජීවත්වීම සඳහා ජනතාවට අවශ්‍ය මූලික අවශ්‍යතාව යන් එක්කෝ ලබාගැනීමට බැරිය. තිබුණත් ඒවා තිබෙන්නේ ගිනි ගණන් ගෙවා ලබාගත යුතු කළු කඩය තුළ පමණි. ජීවන වියදම අහස උසට නැග තිබේ. රැකීරක්ෂා නැතිකමේ ප්‍රමාණය දස ලක්ෂය ඉක්මවා ඇත. ජනතාවගේ ජීවන තත්ත්වයන්ට දරුණු ලෙස පහර ගසා ඇත. පාන්වල මිළ වැඩි කර ඇත. සහල් සළාකය අඩකින් කපා දමා ඇත. අපගේ රුපියලේ අගය අඩුකර ඇත. අප ඉදිරියේ ඇත්තේ කුමන ආකාරයේ දරුණු දේවල් දැයි අපි හරියාකාර නොදනිමු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් අතින් දේශීය සහ විදේශීය ධනේශ්වර පංතියට ඉමක් නැති වාසි සලසා ඇත. වෙළඳ සමාගම් බද්ද අඩු කර ඇති අතර තාවකාලික ගමන් බලපත්‍ර බද්ද සහමුලින්ම ඉවත් කර ඇත. 1935 න් මෙපිට පැවති සියලු ආණ්ඩු විසින් අනුගමනය කරගෙන ආ ඉඩම් ප්‍රතිපත්තීන් මේ ආණ්ඩුව විසින් ආපස්සට කරකවා ඇත. එසේ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුසාජී සහ කාසන් කම්බබැච් සමාගමේ ග්ලෙන්විල් වැනි මහා ධනවතුන්ට ආණ්ඩුවේ ඉඩම් පවරා දී ඇත. මේ ආණ්ඩුව උදව් පදව් කර ඇති ගොවීන් මොවුන් වන අතර, නියමිත ගොවීන් ඉඩම් අහේනියකින් පෙලෙන අතර, බැරි වෙලාවත් බලහත්කාරයෙන් වගා කළහොත් ඒ ගොවීන්ට නීති මගින්ද, දඬුවම් පමුණුවනු ලැබේ.

පොහොසතුන් එන්ට එන්ටම පොහොසත් වන අතර, දුප්පතුන් එන්ට එන්ටම හිඟන්නන් වෙති. මෙවැනි වූ තත්ත්වයක් ඇතිවීමට හේතු සාධක වී ඇත්තේ අපගේ ආර්ථිකයේ මුදුන් විදේශීය අධිරාජ්‍යවාදය විසින් තවදුරටත් අල්ලාගෙන සිටීම නිසාය. මේ විදේශ අධිරාජ්‍යවාදීහු අපගේ පොළොවේ ඉතාම සරුසාර කොටස් හිමිකරගෙන සිටින අතර, ඒ මත වවා ඇත්තේ අපගේ ජාතික ආදායම් උපදවා දෙන වගාවන් වන, තේ සහ රබර් වැනි වගාවන්ය. අපේ රටේ තිබෙන බැංකුවලින් වැඩි හරියක්ද, වෙළඳ ආයතන වැඩි හරියක්ද, ඔවුන්ට අයිතිව ඇති අතර ආනයන සහ අපනයන වෙළඳාමත්, නැව්වලින් බඩු ගෙන්වීමේ සහ යැවීමේ වෙළඳාමත් පාලනය කරන්නේ ඔවුන් විසිනි.

නිරන්තරයෙන් පහළ වැටෙන මිළකට ඔවුන් අපේ රටේ නිෂ්පාදනය කරන වගා නිෂ්පාදනයන් මිළ දී ගන්නා අතර අපි මෙරටට ගෙන්වා ගනු ලබන ආහාරපාන, පොහොර වර්ග, යන්ත්‍රෝපකරණ යනාදිය අපට ඔවුන් විකුණන්නේ නිරන්තරයෙන්ම වැඩි වන මිළකටය. දෙයාකාරයෙන්ම අපව මෙලෙස සූරා කනු ලැබේ. අපේ ආර්ථික අර්බුදයකට හේතු මේවා වෙති. අපගේ ආර්ථික අර්බුදයේ හරය ගත් කළ එය විග්‍රහ කළ හැක්කේ මෙලෙසය. එනම් නිරන්තරයෙන් වැඩි වන්නාවූ අපේ ජනගහණයට අවශ්‍ය ප්‍රමාණයක් මූලික උවමනාවන් නිෂ්පාදනය කිරීමට බැරිකමත්, ඒ වෙනුවට අපට අවශ්‍ය දෑ ගෙන්වා ගැනීමේදී අපි පිටරට යවන ද්‍රව්‍යවල ප්‍රමාණය හුවමාරු කර ගැනීමට ප්‍රමාණවත් නොවීමත්ය.

මේ සඳහා අපට ඇති විසඳුම කුමක්ද? ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයට හෝ ඊනියා ජාතික ආණ්ඩුවක් ලෙස එම පක්ෂය එකට ගැට ගසාගෙන සිටින ප්‍රතිගාමී මිත්‍රයින්ට හෝ ඒ අවශ්‍ය විසඳුම සැපයිය නොහැක. ඔවුන් ඇත්ත වශයෙන්ම කරන්නේ අපගේ ආර්ථිකය විදේශ අධිරාජ්‍ය වාදයේ රථ රෝදයට දැඩි ලෙස ගැට ගසා තිබෙන ඇහැට නොපෙනෙන යදම් තව දුරටත් තද කිරීමේ ප්‍රතිපත්ති පමණි. මෙයින් සිදුවන එකම දෙය නම් අපගේ ආර්ථික අර්බුදය තව දුරටත් උග්‍රවීමත්, අපගේ රට විදේශ අධිරාජ්‍යවාදීන් විසින් කරගෙන යනු ලබන සූරා කෑම තවදුරටත් දරුණුවීම පමණි. විදේශ අධිරාජ්‍යවාදයේ ගැත්තන් ලෙස සිටින්නාවූ එක්සත් ජාතික පක්ෂයට සහ ඔවුන්ගේ ප්‍රතිගාමී සගයන්ට වෙන කළහැකි දෙයක්ද ඇත්තේ නැත.

එහෙත් විරුද්ධ පක්ෂයේ සිටින බල වේගයන් ගැන කිව යුත්තේ කිමෙක්ද? එක්සත් ජාතික පක්ෂය විසින් අනුගමනය කරන ලද අධිරාජ්‍යවාදීන්ට හිතවාදීවූ ප්‍රතිපත්ති කෙරෙහි තමන් තුළ ඇති වූ විශ්වාස හංගත්වය නිසා 1951 දී දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා එම පක්ෂයෙන් ඉවත් වී ප්‍රගතිශීලි සහ අධිරාජ්‍ය විරෝධි පදනමකින් යුතුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගූ බව අපි දනිමු. දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගීමෙහි ලා, ප්‍රගතිශීලි ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා, ඔහුට උපකාරී වීමට මා වැනි උදවිය දේශපාලන වශයෙන් උද්‍යෝගිමත් වූයේ ඒ නිසාය. ඒ ක්‍රියාදාමයේ අවසාන ප්‍රතිඵලය වූයේ අධිරාජ්‍ය විරෝධි සහ යූ. ඇන්. පී. විරෝධි පෙරමුණක් බිහිවීමයි. ඒ පෙරමුණ මගින් කලක් බලවතෙකුව සිටි එක්සත් ජාතික පක්ෂය 1956 දී පාර්ලිමේන්තුව තුළ

4——එච් 12590 (68/3)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇස්, ඩී. බණ්ඩාරනායක මයා.]

නියෝජනය වීම අතින් ආසන 8 කට බස්සා මෙල්ල කරනු ලැබූ තත්ත්වයකට පත්කර ගැනීමට අපට හැකි විය.

දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ධනේශ්වර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය නමැති යන්ත්‍රය උපයෝගී කරගනිමින්, සමාජයේ, සමාජමය සහ ආර්ථිකමය පරිවර්තනයක් කිරීමට උත්සාහ ගත්තේය. එහෙත් වැඩිකල් යන්නට මත්තෙන් එතුමා ප්‍රතිගාමී බලවේගවල හිරකාරයෙක් වූ අතර අවසානයේදී සාහසිකයෙකුගේ වෙඩි පහරින් ජීවිතක්ෂයට පත්කරන්නට යෙදුණි.

ඒ ඛේදවාචකයෙන් වැදගත් ගැටළු ගණනාවක් මතු කරන්නට යෙදුනි. බණ්ඩාරනායක මහතා විප්ලවවාදියෙක් හෝ කොමියුනිස්ට් වාදියෙක් නොවීය. යම් යම් අඩු ලංසුවේ ප්‍රතිසංස්කරණයන් කිරීමටයි ඔහු උත්සාහ ගත්තේ. එහෙත් එම ප්‍රතිසංස්කරණයෙන් විදේශීය හා දේශීය මුල් බැස ගත් ප්‍රතිගාමී බලවේගයන්ට රුචි නොවූ ප්‍රතිසංස්කරණයන් විය. එතුමා ඒ ලෙස ප්‍රතිගාමීන් විසින් අවසන් කරන්නට යෙදුණේ ඒ නිසාය.

එම නිසා උද්ගත වන ප්‍රශ්නය මෙයයි. දිවංගත බණ්ඩාරනායක මහතාට හිමිව තිබුනු දේශපාලන කීර්ති කදම්බය සහ රටේ ජනතාවගේ නොමසුරු අනුගාමිකත්ත්වය සහ අනුබලය තිබියදී එතුමාට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, උපයෝගී කරගනිමින්, මූලික හෝ වේවා, සුළු හෝ වේවා, සමාජීය සහ ආර්ථික වෙනසක් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුලින් ඇති කරන්නට නොහැකි වූවා නම් ඒ ශ්‍රෙෂ්ඨ නායකයාට නොහැකි වූදේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වත්මන් නායකත්වයට කලහැකියයි විශ්වාස කරන ලෙස යමෙක් අපට කියන්නේද ?

මම මේ කාරණය පිළිබඳව ඉතාමත්ම අවංකවම කල්පනාකර බැලීමෙන් පසුව බැසගන්නට යෙදුණ නිගමනය නම් ඒ වැනි වූ ඉඩක් නොපවත්නා බවයි. එප මණක්ද නොව මෙම සභාව තුල සාමාජිකයෙක්ව මම ගත කල අවුරුදු දහසය තුලදී මට ක්‍රමානුකූලව ඉගෙණ ගැනීමට හැකිවූ එක් කාරණයක් නම් කපටි කෙරාටික අධිරාජ්‍යවාදී ස්වාමිවරුන් විසින් අප මත පටවන්නට යෙදුණු මෙම ධනේශ්වර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රෝඩාවක් බවයි. ඒ ජනතාව රැවටීමටත්, නොමග යැවීමටත් ගෙන ඇත්තාවූ උත්සාහයකි. එය සමාජවාදය කරා සාමකාමීව පරිවර්තනය වීමට හැකි ඉඩකඩක් ගැන මායා විශ්වාසයක් පතුරුවා ජනතාවගේ පංති හැඟීම සහ ප්‍රබෝධය මොට්ටකිරීම සඳහා දරන්නාවූ උත්සාහයකි. එය ආයුධවලින් කරන අරගල වෙනුවට වචන වලින් කරන අරගලය ඇබ්බැහි කිරීමේ කපටි උපක්‍රමයකි. අධිරාජ්‍යවාදීන් සහ ධනේශ්වර ඉඩම් හිමියන්ද, ගොවීන් හා කම්කරුවන්ව පාගාගෙන සිටිමින් ඔවුන්ව සූරාකෑම සඳහා උපයෝගී කරගන්නාවූ, බලය රැඳී ඇති නියම ස්ථාන වන සන්නද්ධ හමුදා වලින් සහ රාජ්‍ය තන්ත්‍රයේ සෙසු හිංසක අංවලින්, ජනතාවගේ අවධානය වෙන අතකට හැරවීමට දරන උත්සාහයකි. සේනානායක කෙනෙක් (යූ. ඇන්. පී) හෝ බණ්ඩාරනායක කෙනෙක් (ශ්‍රී. ල. නි. ප.) මාරුවෙන් මාරුවට බලයට පත් වන අන්දමේ සෙල්ලමක් පමණි. මේ සෙල්ලම මෙසේ කෙරී ගෙන යද්දී අධිරාජ්‍යවාදී රුදළ සහ ධනේශ්වර සූරා කෑම්, ජනතාව මත කෙරී ගෙන යාම කිසිම අඩු පාඩුවක් නොමැතිව කෙරීගෙන යයි. සර්ව ජන ඡන්ද බලය ලැබී අවුරුදු 36 ක් ගත වී ඇත. මේ කාල සීමාව තුල පාර්ලිමේන්තුවට හොඳ උගත්තු, දක්ෂ මිනිසුන්, වාදීභ සිංහයින් සහ චතුර කථිකයන්, ගණනාවක් යවා ඇත්තෙමු. මේ උදවිය ඉතාමත්ම විචක්ෂණ සහ දරුණු ආකාරයෙන් කථා පැවැත්වීමේ නම ගිය පුද්ගලයින් වෙති. මේ සභාව තුල අවුරුදු විස්සක් තිස්සේම තමන් සිටිනා බව කියා පාමින් මේ මෑත කදී මහා ඝෝෂා නැගූ උදවියද, මේ අය අතර වෙති. එහෙත් එම මහතුන් විසින්, පාර්ලිමේන්තුව තුල කල හර බර කථා නිසා, ඔවුන් පාර්ලිමේන්තුවට ඇතුලු වූ දාත්, අද මේ මොහොත දක්වා කෙරීගෙන ගියා වූ සහ කෙරීගෙන යන්නාවූ, සූරා කෑමේ ක්‍රමය අංශු මාත්‍රයක්වත් වෙනස් වී ඇත්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිදහස ලබා දැනට අවුරුදු 20 ක් ගත වී ඇතැයිද කියති. බණ්ඩාරනායක ආණ්ඩු දෙකක් සහ කලක් විප්ලවවාදීව තිබුණ ලංකා සම සමාජ පක්ෂයේ "රත්රන්" මොළඳ ඇතුළුව ගොඩනැගූ සභාග ආණ්ඩුවක්ද අපට තිබුණි. ලංකාවේ පවතින අධිරාජ්‍යවාදී ධනවාදී ආර්ථික රටාවේ මූලික වෙනසක් මේ නිසා ඇති වූයේද? අදත් මේ සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම මේ සභාවට ඇතුල් වීමේදී දිවුරුම්දෙන්නේ මේ රටේ ජනතාව ගේ නාමයෙන් නොව විදේශීය රැජිණකගේ නාමයෙනි. මේ කාරණය අප රට තවම විදේශීය අධිරාජ්‍යවාදය පාලනය යටතේ පවතින බවට ඇති එක බාහිර අංග ලක්ෂණයකි.

ධනේශ්වර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය මගින් තමන්හට කිසිදු ප්‍රයෝජනයක් ඇති නොවීමේ කාරණාව මේ රටේ ජනතාව එන්න එන්නම අවබෝධ කරගනිමින් සිටිති.

පාර්ලිමේන්තුවට රිංගීම සඳහාත්, ඊට පසු ආණ්ඩු ඇති කර ගැනීම සඳහාත්, අවසථාවාදී දේශපාලනඥයින් විසින් ගසන ලද දේශපාලන කරනම් ජනතාවට දැන් තිත්තවෙමින් පවතී.

ආණ්ඩු පක්ෂයේ ඉදිරිපස අසුන් අර සිටින අරුම පුදුම මිනිසුන් කොටස දෙස බලන්න. කවදා හෝ අකරතැබ්බයක් නිසා ඇති වූ දේශපාලන කරකාර බන්ධනයක් උනි නම් එය ජීවමානව ඔබට දැකිය හැක්කේ ඊනියා ජාතික ආණ්ඩුව නමින් උපත ලබා සිටින මේ අවජාතක ප්‍රතිගාමීත්වයේ මිත්‍ර සංධානය තුලයි. තමන්ගේ මුලු මහත් ජීවිත කාලය තුලම එකින් එකාට විරුද්ධව ගෝරනාඩු කල අය අද ඊනියා ජාතික ආණ්ඩුව නමැති ශ්‍රෙණිය තුල පාප තර කරකාර බන්ධනකින් සමගි වී සිටිති.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා, වෙල්වනායගම් මහතා සමග ගිවිසුමක් අත්සන් කළ වේලේ ඊට ඉතාමත්ම දැඩි ලෙස හතුරුකම් කල විරුද්ධ වාදියා, අතර මග කඩා කප්පල් වූ, නුවරට පයින් ගමන සංවිධානය කළ ජේ. ආර්. ජයවර්ධන මහතා බව මට ඉතා හොඳින් මතක තබා ගැනීමේ කාරණාවක් ඇත. එහෙත් ඒ දෙපොල අද දේශපාලන අඹ යහළුවෝය. කළින් වැලිමඩ මන්ත්‍රීවරයාව සිටි කේ. ඇම්. පී. රාජරත්න මහතා එදා බෙරිහන් දුන්නේ ලංකාවෙන් පිටවෙන අන්තිම ඉන්දියන්කාරයාගේ හමෙන් තමන්ට සෙරෙප්පු දෙකක් හදා ගන්නා තුරු ඔහුට නින්ද නොයන බවයි. ඉන්දියානු සම්භවයක් ඇති කම්කරුවන්ගේ ඊනියා නායකයා වශයෙන් පෙනී සිටින තොන්ඩමන් මහතා සමග අද ඔහුගේ පක්ෂය මිතුරුව සිටී. 1948 දී ඉන්දියානු සම්භවයක් ඇති වතු කම්කරුවන්ට ඡන්ද බලය අහිමි කිරීමෙනුත්, පුරවැසි භාවය අහිමි කිරීමෙනුත්, තමන්ටම පා පහර දුන් ඒ යූ. ඇන්. පී. කකුළම අද තොන්ඩමන් මහතා ලෙවකයි.

සී. පී. ද සිල්වා මහතා පන්නන තුරු, සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ අමාත්‍ය මණ්ඩලය තුල ඔහු සිටින තාක් කල්, තමන් ඒ තුලට අඩිය නොතබන්නේ යයි ; 1946 දී මැයි දින මහ රැලියේදී පිලිප් ගුණවර්ධන මහතා මේස ගර්ජනාවක් කළ බව අපට මතකය. මාස ස්වල්පයක් ගත වූ තැනදී මේ දෙපොළ යූ. ඇන්. පී. ඇමති මණ්ඩලය තුළ එකි නෙකා වැළඳ ගත්තෝය. පසුගිය මැතිවරණයේදී සමස්ත ලංකා ද්‍රවිඩ සංගමයට විරුද්ධව පෙඩරල් පක්ෂය සටන් කල අතර, එක්සත් ජාතික පක්ෂය ද්‍රවිඩ සංගමයට ආධාර කල නිසා පෙඩරල් පක්ෂය යූ. ඇන්. පියට විරුද්ධ වත්, අනියම් ආකාරයකින් ව්‍යාපාරයක් ගෙන ගියාය. එහෙත් මැතිවරණය හමාර වූවාත් සමගම ප්‍රතිගාමීත්වයේ උවමනාවන් සඳහා පෙඩරල් පක්ෂය යූ. ඇන්. පීය සහ ද්‍රවිඩ සංගමය සමග එකට හාමුවිය.

මේ ආකාරයේ දේවල් දිගින් දිගටම විස්තර කළ හැක. විරුද්ධ පක්ෂය තුළ ඇත්තේත්, මෙවැනිම කථාන්තරයකි. අද පෙඩරල් පක්ෂයට විරුද්ධව ඉතාම දරුණු ලෙස කෑ කොස්සන් ගසන උදවිය, අනතිම ජාතිභෙද වාදයට වැටී සිටින උදවියට තමයි, 1965 දී ඇති වූ පරාජයෙන් පසු ශ්‍රී ලංකා නිදහස පක්ෂයෙ ආණ්ඩුවක් ගොඩ නගා ගැනීමට උදව් දෙන්නේ නම් පෙඩරල පක්ෂයට ඕනෑම දෙයක දීමට කැමති වූයේ !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ඊටත් වඩා වැදගත්, මේ මෑතදී සිදු වූ උදාහරණයක් මට පෙන්වා දිය හැක. 1968 ජනවාරි 26 වෙනිදා විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම තීරණයක් ගන්නට යෙදුණි. මෙම තීරණය වූයේ විරුද්ධ පක්ෂයේ සියළුම සිංහල මන්ත්‍රීවරු මේ සභාව තුළ සිංහලෙන් කථා කළ යුතුය යන්නයි. මේ යෝජනාව සම්මත කිරීමෙන් පසු ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් (මොහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොවේ) යෝජනා කළේ, සම්මත කරන්නට යෙදුණු යෝජනාව, කල්මුණේ අතුරු මැතිවරණය අවසන් වන තුරු පුවත්පත්වලට නිකුත් නොකරන ලෙසයි.

පාර්ලිමේන්තු දේශපාලනයේ ඇති අවස්ථාවාදීත්වය පෙන්නුම් කරන තවත් හොඳ සාධකයක් ඇත. එනම්, පාර්ලිමේන්තුවට රිංගා ගැනීම සඳහා "සිංහල පමණක්" මාර යුද්ධයක් කළ මිනිසුන්ම පාර්ලිමේන්තුවට ගියායින් පසු කියා සිටින්නේ ඔවුන්ට ඉංග්‍රීසියෙන් කථා කරන්නට වුවමනා බවයි. මෙවැනි වූ තත්ත්වයක් ඇති වීමට හේතු සාධක වී ඇත්තේ කුමක්දැයි කිවහොත් එය අනෙකක් නොව මේ සභාව තුළ නියෝජිතයින් ලෙස සිටින සියළුම පක්ෂවල නායකයින් තවමත් සිංහල පාවිච්චි කරන්නේ තමන්ගේ කුස්සිවල පමණක් නිසා බවය. සිංහල හා දෙමළ භාෂාවට හිමි නියම ස්ථාන ඒ භාෂාවන්ට හිමිවන්නේ මෙම භාෂාවන් කථා කරන කම්කරුවන් සහ ගොවීන් බලයට පත්වීමෙන් පසු පමණක් බැව් මම කියන්නේ ඒ නිසාය.

බෞද්ධ මැතිවරණ කොට්ඨාශයක හිත දිනා ගැනීම සඳහා කලක් මාක්ස්වාදීන්ව සිටි උදවිය හිටි අඩියේම භක්තිමත් බෞද්ධයන් වී බුදුරජාණන් වහන්සේ ඉදිරියේ මල් පහන් පූජා කරන හැටි අපි දක්කෙමු. මෙය අන් කිසිවක් නොව දෙවියන්, බුදුන්වත්, මිනිසුන්වත්, යන සියලුදෙනාම රැවටීම සඳහා ගන්නා උත්සාහයකි.

මේ සියලු දේකින්ම පෙන්නුම් කරන්නේ පාර්ලිමේන්තුවාදී ක්‍රමය අවස්ථාවාදය බෝකරන බවයි. අපේ රටේ පාර්ලිමේන්තු මැතිවරණයන් අල්ලස් දීම්, මත් පැන් බෙදීම්, හොර ජන්ද [illegible] ආදී අනේක විධ දූෂණ සමග සම්බන්ධ වී ඇති ආකාරය මම මෙතැනදී විස්තර නොකළාට කමක් නැත. පාර්ලිමේන්තුවාදය වූ කලී ධනේශ්වර පංතිය විසින් නිර්මාණය කරන ලද ඉතාමත් භේදකාරී ආයුධයයි. එය එක ජාතියක් තවත් ජාතියකට විරුද්ධවත්, එක කුලයක් තවත් කුලයකට විරුද්ධවත්, එක ආගමක් තවත් ආගමකට විරුද්ධවත් හප්පයි. ජාතීන් සහ සුලු ජාතීන් අතර පවතින්නාවූ ගැටළු බොහොමයක්ම නොවිසඳී පවතිනුයේ ඒවා විසඳීමට පාර්ලිමේන්තුවාදීන්ට කිසිම උවමනාවක් නැති නිසාය. ඒ මක්නිසාදයත්, එක ජාතියක් හෝ කුලයක් තවත් ජාතියකට හෝ කුලයකට විරුද්ධව හැප්පවීමට ඔවුන්ට අවශ්‍ය වූ විට මේ ගැටලු නොවිසඳා තබා ගැනීම ඔවුන්ගේම ප්‍රයෝජනය සඳහා වන බැවිනි. සිංහල සහ දෙමළ ජාතිභේද වාදය එකිනෙකා මත යැපෙන බව තේරුම් ගත යුතුය.

1958 රාජරත්න මහතාගේ තාර ගෑමේ ව්‍යාපාරය ඇති වූයේ පෙඩරල් පක්ෂයේ අමිර්තලිංගම්ගේ ශ්‍රී විරෝධී ව්‍යාපාරයට උත්තර වශයෙනි.

බංකොලොත් පාර්ලිමේන්තු මාවත ප්‍රතික්ෂේප කර ඒ වෙනුවට විප්ලවවාදී ආකල්පයක් ඇති කර ගනිමු යැයි මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට යෝජනා කළේ මෙතෙක් කියන ලද කාරණා සියල්ල නිසාය. එහෙත් මේ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයේ උවමනාවන්ට හෝ ඈගේ සභාය හවුල්කාරයින්ට හෝ අල්ලන ප්‍රතිපත්තියක් නොවේ. ඔවුන්ට වුවමනා කර ඇති එකම දෙය නම් සමාජවාදය ගැන කථා කරන ගමන් එදිනෙදා ජීවිතයේදී ගොවීන් හා කම්කරුවන් සූරා කමින් එම සූරාකෑම මත ඔවුන්ට අද තිබෙන වලව් සහ ඔවුන්ගේ ඉතාම ඉහළ ජීවන තත්ත්වයන් වැටෙන්නට නොදී ආරක්ෂා කර ගැනීම පමණී.

විප්ලවයක් නොමැතිව සමාජවාදයක් ඇති විය නොහැකි යයි මොවුන්ට දේශනා කිරීම "හාවුන්ට උප්පත්ති පාලනය ගැන" දේශනා කිරීම වැනි දෙයකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වෙන්වීමට සිදුවූයේ මේ නිසාය. කලින් පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩ පිළිවෙල මේ මෑතකදී ඇති කරගත්, කිරිවලට වතුර මිශ්‍ර කරගත් ආකාරයේ සමාජවාදයේ පොදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩ පිළිවෙලක් බවට දියාරු වී තිබීම ජනතාවගේ අවධානයට හසු නොවී බේරීමට බැරිය. ලංකා සමසමාජ පක්ෂයේ නායකත්වය සහ නූතන සංශෝධනවාදී කල්ලියේද අනුමැතිය ඇතිව සකස් කරන්නට යෙදුණ පොදු වැඩ පිළිවෙල අවුරුදු දෙළහකට කලින් ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා විසින් සකස් කරන්නට යෙදුණ මැතිවරණ ප්‍රකාශය තුළ ගැබ්ව තිබූ උන්නතිකාමී පියවරක් හෝ නොතිබීම කොතරම් ඛේද ජනකද ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කෙතරම් දුරට පල්ලම් බැස ඇත්දැයි මෙයින් ඔප්පු වේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඇයගේ සහාග කොටස්කාරයන් විසින් පිළිගෙන ඇති ප්‍රතිපත්තීන් සහ මාවත ඔස්සේ ගමන් කරන ජනතාවට කිසිම ශුභ සිද්ධියක් ඇති වේය යැයි මට තවදුරටත් අවංකවම ජනතාවට කිව නොහැකිය. එම වැඩ පිළිවෙල සහ ප්‍රතිපත්ති තුළින් යූ. ඇන්. පී. සහ ප්‍රතිගාමීත්වය මුලිනුපුටා දැමිය නොහැක. බණ්ඩාරනායක ආණ්ඩු දෙකක් පැවති කාල සීමාව තුළදී යූ. ඇන්. පී. යේ ආර්ථික පදනම වූ විදේශ අධිරාජ්‍ය වාදය බිඳ හෙළීමට අපොහොසත් වීම යූ. ඇන්. පියේ කැත හිස එසවීමට මෙයින් වත් පාඩමක් ඉගෙන ගැනීමට තිබුණි.

විදේශ අධිරාජ්‍යවාදය, රදළ ක්‍රමය සහ යූ. ඇන්. පිය පමණක් මගින් පන්නා දැමිය නොහැක. තමන්ගේ උවමනාවන්ට නුසුදුසු බව දැනගත් මොහොතේම ඔවුන් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ වෙස් මුහුණ ගලවා දමනවා ඇත. විදේශීය සහ දේශීය ප්‍රතිගාමීත්වය සිහසුණෙන් ඇද බිමට දැමිය හැක්කේ විප්ලවකාරී අරගලයක් තුළින් පමණි. මෙය කිරීම සඳහා කම්කරුවන්ගේ, ගොවීන්ගේ, විප්ලවවාදී බුද්ධිමතුන්ගේ සහ සෙසු සියලු අප ජනතාව තුළ සිටින ප්‍රගතිශීලී හා දේශප්‍රේමී කොටස්වල විප්ලවීය සමගියක් ගොඩනැගීම අවශ්‍යය.

ආසියාවේ, අප්‍රිකාවේ සහ ලතින් අමෙරිකාවේ පීඩා විඳින ජනතාවට නිවැරදි මාවත නේනුම් කරනුයේ අද ජීවතුන් අතර සිටින ශ්‍රේෂ්ඨතම මාක්ස් ලෙනින් වාදියා වන මා ඕ සේතුං සභාපති තුමාගේ විප්ලවීය ඉගැන්වීම්වලින් පමණක් බව මම දැඩි ලෙස විශ්වාස කරමි. අපගේ යුගයේ මාක්ස් ලෙනින් වාදියා වන මා ඕ සේතුංගේ චින්තනය මාගී දේශකත්වය ලබන මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයට මම බැඳුනේත් ඒ නිසාය. මේ රටේ බහු ජනතාවට ජයග්‍රහණය ලබා ගත හැකි නිවැරදි විප්ලවීය වැඩ පිළිවෙල අනුගමනය කරන එකම පක්ෂය එය යයි මම විශ්වාස කරමි. මම මින් ඉදිරියට පාර්ලිමේන්තුව තුළ නියෝජනය කරන්නේ එම පක්ෂයයි. මම ඊනියා ජාතික ආණ්ඩුවට විරුද්ධව සිටින අතර විරුද්ධ පක්ෂයේ සංවිධානයට යටත් නොවෙමි.

මගේ පැහැදිලි කිරීම අවසන් කිරීමට කලින් සභාවේ මේ පැත්තේ සිටින මංමුළාවූවන්ට පිළිතුරු ස්වල්පයක් දීමට කැමැත්තෙමි. දේශපාලන වශයෙන් තමන් සමග එකට නොවෙන්නාවූ ඕනෑම කෙනෙකුට (සී. අයි. ඒ) ඇමෙරිකන් රහස් ඔත්තු සේවයේ ලේබලය ඇලවීමත්, තමන් සමග එකඟ නොවීම යූ. ඇන්. පියට උපකාරවන්නේ යැයි කීමත්, මෝස්තරයක් වී ඇත. මෙය බොළඳ ක්‍රමයකි.

මම කියන්න කැමතියි, ලංකා සමසමාජ පක්ෂයත්, නූතන සංශෝධන වාදී කල්ලියත් දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාත් ජීවත්ව සිටි කාලයේ මොවුන් අනුගමනය කළ වැඩ පිළිවෙල මේ කෝදුවෙන්ම මනින්නේ නම් ඔවුන් වද, එම තාර පාරම ගැසිය හැකි බවයි.

මගේ යූ. ඇන්. පී විරෝධී අවංක භාවය එක මොහොතකටවත්, සැකයට භාජනය කළ නොහැකි අතර, එය ආරක්ෂාකිරීමටද උවමනාවක් නැත. මගේ මෙම අවංක භාවයට පහර ගැසීම සඳහා "ඇත්ත" පඩංගුව පාවිච්චි කරන මැද කොළඹ තුන්වෙනි මන්ත්‍රීවරයා 1947 දී තම පක්ෂයට එක්සත් ජාතික පක්ෂය සමග මිත්‍ර සංවිධානයකට එන ලෙස කලබල කිරීමට වඩා, ශ්‍රේෂ්ඨ බව මම මෙතැනදී කියනු කැමැත්තෙමි.

මගේ කිල්ලෝට් එවැනි හුණු පොඩ්ඩක් නැත. මම සඳහටම අධිරාජ්‍ය වාදයටත්, එක්සත් ජාතික පක්ෂයටත් විරුද්ධව සටන් කර ඇත්තෙමි. මම අනාගතයේදීද, එම සටන් නොඅඩුව කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇස්. ඩී. බණ්ඩාරනායක මයා.]
යන්නෙමි. විරුද්ධ පක්ෂයේ යම් යම් පැතිවලින් කරනු ලබන බොළඳ සහ ලාමක මඩගැසීම් වලින් මම කම්පා වන්නේ නැත. ලෙනින්ගේ සතුරන් විසින් ඒ ශ්‍රේෂ්ඨ ලෙනින්ටත් ජර්මන් ඔත්තුකාරයෙක්යැයි කරන ලද මඩ ගැසීම ගැන කල්පනා කරන විට මට සැනසිය හැක.

බල්ලන් බුරපුවාදෙන් තවලම ඉදිරියට ගමන් කරනවා ඇත. මම තව දුරටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය නොකරන්නේ යයි කියමින් මම පාර්ලිමේන්තු ආසනයෙන් ඉල්ලා අස්විය යුතු යයි තවත් සමහරු ඉල්ලා සිටියි. එවැනි වූ දෙයක් මීට කලින් මේ සභාවේ ඇති වූ බවක් මම නොදනිමි. 1951 දිවංගත ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී විරුද්ධ පක්ෂයට ආ වේලාවේ ඒ වෙනස් වීම මීටත් වඩා මූලික වූ කරුණු මත වූ වෙනසක්ව තිබියදීත් ඔහු ආසනයෙන් ඉල්ලා අස් නොවූ අතර ඊළඟ මැතිවරණයේදී එම ආසනයට නැවත තරඟ කළේය. මමද, එම මාවතේ ගමන් කිරීමට බලාපොරොත්තු වෙමි. එපමණක් නොව, තමන් සිටින පක්ෂයෙන් ඉවත් වුවත්, ඔවුන්ගේ ආසන වලින් ඉල්ලා අස් නොවූ මන්ත්‍රීන් පිළිබඳ සිද්ධීන් අද මේ තිබෙන විරුද්ධ පාර්ශ්වයේද එමට ඇත.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මම දරන්නාවූ තත්ත්වය පැහැදිලිවම ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙමි. ඒ කෙරෙහි මගේ විශ්වාසයක් නැත. පාර්ලිමේන්තුවේ වැඩි ආසන ගණනක් දිනා ගැනීම තුළින් අපේ මේ සමාජයේ ආර්ථික හා සමාජමය රටාවේ මූලික වෙනසක් ඇති කළ හැකි යයි මම විශ්වාස නොකරමි. එහෙත් අධිරාජ්‍යවාදය, රදළ ක්‍රමය සහ ධනවාදය එළිදරව් කිරීම සඳහාත් අපේ වැඩ පිළිවෙල ප්‍රචාරය කිරීම සඳහාත්, පාර්ලිමේන්තුව වේදිකාවක් වශයෙන් පාවිච්චි කළ හැක. මෙය පුද්ගලයින් ස්වල්ප දෙනෙකුට කළ හැක. මම කිරීමට බලාපොරොත්තු වන්නේ එයයි. පාර්ලිමේන්තුව අවසාන ජයග්‍රහණය නොවේ. එය අවසාන මාධ්‍යයක් විය හැක.

සභාග කණ්ඩායම් දෙකක් අතර කෙරෙන්නාවූ පාර්ලිමේන්තු සෙල්ලමකට මුළු මහත් දේශපාලන ව්‍යාපාරයම බෙදා වෙන් කිරීමට ප්‍රවෘත්ති පත්‍ර බිස්සවල් සියල්ලම ආධාර ඇතිව මේ සභාවේ සිටින්නාවූ දෙපාර්ශ්වයම ගන්නා වූ විශාල උත්සාහයක් ඇත. ඒ සෙල්ලම අනුව යමෙකු පැති දෙකෙන් එක පැත්තක සිටිය යුතුය. ඊට එකඟ නොවීම පාවාදීමක් ලෙස හංවඩු ගසයි. මම එම උගුලට අසු වීමට බලාපොරොත්තු නොවෙමි.

යූ. ඇන්. පියටත් සකල ආකාරයකම ප්‍රතිගාමිත්වයටත් මම විරුද්ධව නැගී සිටිමි. මම සදහටම එසේ සිටිමි. එහෙත්, යූ. ඇන්. පියට විරුද්ධව සටන් කිරීමෙහි ලා විරුද්ධ පක්ෂය විසින් පිළිගෙන ඇති ප්‍රතිපත්ති හෝ මාවත් ප්‍රතිඵල දායි වී ඇති බව හෝ අනාගතයේදී ප්‍රතිඵල දායි වේයයි හෝ මම පිළිනොගනිමි. ඒ සියල්ලම අද පවතින ආර්ථික රටාව එලෙසම පවත්වාගෙන යාම පමණක් සහතික කරන බව මගේ විශ්වාසයයි. එම නිසා මම යෝජනා කරන්නේ යූ. ඇන්. පියට විරුද්ධව සටන් කිරීමට වෙනත් මාර්ගයකි. ඒ මාර්ගය අනිකක් නොව විප්ලවීය මාර්ගයයි.

අවසානයේදී විජයග්‍රාහී වන මාර්ගයත් ඒ මාර්ගය පමණී. යම් කිසි දිනක මේ රටේ සියළුම විප්ලවවාදී බලවේගයන් සමගිවන එකම මාවතත් ඒ මාවතම පමණයි. එවැනි වූ උත්තුංග විශ්වාසයකින් යුතුව මම තව දුරටත් ජනතාවට සේවය කරමි.

අ. භා. 7.16

**රාජා වෙලේගම මයා.**

*(திரு. ராஜா வெலேகம)*

(Mr. Raja Welegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට මම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දැනුම් දී තිබෙනවා. ඒ ප්‍රශ්නය නම් "දවස" පත්‍රයේ පළ වී තිබුණු එක්තරා ප්‍රවෘත්තියක් සම්බන්ධයෙනුයි. මෙම ප්‍රවෘත්තිය "දවස" පත්‍රයේ පමණක් නොව දැනට දින කීපයකට උඩදී "ඩේලි නිව්ස්" පත්‍රයේත්, පළ වී තිබුණු අතර එය අද "ඇත්ත" පත්‍රයේ ප්‍රධාන ප්‍රවෘත්තිය වශයෙනුත් පළ වී තිබේ නම්. ඒ ප්‍රවෘත්තිය නම් උඩරට ගැමි පුන

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

රුත්ථාපන කොමිසමට උපදේශකයකු වශයෙන් පත් කරන ලද මන්ත්‍රීවරයකු වන වී. අන්නමලේ මහතා පත් කර තිබීමයි. මාර්තු 23 වැනිදා " දවස " පත්‍රයේ පළ වී තිබෙන අන්දමට ඒ ප්‍රවෘත්තිය මෙසේ යි :

" ගැමි කොමිසමට අන්නමලේ

ලංකා වතු කම්කරු සංගමයේ උප සභාපති පත් කළ මන්ත්‍රී වී. අන්නමලේ මහතා උඩරට ගැමි පුණරුත්ථාපන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වදේශ ඇමති ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා විසින් පත් කොට ඇත. "

මේ ප්‍රවෘත්තිය දැකීමෙන් මා පුදුමයෙනුත් පුදුමයට පත් වුණා. මේ ප්‍රවෘත්තිය සත්‍යයක්දැයි මා ගරු ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි. එය සත්‍යයක් නම් තෝරා පත් කරන ලද මන්ත්‍රීවරයකු වූ අන්නමලේ මහත්මයාට උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමේ උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වයක් ලැබීමට ඔහුට ඇති අයිතිය කුමක්දැයි මම අහනවා. මෙපමණ කලක් ප්‍රතිපත්තියක් වශයෙන් පැවැතුනේ උඩරට ගැන දැනීමක් තිබෙන උඩරට ප්‍රශ්න විසඳීමේ හැකියාවක් ඇති උදවිය මේ සඳහා පත් කිරීමයි.

වෙලා නැති නිසා උඩරට ගැමි පුනරුත්ථාපනයක් අවශ්‍ය වූයේ මන්ද යන්න මම පැහැදිලි කරන්ට අදහස් කරන්නෙ නැහැ. අධිරාජ්‍යවාදි පාලනය යටතේ මධ්‍යම පළාතේ සහ ඌව පළාතේ ජනතාවට මුහුණ පාන්නට සිදු වූ තාඩන පීඩනවලින් ඔවුන් මුදවා ගැනීම සඳහායි, මේ උඩරට ගැමි කොමිෂන් සභාව ඇති කළේ. ඒ නිසා ාමෙයින් බලාපොරොත්තු වෙන්නෙ එදා අධිරාජ්‍යවාදී පාලනයෙන් මිරිකී සිටීම නිසා අදත් දුක් විඳින උඩරට ගැමි ජනතාවට යම්කිසි විශේෂ සහනයක් සැලසීමයි. ඒ සඳහා අපි උපදේශකයින් පත් කරන විට පත් කළ යුත්තේ උඩරට ගැමි හැඟීමක් තිබෙන, දැනීමක් තිබෙන ඊට ප්‍රතිකර්ම යෙදීමට ශක්තියක් ඇති උදවියයි.

ඇමතිතුමා විසින් මේ තීරණය ගත්තෙ මොන හේතුවක් නිසාදැයි මා අහන්ට කැමතියි. මා හිතන හැටියට මෙහි විශාල ගුප්ත අදහසක් තිබෙනවා. එහෙම නැත්නම් කිසිසේත් නොගැළපෙන බව මම මේ අවස්ථාවේදී ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. පත් කරන ලද මන්ත්‍රීවරයකු වන අන්නමලේ මහත්මයා නියෝජනය කරන්නෙ උඩරට ජනතාව නොවෙයි. ඔහු නියෝජනය කරන්නෙ උඩරට ජනතාවට පීඩාවක් වෙලා තිබෙන ඉන්දියානු වතු කම්කරු පිරිසයි. එවැනි නියෝජිතත්වයක් දරන කෙනකු උඩරට ගැමි පුනරුත්ථාපන උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන පත් කිරීම කිසිසේත්ම සුදුසු නැහැ. උඩරට ගැමි පුනරුත්ථාපන මණ්ඩලය පිහිටුවීමට හේතු භූත වූ එක් කරුණක් තමයි, ඉන්දියානු වතු කම්කරු ප්‍රශ්නය. එසේ තියබිදී පත් කරන ලද මන්ත්‍රීතුමා මේ උපදෙශ්ක මණ්ඩලයට පත් කළේ මොන හේතුවක් නිසාදැයි ගරු ඇමතිතුමාගෙන් මා අහන්ට කැමතියි. ඒ වගේම මේ පත්වීම නීත්‍යානුකූල නොවන නිසා, සාධාරණ නොවන නිසා, එතුමාගේ උපදේශකත්වයෙන් ලැබෙන ප්‍රයෝජනයට වඩා හානියක් සිදු වෙන්ට ඉඩ තිබෙන නිසා, ඒ විධියේ පත්වීමක් කර තිබෙනව නම් ඒ පත්වීම වහමා අවලංගු කර දමන ලෙස මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපට විශේෂ භයක් තිබෙනවා. 1968 මාර් මස 21 වෙනි බ්‍රහස්පතින්දා නිකුත් වූ "සිළුමිණ" පත්‍රයේ ප්‍රධාන ප්‍රවෘත්තිය මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේලා ඉදිරියේ තබන්ට බලාපොරොත්තු වෙනවා. එහි ප්‍රධාන ප්‍රවෘත්තිය වශයෙන් පලවී තිබෙන්නේ අපි දෙමළු ගැනයි. මේක රජයට පක්ෂපාති පුවත්පතක්. එම නිසා ඒ පත්‍රය රජයට අමාරු තත්ත්වයක් ඇති වන අන්දමේ ආරංචියක් පල කරන්නේ නැහැ. එසෙ හෙයිනුයි, අපට මේ පිළිබඳව වඩාත් බියක් ඇති වන්නට හේතුව. මෙන්න ඒ ප්‍රවෘත්තිය :

" අපි දෙමළු යටි උගුල්

මදුරාසියේ නූල් සූත්තර

මදුරාසියේ ද්‍රවිඩ මුන්නේත්‍ර කඝගම් පක්ෂය වතුකරයේ සිටින ද්‍රවිඩ නායකයින්ගේ මාර්ගයෙන් සිංහලං වළලා දෙමළ රජ කිරීමේ රහසිගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යයි. මෙම වැඩ පිළිවෙළ දැන් වතුකරය පුරා ක්‍රියාත්මක වෙමින් පවතී. "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

කඳුකරයට ආසන්නව ජීවත් වන අපට කඳුකරය පිළිබඳව නොයෙකුත් විධියේ මතිමතාන්තර දැනගන්නට ලැබෙනවා. එම ප්‍රවෘත්තියේ තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා :

"………'අපි දෙමළු' සංවිධානයේ තරුණ සමිති විශාල සංඛ්‍යාවක්ම උඩරට ප්‍රදේශවල පිහිටුවා ඇත. මේවා 'ඇම්. ජී. ආර්. මන්නුම්' යනුවෙන් හැඳින් වෙයි. ඌව ප්‍රදේශයේ සෑම වත්තකම වාගේ මෙවැනි තරුණ සමිති ඇත. මෙම සමිති කාර්යාල ඉදිරිපිට ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් පක්ෂයේ කොඩිය ඔසවා තිබේ.

වතුකරයේ සෑම වත්තකම තරුණ සමිති පිහිටු වීමට 'අපි දෙමළු' සංවිධානය කටයුතු කර ගෙන යයි.'

"සිළුමිණ" පත්‍රයේ පමණක් නොවෙයි, මෙවැනි ප්‍රවෘත්ති "දවස",, "ජනතා" වැනි පුවත්පත්වලත් පල වී තිබෙනවා. 12 වන දින "ජනතා" පත්‍රයේ ප්‍රධාන ප්‍රවෘත්තියක් වශයෙනුත් මෙය පල වී තිබුණා. ඒවායේ යම් කිසි සත්‍යතාවයක් තිබෙන්නට ඕනෑ. උඩරට ගැමි ජනතාවට විශෙෂයෙන්ම ඉන් දියානුන්ගෙන් සහ වෙනත් විදේශීන් ගෙන් ඇතිවුණු තර්ජනවලින් ඔවුන් මුදවා ලීම සඳහා ගොඩනගන ලද සංස්ථාවක් තමයි, උඩරට ගැමි පුනරුත්ථාපන කොමි ෂන් සභාව. ඒකටත් මේ ඉන්දියානු ජන තාව වෙනුවෙන් පෙනී සිටිය උදවිය ඇතු ළත් කිරීමෙන් මෙම ප්‍රවෘත්තිය බොහෝ දුරට සත්‍යදෙයක් වන බව පෙනී යනවා. ඉන්දියානුන් වශයෙන් සිටින අය ගොවි හමුදාවට පවා ඇතුළත්වීමට උත්සාහ දරන බව පේනවා. කඳුකරයට ආසන්න මොණරාගල වැනි ප්‍රදේශවල සිටින එවැනි උදවිය ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා තිබෙනවා, ජනපද ව්‍යාපාරවලට ඇතුළත් වන්නට අවස්ථාව ලබා දෙන ලෙස. මේවා ප්‍රෘත්ති පත්‍රවල පවා පලවුණු ආරංචියි. ඒවා ගේම ගොවි හමුදාවේද රක්ෂා බලාපො රොත්තුවෙන ['සිටිනවා. මෙම වැඩ පිළි වෙළ අපේ රටට ලොකුම තර්ජනයක් වන බවයි පෙනී යන්නේ. ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් පක්ෂය ඇති වුණු ඉන්දියාවේ දී පවා එම පක්ෂයේ යම් යම් ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළවල් ප්‍රතික්ෂේප වී තිබෙනවා. ඉන්දියානු රජය මගින් පවා ඒවා ප්‍රතික් ෂේප කර තිබෙනවා ; විවේචනයට ලක් කර තිබෙනවා. මෙවැනි තර්ජනයක් අපේ රටට තිබෙනවා නම්, ඇයි ඒ ගැන කතා නොකෙරෙ යන්නේ කියා මා අහනවා.

අපි විරුද්ධ පාර්ශ්වයේ සියවිත් රජයට කියා සිටින්නේ, මෙවැනි වැඩ කට යුතුවලට අනුව රටට විපත්තිකර තත්ත්ව යක් පැනනැගී තිබෙනවා නම් පක්ෂ භේදයෙන් තොරව මේ "අපි දෙමළු" ව්‍යා පාරයට එරෙහි ව සටන් කරන්නට ඉදිරි පත් විය යුතු බවයි. ඒ සඳහා විරුද්ධ පාර්ශ්වයේ සහාය දෙන්නට අපි ලෑස්තියි. ඌව ප්‍රදේශයේ ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මා කියන් නට කැමතියි, අපට ලොකු සටන් ඉතිහාස යක් තිබෙන බව. පෘතුගීසීන් සමග පම ණක් නොව ඉංග්‍රිසි සමග පවා විදේශ ආධි පත්‍යයට විරුද්ධව අප සටන් කර තිබෙ නවා. එසේ හෙයින් මෙවැනි නරක තත් වයක් ඇති වී තිබෙනවා නම් ඊට විරුද් ධව වහාම ඉදිරිපත් වන්න. ඒ සඳහා අප ගේ සහයෝගය දෙන්නට ලෑස්තියි. මෙම තත්ත්ය පිළිබඳව වහාම රජයේ සැල කිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටි නවා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමති තුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මෙවැනි වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා නම් වහාම එය ඉල්ලා අස් කරගෙන උඩරට ගැමි ජනතාව පත් වී තිබෙන තර්ජනයෙන් ඔවුන් මුදවා ගැනීමට කටයු කරන ලෙස.

අ. භා. 7.22

ඩැනියෙල් මයා.

(திரு. டனியல்)

(Mr. Daniel)

ගරු ඉඩම් ඇමතිතුමාගේ දැනගැනීම සඳහා එක්තරා කාරණයක් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. වනරක්ෂණ දෙපාර්‍ත මේන්තුවේ බූස්සේ ගබඩාවෙන් අවශ්‍ය ලී ප්‍රමාණයක් ලබා ගැනීමට පළාතේ ගම්සභා පතිවරයා හැටියට මා ඇනවුමක් නැති නම් පේමන්ට් ඔඩර් එකක් දමා ලියම කින් දැනුම් දුන් පසු එය භාර ගන්නට බැරිය කියා ආපසු එව්වා. ඊට පසු මහනුවර වන ආරක්ෂකතුමාට ඒ බව දන්වා එතුමාගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චෙක් පතක් අරගෙන එය දෙපාර්තමේන්තු වට යැව්වා. ඉන් පසුව මට මෙහෙම කියා එවා තිබෙනවා :

" සභාපතිතුමා,
ගම්දහය දකුණ ගම්සභාව,
මොරගොල්ල, තලාතුඔය.

ප්‍රිය මහත්මයාණෙනි,

ඔබ විසින් මා වෙත එවා ඇති මහජන බැංකුවේ 3 ඞී 62. 2. 24 වැනි දින දරණ රුපියල් 2059.20 චැක්පත ආපසු මේ සමඟ එවමි. මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් උපදෙස් අනුව දුවවල වටිනාකම වෙනුවෙන් චැක් පත් භාර ගත නොහැකි බව කරුණාවෙන් සැලකුව මැනවි. එබැවින් ඔබ වෙත එවා ඇති සේවා ඇනවුම් අයදුම්පත් මාර්ගයෙන් එවනු මැනවි."

මහජන බැංකුව මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා රජය මගින් ඇති කර තිබෙන ආයතනයක්. මේ ආයතනයේ සමහර වාංචනික ඇණවුම් පත් ලියනවා. එහෙත් ඔය කියන ලද ඇණවුම් පත ලියන ලද්දේ මහනුවර දනට සිටින දිසාපතිතුමා සහ එතුමාගේ චෙක්පත් ලිවීමට නියෝග ලබා සිටින නිලධාරියා යන දෙදෙනා විසිනුයි. කොටින්ම මේක කච්චේරියේ චෙක් පතක්. එය බූස්සේ දුව ගබඩාවට යැවූ විට එය භාර ගත නොහැකි බව දන්වා ආපසු එවා තිබෙනවා. කරුණාකර මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතුයි.

විදුලි බලය පාලනය වන්නේත් ඉඩම් ඇමතිතුමාගේ අමාත්‍යාංශය මගිනුයි. මගේ ගම්කාර්ය සභා සීමාව තුළ නගර දෙකකට විදුලි බලය ලබා දී තිබෙනවා. ඒ විදුලි බලය දීර්ඝ කිරීම සඳහා අපට තව කණු ස්වල්පයක් වුවමනායි. කොන්ක්‍රීට් කණුවලට වැඩි වියදමක් යන නිසා බූස්සේ ඇති දුව මධ්‍යස්ථානයෙන් අවශ්‍ය කණු ටික ලබා ගැනීමට බලාපොරොත්තු වුණා. බූස්සේ මධ්‍යස්ථානයත් සමග ලියුම් හුවමාරු කර ගැනීමෙන් පසුවයි මේ චෙක් පත යැව්වේ. එක ගසක වටිනාකම රුපියල් 68 යි. ඒ ගස මහනුවරට ගෙන එන්නට යන වියදම රුපියල් 55 යි. ඔන්න අපට මුදල් නාස්ති කරන්නට සිදු වී තිබෙන හැටි. එක කණුවක් බූස්සේ සිට එහාට ගෙන යන්නට කීයක් වියදම් වෙනවාදැයි මොහොතක් කල්පනා කර බලන්න. එසේ කල්පනා කර බලා මෙම කණු ටික ඉක්මණින් ලබා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.25

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශක මණ්ඩලයක් පත් කර තිබෙනවා. එහෙත් එය නීතිගත මණ්ඩලයක් නොවෙයි. එවැනි උපදේශක මණ්ඩලයක් පත් කිරීම සඳහා කිසිම නීතියක් නැහැ. ඒ මණ්ඩලය පත් කරන ලද්දේ ඇමතිවරයා හැටියට මා විසිනුයි. ඒ මණ්ඩලය පත් කරන්නේ උපදෙස් දීම පමණයි. ඒ උපදෙස් භාර ගන්නටත් පුළුවනි. භාර නොගන්නටත් පුළුවනි. ඒ මණ්ඩලයේ සාමාජිකයන් 44 දෙනකු සිටිනවා. පත් කරන කරන ලද මන්ත්‍රී අනන්මලේ මහතා ඒ උපදේශක මණ්ඩලයට පත් කරන ලද්දේ මා විසිනුයි. ඒ මහතා ඊට පත් කිරීමට විරුද්ධව කිසිම කාරණයක් නැහැ. උඩරට පළාතේ කෙරෙන වැඩ කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දෙන්නට පත් කර සිටින 44 දෙනකුගෙන් සමන්විත කොමිටියක ඒ මහතා සිටීමෙහි කිසිම වරදක් නැහැ. එතුමා මෙම ගරු සභාවෙහි පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

සිටිමින් උපදෙස් දීමට, කථා කිරීමට හා ක්‍රියා කිරීමට සුදුස්සකු නම්, ඒ වාගේම එතුමා උඩරට ප්‍රදේශයේ පදිංචිකරුවකු නම්, උඩරට ප්‍රදේශයේ පාරවල් පාවිච්චි කරන්නකු නම් උඩරට ප්‍රදේශය ගැන තොරතුරු දන්නකු නම් මෙම උපදේශක මණ්ඩලයට ඒ මහතා පත් කිරීමෙහි කිසිම වරදක් නැති බව මා කල්පනා කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக் கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.26 ට අද දින සභාසම්මතිය අනුව, 1968 මාර්තු 24 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி பி. ப. 7.26 மணிக்குச் சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 1968 மார்ச் 24, ஞாயிற்றுக்கிழமை பி.ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 7.26* P.M. *until 2* P.M. *on Sunday, 24th March, 1968, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### පෞද්ගලික පාසල් : නම්
### தனிப்பட்ட பாடசாலைகள் : பெயர்கள்
### PRIVATE SCHOOLS : NAMES

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (i) අද පවතින පෞද්ගලික ගාස්තු අය කැරෙන පාසල්වල නම්; (ii) 1960 දී, පෞද්ගලික හා ගාස්තු අය නොකැරෙන පාසල් වශයෙන් සිටීමට සිය කැමැත්තෙන් තෝරාගත් උපකෘත පාසල්වල නම්; (iii) (ii) යටතේ වූ පාසල් අතුරින් ඉන් පසු දෙපාර්තමේන්තුවට භාර දෙන ලද පාසල්වල නම් සහ ඒවා භාර දෙනු ලැබීමට හේතු; එතුමා ප්‍රකාශ කරන්නේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (i) இன்று செயல்படும் தனிப்பட்ட கட்டணம் அறவிடும் பாடசாலைகளின் பெயர்கள்; (ii) தனிப்பட்டதாகவும், கட்டணம்-அறவிடாமலும் இருப்பதென்று 1960 இல் விருப்பந்தெரிவித்த உதவி பெற்ற பாடசாலைகளின் பெயர்கள்; (iii) (ii) இல் கூறப்பட்ட பாடசாலைகளுள் பின்னர் கல்வித் திணைக்களத்திற்குக் கையளிக்கப்பட்ட பாடசாலைகளின் பெயர்கள், அவை கையளிக்கப்பட்டமைக்கான காரணங்கள்; ஆகியவற்றை அவர் கூறுவாரா?*

asked the Minister of Education and Cultural Affairs: Will he state (i) the names of private fee-levying schools functioning today; (ii) the names of assisted schools that opted in 1960 to remain private and non-fee-levying; (iii) the names of such schools in (ii) that have since been handed over to the department and the reasons for their being handed over?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(i) සභාගත කර ඇති (අ) උප ලේඛනයෙහි දක්වා ඇත. (ii) සභාගත කර ඇති (ආ) උප ලේඛනයෙහි දක්වා ඇත. (iii) සභාගත කර ඇති (ඉ) උප ලේඛනයෙහි දක්වා ඇත. මෙහි නම් සඳහන් පාසල් භාරදීමට හේතුව, එම පාසල් නඩත්තු කර පවත්වා ගෙන යැම අපහසු බව කළමනාකාරවරුන් විසින් පවසා ඒවා රජයට භාර දෙනු ලැබීමය.

*(i) சமர்ப்பிக்கப்பட்டுள்ள (அ) ஆம் அட்டவணையில் கொடுபட்டுள்ளன. (ii) சமர்ப்பிக்கப்பட்டுள்ள (ஆ) ஆம் அட்டவணையில் கொடுபட்டுள்ளன. (iii) சமர்ப்பிக்கப்பட்டுள்ள (இ) ஆம் அட்டவணையில் கொடுபட்டுள்ளன. இப்பாடசாலை முகாமையாளர் பாடசாலைகளைத் தொடர்ந்து நடத்த முடியாதமையைத் தெரிவித்து அவற்றை அரசாங்கத்திடம் ஒப்படைத்தனர்.*

(i) Given in schedule (*a*) tabled.
(ii) Given in schedule (*b*) tabled.
(iii) Given in schedule (*c*) tabled. The managers of these schools expressed their inability to continue to maintain these schools and handed them over to the Government.

### "අ" උපලේඛනය

**අද පවතින පෞද්ගලික ගාස්තු අය කෙරෙන පාසල්වල නම්**

1. නු/ශාන්ත පැට්‍රික් විද්‍යාලය, තලවකැලේ
2. නු/අප ස්වාමිදුවගේ කන්‍යාරාමය, නුවරඑළිය
3. නු/ශාන්ත තෝමස් විද්‍යාලය, ගුරුතලාව
4. මා/ආලෝක විද්‍යාලය, මාතලේ
5. කොළ/මීගමුව ලොයලා විද්‍යාලය,
6. හලා/වෙන්නප්පුව ශාන්ත මරියා ... විද්‍යාලය
7. මහ/මිඩ්ලන්ඩ් විද්‍යාලය, මහනුවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

8. මහ/මහත් මා ගාන්ධි විද්‍යාලය, මහනුවර
9. මහ/ක්‍රිස්ටෝපර් විද්‍යාලය, පේරාදෙනිය
10. මහ/අශෝක විද්‍යාලය, මහනුවර
11. මහ/ත්‍රිත්ව විද්‍යාලය, මහනුවර
12. මහ/හිල්වුඩ් විද්‍යාලය, මහනුවර
13. මහ/මෝ බ්රේ බාලිකා විදුහල, මහනුවර
14. බ/බණ්ඩාරවෙල ශාන්ත තෝමස් ප්‍රාථමික විද්‍යාලය
15. බ/බදුල්ල අනුරුද්ධ විද්‍යාලය
16.. බ/උඩුවර ශ්‍රී මහින්ද විද්‍යාලය
17. බ/බදුල්ල සිද්ධාර්ථ විද්‍යාලය
18. කො/බිෂොප් විද්‍යාලය, කොළඹ 3
19. කො/බෞද්ධ කාන්තා විද්‍යාලය, කොළඹ 7
20. කො/කේරි විද්‍යාලය, කොළඹ 7
21. කො/ක්‍රිස්තුරාජ විද්‍යාලය, පන්නිපිටිය
22. කො/සී. එම්. එස්. කාන්තා විද්‍යාලය, කොළඹ 3
23. කො/ඇන්ඩර්සන් විද්‍යාලය, කොළඹ 2
24. කො/ඇලෙක්සැන්ඩ්රා විද්‍යාලය, කොළඹ 7
25. කො/ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස
26. කො/ශාන්ත තෝමස් ප්‍රාථමික විද්‍යාලය, කොළඹ 3
27. කො/ශාන්ත ලෝරන්ස් බාලිකා විද්‍යාලය, කොළඹ 6
28. කො/ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 7
29. කො/මියුසියස් විද්‍යාලය, කොළඹ 7
30. කො/ස්ටැපර්ඩ් කාන්තා විද්‍යාලය, කොළඹ 7
31. කො/සුජාතා විද්‍යාලය, කොළඹ 3
32. කො/ශාන්ත ජෝශප් කණිෂ්ඨ විද්‍යාලය, නුගේගොඩ
33. ක/ශුද්ධවූ යහපත් එඬේරාගේ කන්‍යාරාමය, පානදුර
34. ක/ශාන්ත ජෝන් බාලිකා විදුහල, පානදුර

### அட்டவணை " அ "

தற்போது நடைபெறும் கட்டணம் அறவிடும், தனிப்பட்ட பாடசாலைகள்

1. நு/அர்ச். பற்றிக்ஸ் கல்லூரி, தலவாக்கொல.
2. நு/அவ லேடீஸ் கொன்வென்ற், நுவரேலியா.
3. நு/அர்ச். தோமாஸ் கல்லூரி, குறுத்தலாவ.
4. மா/அலோக வித்தியாலய, மாத்தளை.
5. கொழும்பு வடக்கு, நீர்கொழும்பு லோயல வித்தியாலய.
6. சி/வென்னப்புவ அர்ச். மேரிஸ் ஆரம்ப பாடசாலை.
7. க/மிட்லண்ட் வித்தியாலய, கண்டி.
8. க/மகாத்மா காந்தி வித்தியாலய, கண்டி.
9. க/கிறிஸ்தோபர் வித்தியாலய, பேராதனை.
10. க/அசோகா வித்தியாலய, கண்டி.
11. க/ரின்றி கல்லூரி, கண்டி.
12. க/கில்வூட் கல்லூரி, கண்டி.
13. க/மொ பிரே பெண்கள் பாடசாலை, கண்டி.
14. பது/பண்டாரவெல அர்ச். தோமாஸ் ஆரம்ப பாடசாலை.
15. பது/பதுளை அனுராத வித்தியாலய.
16. பது/உடுவர ஸ்ரீ மகிந்த வித்தியாலய.
17. பது/பதுளை சித்தார்த்த வித்தியாலய.
18. கொ/பிசொப்ஸ் கல்லூரி, கொழும்பு 3.
19. கொ/பௌத்த பெண்கள் கல்லூரி, கொழும்பு 7.
20. கொ/கேரி கல்லூரி, கொழும்பு 7.
21. கொ/கிறைஸ்ற் கிங் கொலிஜ், பன்னிப்பிட்டிய.
22. கொ/சி. எம், எஸ். பெண்கள் கல்லூரி, கொழும்பு 3.
23. கொ/அன்டேசன் கல்லூரி, கொழும்பு 2.
24 .கொ/அலெக்சாண்டர் கல்லூரி, கொழும்பு 7.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

25. கொ/அர்ச். தோமாஸ் கல்லூரி, கல்கிசை.
26. கொ/அர்ச். தோமாஸ் ஆரம்ப பாடசாலை, கொழும்பு 3.
27. கொ/அர்ச். லோறன்ஸ் பெண்கள் வித்தியாலய, கொழும்பு 6.
28. கொ/அர்ச். பிறிஜெற்ஸ் கொன்வென்ற், கொழும்பு 7.
29. கொ/மீசியெஸ் கலலூரி, கொழும்பு 7.
30. கொ/ஸ்ரபோட் பெண்கள் கல்லூரி, கொழும்பு 7.
31. கொ/சுஜாத்தா வித்தியாலய, கொழும்பு 3.
32. கொ/அர்ச். ஜோசேப் கனிட்ட பாடசாலை, நுகேகொட.
33. களு/குட் செப்பேட் கொன்வென்ற், பாணந்துறை.
34. களு/அர்ச். ஜோன்ஸ் பெண்கள் பாடசாலை, பாணந்துறை.

## *Schedule "A"*

NAMES OF PRIVATE FEE-LEVYING SCHOOLS FUNCTIONING TODAY

1. N/St. Patrick's College, Talawakele.
2. N/Our Lady's Convent, Nuwara-Eliya.
3. N/St. Thomas College, Gurutalawa.
4. Mt/Aloka Vidyalaya, Matale.
5. Colombo North Negombo Loyala Vidyalaya.
6. Ch/Wennappuwa St. Mary's Primary School.
7. K/Midland Vidyalaya, Kandy.
8. K/Mahatma Gandhi Vidyalaya, Kandy.
9. K/Christopher Vidyalaya, Peradeniya.
10. K/Asoka Vidyalaya, Kandy.
11. K/Trinity College, Kandy.
12. K/Hillwood College, Kandy.
13. K/Mo Gray Girls School, Kandy.
14. Bd/Bandarawela St. Thomas Primary School.
15. Bd/Badulla Anuruddha Vidyalaya.
16. Bd/Uduwara Sri Mahinda Vidyalaya.
17. Bd/Badulla Siddhartha Vidyalaya.
18. C/Bishops' College, Colombo 3.
19. C/Buddhist Ladies College, Colombo 7.
20. C/Carey College, Colombo 7.
21. C/Christ King College, Pannipitiya.
22. C/C. M. S. Ladies College, Colombo 3.
23. C/Anderson College, Colombo 2.
24. C/Alexandra College, Colombo 7.
25. C/St. Thomas College, Mt. Lavinia.
26. C/St. Thomas Primary School, Colombo 3.
27. C/St. Lawrence Balika Vidyalaya, Colombo 6.
28. C/St. Bridgets Convent, Colombo 7.
29. C/Museus College, Colombo 7.
30. C/Stafford Ladies College, Colombo 7.
31. C/Sujatha Vidyalaya, Colombo 3.
32. C/St. Joseph Junior School, Nugegoda.
33. Kl/Good Shepherd Convent, Panadura.
34. Kl/St. John's Girls School, Panadura.

## "ආ" උපලේඛනය

1960 දී පෞද්ගලික හා ගාස්තු අය නොකෙරෙන පාසල් වශයෙන් සිටීමට සිය කැමැත්තෙන් තෝරාගත් උපකෘත පාසල්වල නම්

1. යා/කයිට්ස් ශාන්ත අන්තෝනි විද්‍යාලය
2. යා/චුන්ඩිකුලි බාලිකා විද්‍යාලය
3. යා/ඉලවා ලෛ ශාන්ත හෙන්රි විද්‍යාලය
4. යා/යාපනය ශුද්ධ පාවුලු කන්‍යාරාමය
5. යා/යාපනය ශාන්ත පැට්රික් විද්‍යාලය
6. යා/යාපනය ශාන්ත ජෝන් විද්‍යාලය
7. යා/වඩ්ඩුකොඩ්ඩෙයි යාපනය විද්‍යාලය
8. යා/උඩුවිල් බාලිකා විද්‍යාලය
9. ත්‍රි/ශාන්ත ජෝශප් විද්‍යාලය, ත්‍රිකුණාමලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

10. ම/ශාන්ත මයිකල් විදුහල, මඩකලපුව
11. නු/ශාන්ත ජෝන් බොස්කෝ විදුහල, හැටන්
12. මාර/ශාන්ත මරියා කන්‍යාරාම විදුහල
13. මා/ශාන්ත ඇග්නස් කන්‍යාරාම විද්‍යාලය, මාතලේ
14. කු/ශාන්ත ආනා විද්‍යාලය
15. කු/ශුද්ධ පවුලේ කන්‍යාරාමය
16. කොළ/වත්තල ශාන්ත අන්තෝනි විද්‍යාලය
17. කොළ/ගම්පහ සිරිකුරුස විද්‍යාලය
18. කොළ/කඳාන ද මැසනඩ් විද්‍යාලය
19. කොළ/මීගමුව ආවේමරියා විද්‍යාලය
20. කොළ/මීගමුව මාරිස්ටෙල්ලා ප්‍රාථමික විද්‍යාලය
21. කොළ/මාරි මීගමුව මාරිස්ටෙල්ලා විද්‍යාලය
22. කොළ/තුඩැල්ල ක්‍රිස්තු රාජ විද්‍යාලය
23. කොළ/මීගමුව ශාන්ත මේරි විද්‍යාලය
24. හලා/හලාවත ශාන්ත මේරි ඉංග්‍රිසි පිරිමි විද්‍යාලය
25. හලා/හලාවත ශාන්ත මේරි ඉංග්‍රිසි බාලිකා විද්‍යාලය
26. හලා/වෙන්නප්පුව පෞද්ගලික ජ්‍යෙෂ්ඨ බාලිකා විද්‍යාලය
27. හලා/වෙන්නප්පුව ජෝසප් වාස් විද්‍යාලය
28. හලා/මාරාවිල ශාන්ත සේවියර් විද්‍යාලය
29. මහ/ශාන්ත අන්තෝනි විදුහල, මහනුවර
30 මහ/මහනුවර යහපත් එඬේරාගේ කන්‍යාරාමය
31. අ/ශාන්ත ජෝශප් විද්‍යාලය, අනුරාධපුර
32. කො/ශාන්ත ජෝසප් විද්‍යාලය, කොළඹ 10
33. කො/ශාන්ත බෙනඩික් විද්‍යාලය, කොළඹ 13
34. කො/ශාන්ත පීතර විද්‍යාලය, කොළඹ 4
35. කො/යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොළඹ 13
36. කො/ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය, කොළඹ 4
37. කො/මෙතෝදිස්ත විද්‍යාලය, කොළඹ 3
38. කො/වෙස්ලි විද්‍යාලය, කොළඹ 8
39. කො/සයිව මංගයාර් විද්‍යාලය, කොළඹ 6
40. කො/ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලය, හංවැල්ල
41. කො/ශාන්ත තෝමස් විද්‍යාලය, කෝට්ටේ
42. කො/ශාන්ත සෙබස්තියන් විද්‍යාලය, මොරටුව
43. කො/මොරටුව කන්‍යාරාමය, මොරටුව
*44. කො/සහිරා විද්‍යාලය, කොළඹ 10
45. ක/සිරිකුරුස විදුහල, කළුතර
46. ක/ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය, කළුතර
47. ක/නැබඩ ශාන්ත අන්තෝනි රෝ. ක. විදුහල
48. ක/ශ්‍රී සිද්ධාර්ථ විදුහල, ලත්පඳුර
49. ක/හොරණ ශාන්ත ෆිලෝමිනා විදුහල
50. ගා/ශාන්ත ඇලෝසියස් විද්‍යාලය, ගාල්ල
51. ගා/දිව්‍ය හෘදය කන්‍යාරාමය, ගාල්ල

* කො/සහිරා විද්‍යාලය, කොළඹ 10—මෙම විද්‍යාලය උපකෘත පාසැලක් වශයෙන් පවත්වාගෙන යන ලදී. 1960.12.1 සිට ගාස්තු අය නොකෙරෙන පෞද්ගලික පාසැලක් වශයෙන් සිටීමට තෝරාගත් නමුත් පසුව රජයට පවරා ගන්නා ලදී. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් අනුව පසුව නැවත මෙම පාසල අයිතිකරුට භාර දෙන ලදී. මෙය දැනට ගාස්තු අය නොකෙරෙන පෞද්ගලික පාසලකි.

## அட்டவணை "ஆ"

கட்டணம் அறவிடாது, தனிப்பட்ட பாடசாலைகளாக நடைபெறுவதென 1960 ம் ஆண்டு விருப்பம் தெரிவித்த உதவி நன்கொடை பெற்ற பாடசாலைகள்

1. யா/ஊர்காவத்துறை அர்ச். அந்தோனியார் கல்லூரி.
2. யா/சுண்டிக்குளி பெண்கள் கல்லூரி.
3. யா/இளவாலை அர்ச். கென்றிஸ் கல்லூரி.
4. யா/யாழ்ப்பாண பரிசுத்த கன்னிகாஸ்திரி மடம்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5. யா/யாழ்ப்பாண அர்ச். பற்றிக்ஸ் கல்லூரி.
6. யா/யாழ்ப்பாண அர்ச். ஜோன்ஸ் கல்லூரி.
7. யா/வட்டுக்கோட்டை யாழ்ப்பாண கல்லூரி.
8. யா/உடுவில் பெண்கள் கல்லூரி.
9. தி/அர்ச். ஜோசேப் வித்தியாலய, திருகோணமலை.
10. மட்/அர்ச். மைக்கேல்ஸ் கல்லூரி, மட்டக்களப்பு.
11. நு/அர்ச். ஜோன் பொஸ்கோஸ் கல்லூரி, கற்றன்.
12. மா/அர்ச். மேரிஸ் கொன்வென்ற் பாடசாலை.
13. மா/அர்ச். அக்னெஸ் கொன்வென்ற் வித்தியாலய, மாத்தளை.
14. கு/அர்ச். அனெஸ் கல்லூரி.
15. கு/பரிசுத்த கன்னிகாஸ்திரி மடம்.
16. கொழும்பு வடக்கு, வத்தளை அர்ச். அந்தோனியார் கல்லூரி.
17. கொழும்பு வடக்கு கம்பகா ஹோலி குறொஸ் வித்தியாலய.
18. கொழும்பு வடக்கு கந்தான டீ மசெனட் வித்தியாலய.
19. கொழும்பு வடக்கு நீர்கொழும்பு அவெ மறியா வித்தியாலய.
20. கொழும்பு வடக்கு மேரி ஸ்ரெல்லா ஆரம்ப பாடசாலை.
21. கொழும்பு வடக்கு நீர்கொழும்பு மேரி ஸ்ரெல்லா வித்தியாலய.
22. கொழும்பு வடக்கு துடெல்ல கிறைஸ்ற் கிங் வித்தியாலய.
23. கொழும்பு வடக்கு நீர்கொழும்பு அர்ச். மேரிஸ் கல்லூரி.
24. சி/சிலாபம் அர்ச். மேரிஸ் ஆங்கில ஆண்கள் வித்தியாலய.
25. சி/சிலாபம் அர்ச். மேரிஸ் ஆங்கில பெண்கள் வித்தியாலய.
26. சி/வென்னப்புவ தனிப்பட்ட சிரேட்ட பெண்கள் வித்தியாலய.
27. சி/வென்னப்புவ ஜோசெப் வாஸ் வித்தியாலய.
28. சி/மரவில அர்ச். சேவியர் வித்தியாலய.
29. க/அர்ச். அந்தோனிஸ் கல்லூரி, கண்டி.
30. க/கண்டி குட் செப்பேட் கொன்வென்ற்.
31. அ/அர்ச். ஜோசேப் வித்தியாலய, அனுராதபுர.
32. கொ/அர்ச். ஜோசேப் கல்லூரி, கொழும்பு 10.
33. கொ/அர்ச். பெனெடிக்ற் கல்லூரி, கொழும்பு 13.
34. கொ/அர்ச். பீற்றேஸ் கல்லூரி, கொழும்பு 4.
35. கொ/குட் செப்பேட் கொன்வென்ற், கொழும்பு 13.
36. கொ/பரிசுத்த கன்னிகாஸ்திரி மடம், கொழும்பு 4.
37. கொ/மெதடிஸ்ற் கல்லூரி, கொழும்பு 3.
38. கொ/வெஸ்லி கல்லூரி, கொழும்பு 8.
39. கொ/சைவ மங்கையர் வித்தியாலயம், கொழும்பு 6.
40. கொ/அர்ச். ஜோன் கொஸ்கோஸ் கல்லூரி, களுஅக்கல, கன்வெல.
41. கொ/அர்ச். தோமாஸ் கல்லூரி, கோட்டே.
42. கொ/அர்ச். செபாஸ்ரியான் கல்லூரி, மொறட்டுவ.
43. கொ/மொறட்டுவ கொன்வென்ற், மொறட்டுவ.
44. *கொ/சாகிரா கல்லூரி, கொழும்பு 10.
45. களு/ஹோலி குறொஸ் கல்லூரி, களுத்துறை.
46. களு/பரிசுத்த கன்னிகாஸ்திரி மடம், களுத்துறை.
47. களு/நாபொட அர்ச். அந்தோனிஸ் ரோ. க. பாடசாலை.
48. களு/ஸ்ரீ சித்தார்த்த வித்தியாலய, லத்பந்துர.
49. களு/ஹொரண அர்ச். பிலோமின வித்தியாலய.
50. கா/அர்ச். அலோசியஸ் கல்லூரி, காலி.
51. கா/சேக்கிரெட் காட் கொன்வென்ற், காலி.

*கொ சாகிரா கல்லூரி, கொழும்பு 10.

இப்பாடசாலை 1.12.60 தொடக்கம் கட்டணம் அறவிடாது நடைபெறுவதாக விருப்பம் தெரிவித்த, உதவி நன்கொடை பெற்ற ஒரு பாடசாலையாகும். ஆனால், பின்னர் இப்பாடசாலை அரசாங்கத்தால் கையேற்கப்பட்டது. உயர் நீதிமன்றத்தின் ஒரு தீர்ப்புக் காரணமாக இப்பாடசாலை முன்னைய முகாமையாளரிடம் பின்னர் ஒப்படைக்கப்பட்டது. இது இப்பொழுது கட்டணம் அறவிடாத ஒரு தனிப்பட்ட பாடசாலையாகும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Schedule "B"*

NAMES OF ASSISTED SCHOOLS THAT OPTED IN 1960 TO REMAIN PRIVATE AND NON FEE-LEVYING

1. J/Kayts St. Anthony's College.
2. J/Chundikuli Girl's College.
3. J/Ilavelai St. Henry's College.
4. J/Jaffna Holy Family Convent.
5. J/Jaffna St. Patrick's College.
6. J/Jaffna St. John's College.
7. J/Vaddukoddai Jaffna College.
8. J/Uduvil Girls College.
9. T/St. Joseph Vidyalaya, Trincomalee.
10. Bt/St. Michael's College, Batticaloa.
11. N/St. John Bosco's College, Hatton.
12. Mr/St. Mary's Convent Vidyalaya.
13. Mt/St. Agnes Convent Vidyalaya, Matale.
14. Ku/St. Anne's College.
15. Ku/Holy Family Convent.
16. Colombo North Wattala St. Anthony's College.
17. Colombo North Gampaha Holy Cross Vidyalaya.
18. Colombo North Kandana de Masenod Vidyalaya.
19. Colombo North Negombo Ave Maria Vidyalaya.
20. Colombo North Mari Stella Primary School.
21. Colombo North Negombo Marie Stella Vidyalaya.
22. Colombo North Tudella Christ King Vidyalaya.
23. Colombo North Negombo St. Mary's College.
24. Ch/Chilaw St. Mary's English Boys' Vidyalaya.
25. Ch/Chilaw St. Mary's English Girls' Vidyalaya.
26. Ch/Wennappuwa Private Senior Girls' Vidyalaya.
27. Ch/Wennappuwa Joseph Vaas Vidyalaya.
28. Ch/Marawila St. Xavier Vidyalaya.
29. K/St. Anthony's College, Kandy.
30. K/Kandy Good Shepherd Convent.
31. A/St. Joseph Vidyalaya, Anuradhapura.
32. C/St. Joseph College, Colombo 10.
33. C/St. Benedict College, Colombo 13.
34. C/St. Peter's College, Colombo 4.
35. C/Good Shepherd Convent, Colombo 13.
36. C/Holy Family Convent, Colombo 4.
37. C/Methodist College, Colombo 3.
38. C/Wesley College, Colombo 8.
39. C/Saivar Mangayar Vidyalayam, Colombo 6.
40. C/St. John Bosco's College, Kaluaggala, Hanwella.
41. C/St. Thomas College, Kotte.
42. C/St. Sebastian College, Moratuwa.
43. C/Moratuwa Convent, Moratuwa.
44. *C/Zahira College, Colombo 10.
45. Kl/Holy Cross College, Kalutara.
46. Kl/Holy Family Convent, Kalutara.
47. Kl/Neboda St. Anthony's R. C. School.
48. Kl/Sri Siddhartha Vidyalaya, Lathpandura.
49. Kl/Horana St. Philomena Vidyalaya.
50. G/St. Aloysius College, Galle.
51. G/Sacred Heart Convent, Galle.

*C/Zahira College, Colombo 10—This school was an Assisted School which opted to remain a non-fee-levying school with effect from 1.12.60 but subsequently taken over to government. As a result of a Supreme Court judgment the school was handed over to the previous management. This is now a non-fee-levying private school.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## "ඉ" උපලේඛනය

**1960 දී පෞද්ගලික හා ගාස්තු අය නොකෙරන පාසල් වශයෙන් සිටීමට සිය කැමැත්තෙන් තෝරාගත් නමුත් පසුව දෙපාර්තමේන්තුවට භාර දෙන ලද පාසැල්වල නම්**

| | | |
|---|---|---|
| 1. | කු/ශාන්ත ආනා විද්‍යාලය ... ... | දෙපාර්තමේන්තුවට සිය කැමැත්තෙන් භාර දී ඇත. |
| 2. | කොළ/තුඩැල්ල ක්‍රිස්තුරාජ විද්‍යාලය ... | දෙපාර්තමේන්තුවට සිය කැමැත්තෙන් භාර දී ඇත. |
| 3. | කොළ/මීගමුව ශාන්ත මේරි විද්‍යාලය ... | දෙපාර්තමේන්තුවට සිය කැමැත්තෙන් භාර දී ඇත. |
| 4. | හලා/හලාවත ශාන්ත මේරි ඉංග්‍රීසි පිරිමි විද්‍යාලය | කළමනා කරු විසින් සතුටුදායක ලෙස නඩත්තු නොක බැවින් රජයට පවරා ගෙන ඇත. |
| 5. | හලා/හලාවත ශාන්ත මේරි ඉංග්‍රීසි බාලිකා විද්‍යාලය | දෙපාරිතමේන්තුවට සිය කැමැත්තෙන් භාර දී ඇත. |
| 6. | හලා/වෙන්නප්පුව ජෝසප් වාස් විද්‍යාලය | |
| 7. | හලා/මාරාවිල ශාන්ත සේවියර් විද්‍යාලය | |
| 8. | කො/කලුඅග්ගල ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලය, හංවැල්ල | දෙපාර්තමේන්තුවට සිය කැමැත්තෙන් භාර දී ඇත. |
| 9. | නු/ශාන්ත ජෝන් බොස්කෝ විදුහල, හැටන් | කළමනාකරු විසින් සතුටුදායක ලෙස නඩත්තු නොක බැවින් රජයට පවරා ගෙන ඇත. |

## அட்டவணை " இ "

(தனிப்பட்ட, கட்டணம் அறவிடாத பாடசாலைகளாக நடைபெறுவதாக (1960 ம் ஆண்டு விருப்பம் தெரிவித்து, பின்னர் வித்தியா பகுதியிடம் ஒப்படைக்கப்பட்ட பாட சாலைகள்

| | | |
|---|---|---|
| 1. | கு/அர்ச். அனெ கல்லூரி .. .. | தன்னிச்சையாக வித்தியா பகுதியிடம் ஒப்படை கப்பட்டது. |
| 2. | கொழும்பு வடக்கு துடைல்ல கிறைஸ்ற் த கிங் வித் தியாலய .. .. | தன்னிச்சையாக வித்தியா பகுதியிடம் ஒப்படை கப்பட்டது. |
| 3. | கொழும்பு வடக்கு நீர்கொழும்பு அர்ச்மேரிஸ் கல்லூரி .. .. | தன்னிச்சையாக வித்தியா பகுதியிடம் ஒப்படைக் கப்பட்டது. |
| 4. | சி/சிலாபம் அர்ச் .மேரிஸ் ஆங்கில ஆண்கள் வித்தியால்ய. .. .. | பாடசாலையை, முகாமையாளர் திருப்திகரமாக நடாத்த தவறியதால், பாடசாலை அரசாங்கத்தால் கையேற்கப்பட்டது. |
| 5. | சி/சிலாபம் அர்ச். மேரிஸ் ஆங்கில பெண்கள் வித்தியாலய | தன்னிச்சையாக வித்தியா பகுதியிடம் ஒப்படை கப்பட்டது. |
| 6. | சி/வென்னப்புவ ஜோசேப் வாஸ் வித்தியாலய | |
| 7. | சி/மாராவில அர்ச். சேவியர் வித்தியாலய | |
| 8. | கொ/காலுகல்ல அர்ச். ஜோன் பொஸ்கோஸ் கல்லூரி, கன்வெல | |
| 9. | நு/அர்ச். ஜோன் பொஸ்கொஸ் கல்லூரி, கற்றன் .. .. .. | பாடசாலையை முகாமையாளர் திருப்திகரமாக நடாத்தத் தவறியதால், பாடசாலை அரசாங்கத் தால் கையேற்கப்பட்டது. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Schedule 'C'*

NAMES OF SCHOOLS OPTED IN 1960 TO REMAIN PRIVATE AND NON FEE-LEVYING THAT HAVE SINCE BEEN HANDED OVER TO THE DEPARTMENT

| | | |
|---|---|---|
| 1. | Ku/St. Anne's College .. | .. Voluntarily handed over to the Department. |
| 2. | Colombo North Tudella Christ King Vidyalaya | .. Voluntarily handed over to the Department. |
| 3. | Colombo North Negombo St. Mary's College | .. Voluntarily handed over to the Department. |
| 4. | Ch/Chilaw St. Mary's English Boys Vidyalaya | .. As the manager had failed to manage satisfactorily the school was taken over to Government. |
| 5. | Ch/Chilaw St. Mary's English Girls Vidyalaya | Voluntarily handed over to the Department. |
| 6. | Ch/Wennappuwa Joseph Vaas Vidyalaya | |
| 7. | Ch/Marawila St. Xavier Vidyalaya .. | |
| 8. | C/Kaluaggala St. John Bosco's College, Hanwella | |
| 9. | N/St. John Bosco's College, Hatton | .. As the manager had failed to manage satisfactorily the school was taken over to Government. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිශිෂ්ටය

### අනුරාධපුර මන්ත්‍රී කේ. බී. රත්නායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය

---

1967 නොවැම්බර් 4 වැනි දින අසන ලද 4 වන ප්‍රශ්නය

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුරය)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) විශේෂ බද්දු ක්‍රමය යටතේ අද වන තෙක් ඉඩම් දෙනු ලැබූ අයගේ නම් හා ලිපිනයන් එතුමා සඳහන් කරනවාද ? (ආ) එම ඉඩම් පිහිටි තැන් හා ඒවායේ ප්‍රමාණයන් සඳහන් කරනවාද ? (ඉ) මෙම ඉඩම්වල වර්තමාන සංවර්ධන තත්ත්වය කුමක් ද ?

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

පිළිතුර ඉතා දීර්ඝ ලේඛනයක් බැවින් මා එය සභාගත කරනවා.

සභාගත කරන ලද ලේඛනය

විශේෂ බද්දු මණ්ඩලය යටතේ පුද්ගලික අංශයට බද්දු දෙන ලද ඉඩම්

අනුරාධපුර දිස්ත්‍රික්කය

| (අ) නම සහ ලිපිනය | (ආ) ඉඩම පිහිටි තැන් හා අක්කර ප්‍රමාණය | | (ඉ) සංවර්ධන තත්ත්වය |
|---|---|---|---|
| ඊ. ඇන්. ඇල්ප්‍රඩ් ද සොයිසා මහතා, බණ්ඩාරනායක මාවත, නව නගරය, අනුරාධපුරය | නෙලුම්කුලම | අක්කර 100 | වී හා පොල් |
| එම | කවරැක්කුලම | අක්කර 50 | වී හා පොල් |
| ඊ. ඇල්. සේනානායක මහතා, මිල්ටන් හවුස්, මහනුවර | දෙහෙල්ගමුව | අක්කර 500 | මහවැලි යෝජනා ක්‍රමයට අයත් නිසා භාරදීම නවතා ඇත. |
| ඩී. ඇම්. ආරියදාස මහතා, මහදිවුල්වැව, ඇරවිරගොල්ලෑව, මැදවච්චිය | ගලේගම හා පාඩින්ගම | අක්කර 25 | සංවර්ධනය කර නැත, ඉඩම භාරදෙන ලද්දේ 1967.6.24 දිනය. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (අ) නම සහ ලිපිනය | (ආ) ඉඩම් පිහිටි තැන් හා අක්කර ප්‍රමාණය | | (ඇ) සංවර්ධන තත්ත්වය |
|---|---|---|---|
| කේ. ඇල්. ආරියදස මහතා, 31, යාපනය පාර, මැදවච්චිය ... | ගලේගම හා පාඩින්ගම | අක්කර 25 | සංවර්ධනය කර නැත. ඉඩම් භාර දෙනලද්දේ 1967.6.24 දිනය |
| ඩී. වී. ජේ. ජයමහ මහතා, වික්ටෝරියා මෝටර් ස්ටෝර්ස්, කොළඹ 10 | කටුපුලියම්කුලම | අක්කර 100 | ඉඩම් භාරදෙන ලද්දේ 1967.6.18 |
| ආර්. ඒ. පී. වීරසිංහ මහතා, පිහිඹියගොල්ලෑව, කහටගස්දිගිලිය | මූනමල්ගහවැව | අක්කර 25 | එම |
| යූ. බී. මුනසිංහ මහතා, ඉට්කට්ටිය, මරදන්කඩවල ... | ඉට්කට්ටිය | අක්කර 15 | ඉඩම් භාරදෙන ලද්දේ 1967.6.20 |
| ඇම්. සරණපාල මහතා, පුසියම්කුලම, ඇලයාපත්තුව ... | නොච්චිකුලම | අක්කර 10 | ඉඩම් භාරදෙනලද්දේ 1967.7.23 |
| ආර්. කිරිබන්ඩා මහතා ඇතුලු පිරිස, කුඹුක්වැව, පලුගස්වැව ... | කුඹුකේවැව අඹගස්වැව | අක්කර 40 | හුරුලුවැව දියගිල්මට අයත්වන නිසා තවම භාරදී නැත. |
| ඩබ්. ඩී. ආයුපාල මහතා සහ පිරිස, සිසර, තිසාවැව, අනුරාධපුරය | කටුපොත | අක්කර 50 | තවම ඉඩම් භාරදී නැත |
| සු. ඇම්. සුල්තාන් මහතා, අලුත්ගම, ගම්මිරිස්වැව ... | පුලියම්කුලම | අක්කර 25 | එම |
| ඩී. ඒ. පෙරේරා සහ පිරිස, 'විමුක්ති', ගෝගම්පොල පාර, වරාගොඩ, කැළණිය ... | වෙල්ලමෝරාන | අක්කර 50 | එම |
| ඒ. ඇම්. කුමාරදස මහතා, හොරොව්පොතාන ... | තිරප්පන්කඩවල | අක්කර 25 | එම |
| ආර්. එච්. ඇම්. හේරත්හාමි මහතා, කුඹුක්වැව, නෑගම්පහ ... | කුඹුක්වැව | අක්කර 20 | එම |
| ඩී. ඒ. ජයකොඩි මහතා, 'බ්‍රින්ටන්', දන්කොටුව ... | තල්ගහපොතාන | අක්කර 200 | එම |
| ඩබ්. ඩී. වී. මහතන්තිල මහතා, 127, මැකාති පාර, කොළඹ ... | කටුගම්පොලයාගම | අක්කර 100 | එම |
| ජේ. ආර්. බී. මුනසිංහ මහතා, රස්නකටුව, රත්මල්ගහවැව ... | කොල්ලෑව | අක්කර 50 | එම |
| සීමාසහිත කෑගල්ල, වි.සේ.ස. සංගමය, කෑගල්ල ... | රත්මල්වැව | අක්කර 200 | එම |
| ඒ. ඇම්. ඒ. ඩී. විජේසුන්දර මහතා, මූගහවත්ත, දෙල්ගොඩ ... | මොරගොඩ | අක්කර 25 | එම |
| පර්සි කුලසිංහ මහතා, දියලුම, පන්නිපිටිය ... | කොටගල | අක්කර 100 | එම |
| ඩබ්. ඇම්. තිලකරත්න මහතා, පාර්ක් ඇවනිව්, කොළඹ ... | කටුගම්පොලයාගම | අක්කර 100 | එම |
| ඊ. ධර්මසිරි මහතා, 69, රජින වීදිය, කොළඹ ... | කටුගම්පොලයාගම | අක්කර 100 | එම |
| ඩී. ඇස්. ගුණසේකර මහතා, 49, පලවර් පාර, කොළඹ ... | කටුගම්පොලයාගම | අක්කර 100 | එම |
| පී. ඒ. පුංචිබන්ඩා මහතා, 5 ඇල, ශ්‍රාවස්තිපුර, රත්මලේ ... | කුඩාගම | අක්කර 15 | එම |
| පී. ඩී. විජේසිරි මහතා, තිසේරා සහ සමාගම, නාවලපිටිය ... | කම්බලවේවාන | අක්කර 50 | එම |
| ඒ. සුහසිංහ සහ පිරිස, මහකුඹුක්ගොල්ලෑව, පූනෑව ... | ගුරුගම්මිල්ලෑව | අක්කර 50 | එම |
| එච්. ඇම්. ආර්. හේරත් මහතා, ඉලුක්වැව විද්‍යාලය, ගලෙන්බිඳුනවැව | කටුකෙටියාව | අක්කර 25 | එම |
| කේ. බී. පිංහාමි මහතා, කන්නිමඩුව, ගලෙන්බිඳුනවැව ... | වේවැල්වැව | අක්කර 15 | එම |
| කේ. පුංචිබන්ඩා මහතා , කොක්මඩුව, කහටගස්දිගිලිය ... | බෙත්වැව | අක්කර 15 | එම |
| ඩී. අලහප්පෙරුම මහතා සහ පිරිස, 230/6, හිල්වීදිය, දෙහිවල ... | යකඳගස්වැව | අක්කර 50 | එම |
| ඒ. ගුණරත්න මහතා, නාවලුව, දෙකටන ... | මොරගොඩ | අක්කර 50 | එම |
| ඩබ්. ඒ. ඩී. ඇස්. කරුණාරත්න මහතා, 22, ඔස්ටින් පෙදෙස, බොරැල්ල | නෙල්ලිකුලම | අක්කර 100 | එම |
|---|---|---|---|
| එස්. කේ. ඒ. සූරියආරච්චි මහතා, ගෝනහේන, කඩවත | අල්ලේ කන්තලේ පාරේ මහවැලි ගඟ වම් ඉවුර අසල | අක්කර 100 | ඉඩම් භාරදෙන ලද්දේ 67.7.24 දින |
| අබ්දුල් කපූර් අබ්දුල් මහතා, 54, ගාලු පාර, දෙහිවල | එම | අක්කර 50 | එම |
| ආර්. ආර්. ප්‍රෙසුඩි මහතා, 56, අනුරාධපුර පාර, ත්‍රිකුණාමලය | තවම ඉඩම් භාරදී නැත | අක්කර 200 | තවම ඉඩම් භාරදී නැත. |
| ඩී. ඩී. වික්‍රමනායක මහතා, සීනි සංයුක්ත මණ්ඩලය, කන්තලේ | එම | අක්කර 15 | එම |
| ඒ. එච්. අල්විස් මහතා, 88, ඇතුල් ඉනර් හාබර් පාර, ත්‍රිකුණාමලය | එම | අක්කර 200 | එම |
| පී. ශිව සුබ්‍රමානියම් මහතා, දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාලය, ත්‍රිකුණාමලය | එම | අක්කර 50 | එම |
| ඇම්. වී. මුරුගයියා මහතා, කැළණිය වතුයාය, මස්කෙලිය | එම | අක්කර 50 | එම |
| කේ. ආර්. මහදේවන් මහතා, මැද්දේනැන්න වතුයාය, පුන්ඩලුඔය | එම | අක්කර 50 | එම |

## වවුනියා දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| පී. එඩ්වඩ්ස් මහතා, එඩ්වඩ්සන්ස්, පුන්ඩලුඔය | වව්නියා උතුර | අක්කර 200 | අක්කර 50 ක් එළිකර අක්කර 35 ක වී වගාව සඳහා පිළියෙල කරති. |
| සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගම, තැ.පෙ. 327, කොළඹ | එම | අක්කර 1000 | අක්කර 300ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| කෙන්ට් පාම් සමාගම, 154, ශ්‍රී රතනජෝති සරවනමුත්තු මාවත, කොළඹ 13 | එම | අක්කර 500 | අක්කර 100ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| විජය කොන්ක්‍රීට් සමාගම, වලච්චත්ත පාර, ගන්ගොඩවිල, නුගේගොඩ | වෙන්ගල චෙඩ්ඩිකුලම් | අක්කර 250 | තවම සංවර්ධනය කර නැත. |
| ඇස්. අම්බලවානර් මහතා සහ පිරිස, 17, ඇල්ප්‍රඩ් පෙදෙස, කොළඹ 3 | එම | අක්කර 500 | අක්කර 100ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| ජේ. ඒ. එල්. ප්‍රනාන්දු මහතා, 34, පරණ බුචර් වීදිය, කොළඹ 11 | එම | අක්කර 100 | තවම සංවර්ධනය කර නැත. |
| ඊ. ෂන්මුගම් මහතා සහ පිරිස, 200, කුමාර වීදිය, කොළඹ | එම | අක්කර 500 | අක්කර 250ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| ඇස්. ඇස්. ආර්. වල්පොල මහතා සහ පිරිස, හැටන් ට්‍රාන්ස්පෝට් හා ඒජන්සි සමාගම, හැටන් | එම | අක්කර 250 | අක්කර 8ක් එළිකර තිබේ. |
| පී. වෙල්ලප්පා මහතා, 23, ස්ටැන්ලි පාර, යාපනය | වව්නියා උතුර | අක්කර 100 | අක්කර 50ක් පමණ එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| සීමාසහිත පරාක්‍රම එන්ටප්‍රයිසස්, 61/21, මීතොටමුල්ල පාර, වැල්ලම්පිටිය | වෙන්ගල චෙඩ්ඩිකුලම් | අක්කර 500 | අක්කර 95ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| එසියාටික් ට්‍රේඩින් ඒජන්සි, 107, කුමාර වීදිය, 1 වෙනි මහල, කොළඹ 11 | එම | අක්කර 250 | අක්කර 75 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| සභාපති, දෙමළ විශ්ව විද්‍යාල සංගමය, 33, ඇලෙක්සැන්ඩ්‍රා පාර, කොළඹ 6 | වව්නියා උතුර | අක්කර 500 | තවම සංවර්ධනය කර නැත. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (අ) නම සහ ලිපිනය | (ආ) ඉඩම් පිහිටි තැන් හා අක්කර ප්‍රමාණය | | (ඉ) සංවර්ධන තත්ත්වය |
|---|---|---|---|
| ටී. මහාලිංගම් මහතා සහ අයෙක්, 15/2, මැලිබෝන් ඇවනිව්, කොළඹ 4 ... | වෙන්ගල වෙඩ්ඩිකුලම් | අක්කර 50 ... | අක්කර 10 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| සීමාසහිත කාගෝ බෝට් ඩිස්පැච් සමාගම, 39/41 රජින පාර, කොළඹ ... | වව්නියා උතුර | අක්කර 500 ... | අක්කර 350 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| සීමාසහිත ප්‍රසිඩන්ට් ලයින්ස් (ලංකා) 29-2/2, ගපූර් ගොඩනැගිල්ල, කොළඹ 1 ... | වෙන්ගල වෙඩ්ඩිකුලම් | අක්කර 500 ... | අක්කර 100 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| ඇන්. කුමාරසාමි මහතා, අමෙරිකන් ඉංජිනියරින් කෝපරේෂන්, 311, පරන යෝන් විදිය, කොළඹ | වවුනියා උතුර | අක්කර 100 ... | අක්කර 50 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| ඩොලර් කෝපරේෂන් සමාගම, 14, වෙල්ල විදිය, පිටකොටුව, කොළඹ ... | මැරිටයිම් පත්තු | අක්කර 1000 ... | අක්කර 150 ක් මිරිස් සහ අතිරේක බෝග වගාකර තිබේ. තව අක්කර 150 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| කේ. සබාරත්නම් මහතා, මැරින් ඉන්ඩස්ට්‍රීස්, වැල්වැටිතුරේ ... ... | මැරිටයිම් පත්තු | අක්කර 100 ... | තවම සංවර්ධනය කර නැත. |
| ඉබ්රාහිම්ජි හසනලි සහ පුත්‍රයෝ, 195. කුමාරවිදිය, කොළඹ 11 ... | වවුනියා උතුර | අක්කර 200 ... | අක්කර 100 ක් එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| අබ්දුල් හුසේන් ජැපර්ජි සමාගම, 192, 4 වෙනි හරස් විදිය, කොළඹ ... | වවුනියා උතුර | අක්කර 500 ... | තවම සංවර්ධනය කර නැත. |
| ඇස්. සිවනේසන් මහතා, සිවකුමාර් හාල් මෝල, ඕමන්තෙයි ... ... | වව්නියා උතුර (දෙමල කොටස) | අක්කර 25 ... | අක්කර 25 එළිකර වගාව සඳහා පිළියෙල කරති. |
| ඇම්. කේ. ඒ. ඩී. ඇම්. කොඩිතුවක්කු මහතා, 25, ස්කූල් ඇවනිව්, නාවල රාජගිරිය... | වෙන්ගල වෙඩ්ඩිකුලම් | අක්කර 75 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.8.2 දින ය. |
| ඕ. ඇම්. බහියිඩියා මහතා, 9, බාවා පෙදෙස, කොළඹ 8 ... | එම | අක්කර 25 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.7.31 දින ය. |
| බී. ඊ. ද සිල්වා මහතා සහ පිරිස, 146, හැව්ලොක් පාර, කොළඹ 5 ... | එම | අක්කර 160 ... | අක්කර 50 ක් පමණ එළිකර තිබේ. |
| ජී. අමිර්තලිංගම් මහතා සහ අයෙක්, 40, කොන්වන්ට් ලේන්, හැඳල වත්තල ... | එම | අක්කර 115 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.7.31 දිනය |
| ඇම්. ඒ. සංගනි මහතා, 161, කෙයිසර් විදිය, කොළඹ 11 ... ... | එම | අක්කර 100 ... | එම |
| ජී. ජී. මෙන්ඩිස් මහතා සහ පිරිස, 52, මොරටුමුල්ල පාර, මොරටුව ... | එම | අක්කර 50 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.7.23 දිනය. |
| ඊ. එස්. බී. ප්‍රනාන්දු මහතා සහ පිරිස, 816, මරදන පාර, කොළඹ 8 ... | එම | අක්කර 50 ... | එම |
| එෆ්. ඊ. බී. ජින්ට් මහතා සහ පිරිස, 29, සාන්ත ලෝරන්ස් පාර, කොළඹ 6 ... | එම | අක්කර 160 ... | අක්කර 50 ක් එළිකර ඇත. |
| එන්. ඒ. වර්ණකුලසිංහම් මහතා, 173, කෙයිසර් විදිය, කොළඹ 11 ... | එම | අක්කර 25 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.7.23 දිනය |
| සීමාසහිත ඩ්‍රාලි (ලංකා) සමාගම, 132, 3 වෙනි හරස් විදිය, කොළඹ 11 ... | එම | අක්කර 25 ... | ඉඩම භාරදෙන ලද්දේ 1967.7.8 දිනය. |
| එස්. සිවලිංගම් මහතා, 116, කුමාරවිදිය, කොළඹ ... ... | ඉඩම දෙනු ලබන ස්ථානය තෝරා නැත | අක්කර 50 ... | — |
| ඩී. පී. ඇලෝසියස් මහතා සහ පිරිස, පරීක්ෂක ඕවර්සියර්, සී.ටී.ඕ. කොළඹ ... | එම | අක්කර 50 ... | — |
| සීමාසහිත ආනන්ද ට්‍රේඩින් සමාගම, 323, 1/1 හා 331, හැව්ලොක් පාර, කොළඹ 6 ... | එම | අක්කර 50 ... | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පරිශිෂ්ටය අංක 2

## සී. පී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් ස්වකීය කථාව පවත්වමින් සභාගත කරන ලද විශේෂ බදුකර යටතේ අය කරන දැව ගාස්තු පිළිබඳ ලේඛනය

### උපලේඛනය

| ගණය | | වර්ගය | කඳ මැදදී වට ප්‍රමාණය අඩි 3ක් සහ ඊට අඩු ලී කඳන් සඳහා අය කරන ගාස්තුව ඝන අඩියකට රු.ශ. | කඳ මැදදී වට ප්‍රමාණය අඩි 3ට වැඩි හා 4ට අඩු ලී කඳන් සඳහා අය කරන ගාස්තුව ඝන අඩියකට රු.ශ. | කඳ මැදදී වට ප්‍රමාණය අඩි 4ට වැඩි ලී කඳන් සඳහා අය කරන ගාස්තුව ඝන අඩියකට රු.ශ. | සැම ප්‍රමාණයකම ඉරාපු ලී සඳහා අය කරන ගාස්තුව ඝන අඩියකට රු.ශ. |
|---|---|---|---|---|---|---|
| විශේෂ | ... | කළුවර, තේක්ක ... ... | 1 0 ... | 8 0 ... | 12 0 ... | 20 0 |
| | | කොස් ... ... | 0 50 ... | 4 0 ... | 8 0 ... | 12 0 |
| | | බුරුත ... ... | — ... | — ... | 4 0 — | |
| I | ... | බුරුත ... ... | 0 75 ... | 3 0 ... | 4 0 — | 6 0 |
| I | ... | හල්මිල්ල, කොහොඹ, නා ... | 0 75 ... | 3 0 ... | 3 0 — | |
| II | ... | අරළු, ගම්මාලු, හුලංහික්, මී, සූරියමාරා, කුඹුක්, මිල්ල, මූනමල්, නෙරළු, පලු, පිහිඹිය, නවැන්න, සියඹලා, හුරිම,රා, උබ්බේරිය, වා, වැවරණ, සහ වන මී ... | 0 50 ... | 2 0 ... | 2 0 ... | 4 0 |
| III | ... | දඹ, දූන්, ඇහැල, හික්, කීරිය, කිරිකොන්, කොලොන්, කෝන්, ලුනුමිදෙල්ල, ගල්සියඹලා, ගුරුකින, හොර, ලියන්, මහදන්, පානක්කා, යකහළු, දූන්, දවු සහ වෙනත් කීන වර්ග ... | 0 40 ... | 1 60 ... | 1 60 ... | 3 20 |
| IV | ... | අලුබෝ, බටදෙඹ, දවට, දියපර, ගොඩ පර, ගොනපනා, කහට, කිරිහෙඹිලිය, රතට්ය ... ... | 0 30 ... | 1 20 ... | 1 20 ... | 2 40 |
| V | ... | අරිද්ද, දවුල්කුරුඳු, දිවුල්, ඇටහෙරලිය, ඇටඹ, හැළඹ, හල්, හන්පලඳ, දුනුමඩල්ල, ගොඩකිරිල්ල, කැටකෑල, පත්කෑල, තම්මැන්න, ඌරුගොඩ සහ වැලිපැන්න | 0 20 ... | 0 80 ... | 0 80 ... | 1 60 |

ඉහත සඳහන් ලැයිස්තුවට ඇතුළත් කොට නොමැති සෑම ලී වර්ගයක් සඳහාම V වැනි ගණයේ ලීවලට අයකරන ගාස්තු ප්‍රමාණයන් අය කරනු ලැබේ.

### දර සහ ලී දඬු

දර—අඩි 3 දිග ප්‍රමාණයට කැපූ, සාමාන්‍යයෙන් විෂ්කම්භය අඟල් 9 නොඉක්මවන කඳේ කොටස් හෝ අතු කැලි රාජ්‍ය භාගය සහ යාරයක් ශත 50 යි.

**I වන ගනයේ ලී දඬු.**—දඬුවේ මුල අඟල් 12 ඉක්මවන, එහෙත් අඟල් 18 නොඉක්මවන ලී දඬු—රාජ්‍ය භාගය එකක් ශත 10 යි.

**II වන ගනයේ ලී දඬු.**—දඬුවේ මුල අඟල් 4 ඉක්මවන, එහෙත් අඟල් 12 නොඉක්මවන ලී දඬු—රාජ්‍ය භාගය එකක් ශත 5 යි.

**III වන ගනයේ ලී දඬු.**—දඬුවේ මුල අඟල් 4 නොඉක්මවන ලී දඬු රාජ්‍ය භාගය එකක් ශත ½ යි. (බුලත් කොවුල්) ලී දඬුවල දිග, ඕනෑම ප්‍රමාණයකින් තිබිය හැකිය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## Appendix No. 2

*List of Royalties on timber chargeable under the Special Leases tabled by Mr. C. P. J. Seneviratne during the course of his speech.*

### SCHEDULE

| *Class* | *Species* | *Rate chargeable for logs 3′ and under in mid-girth per cu. ft.* | *Rate chargeable for logs over 3′ and under 4′ in in mid-girth per cu. ft.* | *Rate chargeable for logs over 4′ in mid-girth per cu. ft.* | *Rate chargeable for sawn timber of all sizes per cu. ft.* |
|---|---|---|---|---|---|
| | | *Rs. c.* | *Rs. c.* | *Rs. c.* | *Rs. c.* |
| Special .. | Ebony, Teak .. .. | 1 0 .. | 8 0 .. | 12 0 .. | 20 0 |
| | Jak .. .. | 50 .. | 4 0 .. | 8 0 .. | 12 0 |
| | Satin .. .. | — .. | — .. | 4 0 } | |
| I .. | Satin .. .. | 75 .. | 3 0 .. | 4 0 } | 6 0 |
| I .. | Halmilla, Kohomba, Na .. | 75 .. | 3 0 .. | 3 0 } | |
| II .. | Aralu, Gammalu, Hulanhik, Mi, Suriyamara, Kumbuk, Milla, Munamal, Neralu, Palu, Pihimbiya, Tawanna, Tamarind, Hurimara, Ubberiya, Wa, Wewarana and Wanami | 50 .. | 2 0 .. | 2 0 .. | 4 0 |
| III .. | Damba, Dun, Ehela, Hik, Keeriya, Kirikon, Kolon, Kon, Lunumidella, Galsiyambala, Gurukina, Hora, Liyan, Mahadan, Panakka, Yakahalu, Dun, Dawu, other Kina(s) .. | 40 .. | 1 60 .. | 1 60 .. | 3 20 |
| IV .. | Alubo, Batadomba, Dawata, Diyapara, Godapara, Gonapana, Kahata, Kirihembiliya, Ratatiya .. .. | 30 .. | 1 20 .. | 1 20 .. | 2 40 |
| V .. | Aridda, Dawulkurundu, Divul, Etaheraliya, Etamba, Helamba, Hal, Hampa'anda, Dunumadalla, Godakirilla, Ketakela, Pathkela, Tammanna, Uruhonda and Welipenna .. | 20 .. | 80 .. | 80 .. | 1 60 |

All species not listed above will be charaed at Class V rates.

### Firewood and Poles

*Firewood.*—Portions of bole or branches billotted into 3′ lengths and generally not more than 9″ in diameter—Royalty 50 cts. a cubic yard.

*Cl. I Poles.*—Poles measuring over 12″ girth and under 18″ girth at the bottom of the Poles—Royalty 10 cts. each.

*Cl. II Poles.*—Poles measuring over 4″ girth and under 12″ girth at the bottom of the Poles—Royalty 5 cts. each.

*Cl. III Poles.*—Poles up to 4″ girth at the bottom of the pole—Royalty ½ cent each. (Betel sticks) Poles can be of any length.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## House of Representatives

**1968 මාර්තු මස 24 වන ඉරිදා**

ஞாயிற்றுக்கிழமை, 24 மாச் 1968

*Sunday, 24th March 1968*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at* 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

நிலையியற் கட்டளை இல. 51(4) இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

### REPORTS PRESENTED UNDER STANDING ORDER No. 51 (4)

Report on the Bill intituled "An Act to incorporate the Wildlife Protection Society of Ceylon."—[*The Hon. E. L. B. Hurulle, Minister of Communications, on behalf of the Minister of State.*]

**පනත් කෙටුම්පත 1968 මාර්තු 25 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.**

மசோதா, 1968 மாச் 25 திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

*Bill ordered to be read a Second time upon Monday, 25th March 1968.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

**හස්ත කර්මාන්ත පරීක්ෂකවරු (යාන්ත්‍රික)**

கைப்பணிப் பரிசோதகர் (எந்திர நுட்பம்)

**INSPECTORS OF HANDICRAFTS (MECHANICAL)**

3. බී. වයි. තුඩාවේ මයා. (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967 සහ 1968 යන අවුරුදුවලදී හස්ත කර්මාන්ත පරීක්ෂකවරු (යාන්ත්‍රික) කී දෙනෙක් අලුතින් සේවයට බඳවා ගනු ලැබුවෝද? (ආ) ඔවුන්ගේ නම්, ලිපිනය සහ සුදුසුකම් මොනවාද? (ඉ) මෙම තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවන ලද්දේ කවර සුදුසුකම් ඇත්තවුන්ගෙන්ද? (ඊ) කාර්මික ගුරු සහතිකය දරන්නවුන්ගෙන් කී දෙනෙක් පරීක්ෂකවරුන් වශයෙන් බඳවා ගනු ලැබ සිටිත්ද? (උ) එසේ බඳවා ගෙන නැත්නම් එයට හේතු කවරේද?

*கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1967, 1968 ஆம் ஆண்டுகளில் கைப்பணிப் பரிசோதகர் (எந்திர நுட்பம்) எத்தனை பேர் புதிதாக நியமிக்கப்பட்டனர்? (ஆ) அவர்களுடைய பெயர்கள், முகவரிகள், தகைமைகள் யாவை? (இ) இவ் வுத்தியோகத்தர்களுக்கு மனுச்செய்பவர்கள் இருக்க வேண்டியதாகக் கூறப்பட்டிருந்த தகைமைகள் யாவை? (ஈ) கைத்தொழில் ஆசிரியர் சான்றிதழ் பெற்றிருந்தவர்களில் எத்தனைபேர் பரிசோதகராகத் தெரிவுசெய்யப்பட்டுள்ளனர்? (உ) எவரும் தெரிவு செய்யப்பட்டிலரெனில், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) In the years 1967 and 1968, how many Inspectors of Handicrafts (Mechanical) were were newly recruited? (*b*) what are their names, addresses and qualifications? (*c*) What were the qualifications that applicants to hese posts were required to possess? (*d*) How

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

many of those who held the Industrial Teachers' Certificate have been recruited as Inspectors? (*e*) If so such recruitments have been made, why?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) හත් දෙනෙකි. (ආ) පිළිතුර වශයෙන් තිබෙන්නේ දිග ලැයිස්තුවක් නිසා මම එය සභාගත කරමි.* (ඉ) අවශ්‍ය සුදුසුකම් මෙසේය: (i) දැනට රජයේ සේවයෙහි යෙදී නැත්නම් 1967.3.22 වැනි දිනට වයස අවු. 23 ට නොඅඩු බව සහ අවුරුදු 40 ට නොවැඩි බවටද, (ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට ඉහල විභාගයකින් සමත් වූ බවටද, (iii) වෘත්තීය පුහුණුවූ ගුරු සහතික පත්‍රය හෝ හස්ත කර්මාන්ත (ලී වැඩ, ලෝහ වැඩ) ගුරු සහතික පත්‍ර හෝ මහරගම රජයේ ගුරු විද්‍යාලයේ ලී වැඩ හෝ ලෝහ වැඩ පිළිබඳව විශේෂ පුහුණුවක් ලත් ද්විතීයික පුහුණු සහතික පත්‍රය දරණ බවටද, (iv) හස්ත කර්මාන්ත ඉගැන්වීමෙහි තුන් අවුරුදු කාලයක පළපුරුද්දක් ඇති බවටද, සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. (ඊ) කිසිවෙක් නැත. (උ) පත්වීම් සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් සියලු දෙනාම කාර්මික ගුරු සහතිකයට වඩා උසස් සහතික ලබා තිබීම.

***සභාමේසය මත තබන ලද ලැයිස්තුව මෙසේ යි :**

| | සුදුසුකම් |
|---|---|
| (ආ) (1) වයි. එම්. ගුණපාල යාපා මහතා, බණ්ඩාරවෙල මහා විද්‍යාලය බණ්ඩාරවෙල | 1. ද්විතීය පුහුණු ගුරු සහතිකය ලි වැඩ හා ලෝහ වැඩ<br>2. චිත්‍රකර්ම ගුරු සහතිකය (ඉංග්‍රීසි)<br>3. චිත්‍රකර්ම ගුරු සහතිකය පොලිටෙක්නික්<br>4. ජ්‍යෙෂ්ඨ සහතිකය (විද්‍යා) |
| (2) ඩී. ජේ. ඉඩිප්පිලි මහතා, මධ්‍ය මහා විද්‍යාලය තෙලිජ්ජවිල | 1. වෘත්තීය පුහුණු ගුරු සහතිකය I පෙළ<br>2. ලංඩන් මැට්‍රික් විභාගය |
| (3) ඩී. පී. ද සිල්වා මහතා, කිංස්වුඩ් මහා විද්‍යාලය මහනුවර | 1. ද්විතීය පුහුණු ගුරු සහතිකය ලි වැඩ හා හා ලෝහ වැඩ<br>අ. පො. ස. (උසස් පෙළ) |
| (4) ඩබ්. ආර්. ඇස්. ඇම්. ආර්. හිග්ගොඩ,/කැබොස්සැල්ල මහා විද්‍යාලය, බොස්සැල්ල | 1. වෘත්තීය පුහුණු ගුරු සහතිකය (යාන්ත්‍රික)<br>2. ජ්‍යෙෂ්ඨ සහතිකය (ඉංග්‍රීසි) |
| (5) ආර්. සී. පී. පී. වීරසූරිය මහතා, කෑ/අලව්ව මහා විද්‍යාලය, අලව්ව | 1. ද්වීතීය පුහුණු ගුරු සහතිකය (ලී වැඩ හා ලෝහ වැඩ)<br>2. ජ්‍යෙෂ්ඨ සහතිකය (ඉංග්‍රීසි) |
| (6) බී. ඒ. කේ. විජේවර්ධන මහතා මහ/ගලගෙදර මහා විද්‍යාලය ගලගෙදර | 1. ද්විතීය පුහුණු ගුරු සහතිකය (හස්තකර්මාන්ත<br>2. අ. පො. ස. (උසස් පෙළ)<br>3. ජ්‍යෙෂ්ඨ සහතිකය (සිංහල)<br>4. ජ්‍යෙෂ්ඨ සහතිකය (ඉංග්‍රීසි) |
| (7) ඊ. වී. රාමනාදන් මහතා, ය/අර්ලාලෙයි මහා විද්‍යාලය චුනාකම් | 1. ද්විතීය පුහුණු ගුරු සහතිකය (යාන්ත්‍රික)<br>2. ලංඩන් මැට්‍රික් විභාගය |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

කාර්මික ගුරු සහතිකය ලබාගෙන කාලයක් තිස්සේ වැඩ කර සිටින ගුරුවරුන් අනෙකුත් අයට වඩා විශේෂ සුදුසුකමක් තිබෙන උදවියය කියන එක ගරු ඇමතිතුමා පිළිගන්නවාද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
**(Mr. Jayasuriya)**

ගරු මන්ත්‍රීතුමා කරුණා කර ඒ ප්‍රශ්නය නැවතත් කියන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**

මා කිව්වේ මෙහෙමයි. කාර්මික ගුරු සහතික පත්‍රය ලබාගෙන යම් කෙනෙක් කාලයක් තිස්සේ ගුරුවරුන් හැටියට වැඩ කට යුතු කිරීමෙන් පුහුණුවක් ලබා සිටිනවා නම් ඒ අය පරීක්ෂකවරුන් හැටියට වඩාත් සුදුස්සන් බව ගරු ඇමතිතුමා පිළිගන්නවාද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
**(Mr. Jayasuriya)**

සමහර විට එය සුදුසුකමක් වෙන්නට පුළුවන් නමුත් සමහර අය ඊටත් වඩා සුදුසුකම් තිබෙන අය වෙන්නට පුළුවනි.

**ගැටහැත්ත-කරඳන කීනගහවිල පාර**

கெட்டஹெத்த—கரந்தனை கினநாவிலப் பாதை

**GETAHETHA-KARANDENA KEENAGAHAWILA ROAD**

7. පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) සපරගමුවේ අවිස්සාවේල්ලේ ගැටහැත්ත කරඳන කීනගහවිල පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාරක් බවත් ; (ii මෙම පාරේ එක්තරා කොටසක් වැවිල රබර් වත්තට පුද්ගලික අයිතියක් තිබෙන කොටසක් බව වර්ෂ 1956 එළිදරව්වූ බවත් ; (iii) එම කරුණ හේතුකොට ගෙන එවකට කිරිඇල්ල ආසනය නියෝජනය කළ මන්ත්‍රීවරියත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාත් එකී පාරේ වැවිල රබර් වත්තට අයත් පුද්ගලික කොටසක් රජයට පවරා ගැනීමට නිර්දේශ කළ බව සහ පවරා ගැනීමේ ආඥා පත්‍රයක් පවා රජයෙන් නිකුත් කළ බවත් ; (iv) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ මුල් තීරණයට පටහැනිව වෙනත් මඟකින් මෙම පාර සකස් කිරීමට දැන් සූදානමක් තිබෙන බවත් ; (v) එකී දෙවන යෝජනාව දෙපාර්තමේන්තුවේ මුල් නිර්දේශය තරම් සුදුසු නොවන බවත් ; (vi) මෙම හේතුව නිසා මෙකී පැවරීම්ම වර්ෂ 1956 සිට අද දක්වා අත පසු වන බවත් ; එතුමා දන්නවාද ? (ආ) දෙපාර්තමේන්තුවේ මුල් නිගමනය උඩ පාර පවරා දුන්නොත් ගම්වැසියන් ශ්‍රමදාන මාර්ගයෙන් එය සකස් කිරීමට පොරොන්දුවී තිබෙන බැවින් අප්‍රමාදව පාර දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට එතුමා ක්‍රියා කරණවාද ?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) சபரகமுவையிலுள்ள அவிசாவலை கெட்டஹெத்த கரந்தனை கினகாவிலப் பாதை அரசாங்கக் கட்டுவேலைத் திணைக்களத்திற்குரிய பாதையென்பதையும்; (ii) இப்பாதையின் ஒரு பிரிவு வேவில றப்பர் தோட்டத்தின் தனிப்பட்ட உரிமையுள்ள பாதையென்பது 1956 ஆம் ஆண்டு தெரியவந்ததென்பதையும் (iii) இதனை முன்னிட்டு, அப்பொழுது கிரியெல்லைத் தேர்தல் தொகுதியைப் பிரதிநிதித்துவம் வகித்த பெண் உறுப்பினரும், அரசாங்கக் கட்டுவேலைத் திணைக்கள நெறியாளரும் மேற்கூறிய பாதையின் வேவில றப்பர்த் தோட்டத்துக்குச் சொந்தமான பிரிவை அரசாங்கத்துக்குச் சுவீகரித்துக்கொள்ள வேண்டுமெனச் சிபார்சு செய்ததென்பதையும், சுவீகரிப்புக்கட்டளைப் பத்திரத்தையும் அரசாங்கம் வெளியிட்டதென்பதையும் அவர் அறிவாரா? (iv) அரசாங்கக் கட்டுவேலைத் திணைக்களத்தின் முன்னைய முடிவுக்கெதிராக வேறுவழியில் இப்பாதையை அமைப்பதற்கு இப்பொழுது ஆயத்தஞ் செய்யப்படுவதையும்; (v) மேலே கூறிய இரண்டாவது தீர்மானம் இத்திணைக்களத்தின் முன்னைய தீர்மானத்தைப் போன்ற தகுதியுடையதன்று என்பதையும்; (vi) இக்காரணத்தினால் சுவீகரிப்புவேலை 1956 ஆம் ஆண்டிலிருந்து பின்போடப்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. විජයසුන්දර මයා.]

பட்டுள்ளதென்பதையும் அவர் அறிவாரா? (ஆ) இத்திணைக்களத்தின் முதலாவது முடிவின்படி பாதையைச் சுவீகரித்தல் கிராம மக்கள் சிரமதான முறையில் அதனைச் சீர் செய்வதற்கு ஒத்துக்கொண்டுள்ளமையால் காலதாமதமின்றிப் பாதையைத் திணைக்களத்திற்குப் பெற்றுக்கொள்ள அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) Is he aware that—(i) the Avissawella Getahetha-Karandena Keenagahavila road in Sabaragamuwa is a P. W. D. road; (ii) the fact emerged in 1956 that a portion of this road is a private road belonging to the Wevila Rubber Estate; (iii) as a result the then lady Member of Kiriella and the Director of Public Works recommended the acquisition of this section of private roadway and that the notice of acquisition was in fact published by the Government; (iv) steps are now being taken contrary to this recommendation to construct diversion to this roadway; (v) this decision is not as suitable as the earlier one; (vi) as a result acquisition proceedings have been stayed since 1956? (b) Will he take action to acquire this road without delay since the villagers had stated that they would improve it by means of Shramadana in case it is acquired in terms of the original decision?

**එම්. එම්. මුස්තාෆා මයා. (සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—රජයේ වැඩ තැපැල් හා විදුලි සන්දේශ ඇමති වෙනුවට)**

*(ஜனாப் எம். எம். முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*

(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(a) (i) No—The Avissawella-Getahetta-Karandana P. W. D. road does not extend to Keergahawila. (ii) Yes. (iii) Yes—Acquisition proceedings were taken up on a trace accepted by the Public Works Department. (iv) Yes. (v) No. The present proposal is found to be more favourable than the original trace as the distance to be connected is much shorter and would involve lesser expenditure. (vi) Yes. (b) No offer of shramadana service has been offered either to this Ministry or the Department of Public Works. Acquisition in respect of the new proposal will, however, be taken up.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 10.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් දෙන මෙන් කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා වෙනු වෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 11.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Since a good deal of particulars have to be obtained, I ask for further time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## " ක්ෂණික තේ "

" உடன் தேநீர் "

### INSTANT TEA

12. **ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)

*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*

(Mr. R. J. G. de Mel—Devinuwara)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) එතුමා හෝ තේ පාලකතැන හෝ තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ "' ක්ෂණික තේ " ව්‍යාපාරය බැලීමට ගොස් තිබේද? (ආ) තේ පර්යේෂණ ආයතනයේ වෙනයම් නිළධාරියකු " ක්ෂණික තේ " ව්‍යාපාරය බැලීමට ගොස් තිබේද? (ඉ) තේ කර්මාන්තයට යම්කිසි සම්බන්ධකමක් හෝ ඒ පිළිබඳ කිසියම් දැනීමක් හෝ තිබෙන කිසියම් ලාංකිකයකුට "' ක්ෂණික තේ " ව්‍යාපාරය බැලීමට ඉඩදී තිබේද? (ඊ) නොඑසේ නම්, ඒ මන්ද? (උ) ' ක්ෂණික තේ ' ව්‍යාපාරයේ වර්තමාන තත්වය පිරික්සා බැලීමට එතුමා වහාම පියවර ගන්නවාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද? (එ) ' ක්ෂණික තේ ' ව්‍යාපාරයේ වර්තමාන තත්ත්වය පිළිබඳව එතුමා මන්ත්‍රී මණ්ඩලයට විස්තරාත්මක ප්‍රකාශයක් කරනවාද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா : (அ) அவர் அல்லது தேயிலைக் கட்டுப்பாட்டதிகாரி அல்லது தேயிலை ஆராய்ச்சித் தாபன அதிபதி " உடன் தேநீர் " திட்டத்தைப் பார்த்துள்ளனரா? (ஆ) தேயிலை ஆராய்ச்சித் தாபனத்தின் வேறு உத்தியோகத்தர் யாராவது " உடன் தேநீர் " திட்டத்தைப் பார்த்துள்ளனரா? (இ) தேயிலைக் கைத்தொழிலுடன் ஏதாவது சம்பந்தமுள்ள அல்லது அதுபற்றிய அறிவுள்ள இலங்கையர் எவரேனும் யாராவது " உடன் தேநீர் " திட்டத்துக்குச் செல்ல அனுமதிக்கப்பட்டாரா? (ஈ) அன்றேல், ஏன்? (உ) " உடன் தேநீர் " திட்டத்தின் தற்போதைய நிலையை ஆராய்வதற்கு அவர் உடனடியாக நடவடிக்கை எடுப்பாரா? (ஊ) அன்றேல், ஏன்? (எ) " உடன் தேநீர் " திட்டம் சம்பந்தமான தற்போதைய நிலை பற்றி விரிவான அறிக்கையொன்றை அவர் இச்சபையில் விடுப்பாரா?*

asked the Minister of Agriculture and Food: (*a*) Has he or the Tea Controller or the Director, T. R. I., visited the 'Instant Tea' project? (*b*) Has any other officer of the T. R. I. visited the 'Instant Tea'; project? (*c*) Has any Ceylonese with any connection or knowledge of the tea industry been allowed access to the 'Instant Tea' project? (*d*) If not, why? (*e*) Will he take immediate steps to investigate the present position of the 'Instant Tea' project? (*f*) If not, why? (*g*) Will he make a detailed statement to the House of the present position regarding the 'Instant Tea' project?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට)**

*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—விவசாய, உணவு அமைச்சர் சார்பாக)*

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance—on behalf of the Minister of Agriculture and Food)

(අ) හා (ආ) කලින සිටි වාණිජ හා වෙළඳ ඇමති තුමාත්, තේ පාලකත් කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේත් වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයෙත් නිලධාරීනුත් අගරපතනේ ඉදිකර තිබෙන " ක්ෂණික තේ " කර්මාන්තශාලාව බැලීමට ගොස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. විමලසේන මයා.]
තිබේ. තේ පර්යේෂණායතනයේ වර්තමාන අධ්‍යක්ෂ ක්ෂණික තේ කර්මාන්ත ශාලාව නරඹා නොමැත. එහෙත් ඔහුට පෙර සිටි තෙ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂත් තේ පර්යේෂණායතනයේ අනිකුත් නිලධාරීනුත් එහි ගොස් තිබේ. (ඉ) හා (ඊ) අවශ්‍යතාවයක් පැන නොනගී. (උ) සීමාසහිත සිටි සමාගම මේ සම්බන්ධයෙන් ලබන ප්‍රගතිය අමාත්‍යාංශය විසින් නිතර නිතර සළකා බලනු ලැබ්. (ඌ) මෙබන්දක් පැන නොනගී. (එ) ඉන්දියාවේ සහ නැගෙනහිර අප්‍රිකාවේ ක්ෂණික තේ නිෂ්පාදනය කරන සමාගම් එම රටවල් දෙකේ ක්ෂණික තේ නිෂ්පාදනය හා අළෙවි කිරීම පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය නොකරයි. එබැවින් ලංකාවේ "ක්ෂණික තේ" කමර්ාන්තය පිළිබඳ කිසිදු තොරතුරක් අනාවරණය කිරීම නුවණට හුරු නැත. එසේ වුවද, යම් මන්ත්‍රීවරයෙක් විසින් විශේෂ කරුණක් මතු කළහොත් ඒ ගැන පරීක්ෂා කිරීමට කට යුතු පිළියෙල කරන්නෙමි.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
**(Mr. de Mel)**

අතුරු ප්‍රශ්නයක් අහන්න කැමතියි. ඉන්දියාවේත්, නැගෙනහිර අප්‍රිකාවේත් ක්ෂණික තේ ව්‍යාපාරය වාණිජමය කර්මාන්තයක් හැටියට ආරම්භ කර තිබ් යදී, ඒ පිළිබඳව මූලික වශයෙන් පර්යේෂණ කටයුතු කළ ලංකාවේ ක්ෂණික තේ කර්මාන්ත ශාලාවක් අද වන තුරු ඇති නොකිරීමට හේතු මොනවා දැයි දැන ගන්න කැමතියි.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
**(Mr. Wimalasena)**

එය තවමත් ගෙන යන්නේ, පර්යේෂණ ආයතනයක් විධියට මිස කර්මාන්ත ශාලාවක් හැටියට නොවෙයි.

**සෝවියට් රුසියාවේ පැට්රිස් ලුමුම්බා මිත්‍රතා විශ්ව විද්‍යාලයේ උපාධි**

*ஐ. சோ. ச. கு. பற்றிக் லுமும்பா நட்புப் பல்கலைக் கழக பட்டங்கள்*

**DEGREES OF PATRICE LUMUMBA FRIENDSHIP UNIVERSITY, U.S.S.R.**

1. **තුඩාවේ මයා.** (පී. ජී. බී. කෙනමන් මයා.—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)
*(திரு. துடாவ—திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர் சார்பாக)*
**(Mr. Tudawe—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)**

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ පැට්රිස් ලුමුම්බා මිත්‍රතා විශ්ව විද්‍යාලය විසින් ලාංකිකයින්ට ප්‍රදානය කරනු ලබන උපාධි, රැකී රක්ෂා දීම සඳහා රජයේ සියලුම දෙපාර්තමේන්තු විසින්ද සියලුම නීතිගත සංසථා විසින්ද පිළිගනු ලැබේද? (ආ) එසේ නම්, ඒ බව සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ද සියලුම නීතිගත සංසථාවල සභාපතිවරුන්ට ද දැන්වීමට එතුමා වග බලා ගන්නවා ද? (ඉ) නොඑසේ නම්, (i) ඉහත කී උපාධි නොපිළි ගන්නේ කවර දෙපාර්තමේන්තු හා කවර සංසථාද යන බව හා ඒ මක්නිසාද යන බවත්, එමෙන් ම, (ii) තමන් උපාධි නොපිළි ගන්නා විශ්ව විද්‍යාලයක ශිෂ්‍යත්ව සඳහාත් එම ශිෂ්‍යත්ව සඳහා ශිෂ්‍යයින් තේරීම හා යැවීම සඳහාත් දැන්වීම් පළ කිරීම රජය විසින් තවදුරටත් කර ගෙන යනු ලබන්නේ මක්නිසාද යන බවත් එතුමා සඳහන් කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஐக்கிய சோவியத் சமவுடைமைக் குடியரசின் பற்றிக் லுமும்பா நட்புப் பல்கலைக்கழகம் இலங்கையர்கட்கு வழங்கும் பட்டங்களைத் தொழில் வசதி நோக்கத்திற்காக அரசாங்கத் திணைக்களங்கள் அனைத்தும் சட்ட உருவாக்கம் பெற்ற கூட்டுத்தாபனங்கள் அனைத்தும் அங்கீகரிக்கின்றனவா? (ஆ) அங்ஙனமாயின், இதுபற்றித் திணைக்கள அதிபர்கள் அனைவருக்கும் மேற்கூறிய கூட்டுத்தாபனத் தலைவர்கள் அனைவருக்கும் அவர் அறிவிப்பாரா? (இ) அன்றேல், (i) எத்திணைக்களங்களும் எக் கூட்டுத்தாபனங்களும் இப்பட்டங்களை அங்கீ*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கரிப்பதில்லையென்பதையும், ஏனென்பதையும்; (ii) எப்பல்கலைக்கழகப் பட்டங்களை அரசாங்கம் அங்கீகரிப்பதில்லையோ அப்பல்கலைக் கழகத்தில் உதவிச் சம்பளத்தில் கற்பதற்கெனத் தொடர்ந்து விளம்பரப்படுத்தப்பட்டு மாணவர்கள் தேர்ந்தெடுக்கப்பட்டு அனுப்பப்படுவது ஏனென்பதையும் அவர் தெரிவிப்பாரா?

asked the Minister of Finance: (*a*) Are degrees awarded by the Patrice Lumumba Friendship University of the U.S.S.R. to Ceylonese reorganised for the purposes of employment by all Departments of the Government and by all statutory Corporations? (*b*) If so, will he see that all Heads of Departments and all Chairmen of statutory Corporations are so informed? (*c*) If not, will he state—(i) by which Departments and Corporations such degrees are not recognised and why; and (ii) Why the Government continues to advertise scholarships and to select and despatch students to a university whose degrees it does not recognise?

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

(*a*) The National Council of Higher Education has not recognized as yet the degrees awarded by the Patrice Lumumba Friendship University of the U. S. S. R. The National Council of Higher Education has called for necessary particulars in order to take a decision on the matter. They have not received the information called for as yet. The P. S. C. has accepted applications from graduates of this university. As regards medical graduates, I am advised that holders of medical degrees who have not been recognized in Ceylon should first pass a special examination before registration for purpose of doing the internship with a view to their full registration. Medical graduates from the Patrice Lumumba University of the U. S. S. R. may accordingly apply to the Registrar, Ceylon Medical Council for registration according to these terms. (*b*) Formal recognition of the degrees awarded by the Patrice Lumumba Friendship University of the U. S. S. R. to Ceylonese will henceforth require recognition by the National Council of Higher Education. Such recognition is to be expedited once the data called for by the National Council of Higher Education is made available. Recognition of Medical degrees is by the Registrar of Ceylon Medical Council, Colombo, and should follow the procedure indicated at (*a*) above. (*c*) (i) Vide (*a*) and (*b*). (ii) Scholarships to this university are normally advertised by the Ministry of Education and Cultural Affairs and I am informed that the number of students seeking higher education in Ceylon is proportionately greater than the facilities available locally. These scholarships are offered voluntarily by the U. S. S. R. just as in the case of other countries. Hence, it is considered fair to give an opportunity, to those students who seek higher education, to avail themselves of these facilities. In these circumstances, these scholarships continue to be advertised.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් ඇසීමට තිබෙනවා. මේ ලුමුම්බා මිත්‍රත්ව විශ්ව විද්‍යාලයේ ඉගෙනීම ලබාගෙන එන ශිෂ්‍යයින්ගේ උපාධි පිළිගැනීමට උසස් අධ්‍යාපන සභාව මගින් අවශ්‍ය කටයුතු සම්පූර්ණ කර එම උපාධි පිළිගැනීමට ඉක්මණින් ක්‍රියා කරනවාද කියා මා අහනවා.

**විමලසේන මයා.**
(திரு. விமலசேன)
(Mr. Wimalasena)

කිසි අනුමානයක් නැහැ. ඉක්මණින්ම අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු ශු. බී. වන්නිනායක (මුදල් ඇමති)**
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

ඕකේ අහන්නත් දෙයක්යැ!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යාපනය, අනුරාධපුරය ආදී දිස්ත්‍රික්කවල ඉඩම් ව්‍යාපාර**

*யாழ்ப்பாணம், அனுராதபுரம் ஆகிய இடங்களில் காணித்திட்டங்கள்*

**LAND SCHEMES IN JAFFNA, ANURADHAPURA, ETC.**

2. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)—(කේ. බී. රත්නායක මයා.—අනුරාධපුර—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. K. B. Ratnayake—Anuradhapura)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (i) යාපනය (ii) අනුරාධපුර (iii) කුරුණෑගල (iv) මහනුවර (v) මඩකලපුව (vi) ගාල්ල (vii) පොළොන්නරුව සහ (viii) කොළඹ යන දිස්ත්‍රික්ක පිළිබඳ පහත සඳහන් විස්තර එතුමා සඳහන් කරනවාද? (i) විශාල ජනපද ව්‍යාපාර, සංඛ්‍යාව, ඒවායේ නම් හා ඒ එක එක ජනපද ව්‍යාපාරයෙහි සිටින ජනපද වාසීන්ගේ සංඛ්‍යාව ; (ii) ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර සංඛ්‍යාව හා ඒ එක එක ව්‍යාපාරයෙහි තිබෙන ඉඩම් කට්ටි සංඛ්‍යාව ; (iii) එක එක දිස්ත්‍රික්කයෙහි බලහත්කාරයෙන් පදිංචිවීම් සංඛ්‍යාව ; (iv) දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරීන් සංඛ්‍යාව සහ එක එක දිස්ත්‍රික්කයට සම්බන්ධ ඉඩම් නිලධාරීන් සංඛ්‍යාව.

*காணி, நீர்ப்பாசன, மின்சக்தி அமைச்சரைக் கேட்ட வினு : (i) யாழ்ப்பாணம், (ii) அனுராதபுரம், (iii) குருநாக்கல், (iv) கண்டி, (v) மட்டக்களப்பு, (vi) காலி, (vii) பொலநறுவை, (viii) கொழும்பு ஆகிய மாவட்டங்கள் சம்பந்தமாக (i) பெருங்குடியேற்றத் திட்டங்களின் எண்ணிக்கை, அவற்றின் பெயர்கள் ஒவ்வொரு திட்டத்திலுள்ள குடியேற்றக்காரரின் எண்ணிக்கை ; (ii) கிராம விஸ்தரிப்புத் திட்டங்களின் எண்ணிக்கையும் ஒவ்வொரு திட்டத்திலும் ஒதுக்கப்பட்டுள்ள காணித்துண்டுகளின் எண்ணிக்கையும் ; (iii) ஒவ்வொரு மாவட்டத்திலும் அத்துமீறப்பட்ட மாவட்டத்திலுமுள்ள மாவட்ட காணி உத்தியோகத்தர்களினதும் காணி உத்தியோகத்தர்களினதும் எண்ணிக்கை ஆகிய தகவல்களை அவர் தருவாரா ?*

asked the Minister of Land, Irrigation and Power: Will he give the following information: (i) the number of major colonization schemes, their names and the number of colonists in each scheme; (ii) the number of Village Expansion Schemes and the number of allotments in each scheme; (iii) the number of encroachments in each District; (iv) the number of District Land Officers and Land Officers attached to each District; in respect of the following Districts—(i) Jaffna, (ii) Anuradhapura, (iii) Kurunegala, (iv) Kandy, (v) Batticaloa, (vi) Galle, (vii) Polonnaruwa and (viii) Colombo?

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

ගරු කථානායකතුමනි, මේ පිළිතුර ඉතා දීර්ඝ එකක් නිසා එය සභාවට ඉදිරිපත් කරනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The Answer will be kept in the Library and will be available to hon. Members for perusal. It is too long to be included in HANSARD.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු කථානායකතුමනි, පුස්තකාලයේ එක පිටපතක් තැබීමෙන් අපි දෙතුන් දෙනකුට එකවර බලාගැනීමට ඕනෑ වුණොත් අපහසු තත්ත්වයක් ඇති වන නිසා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරනවාද ?

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
පුස්තකාලයේ තිබෙන විට ඕනෑ කෙනෙකුට බලාගන්නට පුළුවන්.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
එහෙනම් ප්‍රශ්නය ඇසූ මන්ත්‍රීවරයාට එක පිටපතක් යවන්නය කියා මා ඉල්ලනවා.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
A copy will be given to the Member.

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
හැම මන්ත්‍රීවරයකුටම පිටපත බැගින් දෙන්නට කටයුතු කරනවාද කියා මා අහනවා.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ඒක කරන්න බැහැ.

Has any hon. Member been authorized to ask Question No. 4 ?

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු සී. පී. ද සිල්වා—වාණිජ හා වෙළඳ ඇමති වෙනුවට)
*(கௌரவ சி. பீ. டி சில்வா—வர்த்தக, வியாபார அமைச்சர் சார்பாக)*
(The Hon. C. P. de Silva—on behalf of the Minister of Commerce and Trade)
ඒ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට සති දෙකක් කල් ඉල්ලා තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)
පරණ දෙයක්නේ. හොයන්න අමාරුයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Anybody authorized to ask Question No. 5 ?

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
මම ඒ ප්‍රශ්නය අහනවා.

ජයසූරිය මයා.
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට සති 3 ක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව : හාස් ලැමිනේටන යන්ත්‍රය

தேசியப் பொதுச் சுவடித் திணைக்களம் : " ஹாஸ் " அடுக்குத்தகடிடும் இயந்திரம்

### DEPARTMENT OF NATIONAL ARCHIVES : HASS LAMINATING MACHINE

6. තුඩාවේ මයා. (පී. ජී. බී. කෙනමන් මයා.—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)

(திரு. துடாவ—திரு. பி. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர் சார்பாக)

(Mr. Tudawe—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

රාජ්‍ය කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව හාස් ලැමිනේටන යන්ත්‍රයක් මිළදී ගත්තේ කවදාද ? (ආ) මෙම මිළදී ගැනීම නිර්දේශ කළේ කවරහුද ? එය මිළදී ගැනීමට පෙර විශෙෂඥ උපදෙස් ඉල්ලා සිටියේද ? නොඑසේ නම්, ඒ මන්ද ? මෙම මිළදී ගැනීම කරන ලද්දේ රජයේ බඩු ගබඩාව මාර්ගයෙන්ද ? (ඉ) මෙම යන්ත්‍රය මිළදී ගැනීම සඳහා රජයට කීයක් වියදම් වීද ? (ඊ) මෙම යන්ත්‍රය පුස්කොළ ලිපි හා සච්කොළ හෝ සේද හෝ ඒකාබද්ධ කරන ලද කඩදාසිවල ලියැවුනු ලිපි ද ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නුසුදුසුයැයි ඒත්තු ගොස් තිබෙන බව එතුමා දන්නවාද ? (උ) මෙම යන්ත්‍රයෙන් කිසියම් ප්‍රයෝජනයක් ගනු ලැබේ නම්, ඒ කිනම් ප්‍රයෝජනයක්ද ?

இராஜாங்க அமைச்சரைக் கேட்ட வினா : (அ) தேசியப் பொதுச் சுவடித் திணைக்களத்தினர் " ஹாஸ் " அடுக்குத்தகடிடும் இயந்திரத்தை எப்பொழுது கொள்வனவு செய்தனர் ? (ஆ) இக்கொள்வனவை யார் சிபார்சு செய்தவர் என்பதையும் ; கொள்வனவிற்கு முன் சிறப்பியலாளரின் ஆலோசனையேதும் கோரினரா, இன்றேல் ஏன் என்பதையும் ; கொள்வனவு அரசாங்கக் களஞ்சியத் திணைக்கள மூலமாகவா செய்யப்பட்டது என்பதையும் அவர் கூறுவாரா ? (இ) இவ்வியந்திரம் சம்பந்தமாக அரசாங்கத்திற்கு எவ்வளவு பணம் செலவானது ? (ஈ) ஓலைச்சுவடிகளையும், இழையம், பட்டு முதலானவை இணைக்கப்பட்ட காகிதச் சுவடிகளையும் பழுது பார்ப்பதற்கு இவ்வியந்திரம் ஏற்றதல்ல என்று காணப்பட்டதை அவர் அறிவாரா ? (உ) இவ்வியந்திரம் இப்போது எதற்கேனும் உபயோகப்படுத்தப்படுகிறதெனில், அந்த உபயோகம் என்ன என்பதை அவர் கூறுவாரா ?

asked the Minister of State : (*a*) When did the Department of National Archives purchase a Hass laminating machine ? (*b*) Who recommended this purchase ; was specialist advice sought prior to purchase and if not, why ; and was the purchase made through the Government Stores ? (*c*) What was the cost to Government of this machine ? (*d*) Is he aware that this machine has been found unsuitable for the repair of Ola manuscripts and of documents on paper incorporated with tissue or silk ? (*e*) To what use, if any, is this machine now put ?

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

(*a*) In November 1964 by the Government Archives Department (now known as the Department of National Archives). (*b*) The Government Archivist. No other expert advice has been considered necessary. Yes. (*c*) The total cost was Rs. 14,252.88. (*d*) The machine was not intended for the repair of such items. (*e*) It is being used for the purpose it was imported viz. for the repair of paper documents in a fragile state and for newspapers.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Question No. 8.

ද සොයිසා සිරිවර්ධන මයා.

(திரு. டி சொய்ஸா சிறிவர்தன)

(Mr. de Zoysa Siriwardena)

මම ඒ ප්‍රශ්නය අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ප්‍රශ්නයට පිළිතුරු දීමට සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**විවේකානන්ද මහා විද්‍යාලය, කොළඹ**

விவேகானந்த மகா வித்தியாலயம், கொழும்பு

**VIVEKANANDA MAHA VIDYALAYA, COLOMBO**

9. තුඩාවේ මයා. (කෙනමන් මයා. වෙනුවට)
(திரு. துடாவ—திரு. கெனமன் சார்பாக)
(Mr. Tudawe—on behalf of Mr. Keuneman)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ C/විවේකානන්ද මහා විද්‍යාලයේ තත්ත්වය පහත් කිරීමට ගත් තීරණයට විරුද්ධ ව එම මහා විද්‍යාලයේ ගුරු දෙගුරු සංගම යෙන් ඉදිරිපත් කරන ලද ලියවිල්ලක් අධ්‍යාපන අධ්‍යක්ෂතැනට ලැබී තිබේද? (ආ) මෙම ගුරු දෙගුරු සංගමයේ ඉල්ලීමට එතුමා ඉඩ දෙනවාද? නො එසේ නම්, මන්ද?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு கொ/விவேகானந்த மகா வித்தியாலயப் பெற்றோர்—ஆசிரியர் சங்கத்திடமிருந்து இப்பாடசாலையின் தரத்தைக் குறைப்பதற்கான முடிவை எதிர்க்கும் கண்டனத்தைக் கல்வி அதிபர் பெற்றுள்ளாரா? (ஆ) பெற்றோர்—ஆசிரியர் சங்கத்தின் இக்கோரிக்கையை அவர் வழங்குவாரா? அன்றேல், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Has the Director of Education received a protest from the Parent-Teachers Association of C/Vivekananda Maha Vidyalaya, Colombo, against the decision to degrade the status of this school? (*b*) Will he grant the request made by this P. T. A.; and if not, why?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
(අ) එසේය. (ආ) ඉල්ලීම ඉටු කර ඇත.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දැනට අනික් ප්‍රදේශවලත් පාඨශාලා වර්ග කිරීම කරගෙන යන නිසා, එම පාස ලුත් පහත් වර්ගයට හෙළීමට විරුද්ධව මේ අන්දමට මහජනයා කරුණු ඉදිරිපත් කරන විට ඒ අයගේ ඉල්ලීම් ඉෂ්ට කිරීමට කටයුතු කරනවද?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ඉල්ලීම් සාධාරණ නම් ඒවා ඉටු කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අධ්‍යාපන පනත මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කර නැති නිසා ඒ පනතට සම්බන්ධ කාරණයක් වන පාසල් වර්ග කිරීම නීති විරෝධී බව ගරු ඇමතිතුමා පිළිගන්නවද?

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
පිළිගන්නෙ නැහැ.

**හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය: මිනින්දෝරු පාඨමාලාව**

"ஹாடி சிரேஷ்ட கைத்தொழில் நிறுவனம்": நில அளவை வகுப்பு

**HARDY INSTITUTE OF TECHNOLOGY: SURVEYORS' COURSE**

13. ද සොයිසා සිරිවර්ධන මයා. (ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—(திவுலப்பிட்டிய—சார்பாக)
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කලින් ගංගා නිම්න සංවර්ධනයට අයිතිව තිබී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]
දැනට අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති "හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ" මිනින්දෝරු පාඨමාලාව හැදෑරීමට ඇතුළත් වීමේ විභාගය 1968.1.20 දින පැවැත්වූ බැව් එතුමා දන්නවාද? (ආ) එම විභාගය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වීම නිසා සිංහල හා දෙමළ පමණක් උගත් ශිෂ්‍යයින් කොන්වෙන බව එතුමා දන්නේ ද? (ඉ) මේ ආයතනයේ ප්‍රධානියා කවුද? (ඊ) ඔහුගේ අධ්‍යාපන ඥණය කොපමණද? (උ) මේ විභාගය අවලංගුකර එය සිංහලෙන් පවත්වනවාද? (ඌ) නො එසේ නම්, ඒ මන් ද?

*கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) முன்னர் ஆற்றுப் பள்ளத் தாக்கு அபிவிருத்திச் சபைக்குரியதாக விளங்கி இப்போது கல்வி அமைச்சுக்குட்பட்டதாய் உள்ள "ஹாடி சிரேஷ்ட கைத்தொழில் நிறுவனத்தின்", நில அளவை சம்பந்தமான வகுப்புகளில் சேர்ந்து கற்பதற்கான புகுமுகத்தேர்வு ஒன்று 20.1.1968 அன்று நடைபெற்றதை அவர் அறிவாரா? (ஆ) அத்தேர்வு ஆங்கில மொழிமூலம் மட்டுமே நடாத்தப் பட்டதால் சிங்களமும், தமிழும் மட்டும் அறிந்த மாணவர்களுக்கு அனுமதி மறுக்கப் பட்டதை அவர் அறிவாரா? (இ) இந்நிறுவனத்தின் தலைவர் யார்? (ஈ) கல்வித்துறையில் அவர் ஈட்டியவை யாவை? (உ) அத்தேர்வை இரத்துச் செய்துவிட்டு, அதைச் சிங்கள மொழியில் அவர் நடத்துவாரா? (ஊ) அன்றேல், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the entrance examination for the Surveyors' Course of the Hardy Institute of Technology, which was under the River Valleys Development Board earlier and is at present under the Ministry of Education, was held on 20.1.1968? (*b*) Is he aware that as this examination is held in the English medium only, students educated only in Sinhala or Tamil are denied admission to this Course? (*c*) Who is the Head of this Institute? (*d*) What are his educational attainments? (*e*) Will he cancel this examination and hold it in Sinhala? (*f*) If not, why?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(අ) දනිමි. නමුත් එම විභාගය දැන් අවලංගු කර ඇත. (ආ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වීමට විභාග කොමසාරිස් විසින් විධිවිධාන යොදා ඇත. (ඉ) පී. නරේන්ද්‍රන් මහතා. (ඊ) බී. එස්. සී. (ගෞරව, ලංඩන්) ඒ. ඉන්ස්ට්.ජී (ලංඩන්) ඒ. එම්, අයි.ඊ.ආර්.ඊ. (ලංඩන්) එස.එම්.අයි.ඊ.ඊ.ඊ.—(නිව්යෝර්ක්.) ඒ එම්.අයි.ඊ.සී. (උ) දැනටම අවලංගු කර ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පැවැත්වේ. (ඌ) පැන නොනඟී.

## ඩබ්ලිව්. එම්. එන්. නන්දන මහතා, වැඩ්දුම්කරු, දුම්රිය ධාවනාගාරය, මහනුවර

*திரு. டபிள்யு. எம். என். நந்தன, கண்டி புகைவண்டி நிலைய இணைப்பவர்*

MR. W. M. N. NANDANA, FITTER, RAILWAY RUNNING SHED, KANDY

14. **ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*
(Mr. D. P. R. Weerasekera—Dehiowita)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහනුවර දුම්රිය ධාවනාගාරයේ වැඩ්දුම්කරු ඩබ්ලිව්. ඇම්. ඇන්. නන්දන යන අයගේ සේවය 1966 ජනවාරි 22 වනදා සිට තහනම් කර ඇති බව එතුමා දන්නවා ද? (ආ) සේවය නැවැත්වීමට එම අයට විරුද්ධව ඇති චෝදනා මොනවාද? (ඉ) එම චෝදනාවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ බව දන්නවාද? (ඊ) ඒ පිළිබඳ කොමිසම ගත් පියවර මොනවා දැයි සඳහන් කරන්නේද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கண்டி புகை வண்டி நிலையத்தில் இணைப் பவராகக் கடமையாற்றிய திரு. டப்ளியு. எம். என். நந்தன என்பவரின் சேவையை 1966 ஆம் ஆண்டு ஜனவரி 22 ஆம் திகதியிலிருந்து நிறுத்தியிருப்பதை அவர் அறிவாரா? (ஆ) சேவையிலிருந்து இவரை நிறுத்த இவருக்கு*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

எதிராகவுள்ள குற்றச்சாட்டுக்கள் எவை? (இ) அக்குற்றச் சாட்டுகளை மறுத்து அரசாங்கச் சேவை ஆணைக்குழுவுக்கு மேன்முறையீடு செய்யப்பட்டதை அவர் அறிவாரா? (ஈ) அது சம்பந்தமாக ஆணைக்குழு எந்நடவடிக்கை எடுத்தது என்பதை அவர் கூறுவாரா? (உ) அன்றேல், ஏன்?

asked the Minister of Communications: (*a*) Is he aware that Mr. W. M. N. Nandana, fitter Railway Running Shed, Kandy, has been discontinued from service from 22nd January, 1966? (*b*) What are the charges made against him by reason of which he has been discontinued? (*c*) Is he aware that an appeal was made to the P. S. C. against those charges? (*d*) Will he state the steps taken by the P. S. C. in regard to this matter? (e) If not, why?

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහන ඇමති)

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(*a*) Mr. W. M. N. Nandana was interdicted on 23.1.66 and a disciplinary inquiry was held and he was dismissed from service with effect from 21.11.66 on being found guilty of the charges framed against him. (*b*) The following charges were framed against him:

(i) That on or about the 8th day of January 1966, you did incite others to absent themselves from work on the 8th January 1966 for reasons of a political nature, to wit, demonstration of opposition to the introduction in Parliament of the regulations under the Tamil Language (Special Provisions) Act of 1958.

(ii) That on or about the 8th day of January 1966, you did organize a campaign with the intention of persuading others to absent themselves from work on the 8th January 1966 for reasons of a political nature, to wit, demonstration of opposition to the introduction in Parliament of the regulations under the Tamil Language (Special Provisions) Act of 1958.

(iii) That you did absent yourself from duty on the 8th January 1966 notwithstanding the warning conveyed to you in terms of Circular No. CB. (Misc.) dated 7th January 1966 issued by the Secretary to the Treasury."

(*c*) Yes. (*d*) A decision on the appeal has not been received from the P.S.C. as yet. (*e*) Does not arise.

## හේන්පිටගෙදර—මඩින්නගම—සපුවලාන ගම පාර

## ஹபுவலானவுக்கூடாகச் செல்லும் ஹேன்பிட்டகெதற—மடித்தகம தெரு

## HENPITIGEDARA-MADITHTHAGAMA VIA HAPUWALANA ROAD

15. ද සොයිසා සිරිවර්ධන මයා. (ජයකොඩි මයා.—වෙනුවට)

(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஜயக்கொடி சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Jayakody)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හෙන්පිටගෙදර-මඩින්නගම සපුවලාන ගම හරහා ඇති පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතට ගත්තේ කොයි වර්ෂයේ ද? (ආ) එය තාර දා අවසාන කිරීමට වහාම කටයුතු සලස්වනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) ஹேன்பிட்டகெதறவிலிருந்து ஹபுவலானவுக்கு ஊடாக மடித்தகமவுக்குச் செல்லும் தெருவை அரசாங்கக் கட்டுவேலைத் திணைக்களம் எந்த ஆண்டில் பொறுப்பேற்கும்? (ஆ) அதற்குத் தாரிட்டு முடிக்க அவர் உடனே ஏற்பாடுகள் செய்வாரா? (இ) அன்றேல், ஏன்?

asked the Minister of Public Works, Post and Telecommunications: (*a*) In which year was the Henpitagedera Madiththagama via Hapuwalana Road taken over by the Public Works Department? (*b*) Will he make immediate arrangements to have this road tarred and completed? (c) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුස්තාපා මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති—වෙනුවට)

(ஜனுப் முஸ்தபா—அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)

(Mr. Mustapha—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(*a*) The road referred to was taken over by the Public Works Department on 5.4.1958. (*b*) $1\frac{1}{4}$ miles from the Maradagahamulla end of this road have been metalled and tarred, and the balance $1\frac{1}{4}$ miles are gravelled and maintained satisfactorily. Improvements to the untarred section would, however, depend on the availability of funds. (c) Does not arise in view of (b) above.

## රජය කෙරෙහි විශ්වාස භංගය : විශේෂ බදුකර යටතේ රජයේ ඉඩම් පවරා දීම

## அரசாங்கத்தின் மீது நம்பிக்கையின்மை : முடிக்குரிய காணிகளை விசேட குத்தகைக்குக் கொடுத்தல்

## No Confidence in Government : Special Leases of Crown Lands

**කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [1968 මාර්තු 23.]**

" විදේශීය හා දේශීය ධනපති සමාගම්වලට හා ඇමතිවරුන්, පාර්ලිමේන්තු ලේකම්වරුන් හා ඔවුන්ගේ අඹුසැමියන් ද ඇතුළුව සෙසු හිතවතුන්ට විශේෂ බදු දීම් යටතේ රජයේ ඉඩම් විශාල ප්‍රමාණයක් පවරාදීමේ රජයේ ප්‍රතිපත්තිය මහජන අපකීර්තියට පත් වී ඇති හෙයිනුත් ; ආහාර නිෂ්පාදනයෙහි මොන යම් හෝ සැළකිය යුතු වැඩිවීමක් නොමැතිව වටිනා විදේශ විනිමය ඇතුළුව විශාල අරමුදල් නාස්ති වීමටත් ; අගනා වන සම්පත් වනසාලීමටත්, වෙනත් දූෂණ සිදුවීමටත් හේතුවී ඇති බැවිනුත් ; එවැනි බරපතල දූෂණ නැති කිරීමට හෝ මේ ක්‍රමය යටතේ, ආහාර නිෂ්පාදනයේ නාමයෙන් වාහන හා වෙනත් යන්ත්‍රෝපකරණ ආනයනය කිරීමට අවසර ලැබූ, එහෙත් කාර්යය පැහැර හරින්නවුන්ගෙන් එම වාහන හා වෙනත් යන්ත්‍රෝපකරණ ආපසු ලබාගැනීමටවත් රජය සවිර ලෙස ක්‍රියා කර නැති බැවිනුත්, රජය කෙරෙහි මෙම මන්ත්‍රී මණ්ඩලය විශ්වාසය නොතබයි." [එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

1968 மாச் 23, ஆம் தேதிய விஞமீதான ஒத்தி வைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

" அந்நிய, உள்நாட்டு முதலாளித்துவக் கம்பனிகளுக்கும், அமைச்சர்கள், பாராளுமன்றக் காரிய தரிசிகள், அவர்களின் வாழ்க்கைத் துணைவர்கள் ஆகியோர் உட்பட்ட தனிச் சலுகைக்குரிய பிற ஆட்களுக்கும், பெருமளவான முடிக்குரிய காணிகளை விசேட குத்தகைக்குக் கொடுக்கின்ற அரசாங்கத்தின் கொள்கையானது பொதுசனப் பழிப்புக்குள்ளாகியிருப்பதாலும், அக்கொள்கையின் விளைவாய்ப் பெறற்கரிய அந்நியச் செலாவணியுட்படப் பெருந்தொகையான பணம் வீணுக்கப்பட்டது மட்டுமன்றி பெறுமதி மிக்க காட்டு வளங்கள் பாழாக்கப்பட்டுள்ளதுடன் வேறு பலவித ஊழல்களும் ஏற்பட்டுள்ள போதிலும், உணவு உற்பத்தியில் குறிப்பிடத்தக்க பெருக்கமெதுவும் ஏற்படவில்லையாகையாலும், மேலும், அத்தகைய படுமோசமான ஊழல்களை அற்றுப்பண்ணுதற்கோ இத்திட்டத்தின் கீழ் தவறிழைத்தவர்களிடமிருந்து உணவு உற்பத்தியென்னும் சாட்டில் அவர்கள் இறக்குமதி செய்வதற்கு அனுமதிக்கப்பட்ட வாகனங்களையும் ஏனைய இயந்திர சாதனங்களையும் பறிமுதல் செய்வதற்கோ அரசாங்கம் திடமான நடவடிக்கையெதுவும் எடுக்காமையாலும் இச் சபை அரசாங்கத்தின் மீது நம்பிக்கை யிழந்துள்ளது. "

[திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க]

*Order read for resuming Adjourned Debate on Question.—[23rd March 1963.]*

"That inasmuch as the Government's policy of granting Special Leases of large extents of Crown lands to foreign and local capitalist companies and to other favoured individuals, including Ministers and Parliamentary Secretaries and their spouses, has become a public scandal and has led to the squandering of large funds, including valuable foreign exchange, to the despoliation of valuable forest resources, and to other abuses without any appreciable increase in the production of food, and as the Government has not acted resolutely to eradicate such flagrant abuses or even to recover from defaulters under this scheme the vehicles and other machinery that they have been allowed to import under the guise of food production, this House has no confidence in the Government."—[*Mr. F. R. Dias Bandaranaike.*]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினு மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

I want to bring to the notice of hon. Members that according to the agreement the Opposition was to have five

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hours and the Government 4½ hours. The Opposition has already taken 2 hours and 56 minutes and the Government 1 hour and 7 minutes. The Government has 3 hours and 23 minutes left while the Opposition has only 2 hours and 4 minutes left and the Chief Opposition Whip expects 17 hon. Members to speak within those 2 hours and 4 minutes, which is an impossible situation. I wish they would not place me in the position of having to ask hon. Members to sit down. I would kindly request hon. Members who are speaking to be as brief as possible.

අ. භා. 2.21

**තුඩාවේ මයා.**
(திரு தடாவ)
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් බෙදා දී තිබෙන ආකාරය දෙස බලන විට පැරණි සිංහල කියමනක් අපට මතක් වෙනවා. බෙදන්න ඉන්න මිනිහා ගොටුව ගහ ගත්තා වගේය කියා සිංහල කියමනක් තියෙනවා. මේ ආණ්ඩුව ඉඩම් බෙදන විටත් වැඩියෙන් ඉඩම් අරගෙන තිබෙන්නේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් තමයි. එදා දුන් පිළිතුර අනුව ඉඩම් අක්කර 56,263ක් බෙදා දී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මෙයින් දහයෙන් පංගුවක්—අක්කර 5,000 ක් පමණ—මේ රජයේ ඇමතිවරුනුත්, උප ඇමතිවරුනුත් සහ මන්ත්‍රීවරුනුත් තමයි, අරගෙන තිබෙන්නේ. එම නිසා මේක හරියට බෙදන්නට ඉන්න මිනිහා ගොටුව ගහ ගත්තා වගේ වැඩක්. මේ රජයේ ඇමතිවරුන් තමයි, මේ රටේ ගොවියෝ. මේ රජයේ උප ඇමතිවරුන් තමයි, මේ රටේ ගොවියෝ, මේ රජයේ මන්ත්‍රීවරුන් තමයි මේ රටේ ගොවියෝ.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

බොහොම හොඳ නේ.

**තුඩාවේ මයා.**
(திரு தடாவ)
(Mr. Tudawe)

දුප්පත් ගොවීන්ට ඉඩම් අඟලක් නැහැ. රජයේ ඇමතිවරුන්ට බොහොම හොඳයි. මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව, ඉඩම් වල තිබෙන දැව ටික කපා ගැනීම, විනිමය හොරකම් කර ගැනීම, හොඳ දේවල්. මේ ආණ්ඩුව ගොවීන් වෙනුවෙන් සැලකිල්ලක් නොදක්වන්නේ ඇයි? විශාල ජාවාරම්කාරයන්ට ඉඩම් දී අපේ විදේශ විනිමය වැරදි විධියට පාවිච්චි කරන්නට ඉඩ දී තිබෙනවා. ජාවාරම්කාරයන්ට මිස ගොවි ජනතාවට සැලකිල්ලක් දක්වන්නේ නැහැ.

ඒ සම්බන්ධයෙන් මා එක් කාරණයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කෙරෙව්වා. උඩ වලවේ වම් ඉවුරේ ගොවි පවුල් 637 ක් අද විඳින දුක මා ගරු ඇමතිතුමාට පෙන්වා දුන්නා. කිරිඉබ්බන්ආර, මහගම, හත්පෝරුව, කියන ගම්වල ගොවි පවුල් 637 ක් දුක් විඳින්නේ ඔවුන්ට වතුර සපයන්නට ගරු ඇමතිතුමාට පුළුවන් කමක් නොමැති නිසයි. ඒ ගොවීන්ට වතුර සපයන්නටවත්, ඔවුන්ට පදිංචි ගෙවන්නටවත් ගරු ඇමතිතුමාට පුළුවන් කමක් නැහැ. අද ඔවුන්ට ජීවත් වන්නට විධියක් නැහැ. මේක මොන තරම් අසාධාරණයක්ද? ඉඩම් ඇමතිතුමා මේ ගොවීන්ට ජලය සපයා දුන්නා නම් ඔවුන් මුදල් ඉල්ලන්නේ නැහැ. ජලය සපයන තුරු ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මුදල් දෙන්නාක් මෙන් මේ ගොවීන්ට මුදල් දෙන බවට ඉඩම් ඇමතිතුමා පොරොන්දුවක් දී තිබෙනවා. එහෙත් එතුමාම ඒ පොරොන්දුව කැඩුවා. අද එතුමා ඒ ගොවීන් ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මා මේ අවසථාවේදී එතුමාගෙන් විශේෂයෙන් ඉල්ලන්නේ, මේ ගොවි පවුල් 637 ට සහන සැලසීමට ක්‍රියා කරන ලෙසටයි. එහෙත් එතුමා ඒ සඳහා උනන්දුවක් දක්වතැයි සිතන්නට නම් බැහැ. කොම්පැනිකාරයන් සම්බන්ධයෙනුයි, ගරු ඉඩම් ඇමතිතුමාගේ හදවත කකියන්නේ. දුප්පත් ගොවීන් ගැන හදවත කකියන්නේ නැහැ. උඩ වලවේ හත්පෝරුවේ ගොවීන් ගැන එතුමාට කැක්කුමක් නැහැ. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

පවුල් 637 ට 3,000 ක පමණ ජනගහණයක් ඇතුළත් වෙනවා. අද ඔවුන්ට කන්නට බොන්නට විධියක් නැහැ. ගොවීන්ට සැලකීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නොවෙයි. එහෙත් මේ ගොවීන්ගේ ප්‍රශ්න අමතක නොකරන හැටියටත්, ඒවා සම්බන්ධයෙන් සෑහෙන පියවරවල් ගන්නා හැටියටත් මා ගරු ඇමතිතුමාගෙන් ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මේ කාරණය මතක් කරන්නට කැමතියි. තම මිත්‍රයන්ට මහ ජන දේපළ මංකොල්ල කන්නට ඉඩ දීමෙන්, කම්කරු පංක්තිය සූරා කන්නට ඉඩ දීමෙන්, විදේශ විනිමය හොරකම් කර ගන්නට ඉඩ දීමෙන්, මෙම ආණ්ඩුව විසින් කරන ලද මෙම මහජන විරෝධි ක්‍රියා ඉතාමත්ම කෲරතර ඒවා හැටියට මේ රටේ මහජනතාව හෙළා දකිනවා. ඇත්තෙන්ම මේවා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියායි; දේශ ද්‍රෝහි ක්‍රියායයි; ජාති ද්‍රෝහී ක්‍රියායි. ඒ නිසා මේ තරම් වැදගත් කාරණයක් මුල් කොටගෙන ඉදිරිපත් කරන ලද මෙම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේද ඡන්දය ලැබිය යුතුයි. මෙම යෝජනාවට පක්ෂව ඡන්දය දුන්නොත් ඔවුන්ට අනාගතයේදී මහජනයා ඉදිරියට යන්නට පුළුවන් වේවි. එසේ නැත්නම් ඔවුන්ට මහජනයා ඉදිරියට යන්නට ඉඩ නොලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 2.25

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, උඩ වලවේ ව්‍යාපාරය ගැන මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) සඳහන් කළා. අද උදේ වන විට උඩ වලවේ වැවේ වතුර මට්ටම අඩි 64 යි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

වැවේ වතුර තිබුණට මොකටද ඒවා ගොවීන්ට ලැබෙන්නේ නැත්නම්?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා ඒ ප්‍රශ්නය ගැන දැන් විවාද කරන්නට අදහස් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඊයේ දක්ෂ කථාවක් කළා. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ මින් පෙර කවදාවත් මේ වාගේ ඉඩම් දීමක් කර නැති බවත් මෙම ඉඩම් දීමේ ක්‍රමය ඉතාමත්ම අසාධාරණ බවත් එතුමා සඳහන් කළා. එතුමා මේ කාරණය සඳහන් කෙළේ ඉතාමත්ම වේග ස්වරයෙනුයි. එහෙත් මා එක කාරණයක් මතක් කරන්නට කැමතියි.

The Department of National Planning
The Short-Term implementation Programme—1962.

නමැති මේ පොතේ ෆෝර්වර්ඩ් එක අත්සන් කර තිබෙන්නේ සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මියයි. ජනපදවල දියුණුව ගැන කියැවෙන මෙහි 138 වැනි පිටුවෙහි තව දුරටත් මෙසේ සඳහන් වෙනවා :

"There is therefore an urgent need to evolve some new method of opening up the Dry Zone at a more rapid pace and at less cost, as it will otherwise be necessary to discount the possibility of any significant contribution from new lands in the Dry Zone to our immediate problems of economic development."

එයින් කියැවෙන්නේ, ජනපද ක්‍රම අනුව ඉඩම් දීමෙන් රටේ සාමාන්‍ය ආර්ථික ප්‍රශ්න නොවිසඳෙන බවයි. ඒ සමගම, ඉක්මනිනුත් අඩු වියදමකිනුත් ආර්ථික ප්‍රශ්න විසඳිය හැකි ක්‍රම ඇති කළ යුතු බවත් එයින් කියැවෙනවා.

"The land will be alienated to middle class co-operative societies, commercial companies and other organizations for commercial farming on a mechanised basis."

ඒ කියන්නේ, ධනපති ක්‍රමය අනුව යන්ත්‍ර සූත්‍ර යොදා ගොවිතැන් කිරීම සඳහා මධ්‍යම පන්තියේ අයටත් සමූපකාර සමිතිවලටත් හා වෙළෙඳ සමාගම්වලටත් ඉන් පිටස්තර වෙනත් සංවිධානවලටත් ඉඩම් දිය යුතු බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"The necessary incentives will be provided by way of long-term loans, tax concessions, and guaranteed prices. The provision of access facilities and the restoration of any minor tanks in the area, will also be undertaken by government, the cost of the latter being recovered in instalments over a period of years."

මෙකී සංවිධානවලට දීර්ඝ කාලීන ණය දීමත් ඒවා ආදායම් බදුවලින් නිදහස් කිරීමත්—ආදායම් බදුවලට නිවාඩු දීමත්—පාරවල් තැනීමට හා වැව් බැඳීමට යන වියදම් ආණ්ඩුව විසින් දැරීමත් ඒ ආණ්ඩුව පිළිගත් බවයි එහි අදහස. මාතර ගරු මන්ත්‍රීතුමා නම් (තුඩාවේ මයා.) එදා ඒ ආණ්ඩුවේ හිටියේ නැහැ. එතුමා හැමදාම විරුද්ධ පක්ෂයේ. එදා ඒ ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරන ලද මේ පොතෙහි තිබෙන කරුණුයි මා කියවන්නේ.

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)
(Mr. Somaratne Senerath—Amparai)

ඔය කියෙව්වේ පොතේ ෆේජ්වර්ඩ් එකනේ. පොත කාගේද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

පොත නොවෙයි, පොතේ අදහස් කාගේද කියා බලන්නයි ඕනෑ. පොත නම් මගේ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

එදා ආණ්ඩුව පිළිගත් ප්‍රතිපත්ති ඒ. එදා ඇති කරන ලද ඉඩම් දීමේ මණ්ඩලයේ සභාපති එවකට සිටි අගමැතිණී බණ්ඩාරනායක මහත්මියයි. උප සභාපති එදා සිටි මුදල් ඇමති, අද දෙම්පේ ගරු මන්ත්‍රී, පිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහත්මයායි. ආණ්ඩුව එදා ගත් තීරණය අනුව 1962, 1963 වර්ෂවල ඉඩම් කච්චේරි පැවැත්තුවා. ඉඩම් සංවර්ධන පනතෙන් පිටස්තරව අක්කර විසිහය දහස් ගණනක් එදා දුන්නා. හිටපු ගරු මන්ත්‍රීවරුන්ටත් දැනට සිටින සමහර ගරු මන්ත්‍රීවරුන්ටත් එදාත් ඉඩම් ලැබුණා. එය වරදක් යයි මා කියන්නේ නැහැ. එදා ඉඩම් ලැබූ මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුව මම දැන් කියවන්නම්.

ඩී. පී. වික්‍රමසිංහ මන්ත්‍රීතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අක්කර 45.1.12

ලීලානන්ද විරසිංහ මන්ත්‍රීතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අක්කර 4.2.23

එල්. බී. ජයසේන මන්ත්‍රීතුමා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අක්කර 70

පී. බී. තෙන්නකෝන් මන්ත්‍රීතුමා, මාතලේ, අක්කර 43

එස්. බී. ලේනව මන්ත්‍රීතුමා, මාතලේ, අක්කර 10

කේ. බී. රත්නායක මන්ත්‍රීතුමා, මාතලේ, අක්කර 10

පී. බී. ඉලංගරත්න මහත්මියට පුත්තලමෙන් අක්කර 25 යි. ආර්. බී. රත්නමලල මහත්මයාට අනුරාධපුරයෙන් අක්කර 25 යි. අනිල් මුණසිංහ මහත්මයාට පුත්තලමෙන් අක්කර 25 යි. ජයරත්න මහත්මයාට පුත්තලමෙන් අක්කර 25 යි. ලක්ෂ්මන් ජයකොඩි මහත්මයාට පුත්තලමෙන් අක්කර 25 යි. රොනී ද මෙල් මහත්මයාට පුත්තලමෙන් අක්කර දෙසිය ගණනක් දී තිබෙනවා. මේක වැරදිය කියා මා කියන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

විදේශ විනිමය කොපමණ දී තිබෙනවාද ?

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

විදේශ විනිමය වුවමනා වුණේ නැහැ.

**සෙනරත් මයා.**
(திரு. செனரத்)
(Mr. Senerath)

තමුන්නාන්සේට කොපමණ ලැබුණාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මට එකක්වත් ලැබුණේ නැහැ. ඒ අනුව මන්ත්‍රීවරුන්ට ඉඩම් දීම වැරදිය කියා මා කියන්නේ නැහැ. ඒ කාලයේත් දුන්නා. දැනුත් දෙනවා. ඒ කාලයේදී දීර්ඝ කාලීන ණය දෙනවාය කිව්වා. මේ කාලයේ දීර්ඝ කාලීන ණය දුන්නේ නැහැ. පාරවල් කැපුවේ නැහැ; වැව් බැඳී මට ආධාර කළේ නැහැ. මොකවත් කළේ නැහැ. ඒ උදවියට තමන්ගේ මුදල් යොදවා යන්ත්‍ර ගැනීමට බලපත්‍ර දුන්නා. මුදල් දුන්නේ නැහැ. අද මෙන් ඒ කාලයේ මේ විදේශීය විනිමය බලපත්‍ර වුවමනා වුණේ නැහැ. ඒ කාලයේ වුවමනා හැටියට යන්ත්‍ර ගන්නට අවස්ථාව තිබුණා. මේ අවස්ථාවේත් විනිමය දුන්නෙ නැහැ. ඒ අයගේ මුදල්වලින් යන්ත්‍ර ගෙන්වා ගන්නට බලපත්‍ර දුන්නා. ඒක වැරදිය කියා මා කියන්නේ නැහැ.

ඊළඟට, මොන නීතියක් යටතේ මේ ඉඩම් දුන්නාද කියා දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ප්‍රශ්න කළා. මට මේ ඉඩම් දෙන්නට නීතියක් නැත කියා ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා. නමුත් "ක්‍රවුන් ලෑන්ඩ්ස් ඕඩිනන්ස්" එක නැත්නම් රජයේ ඉඩම් පනත යටතේ මට ඒ බලතල තිබෙන බව පෙන්වා දෙන්නට සතුටුයි. රජයේ ඉඩම් පනතේ 6 වන ඡේදයේ 1 වන කොටස බලන්න.

"A special grant or lease of Crown land may be made at a nominal price or rent or gratuitously for any charitable, educational, philanthropic, religious, or scientific purpose, or for any other purpose which the Governor-General may approve."

ආණ්ඩුකාරතුමාගේ බලතල ඉඩම් ඇමතිතුමාට පවරා තිබෙනවා. Gazettes Nos. 10,013 of 2nd September 1949, and 10,127 of 21st July 1950. දැන් ඒ බලතල මා පාවිච්චි කළේ ආණ්ඩුවේ තීරණයක් ක්‍රියාත්මක කරන්නට ඇමති මණ්ඩලය සම්මත කළ යෝජනාවක් උඩයි. 6 වන ඡේදයේ 1 වන කොටසේ සඳහන් බලතල මා ඒ කාලයේදීත් පාවිච්චි කළා. එසේ පාවිච්චි කළේත් ඒ කාලයේදී තිබුණු ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ගත් තීරණයක් උඩයි. මේ ඇමති මණ්ඩලයත් එවැනි තීරණයක් ගත්තා.

ගරු කථානායකතුමනි, මේ පොතේ තවත් විස්තර තිබෙනවා. මා නැවතත් මේවා කියවන්නට අදහස් කරන්නේ නැහැ. මේ පොතේ තිබෙන සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනියගේ "'ෆේස්වඩ්" එක මෙහෙමයි :

"The prospect before us is far from rosy though certainly not one for defeatism. With a resolute faith and sustained effort, we can still outflank the forces pressing against us and reach our economic goals. But we shall have to traverse a hard terrain first. We must be prepared to place ourselves, if need be, on a war footing and accept resolutely the austerities and hard work which that effort demands. Indeed, if we could submit ourselves to a regimen of the gravest hardships and privations in two imperialistic wars for the protection of non national interests, why should we not put up with less heavy sacrifices and restraints for a shorter period in an all-out effort to build peace and prosperity for ourselves in our own country ?"

මේ තත්ත්වය දැනුත් තිබෙනවා. ඒකෙ වෙනසක් නැහැ. ඒ අනුව සෑම අංශයක්ම යොදවා රටේ ආහාර නිෂ්පාදනය වැඩි දියුණු කරන්නට වර්තමාන ආණ්ඩුව කල්පනා කළා. ඒ අනුව කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා. කැබිනට් මණ්ඩලයේ අනුමතිය ඇතිවයි මා ඒ 6 වන ඡේදයේ 1 වන කොටසේ සඳහන් බලතල පාවිච්චි කළේ. දැන් විශේෂ බදු මණ්ඩලයක් පත් කර තිබෙනවා. ඉඩම් ලබා ගැනීමට එවූ සියලුම ඉල්ලුම් පත්‍ර ඒ ඒ ප්‍රදේශවල දිස්ත්‍රික් කෘෂිකර්ම කාරක සභා සලකා බලා තිබෙනවා. ඒ දිස්ත්‍රික් එකොළහේ නම් මා ඊයේ කිව්වා. ඒ දිස්ත්‍රික්ක එකොළහේ ඉඩම් බෙදා දෙන්න තීරණය කළේ ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක කෘෂිකර්ම කමිටුවල අනුමැතිය ඇතිවයි. මේ විශේෂ බදු මණ්ඩලයේ රැස්වීම්වලට ඒ දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් සහභාගි වුණා. ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් සභාපති වශයෙන් ක්‍රියා කළ අතර ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, කෘෂිකර්ම අධ්‍යක්ෂ, වාරිමාර්ග අධ්‍යක්ෂ, ක්‍රම සම්පාදක අමාත්‍යාංශයේ නියෝජිතයෙකු, මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයකු හා ඉඩම් කොමසාරිස් යන හත් දෙනාගෙන් මේ විශේෂ බදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලය සමන්විත වුණා. ඊට දිසාපති වරුත් එකතු වුණා. ඒ මණ්ඩලයෙන් නම් තෝරා එව්වා. මම බැලුවෙ මෙපමණයි: දිස්ත්‍රික්ක කෘෂිකම් කමිටුවත්, විශේෂ බදු මණ්ඩලයත් ඒකමතිකව අනුමත කර එවා තිබුණු ඒව බෙදා දෙන්න මම තීරණය කළා.

ගරු කථානායකතුමනි, විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් බෙදා දුන්න උදවිය ගේ නම් ලැයිස්තුවක් ඉල්ලා පසුගිය දිනක අනුරාධපුර ගරු මන්ත්‍රීතුමා (රත් නායක මයා.) ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබුණා. මා ඊට දුන්න පිළිතුරේ ඒ උදවිය ගේ නම් සඳහන් කර තිබුණා. ඒ ලැයිස් තුවේ පිටපතක් මා ළඟ දැන් තිබෙනව. "පුද්ගලයන් සඳහා විශේෂ බදු මණ්ඩලය මගින් බදු දී ඇති ඉඩම්" යන ශීර්ෂය යට තේ ඒ පුද්ගලයන්ගේ නම් සඳහන් කර එතෙක් ඉඩම් භාර නුදුන් පුද්ගලයන්ගේ නම් ඉදිරියෙන් "ඉඩම් භාර නොදෙන ලදී." යනුවෙන් සඳහන් කර තිබුණා. දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඒ ලැයිස්තු කියවද්දී ඒ කොටස කියෙව්වේ නැහැ. ඊ. එල්. සේනානායක මහත්මයා අක්කර 500 යි ආදී වශයෙන් කියාගෙන ගියා. ඊ. එල්. සේනානායක මහත්මයාට අක්කර 500 ක් දිය යුතු යයි විශේෂ බදු මණ්ඩලය පිළිගෙන තිබෙන නමුත් ඉඩම් භාර දී නැහැ. ඒ ඉඩම් දීම නවත්වන්න නියම කර තිබෙනව. ඒක ඉංග්‍රීසියෙන් තිබෙන්නෙ මෙහෙමයි:

"Mr. E. L. Senanayake—500 acres—Held up as this land falls under Mahaweli Diversion Scheme.'

මම මේ නම් කියවන වර්තමාන මන්ත්‍රී වරුන්ට ඉඩම් භාර දුන්නෙ නැහැ, ඒ ලැයිස්තුවේ හැටියට. ඒ වෙලාවෙ ඒ මන්ත්‍රී වරුන්ට ඉඩම් භාර දී තිබුණෙ නැහැ. මෙන්න ඒ මන්ත්‍රීවරුන්ගේ නම්: ඊ. එල්. සේනානායක මහත්මයා, කේ. ඩබ්ලිව්. දේවනායගම් මහත්මයා, ඒ. එල්. සින්නලෙබ්බෙ මහත්මයා, සී. රාජදුරෙයි මහත්මයා, වයි. ආර්. පියසේන මහත්මයා, ජී. ජී. පොන්නම්බලම් මහත්මයා, එන්. විමලසේන මහත්මයා, එම්. ඒ. ඩැනියෙල් අප්පුහාමි මහත්මයා, එස්. බී. ලේනව මහත්මයා සහ පී. බී. ඒ. වීරකෝන් මහත් මයා. මේ මන්ත්‍රීවරුන්ට ඉඩම් භාර දී නැහැ. ඒ බව ඒ ලැයිස්තුවේත් සඳහන් කර තිබෙනව. ඊට පසුව ඇමති මණ්ඩලය විසින් මේ වැඩ පිළිවෙල ගැන නැවත සාකච්ඡා කිරීමෙන් පසුව තීරණයකට බැස්සා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, සෙනෙට් මන්ත්‍රීවරුන්ටත්, ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ටත් ඔවුන්ගේ භාර්යාවන්ට හා ඔවුන්ගෙන් යැපෙන දරු වන්ටත් ඉඩම් බෙදා නොදිය යුතුයි කියා. එහෙත් දැනටමත් යම්කිසි ගරු මන්ත්‍රී වරයෙක් ඉඩමක් ලබාගෙන එයින් යම් කොටසක් එළි කරගෙන තිබෙනවා නම් ඒ කොටස පමණක් ඔවුන්ට භාර දෙන්න තීරණය කර ගත්ත. ඒ නිසා මම මේ නම් සඳහන් කළ මන්ත්‍රීවරුන්ට ඉඩම් බෙදා දීම නවතා දැම්ම.

ගරු කථානායකතුමනි, ආහාර අතින් අද තිබෙන අමාරුකම් මග හරවා ගැනීම සඳහා වගා කරන්ට මේ උදවියට භාර දී තිබෙන ඉඩම් තව අවුරුදු 25 කින් වත් යම් කිසි සැලැස්මකට අසුවන ඉඩම් නොවෙයි. අපි ඒ ඉඩම් සඳහා සැලැස්මවල් ඇති කරන්ට තවම හිතලවත් නැහැ. මහවැලි ගඟ සංවර්ධන ක්‍රමයට අසු වෙනවාය කියා අක්කර 500ක් දීම නැවැත්තුවා. ඒවා ඊ. එල්. සේනානායක මහත්මයාට වෙන් කළ ඒවායි. මහවැලි ගඟ සංවර්ධන ක්‍රමය කවදද ඒවිද? එතරම් දුරට සොයා බලා තමයි, මෙම කටයුතු කර තිබෙන්නේ. කවදා හෝ මහවැලි ගඟ සංවර්ධන ක්‍රමයට අසු වේවිය කියා එම අක්කර 500 දීම නැවැත්තුවා. ඒ අන්දමට සමහරවිට සංවර්ධන සැලැස්මට පවා අසු නොවුණු ඉතා දුෂ්කර ඉඩම් තමයි, ඒ අයට දී තිබෙන්නේ. ඒ උදවියගේ මුදලින් ඒවා සංවර්ධනය කරනවා ඇතැයි අප සිතාගෙනයි කටයුතු කළේ. අක්කර 56,000ක් දුන්නේ කොහොමදැයි මා කියන් නම්. මේ බදු ක්‍රමය යටතේ ඉල්ලුම් පත්‍ර 89,272ක් ලැබුණා. එයින් 56,263 කට දුන්නා. ඊට පසු 12,179ක් කැන්සල් කළා. එම ඉඩම් දුන්නේ එක පාරටම දියුණු කරන්නට අමාරු නිසා අවුරුදු පහකින් දියුණු කරන්නටයි. හැම අවුරුද්දේම පහෙන් එකක් එළි කරන්නට සිදු වෙනවා. ගිය අවුරුද්දේ අක්කර 11,253ක් එළි කළ යුතුව තිබුණා. අපි මාස හයකට වරක් ඒජන්තවරයාගේ රපෝර්තුවක් ලබා ගෙන බලනවා. මේ කපන මාස් කන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

යේදී වගා වී තිබෙනවා, අක්කර 7,233ක් පමණ. ඒවායින් ලැබෙන්නේ වීද, කුරක්කන්ද, බඩඉරිඟුද, මොනවාද කියන්නට මා දන්නේ නැහැ. කෙසේ වෙතතත්, ඒවායින් ලැබෙන වගාව මේ රටේ මහජනතාවගේ ආහාරය සඳහායි. ආණ්ඩුවට ඒ සඳහා ශතයක්වත් වියදමක් නැහැ.

ලී සම්බන්ධයෙන් ඉඩම් පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වා තුන් හතර පාරක් කැලේ කැපුවායින් පසු ඉතිරිව තිබෙන්නේ වට අඩි තුනෙන් පහළ ගස් බව. ඒවාට ලක්ෂ එකහමාරක් විතර මුදලක් රජයට ඇවිත් තිබෙනවා. [බාධා කිරීමක්] හොරකම් කළාද මන්දා. මට කියන්නට බැහැ, හොරකම් කළාද නැද්ද යන්න. සමහරවිට හොරකම් කරන්නටත් ඇති. ඒකයි තත්ත්වය. පාර්ලිමේන්තු ලේකම්තුමා ලැයිස්තුවක් ඉදිරිපත් කළා.

මෙය කවදාවත් නොකළ අළුත් දෙයක් හැටියට සමහර මන්ත්‍රීවරු සඳහන් කළා. මේක අළුත් දෙයක් නොවෙයි, පරණ දෙයක්.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කිව්වා, කාටදෝ ඉඩම් දුන්නේ නැති බව. 1966, 1967 අවුරුදුවල විශෙෂ බදු මණ්ඩල ක්‍රමය යටතේ වියලි කලාපයේ කුඹුරු අක්කර 15,780ක් දී තිබෙනවා. ගම් පුළුල් කිරීමට අක්කර 65,262 යි. බලපත්‍ර නොමැතිව බලෙන් අල්ලාගෙන සිටි අයට අක්කර 2,03,500ක් දී තිබෙනවා. මේ රජයේ ඉඩම් දී තිබෙන්නේ රජයට වුවමනා විදියට නට යුතු කරන්නටයි.

වයි. ආර්. පියසේන සෙනෙවි මන්ත්‍රීතුමා මට අද උදේ හමු වුණා. එතුමා පිළිබඳව ඊයේ විශෙෂයෙන් සඳහන් වුණු නිසා මට එතුමා ලියවිල්ලක් දුන්නා. දොම්පේ මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කිව්වා එතුමා හුඟක් ලී කපාගෙන අවසාන බව. මේ අන්දමට එම සෙනෙවි මන්ත්‍රීමාට විශෙෂයෙන් චෝදනා ඉදිරිපත් කළ හෙයින් එතුමා විසින් ඉදිරිපත් කර ඇති ලියවිල්ල කියවන්නට මා ගරු කථානායකතුමාගෙන් අවසර ඉල්ලනවා. ඒ මෙසේයි:

1. ගැසට් නිවේදනය අනුව 1967 පෙබරවාරි මුලදී හම්බන්තොට දිස්ත්‍රික්කයන් මම ඉඩමක් ඉල්ලුවෙමි.

2. 1967 ජූනි මාසයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ඉඩමක් වෙන් කළ බව දන්වමින් සහ ඒ ගැන වැඩි විස්තර දිසාපතිතුමා විසින් දන්වන බවත් දැනුම් දෙමින් විශේෂ බදු මණ්ඩලයේ සභාපතිතුමාගෙන් ලිපියක් ලැබුණි.

3. ඉඩම ගැන විස්තරයක් දෙන මෙන් ඉල්ලමින් 1967 ජූලි මස 1 වනදා හම්බන්තොට දිසාපතිතුමාට ලිපියක් යැවීමි.

4. ඉඩම් ගැන කුසපත් අදින බව දන්වා ජූලි මස 16 වනදා දිසාපතිතුමාගෙන් ලිපියක් ලැබුණි.

5. කුසපත් ඇදීමට මගේ නියෝජිතයා වශයෙන් එන්. රාජපක්ෂ මහතා පැමිණෙන බව දන්වා ජූලි 19 වනදා දිසාපතිතුමාට ලිපියක් යැවීමි.

6. මත්තල නමැති ගමට යාව ඇති කැලෑවෙන් අක්කර දෙසියයක් කුසපත් ඇදීමේදී මගේ නමට ලැබුණු බව රාජපක්ෂ මහතා විසින් දැනුම් දෙන ලදී.

7. අගෝස්තු මාසයේදී මම ඉඩම බැලීමට ගියෙමි. එවිට ඉඩම තවම මැන නැති නිසා ඉඩම පෙන්වීමට නොහැකි බව ආණ්ඩුවේ මිනින්දෝරු තැන වූ ඒ. ආර්. ප්‍රනාන්දු මහතා විසින් මට ප්‍රකාශ කරන ලදී.

8. මායිම් පෙන්වීමට පැමිණෙන ලෙස දන්වා 1967 නොවැම්බර් 4 දාතමින් යුත් ලිපියක් මිනින්දෝරු තැනගෙන් ලැබී තිබේ.

9. ඒ දිනවල මා පොදු රාජ්‍ය මණ්ඩලයේ රැස්වීමක් සඳහා රටින් බැහැරව ගොස් සිටි නිසා මේ කටයුත්ත කළ හැක්කේ මා ආපසු පැමිණි විට බව දන්වමින් මගේ ලේකම් විසින් ලිපියක් යවා තිබේ.

10. මා ආපසු පැමිණි පසු මගේ නියෝජිත රාජපක්ෂ මහතාට මායිම් පෙන්වන්නටය කියා 1967 නොවැම්බර් 25 වැනිදා ලිපියක් යැවීමි.

11. මායිම් සලකුණු කළ බව දන්වා රාජපක්ෂ මහතා විසින් දෙසැම්බර පස්වැනිදා මට ලිපියක් එවන ලදී.

12. පෝරම වගයක් පුරවා යවන්නටය කියා දෙසැම්බර 2 වන දා විශේෂ බදු මණ්ඩලයේ සභාපතිතුමාගෙන් ලිපියක් ලැබුණි.

13. දෙසැම්බර 13 වනදා ඒවා පුරවා යවන ලදී.

14. 1968 මාර්තු 3 වනදා සභාපතිතුමාගෙන් මේ විධියේ ලිපියක් ලැබුණි:

"එම ඉඩම තවම ඔබ වෙත පවරා නැති හෙයින් ඔබට දෙන ලද එම ඉඩම ආපසු රජයට පවරා ගත් බව දන්වමි."

15. මා, මෙම ඉඩමට මේ තාක් ගොස් නැත. කිසිවකු ලවා එකම ගසක් හෝ කප්පවා ගෙන නොමැත. මේ බවට හම්බන්තොට දිසාපතිතුමා සහ ආණ්ඩුවේ මිනින්දෝරු තැන සාක්ෂි දරනවා ඇත. මේ ගැන මා කිසි දිනෙක පාර්ලිමේන්තු ගොඩනැගිල්ල තුළදී හෝ ඉන් පිටතදී හෝ කිසිවකු සමග කිසිවක් කථා කර නැත. මෙම ප්‍රකාශය මට පෞද්ගල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලික වශයෙන් අපහාස කිරීම සඳහා සහ අපේ පක්‍ෂය අපකීර්තියට පත් කිරීම සඳහා කර තිබෙන අභූත චෝදනාවකි, අමූලික බොරුවකි. මෙම ප්‍රකාශය පාර්ලිමේන්තුවෙන් පිටතදී කරන හැටියට මම ඕනෑම කෙනෙකුට අභියෝග කරමි."

ගරු කථානායකතුමනි, උත්තර මන්ත්‍රීතුමාට පෞද්ගලික වශයෙන් චෝදනාවක් එල්ල කලා රුපියල් ලක්ෂයක මුදලක් ගත්තාය කියා. ඇමතිවරයා හැටියට මා එය පරීක්ෂා කර බලනවා. මෙය කියෙව්වේ පෞද්ගලික වශයෙන් චෝදනා කළ නිසයි.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)
කැලෑවේ ගස් තිබෙනවාද කපන්නේ නැතිව?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම පරීක්ෂා කර බලන්නම්. මේ ලිපිය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒජන්තතුමාට යවනවා. ඒ එක් කාරණයක්. අනෙක් කාරණය, ඔප්පුවක් බලපත්‍රයක් දී නැතැයි කිව්වා. හැම දෙනාටම බලපත්‍ර යවා තිබෙනවාය යවා තිබෙන්නේ තාවකාලික බලපත්‍රයක්ය යනුවෙන් මගේ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමා ඊයේ සවස කිව්වා. මායිම් දමා නැහැ. මැනලා නැහැ. මැනලා දෙන්නට පුළුවනි. මායිම් දමා මේ පනත යටතේ පර්මිට් එකක් දුන්නාම ඊට පස්සේ මතු අනාගතයේදී ඇති වන ආණ්ඩුවකට හිතුවක්කාර අන්දමට එය කැන්සල් කරන්නට පුළුවනැයි හිතන්නට පුළුවන්කමක් මට නැහැ. එහෙම කරන්නට බැහැ. දැන් තිබෙන පාලන ක්‍රමයේ හැටියට එවැන්නක් කරන්නට බැහැ. හැබැයි, පනතක් ගෙනෙන්නට පුළුවනි. අසුවල් අයට අයත් අසුවල් ඉඩම් අවලංගු කළ යුතු යැයි පනතක් අළුතින් ගෙනෙනවා විනා දැන් තිබෙන "Crown Lands Ordinance" එක යටතේ නම් ඒ විධියේ නියෝග පනවන්නට පුළුවන් යැයි මා හිතන්නේ නැහැ. හැබැයි, කොමියුනිස්ට් රජයක් යටතේ නම් වලව්, බූදල, දේපොළ, සේරම රජයට ගන්නට පුළුවනි. එහෙත් දැන් අප කරන්නේ ඇමති මණ්ඩලයේ තීරණය උඩ "Crown Lands Ordinance" එක යටතේ ඒ ඉඩම්වලට ඔප්පු දීමයි. එවැනි ඔප්පුවක් අවලංගු කරන්නට, මින් පසුව බලයට පත් වන රජයකට පුළුවන්කමක් ලැබෙන්නේ කොහොමද? කලින් රජයක් යම්කිසි නීතියක් යටතේ දුන් දෙයක්, ඉන් පසුව බලයට පත් වන රජයකට හිතුවක්කාර ලෙස අයත් කර ගන්නට බැහැ. එම ඉඩම් ආපසු ගන්නට පුළුවන්කම ලැබෙන්නේ, දැනට තිබෙන නීතිය යටතේ ඒවාට වන්දි ගෙවීමෙන් පසුවයි. එහෙම නැතිව හිතුවක්කාර ලෙස "අසුවල් අයගේ අසුවල් ඉඩම් බලහත්කාරයෙන් රජයට ගත යුතු යයි" ලැයිස්තු ඉදිරිපත් කරන්නට බැහැ. එක්තරා අවස්ථාවකදී යම් යම් අයගේ නම් ඉදිරිපත් කරමින් එල්ලුම් ගස් යවන්නටත් හැදුවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒ ඇමති මණ්ඩලයේ තමුන්නාන්සේත් හිටියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔව්, ඒක ඇත්ත. සභානායක වශයෙන් එය ඉදිරිපත් කළේ මායි. එසේ කළේ ඇමති මණ්ඩලයේ වැඩි දෙනාගේ තීරණය අනුවයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒකමතික තීරණය.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ විධියට නම් කර එල්ලුම් ගස් යවන්න බැරි වුණා. එහෙම කටයුතු කළ අය දැනුත් හිතුවක්කාර විධියට කටයුතු කරන්න අදහස් කරනවා. ලංකාව හැදුණු රටක්. නොහැදුණු වල් රටක් නොවෙයි. හැදුණු රටක අනුගමනය කරන සාමාන්‍ය ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

මේ ඉඩම් බදු දී තිබෙන්නේ හිතුවක්කාර විධියට නොව නීත්‍යානුකූලව බව නැවත වරක් මතක් කරන්න කැමතියි. රජයේ ඉඩම් ආඥා පනතේ 61(6) වැනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරතුමා විසින් ඇමතිවරයාට පවරා ඇති බලතල අනුව, කැබිනට් මණ්ඩලයේ තීරණයක් උඩයි, මේ ඉඩම් බෙදා දී තිබෙන්නේ. පසුගිය රජය පැවති කාලයේදීත්, කැබිනට් මණ්ඩලයේ තීරණයක් උඩ ස්ථිර ප්‍රතිපත්තියක් වශයෙන් ඉඩම් බෙදා දී තිබෙනවා. විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දීමේ නියම තත්ත්වය එය බව පෙන්වා දෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.55

**එච්. එම්. නවරත්න මයා.** (මිනිපෙ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)

කථානායකතුමනි, විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් රජයට විරුද්ධව ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව පිළිබඳ විවාදයේදී මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඉඩම් ඇමතිතුමා සිය පිළිතුරු කථාවේදී කීවා, එක්දහස් නවසිය හැට ගණන්වල ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය පැවති කාලයේදීත්, අක්කර 25 බැගින් මන්ත්‍රීවරුන්ට ඉඩම් දුන්නාය කියා. ඇමතිතුමාගේ ඒ ප්‍රකාශය අමූලික බොරුවක්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please. The hon. Member cannot say "අමූලික බොරුවක්".

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)

පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉඩම් මධ්‍යම පාන්තිකයන් අතර බෙදා දීම සම්බන්ධයෙන් කොළඹ දිසාපතිතුමා ගැසට් නිවේදනයක් පළ කළා. මාත් ඉල්ලුම් පත්‍රයක් ඇම්මා. එහෙත් මට ඉඩම් ලැබුණේ නැහැ. ඒ ගැසට් නිවේදනය අනුව ඉල්ලුම් කළ සමහර අයට තමයි, අක්කර 25 බැගින් පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ඉඩම් ලැබුණේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉල්ලුම් පත්‍ර කැඳවා තමයි, කාටත් ඉඩම් දෙන්නේ.

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)

පසුගිය රජය කාලයේ ඉඩම් බෙදා දුන්නේ ඒ අන්දමට මිස, මෙවැනි විශේෂ බදු ක්‍රම යටතේ අක්කර දහස් ගණනින් නොවෙයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා අක්කර ගණනක් සඳහන් කළා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒවාත් ඉඩම්.

**නවරත්න මයා.**
*(திரு. நவரத்ன)*
(Mr. Nawaratna)

මේ විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් බෙදා දී තිබෙන්නේ කොළඹ කුරුඳුවත්තේ ගොවි මහතුන්ටයි. එසේ ඔවුන්ට බෙදා දී තිබෙන්නේ උතුරේ හා බින්තැන්න ප්‍රදේශයේ ඉඩම්. බින්තැන්න ගැන මා හොඳින් දන්නවා, එය මගේ යාබද ආසනයට අයත් ප්‍රදේශයක් නිසා. දැන් මේ ගොවි මහත්වරුන් ගොවිතැන් කරන්නේ කොළඹයි. ගොවිතැන් කටයුතු වෙනුවෙන් ඔවුන්ට දුන් විදේශ විනිමය වැය කර ගෙන්වා ගත් රථ වාහන දැන් කොළඹ ප්‍රදේශයේ දිවෙන බව මා නොකීවාට තමුන්නාන්සේලා කවුරුනුත් දන්නවා. ජීප් රථ තිබෙන්නේ කොළඹයි. එහෙත් ඉඩම් දුන්නේ බින්තැන්නේයි. මෙසේ බින්තැන්න ප්‍රදේශයෙන් ඉඩම් ලැබුණු ගොවි මහතුන්ගේ නම් ලැයිස්තුව මම කියවන් නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාසන් සහ සමාගමට අක්කර 1,000යි. මුසාජී සහ සමාගමට අක්කර 1,000 යි. ලංකා දුම්කොළ කොම්පැණියට අක්කර 500 යි. ඒ. ආර්. එන්. ද පොන්සේකාට අක්කර 500 යි. එච්. එම්. නසීර් හමීදි අක්කර 250 යි. ඩී. එප්. කේ ජයමහ අක්කර 100 යි. ඩබ්ලිව්. ජී. පෙරේරා අක්කර 500 යි. සීමාසහිත සාරභූමි සහ සමාගම අක්කර 500 යි. ඒ කියන්නේ තුඩාවේ සහ සමාගම. ආර්. එල්. ජයකොඩි අක්කර 500 යි. සීමාසහිත සමීර් සහ සමාගම අක්කර 500 යි. දිවුල පැලස් fපාම්ං සමාගම අක්කර 1000 යි. මාතර බුද්ධදාස අතපත්තු අක්කර 500 යි.

ඔන්න ඔය විධියේ ගොවි මහත්වරුන්ට බින්තැන්නෙන් ඉඩම් ලැබී තිබෙනවා. ලක්ෂණට ඇති. කාර්සන් කම්බබැච් සමාගම ගොඩනැගිලි සඳහා රුපියල් 1,40,000 ක් වියදම් කර තිබෙනවාය කියා සඳහන් කර තිබෙනවා. එසේ සඳහන් කර තිබෙන්නේ ආදායම් බදුවලින් බේරීමටයි. රුපියල් 1,40,000 ක් ගොඩනැගිලිවලට වියදම් කර තිබෙනවාය කියා ඔවුන් කියනවා. එහෙත් මා ආණ්ඩුවට කියනවා රුපියල් 15,000ක ගොඩනැගිලිවත් හදා තිබෙනවාද කියා කමිටුවක් පත්කර පරීක්ෂණයක් කරවන්නය කියා. රුපියල් 15,000ක වත් ගොඩනැගිලි හදා නැති බවට මා අභියෝග කරනවා. මුසාජීස් සමාගම රුපියල් 1,75,000 ක ගොඩනැගිලි හදා තිබෙනවාලු. එයත් මා මුලින් කීවාක් මෙන්ම අමූලික බොරුවක්. ඒ අය රජයට ඉදිරිපත් කරන්නේ ඔන්න ඔය විධියේ අමූලික බොරු වාර්තා. [බාධාකිරීමක්] එහෙනම් ඒ වාර්තාව සත්‍යයෙන් තොරයි කියා මා කියනවා. ඔවුන් ඔය විධියට අසත්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේ ආදායම් බද්ද නොගෙවා පැහැර හැරීමටයි. විශේෂ බදු ක්‍රමයට ඉඩම් ලබාගත් කොළඹ සිටින මේ ගොවි මුදලාලිලා මේ විධියට ආණ්ඩුව මුලා කරමින් කරන්නේ මොකක්ද? ජීප් රථයෙන් සතියකට වරක් බින්තැන්න ප්‍රදේශයට ගොස් සතුන් මර මරා තුවක්කු ලයිසන් ලබාගෙන තිබෙනවා— ඒවා අනුභව කරමින් සති අන්තය ගතකොට නැවත කොළඹට එන එකයි මේ ගොවි මුදලාලිලා කරන්නේ. ඒක නේද මේ අයගේ ගොවිතැන් කිරීම කියා මා අහනවා. කාසන් කම්බබැච් මුසාජීප් ආදී කොම්පැනිවලට බින්තැන්න ප්‍රදේශයෙන් දී තිබෙන ඔය ඉඩම් සිංහල රජ කාලයේ සාර්ථක ලෙස ගොවිතැන් කළ සරු සාර ඉඩම් බව ගරු ඇමතිතුමා පිළිගන්නට ඕනෑ. ඒවා මහවැලි ගඟ අයිනේ තිබෙන ඉඩම්. වතුර නැහැ කියන්න පුළුවන්කමක් නැහැ. මේ ගොවි මුදලාලිලා ඒ ඉඩම් අරගෙන කළේ මොකක්ද? ප්‍රථමයෙන්ම විදේශ විනිමය ලබාගෙන පිට රටින් ලොරි ගෙන්වා ගත්තා. ඒ ලොරිවලින් ඒවායේ තිබුණු රුපියල් ලක්ෂ ගණන් වටිනා කළුවර, බුරුත, නැදුන් ආදී ගස් කොළන් කපා කොළඹට ගෙනාවා. ඒ මදිවාට ආදායම් බද්දෙනුත් නිදහස් වීමට අපි මෙපමණ වියදම් කළාය කියා බොරු ගණන් ආණ්ඩුවට ඉදිරිපත් කර බදු ගෙවීමත් පැහැර හරින බව මා කියනවා. එසේ අයබදුවලින් නිදහස් කිරීම නිසා මේ ගොවි මහත්වරුන්ගෙන් ආණ්ඩුවට එන්නට තිබූ විශාල මුදලක් ආණ්ඩුවට නැති වී තිබෙන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. අපේ විදේශ විනිමය විශාල වශයෙන් පිට රටට ඇදී යන අතර ලංකාවේ සිටින ඔය ගොවි මුදලාලිගෙන් එන්නට තිබෙන අය බදු පවා අය කර ගැනීමට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා මෙහි නැති වීම ගැන මා කණගාටු වෙනවා. මා මේ කාරණය ගැන ගරු ඇමතිතුමාට පැමිණිලි කළා. මධ්‍යම පන්තියේ අය පමණක් නොවෙයි, මිනිපේ ආසනයේ මුදල් තිබෙන දක්ෂ ගොවි මහත්වරුන් සිටිනවා. ඒ ගොවි මහත්වරුන් ඉඩම් ඉල්ලුවා. එහෙත් ඒ අයට සුදුසුකම් තිබෙද්දීත් ඉඩම් අක්කරයක්වත් ලැබුණේ නැහැ. මා ස්ථිර ලේකම්තුමත් හමු වී මේ ගැන පැමිණිලි කළා. එම්. බී. ඩබ්ලිව්. මැදිවක මහත්මයාට හසලක ගොවි ජනපදය ඇතුළෙ අක්කර 29ක් දීලා තියෙනවා. ගොවි ජනතාවට වගා කරන්නට කිසිම තැනක් නැහැ. එහෙත් අක්කර 30, 40, 50 සමහරවිට අක්කර දහස් ගණන්, එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ මැදිවක මහත්මයා වැනි අයට දෙන විට ගොවි ජනතාව කොහේ යන්නද?

ගරු කථානායකතුමනි, අද ධනේශ්වර පන්තියට දුන් ඉඩම්වලින්, කොම්පැණිවලට දුන් ඉඩම්වලින් ගස් කැපුවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නවරත්න මයා.]

කිසිම තඩුවක් නැහැ. එහෙත් අක්කර 5 ක් තිබෙන ජනපද වාසීන්ට තමන්ගේ ඉඩමේ තිබෙන ගහ කපා ගන්නට බලපත්‍රයක් ඕනෑ. බලපත්‍රයක් නැතිව ඒ ගස් කැපුවොත් ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරනවා. කුරුඳුවත්තේ ධනපති ගොවි මුදලාලිලාට දී තිබෙන ඉඩම්වල දහස් ගණන් ගස් කපාගෙන ගිහින් විශාල මුදල් වලට විකිණීම ගැන කිසිම දෙයක් කරන්නෙ නැහැ. ඔවැනි තත්ත්වයක් අද තිබෙනවා.

අපට උදේන්ම අහන්නට තිබෙන්නේ ගුවන් විදුලි පච ප්‍රචාරයයි. දැනට සතියකට පමණ පෙර ගුවන් විදුලි පච ප්‍රචාරයෙන් කිව්වා, විශේෂ බදු ක්‍රමය යටතේ දී තිබෙන ඉඩම්වලින් විශාල අස්වැන්නක් ලැබී තිබෙනවාය කියා. ගුවන් විදුලි පච ප්‍රචාරය මගින් එසේ ප්‍රකාශ කරන්නට ඇත්තේ, ඊයේ සිට මේ විශ්වාස භංග යෝජනාව විවාද වන නිසා, මහජනයා මුලා කරන්නට බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. ගොවිතැන් කර තිබෙන්නේ ගුවන් විදුලියේ පමණයි. මුසාජි සමාගම කුකුල් කෑම සැපයීම සඳහා අක්කර 100 ක පමණ ගොවිපළක් ඇති කර තිබෙනවා. එය බලන්නට මා ගියා. කුකුළන්ට අවශ්‍ය කෑම සඳහා වගා ඇති කර තිබෙනවා. මේ රටේ කුකුළන්ට එදිනෙදා විශේෂ ආහාර ලැබෙනවා. එහෙත් මේ ජනතාවගේ එදිනෙදා ආහාරයට අවශ්‍ය කිසිම දෙයක් ගොවිතැන් කරන්නෙ නැති බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු කථානායකතුමනි, මා නියෝජනය කරන මිනිපේ ආසනයේ ගඟේවත්ත ගොවි සමුපකාර සමිතිය වගා කිරීම සඳහා අක්කර 250 ක් ඉල්ලුවා. ඒ සඳහා රුපියල් 250 ක් බඳින්නට නියම කළා. මුදල් බැන්දට පස්සෙ කිව්වා, මුදල් ආපසු ගන්නය, ඒ ගොවි සමුපකාර සමිතිය ඉඩම් ලැබීමට සුදුසු නැත කියා. ඒ සමිතියේ සිටින අය සියයට සියයක්ම ගොවීන්. රට ස්වයම්පෝෂිත කිරීම සඳහා දිවා රෑ නොබලා වැඩ කරන්නේ ඒ අයයි. එහෙත් ගොවි ජනතාව නගා සිටුවනවාය කියන මේ ආණ්ඩුව ගොවි සමුපකාර සමිතිවලින් ඉඩම් ඉල්ලුවම ඉඩම් දෙන්නෙ නැහැ. එහෙත් ධනපති ගොවි මුදලාලිලාට, මුසාජි, කෘසන් ආදි කොම්පැණිවලට අක්කර දහස් ගණන් දී තිබෙන බව ප්‍රකාශ කරන්නේ ඉතා කණගාටුවෙන්. ගරු අගමැතිතුමා බින්තැන්න ප්‍රදේශයට ගියාම සතුටු වන්නට ඇති. එහෙත් ඒ ප්‍රදේශයේ විශේෂ බදු ක්‍රමය යටතේ දී තිබෙන ඉඩම් වලින් නියම ප්‍රයෝජන ලැබෙනවාද කියා නැවතත් ඒ ප්‍රදේශයට ගොස් බලන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අගමැතිතුමා හෝ ඇමතිවරුන් හෝ ඒ කෘෂිකර්ම කටයුතු බලන්නට යන බව දැනුම් දුන්නාම කොහෙන් හෝ මිනිසුන් ටික දෙනකු කැඳවාගෙන පොළොව කොටවීම විශේෂ බදුකාරයන්ගේ වැඩ පිළිවෙලයි. ඇමතිවරුන් ඒවා බලා ආපසු ආවායින් පසුව නැවතත් ඒවා පෙර පරිදිමයි. විශේෂ බදුකාරයන් ගොවිතැන් කරන්නේ ඔය විධියටයි. ඇත්තෙන්ම ඔය ගොවි මුදලාලිලාට ඉඩම් දීලා නම් මේ රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන් වන්නේ නැහැ. මේ රට ස්වයංපෝෂිත කරන්නට වුවමනා නම් ගොවි ජනතාව අතර ඉඩම් බෙදා දිය යුතුයි. දෙන ලද මේ ඉඩම් ආපසු ලබා ගන්නට බැරි බවකුත් කියැවුණා. කෙසේ වෙතත් මෙම ආණ්ඩුව පරාජයට පත් වූ දවසට පසුවදා නීතියෙන් බැරි පුළුවන් බව කෙසේ වෙතත් මේ රටේ ගොවි ජනතාව බින්තැන්න ප්‍රදේශයේ ඉඩම් ආපසු අල්ලා ගන්නා බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.8

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

ගරු කථානායකතුමනි, ඊයේ සිට පැවැත්වෙන මෙම විවාදයේදී ඉදිරිපත් කරන ලද කාරණා අප බොහොම හොඳින් අසාගෙන සිටියා. පළමුවෙන්ම විශ්වාස භංග යෝජනාවෙන් ඉදිරිපත් කරන ලද කාරණා මොනවාදැයි තේරුම් බේරුම් කර ගතහොත් ඒවාට නියම පිළිතුරු දෙන්නට අපට පුළුවන් වන බව මතක් කරන්නට කැමතියි. කෙසේ වෙතත් මෙම යෝජනාවෙන් ඉදිරිපත් වන අදහස්වලට පිටස්තර කාරණා මෙම විවාදයේදී ඉදිරිපත් වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොයෙකුත් තැන්වල පැවැත්වෙන ප්‍රචාරක රැස්වීම්වලදී අවුරුදු ගණනාවක් තිස්සේ බෙරිහන් දෙමින් කියාපාන ලද කාරණා මෙම විවාදයේදීද ඉදිරිපත් කිරීමෙන් ඇත්තෙන්ම යෝජනාවෙන් පිට පැන තිබෙන බව පෙනී යනවා. ඒ ප්‍රචාරක අදහස්ද සැලකිල්ලට ගතහොත් මෙම යෝජනාවෙන් කියැවෙන ප්‍රධාන අදහස් දෙක තුනට පිළිතුරු සැපයීම කරදර සහිත වෙනාව. හොඳයි, මෙම යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන කාරණා මොනවාද ? විශේෂ බදු මණ්ඩලය මගින් රජයේ ඉඩම් විදේශීය හා දේශීය ධනපතියන්ට, ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු ලේකම්වරුන්ට, හා ඔවුන්ගේ භාර්යාවන්ට දී තිබෙනවාලු. මේ රජය, වන සම්පත් විනාශ කිරීමට කටයුතු කර තිබෙනවාලු. රථවාහන හා මැෂින් ආදිය දෙන ලද අතර ඒවායින් අනිසි ප්‍රයෝජන ගන්නවාලු. රජය මේ කාරණා සම්බන්ධයෙන් නිසි පියවර නොගැනීම නිසා රජය කෙරෙහි විශ්වාසයක් නැතිලු. ඉතින්, විශේෂ බදු මණ්ඩලය මගින් රජයේ ඉඩම් බදු දීම වරදක් හැටිය පෙන්වා තිබෙනවා. කොම්පැණිවලටත් වෙනත් පුද්ගලයන්ටත් ඉඩම් බදු දීම වැරදි බවකි, පළමුවෙන්ම කියන්නේ. ඒ දීම නීත්‍යානුකූල නැතැයි දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්ජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඊයේ එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා. රජය වෙනුවෙන් කථා කළ ඉඩම් අමාත්‍යාංශයේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් ඒවාගේම ගරු ඉඩම් ඇමතිතුමාත් විරුද්ධ පක්‍ෂයේ ඒ කථාවලට සෑහෙන පිළිතුරු සපයා තිබෙනවා. එහෙත් සංක්ෂේපයෙන් ඒ ගැන වචනයක් දෙකක් කිය යුතුයි. පෞද්ගලික දේපළ අයිතිවාසිකම් තිබීම පමණක් නොව නිෂ්පාදන කටයුතු සඳහා ඒ පෞද්ගලික අංශය යොදා ගැනීමත් මේ රජය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන තිබෙනවා. ගොවිතැන් කටයුතුවල හෝ ආහාර නිෂ්පාදන කටයුතුවල හෝ කර්මාන්තවල හෝ වෙනත් නොයෙක් විධියේ ව්‍යාපාරවල හෝ නියුක්ත වීමට පෞද්ගලික අංශයට ඉඩ දී එයින් ප්‍රයෝජන ගැනීම මේ රජයේ ප්‍රතිපත්තියක්. මිශ්‍ර ආර්ථික ක්‍රමයක් පවත්වා ගෙන යාමේ න්‍යාය ධර්මය උඩ අප එසේ කටයුතු කරගෙන යනවා. ඒ ප්‍රතිපත්තිය අනුව දැන් මේ රජය යම් යම් පියවරවල් ගෙන තිබෙනවා. විශේෂයෙන්ම ආහාර නිෂ්පාදන ව්‍යාපාරය එයින් මුල් තැනක් ගන්නා එකක්.

ආණ්ඩු පක්‍ෂයේ මෙන්ම විරුද්ධ පක්‍ෂයේත් කණ්ඩායම් කීපයක් සිටිනවා. මාක්ස්වාදී පක්‍ෂවලට අයත් සමසමාජ පක්‍ෂය හෝ වේවා, කොමියුනිස්ට් පක්‍ෂය හෝ වේවා——

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මහජන එක්සත් පෙරමුණ හෝ වේවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)
ඔය පැත්තේ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
නෑ, ඔය පැත්තේ මාක්ස්වාදී පක්‍ෂය.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)
පෞද්ගලික දේපල අයිතිවාසිකම් සම්බන්ධයෙන් කුමන විධියේ ප්‍රතිපත්තියක් දැන් අනුගමනය කරනවාද යන්න අපට නම් ප්‍රහේළිකාවක්. ඒ පක්ෂවල ගරු මන්ත්‍රීවරුන්වත් එය හරිහැටි දන්නවාදැයි මා දන්නේ නැහැ. මාක්ස්වාදී පක්ෂවල දේශපාලන ප්‍රතිපත්ති එක් එක් කාලවලදී නොයෙක් නොයෙක් ආකාරයෙන් වෙනස් වී තිබෙන නිසා, ඉඩකඩම් හෝ වෙනත් බන් ධ.,උගුඩහෝ ගද වද මිඩ ම කව්වද දේපල හෝ රජය පමණක් සන්තක කර ගෙන ඒ මාර්ගයෙන් නිෂ්පාදන දියුණු කිරීම කවදාවත් සිදු වන දෙයක් නොවෙයි. එම නිසා, විරුද්ධ පක්ෂය මොන න්‍යාය ධර්මයක් උඩ ක්‍රියා කරනවාද යන්න අප කල්පනා කර බැලිය යුතුයි. එදා ඒ උදවිය දැරූ අදහස් උදහස්වල හැටියට තුන් අවුරුදු වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ගරු ඉඩම් ඇමතිතුමා ඒ ගැන කරුණු සඳහන් කළා. 1962 දී එම සැලැස්ම ප්‍රසිද්ධියට පත් කර තිබෙනවා. එදා අගමැතිණි


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

යව සිටි, අද විරුද්ධ පාර්ශ්වයේ නායිකා වගේ ප්‍රධානත්වයෙන් එතුමියගේ අත්සන් ආදිය ඇතිව ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළ මෙයයි. මෙහි නොයෙක් අදහස් ඇතුළත් වී තිබෙනවා. නිෂ්පාදන වැඩ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ගොවි කර්මාන්තය සම්බන්ධයෙන් පෞද්ගලික අංශයට අවස්ථාවක් දිය යුතුය, කොයි කොයි අන්දමට කුමන ක්‍රමයකට, ඒ අවස්ථාව දිය යුතුද, ආදි වශයෙන් විස්තර මේකට ඇතුළත් කර තිබෙනවා. පිටුවක් පාසා මේ පොත කියවන්නට වුවමනා කරන්නේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ න්‍යාය ධර්මයන්ට එකගව තීරණය කළ ප්‍රතිපත්ති තමයි මේ වාර්තාවට ගැබ් කර තිබෙන්නෙ. පෞද්ගලික අංශයට අවස්ථාවක් සලසා දෙමින් ඉන් ප්‍රයෝජන ගතයුතුය කියා අදහස් කරන මේ ආණ්ඩුවට උග්‍ර ප්‍රශ්නයකට මුහුණ දෙන්නට තිබුණු අවස්ථාවකදී ඒ පියවර අපි ගත්තා.

1962 වර්ෂය ගැන බලමු. 1962 වර්ෂය ගැනම මා සඳහන් කළේ මේ නිර්දේශ සියල්ලක්ම අඩංගු කර ඒ ක්‍රියාත්මක වැඩ පිළිවෙළේ මුල් පිටුවේම එවකට අගමැතිවරිය වශයෙන් කටයුතු කළ වර්තමාන විරුද්ධ පාර්ශ්වයේ නායිකාව කියා තිබෙන කාරණයක් ගැන මතක් කරන්නටයි. යුද්ධයකට මුහුණ දෙන්නට යම්සේ කටයුතු කරනවාද ඒ හා සමානව මේ රටේ තිබෙන උග්‍ර ආර්ථික තත්ත්වය පිළිඳවත් කටයුතු කළ යුතුය කියා එතුමිය සඳහන් කර තිබෙනවා. 1962 තත්ත්වය එතරම් උග්‍ර වී තිබුණා නම් 1965, 1966 වන විට තත්ත්වය කෙතරම් උග්‍ර වුණාද කියා වටහා ගන්නට ගරු මන්ත්‍රීතුමන්ලාට අපහසුවක් නැහැ. ඒ කෙටි කාලීන සංවර්ධන සැලැස්මේ ක්‍රියාත්මක කළයුතු නිර්දේශ එකක්වත් හරියාකාරව ක්‍රියාත්මක කරන්නට බැරි වුණා නම් බැරි වුණේ කුමන හේතුන් නිසාද කියා ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. කොයි තරම් ශීඝ්‍ර අන්දමින් අවුරුද්දෙන් අවුරුද්දට අපේ විදේශ විනිමය තත්ත්වය උග්‍ර වුණාද ? විනිමය පාලනය කිරීම පිණිස නොයෙක් නොයෙක් නීතිරීති පිළියෙළ කරන්නටත් බලපත්‍ර ක්‍රම ඇති කරන්නටත් එතුමන්ලාට සිද්ධ වුණේ එම නිසයි. එකල තත්ත්වය එහෙම නම් තවත් අවුරුදු හතරක් පහක් ගතවී තිබෙන මේ අවස්ථාවේදී යුද්ධයකට මුහුණ දෙනවා හා සමාන අන්දමින් විශාල උත්සාහයක් දරා අපේ ආර්ථික තත්ත්වය උසස් කර ගත යුතුය යන හැඟීම ඊටත් වඩා කොයි තරම් උණුසුම්ව මේ ආණ්ඩුවට තිබිය යුතුද යන්න ගැන තමුන්නාන්සේලා කල්පනා කළ යුතුයි. අද තිබෙන මේ තත්ත්වය ගැන අපි සොයා බැලුවා. තමුන්නාන්සේලාත් මේ ප්‍රශ්නය ගැන සොයා බලා තිබෙන බව මේ වාර්තාවලින් පෙනෙනවා. කොයි තරම් මහන්සි වුණත් දිගටම කරගෙන ආ නිෂ්පාදන ක්‍රම මගින් පමණක්, ගොවීන්ගේ මාර්ගයෙන් පමණක්, මේ රටට වුවමනා කරන සෑම ආහාර වර්ගයක්ම සපයා ගන්නට ගියොත් දීර්ඝ කාලයක් ගතවෙනවාය යන්න මේ සැලැස්මේත් සඳහන් කර තිබෙනවා. අවුරුදු පනහක් හැටක් ගියත් ඒ කාර්යය ඉෂ්ට කර ගන්නට බැරි වේවිය යන අඩමානය මේකෙන් සඳහන් කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේක ඉතාමත්ම දුෂ්කර කාර්යයක්. අවුරුදුපතාම කෝටි 80 ක් පමණ වැය කර පිටරටින් මේ රටට ආහාර වර්ග ගෙන්වනවා. ඒ කෝටි 80 න් කෝටි 55 ක් පමණවත් වටිනා ආහාර ද්‍රව්‍ය— මිරිස් හෝ වේවා එනු හෝ වේවා, බඩ ඉරිඟු හෝ වේවා ඔය ආදී සෑම ආහාර වර්ගයක්ම —මේ රටේම වගා කර ස්වයංපෝෂිත කිරීම එතරම් පහසු දෙයක් නොවෙයි. පුළුවන් තරම් ආධාර කරල, තමන්ගේ උත්සාහයට සරිලන මුදලක් ලබාගැනීමට ක්‍රම සලස්වල, ණය ක්‍රම ආදි නොයෙක් විධියේ පහසුකම් ඇති කරල, ඉඩම් ලැබෙන්නට වැඩ පිළිවෙල යොදල ක්‍රියා කරගෙන යන නිසා දැන් ගොවි ජනතාව තුළ ලොකු උනන්දුවක් තිබෙනව, අතිරේක ආහාර නිෂ්පාදනය කරන්න. වී වගාවත් එහෙමයි. එපමණකින් අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්ට පුළුවන්කමක් නැති නිසා මේ රජය කල්පනා කළා, තාවකාලිකව අවුරුදු ගණනකට බදු ක්‍රමයක් යටතේ ඉඩම් බෙදා දී මිළ මුදල් තිබෙන පිරිසටත් ආහාර නිෂ්පාදනය කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුයි කියා. ඒ උදවියගේ මිළ මුදල් ආහාර නිෂ්පාදනය සඳහා යොදවා ගන්න අපි කල්පනා කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ආර්ථික පදනම පළල් කර ඉක්මණින් රට ස්වයංපෝෂිත කර ගන්ට නම් යුද්ධයකට මුහුණ දෙන රටක් හා සමානව ළහිලහියේ ක්‍රියා කරන්න ඕනෑ. ලෝකයේ අද පවතින තත්ත්වය දිහා බලන විට බලා සිටිද්දී ආහාර මිළ නගින බව පෙනී යනව. යුද බිය ආදි කලබල නිසාත්, අභ්‍යන්තර තත්ත්වයක් නිසාත් අපට දැනට ඇතැම් ආහාර ද්‍රව්‍ය ලැබෙන රටවලිනුත් ඉදිරියේදී ආහාර නොලැබෙයි කියා අඩමාන තත්ත්වයක් පවතින නිසාත් අපට යොදන්ට පුළුවන් හැම උත්සාහයක්ම හැම මාර්ගයක්ම ආහාර නිෂ්පාදනය සඳහා යෙදිය යුතුයි කියන චේතනාවෙන් තමයි, මේ අන්දමට අපි ක්‍රියා කරන්ට තීරණය කළේ. පෞද්ගලික අංශයට මේ බෙදා දී තිබෙන ඉඩම් ගොවි මහත්වරුන් ඉල්ලුවාය නමුත් දුන්නේ නැත කියනව නම් ඒක වැරදියි. මේ රටේ ගොවි ජනතාවටත්, මධ්‍යම පන්තියේ පිරිසටත්—විශේෂයෙන් ගොවි ජනතාවට—නොයෙක් ආකාරයෙන් ඉඩම් බෙදා දී තිබෙනව. ජනපද ක්‍රම යටතේ හෝ වේවා, බලහත්කාරයෙන් පදිංචිව සිටින ඉඩම්වලට ඔප්පු ලබා දීමෙන් හෝ වේවා ඒ කටයුත්ත සිදු කර තිබෙනව. නමුත් නාන්සේලා මේ ඉදිරිපත් කර තිබෙන ලේඛනයෙන් කියා තිබෙනව, කොයිතරම් දුරට ඒ කටයුත්ත කරගෙන ගියත් ඒ ප්‍රශ්නය විසඳන්ට බැහැ කියා. එහි කියා තිබෙනව, රට අතිරේක ආහාර අතින් ස්වයංපෝෂිත වෙන්ට නම් අක්කර 1,50,000 ක පමණ අතිරේක ආහාර වගා කළයුතුයි කියා. මේ ලේඛනයෙම තිබෙන නිසා කියනව නොවෙයි. අපේ නිගමනයත් ඒ හා සමානයි. විවාදයට වුවමනා නිසා නමුත් නාන්සේලා දැන් හුඟක් වෙනත් දේවලුත් කියනවා ඇති. මේ අතර රජය සොයා බැලුව, තමන්ගේ මිළ මුදල් යොදවා මේ කටයුතු කරන්ට ආශාවක් දක්වන පුද්ගලයන් හෝ වේවා, කොම්පැණි හෝ වේවා, පුද්ගල කණ්ඩායම් හෝ වේවා සිටිනවාද, ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය වෙන්නෙ මොන විධියේ පහසුකම්ද කියා. ගොවිතැන් කරන්ට ඔවුන්ට ඉඩම් ඕනෑ. ආහාර වගාව දියුණු කරන්ට ඉඩම් වුවමනායි. ඒ වගේම වගා කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ අවශ්‍යයි. ඒ නිසා විදේශ විනිමය වෙන් කරන අවසථාවලදී පෞද්ගලික ඉඩම්වල ආහාර නිෂ්පාදනයේ සහ සත්ව පාලනය ආදි කටයුතුවල යෙදී සිටින උදවියට ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගැනීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ වාහන ආදිය ගෙන්වා ගැනීමට විනිමය වෙන් කර දී තිබෙනව. අනික් අතින් ඉඩම් නැති එහෙත් ආහාර වගාවේ යෙදෙන්ට කැමති, මිළ මුදල් යට කරන්ට බලාපොරොත්තු වන, ඒ සඳහා ශක්තිය ඇති උදවියට විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් බෙදා දුන්න.

වියළි කලාපයේ අතිරේක ආහාර වගා කිරීම සඳහා බෙදා දුන් ඇතැම් ඉඩම්වල මාස්කන්නයේ වී එහෙම ඉහළ තිබෙන බව අපි දන්නවා. මෙම කටයුතු සඳහා සුදුසු බිම් ප්‍රමාණ වෙන් කර ගත්තේ කෙසේද ? ඇමතිතුමා ප්‍රකාශ කළාක් මෙන් නව අවුරුදු 25කට වත් වුවමනා නොකරන ඉඩම් තමයි, දෙන්නට කල්පනා කළේ. වාරිමාර්ග ක්‍රම යෙදීම සඳහා පරීක්ෂණ කටයුතු පවත්වන ලද ස්ථානවලින් බොහොම ඈත ඉඩම් මේ ගණයට වැටෙනවා. එත කොට වාරිමාර්ග ක්‍රමවලට හිරිහැරයක් වන්නේ නැහැ. ගම් නියම්ගම් පුළුල් කිරීමට වුවමනා කරන ඉඩම් අසු වන්නේත් නැහැ. සම්පූර්ණයෙන්ම ජනාවාසවලින් පිටස්තර කැලෑ බිම් තමයි, ඒ සඳහා තෝරා ගත්තේ. කැලෑ දෙපාර්තමේන්තුව මගින් ලී පවා අස් කර ගෙන තිබෙන කැලෑ සොයලයි දෙන්නට කල්පනා කළේ. අසුවල් අසුවල් දිස්ත්‍රික්කවල අසුවල් ඇසුවල් ඉඩම් දෙන්නට බලාපොරොත්තුව තිබෙනවාය කියා දැනුම් දුන්නා. දිස්ත්‍රික් කෘෂිකර්ම කොමිටිවල සාමාජිකයන් වශයෙන් අපේ ගරු මන්ත්‍රීවරුන් පවා කටයුතු කරන බව අප දන්නවා. ඒ අයගේ රෙකොමදාරු ඇතුවයි අපි ක්‍රියා කර තිබෙන්නේ. සාමාන්‍ය ගොවි ජනතාවගේ ආරක්ෂාව සැලසෙන පරිදි අවුරුදු 25කට වත් වුවමනා නොකරන අන්දමේ ඉඩම් මේ සම්බන්ධයෙන් යොදවන්නට කල්පනා කළේ එම නිසයි. ඒ අනුව සාමාන්‍ය ගොවි ජනතාවගේ වැඩ කොටස් කෙරී ගෙන යනවා. සාමාන්‍ය ගොවි ජනතාවට හිරිහැරයක් සිදු වෙනවාද යන්න හොඳින් සොයා බැලුවාට පසුවයි, මෙම ඉඩම් දී තිබෙන්නේ. නොයෙකුත් අවස්ථාවලදී පාර්ලිමේන්තු මන්ත්‍රීන්ට පවා රජයේ ඉඩම් ලැබී තිබෙන බව කියන්නට යෙදුණා. රජයේ බලපවත්වන නීති රීති සම්මතේ, ඒවා දී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

විශේෂ බදු මණ්ඩලයක් නීතියෙහි සඳහන් වී ඇත්තේ නැහැ. එහෙත් එවැනි මණ්ඩලයක් පත් කර තිබෙන්නේ මේ සඳහා උපදෙස දෙන්නටයි. යම් යම් අවස්ථාවලදී යම්කිසි කොමිටි නැතිනම් මණ්ඩල පත් කර ගන්නට රජය කල්පනා කරනවා, උපදෙස් ලබා ගැනීම පිණිස. ඒ අනුව ඒවා නීතිගත සංස්ථා වන්නේ නැහැ. එම මණ්ඩල නැතිනම් කොමිටි මගින් උපදෙස් ලබා ගෙන කටයුතු කරනවා. ඉඩම් සම්බන්ධයෙන් පත් කර ඇති බදු මණ්ඩලයත් එවැනි එකක්. එහෙත් ඉඩම් දෙන්නේ නීතියෙහි පෙනෙන බලය ලත් පිරිස අතින් මයි. එහි වෙනසක් ඇත්තෙ නැහැ. ඉක්මණින් රට ස්වයංපෝෂිත කරන්නට දෙන රුකුලක් වශයෙනුයි, මෙම බදු මණ්ඩල ක්‍රමය යටතේ ඉඩම් දෙන්නේ. එම ඉඩම් දෙන්නේ ස්ථිර වශයෙන් නොවෙයි. අවුරුදු 25ක බද්දකටයි. අවුරුදු 25 ගත වන විට එම ඉඩම් අවලංගු කරන්නට පුළුවනි. යම් හෙයකින් මුලදී පනවන ලද කොන්දේසි කඩ කර තිබෙනවා නම්, එම ඉඩම් වගා කරන්නේ නැතිව සිටිනවා නම් ඉක්මණින්ම ඒවා කැන්සල් කරන්නට පුළුවනි.

විශේෂයෙන් අතිරේක ආහාර වර්ග මේ වායේ වගා කරන්නට පුළුවන් වේ යැයි අප කල්පනා කළා. විනිමය හුඟක් වියදම් කොට පිටරටින් ගෙන්වන අමු ද්‍රව්‍යත් මෙම ඉඩම් වල වගා කරන්නට හැකි වේ යැයි අප කල්පනා කළා. මෙම ඉඩම් බදු ක්‍රමයට බෙදා දුන් විට ඒවා එළිපෙහෙලි කිරීම සඳහා නොයෙකුත් අන්දමේ යන්ත්‍රෝපකරණ යොදවන්නට සිදු වෙනවා. අක්කර 30, 40, 50 පමණක් නොවෙයි විශේෂයෙන් ඊටත් විශාල ප්‍රමාණයේ ඉඩම් එළි කරන විට නොයෙකුත් අන්දමේ යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකර ඒවායේ කටයුතු කරන්නට බැරි වෙනවා. එසේ යන්ත්‍රෝපකරණ යොදවා ක්‍රියා කිරීමේදී වැඩ කරන උදවියට යන්ත්‍රෝපකරණ පිළිබඳ විශාල අත්දැකීමක් ලැබෙනවා. එම යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීමට යෙදෙන පිරිසට විශේෂ පුහුණුවක්, ඇබ්බැහිවීමක් ඒ අනුව ඇති වෙනවා. ඒක අපේ රටට සිදු වන ලොකු ප්‍රයෝජනයක්. එය මේ රටට ඇති වන ප්‍රයෝජනයක්. විශේෂයෙන්ම ගොවිතැන, වෙළඳාම, ආදී නොයෙකුත් අංශවල නොයෙක් කටයුතු යටතේ හෝ කිසිම රැකිරක්ෂාවක් ලබා ගැනීමට නොහැකිව සිටින දැන උගත්කම් ඇති තරුණයන් සෑහෙන සංඛ්‍යාවකට ඒ ඒ පළාත්වලින් ඉඩකඩ ලැබෙනවා ඇති. දැනටමත් එසේ ලැබී තිබෙනවා.

ඊයේ කළ කථාවේදී ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් යම් යම් පර්යේෂණ කටයුතු කෙරීගෙන යනබව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කියා තිබෙනවා. මිරිස්, එනු, බඩඉරිඟු ආදී නොයෙක් බෝග වර්ග වගා කිරීම දැනට වඩා කෙරන්නට ඉඩ තිබෙනවා. රජය මගින් හැම දෙයක්ම කෙරේ නැයි බලාපොරොත්තු වන්නට හොඳ නැහැ. එහෙම කරන්නට බැහැ. රජයෙනුත් එක්තරා ප්‍රමාණයක් වැඩ කෙරෙනවා. ඒ අතර පෞද්ගලික අංශවලිනුත් වැඩ කෙරෙන්නට ඕනෑ. රජයෙන් කෙරෙන වැඩ කටයුතුවලින් නොයෙක් අත්දැකීම් ලැබෙනවා. ඊට අතිරේකව පුද්ගලයන්ගේ වැඩවලිනුත් අත්දැකීම් ලැබෙනවා. ඒ මගිනුත් නිෂ්පාදන වැඩිකර ගන්නට පුළුවනි. එය තවත් ප්‍රයෝජනයක් හැටියට සලකනවා.

අපට වුවමනා කරන ආහාර ද්‍රව්‍යවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ලෝකයේ නොයෙක් රටවලින් අවුරුදුපතා ගෙන්වා ගන්නවා. හාල්, මිරිස්, සීනි, එනු, වැනි දේවල් මෙන්ම කිරි ආහාර වර්ගත් විශාල වශයෙන් ගෙන්වා ගන්නවා. අර්තාපල් වෙනුවෙන් පසුගිය කාලයේ විශාල මුදලක් පිට රටවලට යැව්වා. ඒවා ගෙන්වන්නේ නැතැයි පාරිභෝගිකයන් ඝෝෂා කරනවා නම් ඉන් එහාට හැරිලා කවුරුවත් බලන්නේ නැහැ. මොන විධියේ රටකින්ද, මොන විධියේ සංවිධානයකින්ද ඒවා ගෙන්වන්නේ, කියා බලන්නේ නැහැ. ධනපතියන් නිෂ්පාදනය කරන දේවල්ද, මෙහි ප්‍රයෝජනය ගන්නෝ ධනපතියෝද, යනාදි වශයෙන් බලන්නේ නැහැ. එහෙම බැලීමක් ඇත්තේ නැහැ. කාට ගියත්, මුදල් වශයෙන් කොයි තරම් ප්‍රමාණයක් ගියත් කමක් නැහැ. අවශ්‍ය විනිමය ගෙවා අවශ්‍ය භාණ්ඩ පාරිපෝගිකයාට ලබා දෙන්නට ඕනෑය කියා පිටරටවලින් ගෙන්වනවා. එවැනි තත්ත්වයක් තිබෙනවා නම් කල්පනා කළ යුත්තේ කෙසේ ද? මෙය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලහි ලහියේ කළ යුත්තේ නම්, හැකි තාක් ඉක්මනින් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කළ වන්නට ඉඩ හරින්නට බැරි නම් මෙය රජයේ ගොවිපොළවලින් හෝ සාමාන්‍ය ගොවි ජනතාවගේ වැඩ කටයුතුවලින් පමණක් කෙරෙන තුරු බලාගෙන ඉන්නට පුළුවන්කමක් නැහැ. එහෙම නම් කුමක් ද කළ යුත්තේ ? තමන්ගේ සල්ලි බැංකුවල තබා ගෙන ඉන්න, එහෙම නැත් නම් වෙන වෙන තැන්වල තබාගෙන ඉන්න පිරිසක් ඉන්නවා. තවත් සමහර උදවිය තමන් ළඟ තිබෙන මුදල් ප්‍රයෝජනවත් ලෙස යොදවන්නට ක්‍රම නැතිව ඉන්නවා වෙන්නටත් පුළුවනි. තමන්ගේ නෑදැයන්ට හෝ වෙනත් තැන්වලට මුදල් යවන්නට පුළුවන්කමක් නැහැ. මුදල් තිබෙන උදවියට බදු සහන වැනි දේවල් දුන්නොත් තමන්ගේ මුදල් යොදා රටටත්, රජයටත්, තමන්ටත් යම් ප්‍රයෝජනයක ලැබෙන ආකාරයට වැඩ කරන්නට පුළුවනි. එවැනි වැඩ පිළිවෙළක් ගැන අපේ ආණ්ඩුව කල්පනා කළා. තේ, රබර්, පොල් වැනි වැවිලිවල කාලයක් තිස්සේ නිරත වීමෙන් විශාල අත්දැකීම් රාශියක් ලබා ගත් පිරිසක් මේ රටේ ඉන්නවා. එහෙත් මේ සම්බන්ධයෙන් එවැනි විශේෂ දැනුමක් හෝ අත්දැකීම් හෝ ඇති අය බොහොම අඩුයි. අක්කර දහස් ගණනක විශාල වශයෙන් ආහාර වගා කරන අය බොහොම අඩුයි. පෞද්ගලික අංශයට යම්කිසි බදු සහනයක් දීමෙන්—තමන් භාර ගන්න වැඩ කොටස හරියාකාර කරන්නට ඒ අයට පුළුවන් බව ඔප්පු කරන්නට පුළුවන් නම් පමණයි එය දෙන්නේ—සෑහෙන ප්‍රයෝජනයක් ලැබෙනවා. එවැනි අයට බදු සහනයක් දෙනවා. අනෙක් අතට, විශාල වශයෙන් ගොවිතැන් කිරීමට නම් කැලෑ එළි කිරීමට හා වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහාත්, ගමනාගමනය සඳහාත් යන්ත්‍රෝපකරණ හා රථ වාහන වුවමනා කරනවා. අප විදේශ විනිමය හිඟයකින් පෙළෙන නිසා විදේශ විනිමය පාලනයක් ඇති කොට තිබෙන නිසා, ඕනෑ කෙනකුට ඕනෑම දෙයක් පිටරටින් ගෙන්වා ගැනීමට පුළුවන්කමක් නැහැ. තමන් කරන වගා කටයුතු ඔප්පු වන විධියේ සාක්ෂි තිබෙනවා නම්, තමන් සතු ඉඩම් තිබෙනවා නම් හෝ රජයෙන් ඉඩම් ලැබෙනවා නම්, යම්කිසි සැලැස්මක් අනුව කටයුතු කිරීමේ බලාපොරොත්තුවක් ඔවුන් තුළ තිබෙනවා නම් ඒ අයට යන්ත්‍රෝපකරණ හා රථ වාහන ගෙන්වා ගැනීම සඳහා විදේශ විනිමය දිය යුතු යැයි අප තවත් තීරණයක් කළා. ඉඩම් හා විදේශ විනිමය පමණක් නොව බදු සහන පවා සලසා තිබෙනවා. අපේ ඒ අදහස්ම, 1962 ක්‍රම සම්පාදක මණ්ඩලය විසින් සකස් කරන ලද පොතේත් පිටුවක් පිටුවක් පාසා තිබෙනවා. ඒ හැම එකක්ම පිටුවක් පාසා කියවන්නට ඕනෑ යැයි මා හිතන්නේ නැහැ. එහෙත් තමුන්නාන්සේලා "නැතැයි" කියනවා නම්, ඒවා තිබෙන තැන් පෙන්වා දෙන්නට පුළුවනි. එහි බදු සහන ගැනත් තිබෙනවා, කොම්පැණි හා පුද්ගලයන් මෙන්ම වෙනත් ආයතනත් මගින් ද මධ්‍යම පන්තියේ වේවා, ඊට වඩා උසස් පන්තියේ වේවා—

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඒවා ක්‍රියාත්මක කළා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

'වියළි කලාපය දියුණු කිරීම සම්බන්ධයෙන් මේ මේ ක්‍රියා මාර්ග ගත යුතු යැයි' එහි තිබෙනවා. මන්ත්‍රීවරුන් වේවා, පාර්ලිමේන්තු ලේකම් වරුන් වේවා, ඇමතිවරුන් වේවා රජයේ ඉඩම් ලබා ගැනීම හොඳද නැද්ද යන්නයි, දැන් තිබෙන ප්‍රශ්නය. දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) වැනි අය ඒ පිළිබඳව මීට කලිනුත් මේ ගරු සභාවේ තර්ක කර තිබෙනවා. ගොවිතැන ගැන ඇල්මක් තිබෙනවා නම්, එමගින් රටටත් ප්‍රයෝජනයක් වෙනවා නම්, මන්ත්‍රීවරු මන්ත්‍රීවරුන් වශයෙන් වේවා පුද්ගලයන් වශයෙන් වේවා සහන ලබා ගැනීමේ වැරැද්දක් නැහැයි මා අදහස් කරනවා. මධ්‍යම පන්තියේ වේවා, වෙන මොන පන්තියක වේවා මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් රජයේ ඉඩම් ලබා ගැනීම නුසුදුසුය යන අදහසක් දෙම්පේ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති වශයෙන් කටයුතු කරන කාලයේ එතුමා තුළ තිබුණේ නැතැයි මා කියනවා. දෙම්පේ ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු. එම්. ඩී. බණ්ඩා]
තුමා සමග මා කරන තර්කය නම්, එදා නුසුදුසු යැයි නොපිළිගත් දෙයක් පරාජිකා වුණු පිරිසක් වශයෙන් දැන් ඉස්මතු කර පෙන්නීම හරිද යන්නයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
එදා තමුන්නාන්සේලා කීවේ මොකක්ද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මොකක්ද කීවේ ?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
එදා දුන්නේ අක්කර 10, 15 බැගින්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ප්‍රශ්නය අක්කර ගණන ගැන නොවෙයි, ඉඩම් දීම ගැනයි. අක්කර 50, 60 දුන්නාට වරදක් නැතැයි තමුන්නාන්සේලා කියන වාද ?

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)
දෙකම වැරදියි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේලාගේ විරුද්ධත්වය අක්කර ගණන ගැනද ?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)
පස්සෙ කියන්නම්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මා සඳහන් කළේ එතුමන්ලාගේ ක්‍රමයක්, පොතක් ගැන නොවෙයි. සභාග රජය කාලයේ තමුන්නාන්සේලාත් සිටියා නොවැ ?

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
සභාග රජයෙන් ඕවා දුන්නේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මගේ හැඟීමට තමුන්නාන්සේලා එකඟදැයි මා දන්නේ නැහැ. පසුගිය රජය විසින් මන්ත්‍රීවරුන්ට ඉඩම් අක්කර 50, 60, 70 බැගින් දී තිබෙනවා නම් එහි වරදක් නැති බවයි, මගේ හැඟීම. යම් කෙනෙක් මධ්‍යම පාංතික ක්‍රමයට දෙන ඉඩමක් අරගෙන කොන්දේසිවල හැටියට කටයුතු කළොත් ඔහුට ඒ ඉඩම අයිති වෙනවා. එය බද්දක් නොවෙයි. එය ඉඩම් තමන්ටම සථිර වන අන්දමේ ක්‍රමයක්. මධ්‍යම පාංතික ක්‍රමයට ඉඩම් ලබාගෙන සිටින අයට ඒ ඉඩම් අයිති වෙනවා. රජයේ ඉඩම් කෙලින්ම මහජනයාට දෙන්නට පුළුවන්කමක් නැති නිසා මධ්‍යම පාංතික ක්‍රමයට දෙනවා. ඒවා ඔවුන්ට සථිරයි. කාලසීමාවක් නැහැ. එහෙත් මේ විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දී තිබෙන්නේ යම්කිසි අවශ්‍යතාවයක් ඉටුකර ගැනීම සඳහා යම්කිසි කාලසීමාවකට පමණයි. දිගටම භුක්ති විඳගෙන යන්න පුළුවන්කමක් නැහැ. එහෙත් මධ්‍යම පාංතික ක්‍රමයට දෙනු ලැබූ ඉඩම් ඒ අයටම සථිර වෙනවා. ඒ ක්‍රමයට දොස් කියනවා නොවෙයි. ඒ වැඩේ බොහොම හොඳයි. මොන ක්‍රමයකින් හෝ මේ රටේ තිබෙන ඉඩම් සංවර්ධනය වෙනවා නම් හොඳයි. එයට මා එකඟයි. එහෙත් තමුන්නාන්සේලා දැන් ඇඟිල්ල දික් කර කර මෙතන මෙමහෙමයි අතන මෙහෙමයි කියා මන්ත්‍රීවරුන් ඇමතිවරුන් ගැන පෙන්වන්නේ ඔවුන් හරියට පරාජිකා වූ අය වගේ. ඒ අයට මේ රටේ වෙළඳාමක් කරන්න බැහැ; රක්ෂාවක් කරන්න බැහැ; ගොවිතැනක් කරන්න බැහැ. අපට පමණක් නොවෙයි තමුන්නාන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලාටත් ඔය තත්ත්වය තිබෙනවා. ශ්‍රාවස්තියේ ගහක් සෙලවුණත් මන්ත්‍රීවරුන්ට පත්තරයෙන් චෝදනා කරනවා. තමන්ට චෝදනාවක් ඒවිය කියා ගහක් සෙලවුණත් මන්ත්‍රීවරුන්ට සැකයක් ඇති වෙනවා. මන්ත්‍රීවරුන් ඉන්නේ ඒ විධියේ තත්ත්වයකයි. කළ යුතු දේවල් මේවාය, කළ නොයුතු දේවල් මේවාය, යුතු මාර්ගය මේකයි, අයුතු මාර්ගය මේකයි කියා අපි කියන්නේ නැහැ. උපතින්ම ධනේශ්වර තත්ත්වයක් ලබා ඇති මන්ත්‍රීවරුනුත් සිටිනවා. ඒ අයට නම් කිසිම අමාරුවක් නැහැ. අපේ අගලවත්තේ මන්ත්‍රීතුමා වැනි අය (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) නීතිඥ වෘත්තියේ යෙදී තමන්ගේ දක්ෂතාවය අනුව හරි හම්බ කර ගෙන ධනය ලබාගෙන සිටිනවා. එදා සිටම දේශපාලනයට රිංගාගෙන සිටි කොළොන්නාවේ මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා) වැනි අයත් සිටිනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
ඒකෙන්ම හම්බ කරගෙනද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒකෙන්ම නට්ටං වෙලා. හම්බ කරගත් අයත් ඉන්නවාද කියා මා දන්නේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මා ගැන කීවේ මොකක් ද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේගේ රක්ෂාවත් ගහලා ගිහින් මෙතන ඉන්නවාය කිව්වා. සමහර අය රක්ෂාවල් කර හම්බ කර ගත්තා. සමහර අයට උපතින්ම ධනය තිබෙනවා. සමහර අයට දේශපාලනයට ඇවිත් රක්ෂාවත් නැහැ, අරකත් නැහැ, මේකත් නැහැ, මහ කරදර තත්ත්වයකට වැටී සිටිනවා. සමහර අයට නම් හරිගියාද කීයලත් මා දන්නේ නැහැ. අගලවත්තේ මන්ත්‍රීතුමා නම් කියනවා හරිගිය අයත් ඉන්නවාය කියා.

ගරු කථානායකතුමනි, ගොවිතැන් කිරීම වරදක් නොවෙයි. එය මේ රටට ඕනෑ දෙයක්. මන්ත්‍රීවරු මේවාට අත ගහන්න ඕනෑ නැත කියා තර්කයක් වශයෙන් ඉදිරිපත් කරනවා නම් ඔය පැත්තේ මන්ත්‍රීවරුන් සුළු දෙනෙක්ම ඉඩම් ලබාගෙන තිබෙන බව කියන්නට ඕනෑ. දඹදෙනියේ මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) මහර මන්ත්‍රීතුමා (සූරියාරච්චි මයා.) ආදී අය විශේෂ බදු ක්‍රමයට ඉඩම් ලබාගෙන තිබෙනවා. ඒ හැර තම තමන්ගේ ඉඩම්වල ගොවිතැන් කිරීම, සත්ව පාලනය, කිරි පට්ටි පිහිටුවීම ආදී දේවල් සඳහා—සමහර අය මේ පැත්තේ; සමහර අය ඔය පැත්තේ—අනිකුත් මහජනතාව ඉල්ලනවා හා සමානම ඉල්ලීම් කර තිබෙනවා. දෙම්පේ ගරු මන්ත්‍රීතුමාගේ කිරි පට්ටියක් තිබෙනවා. එතුමාගේ ඉඩමක ගවයින් හදනවා. ඒ අනුව එතුමා ඒ ව්‍යාපාරයේ යෙදුණු කෙනෙක්. පසුගිය දවසක උන්නැහේ සමග කථා කරන විට උන්නැහේ කිව්වා, මේ මේ විධියට කටයුතු කරගෙන යනවාය, සතුටුදායක තත්ත්වයක තිබෙනවාය කියා. මම ඒ ගැන බොහොම සතුටු වුණා. මා මේ වරදක් කියනවා නොවෙයි. විනිමය නැතිව මේ වැඩ කරන්නට බැහැ. යම්කිසි තැනකට ගිහින් අසවල් යන්ත්‍රය ඕනෑය කිව්වම ඒ අය කියනවා, විදේශ විනිමය නැහැ, දෙන්නට විධියක් නැහැ කියා. විදේශ විනිමය ලබා ගන්නා ක්‍රමය මේකයි. යම් කෙනකු විශාල කිරි පට්ටියක් ඇති කර ගැනීමට කැමති නම්, ආහාර නිෂ්පාදනය කිරීමට හුඟක් දුරට වැඩ කරන්නට කැමති නම් ඒ සඳහා යම් යම් දේ වුවමනා කරනවා. රජයට දන්වුවාම ඒ ගැන සොයා බලා උනන්දුවක් ඇතිව මේ කටයුතු කරන්නට බලාපොරොත්තු වන බව පෙනෙනවා නම් ඉල්ලන උදව්ව දෙනවා. ඒ විධියට එතුමාටත් ලැබුණා; විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් ලැබුණා. [බාධා කිරීමක්] වාහනයක්. ඒකෙ වැරද්දක් නැහැ. ඉල්ලීමේ වැරද්දකුත් නැහැ. ඒක දීමේ වැරද්දකුත් නැහැ. එපමණක් නොවෙයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේලායි, වැරදිය කියන්නෙ. අප කියන්නෙ නැහැ, වැරදිය කියා. මේ විවාදයේදී මේක මහා ලොකු වරදක් හැටියට පෙන්නුම් කරන්නට උත්සාහ කළ නිසයි, මා මෙසේ කියන්නෙ. එහෙත් කරල [illegible]න්ත වරදක් නොවේය, මෙතෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
කරල තියෙන්නෙත් වරදක් නොවේය කියායි මා කියන්නෙ. [බාධා කිරීමක්] තමුන්නාන්සේට වුවමනා කරන්නෙ එක පැත්තකට පමණක් ඇහැ ගහගෙන ඉන්නයි.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
මා කියනවා, වැරදි දෙකකින් එක වැරද්දක් හැදෙන්නෙ නැත කියා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
ඒක නොවෙයි මගේ තර්කය. මා කියන්නෙ නැහැ, අර වැරද්ද නිසා මේක හරිය කියා. මා කියන්නේ අපේ ප්‍රතිපත්තියට අනුව ඉල්ලීමක් කර තිබුණු බවයි; ඒක සුදුසු බව පිළිගත් නිසා දුන්න බවයි.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
දෙපැත්තම හරිය කියනවද?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
මේකෙ කී පැත්තක් තියෙනවද?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
Sir, you cannot have parity in sinning. Can you?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
There is no fight in this. That is a word you must yourself forget. It is a dangerous word—

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
A very valuable word.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
An explosive word.

ගරු කථානායකතුමනි, මා දැන් ප්‍රකාශ කළේ මගේ අදහසයි. එහෙත් ඒ විවාදයෙන් පසු ගරු අගමැතිතුමා කල්පනා කළා, මේ විධියට ක්‍රියා කරන්නට වුවමනාවක් නැත කියා. කැබිනට් මණ්ඩලයේදී ඒ ගැන සාකච්ඡා කළා. සාකච්ඡා කර තීරණයකට බැස නියෝගයක් කළා, ඉඩම් ඇමතිතුමා ප්‍රකාශ කළ ආකාරයට. දෙන්නට සුදුසුය කියා තීරණය කර තිබුණු ඉඩම් භාර දී නැත්නම් ඒ ඉඩමුත්, භාර දී තිබෙන ඉඩම්වල වගා කර තිබෙන කොටස් හැර ඉතිරි කොටසුත් බලපත්‍රයෙන් අස් කරන්නටය කියා නියෝග කළා. ඒ නියෝගය අනුව කටයුතු කර තිබෙනවා.

මේ ව්‍යාපාරය පටන් ගත් අවුරුද්දේ 1966 දී වුවමනා ප්‍රමාණයටත් වඩා ඉල්ලුම් පත්‍ර ලැබෙන්නට ඇති. ගරු ඉඩම් ඇමතිතුමා 1967 අප්‍රේල් මාසයේදී—දොම්පේ මන්ත්‍රීතුමාගේ (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කථාව තිබුණේ අගෝස්තු මාසයේදීයි—නියෝගයක් කර තිබෙනවා, මීට පසු විශේෂ බදු ක්‍රමය යටතේ ඉල්ලුම් පත්‍ර භාර ගන්නට එපාය කියා. එසේ නියම කර තිබෙන්නේ ඕනෑ තරම් ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙන නිසයි. එදාට පසු ඉල්ලුම් පත්‍ර එකක්වත් භාර ගෙන නැහැ. ඊට පසු ඉඩම් දීම නතර කර තිබෙනවා.

ඉඩම් ලබා ගත් උදවියටත් ප්‍රශ්නයක් තිබෙනවා. බොහොම දුර ඈහැර පළාත්වලයි, මේ ඉඩම් ලැබී තිබෙන්නෙ. නියමිත වෙලාවට ඉඩම් එළි කර ගිනි තබා වගා කාලය එන විට පොළොව සකස් කර වගා කිරීමට පුළුවන්කමක් නැත්නම් ඒ අවුරුද්දේ ඉඩම් ලැබීමෙන් ඇති පලක් නැහැ. අගෝස්තු මාසය වන විටවත් කැළෑවට බසින්නට ඕනෑ. අගෝස්තු මාසයේදීවත් කැළෑ කොටන්නට පුළුවන් වන පරිදි ඉඩම් නොලැබුණහොත් ඒ අවුරුද්ද නිකම්ම ලිස්සා යනවා. ආයේත් ඊළඟ අවුරුද්දේයි, කැළෑ කොටන්නට පුළුවන් වන්නේ. ඉතින් ඒ අන්දමට ඉඩම් ලබා ගන්නා උදවියගේ නම් පමණයි, ලැයිස්තුවේ සඳහන් වන්නේ. විශේෂ බදු ක්‍රමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යටතේ ඉඩම් ලැබූ අයට සියලු පහසුකම් සලස්වන්නට ආණ්ඩුව පොරොන්දු වී නැහැ. සමහර විට කවු පාරවල් ඇනැප්ම දෙකක් තුනක් සාදා දෙන්නට සිද්ධ වෙනවා ඇති. අද තිබෙන්නේ ඔන්න ඔය තත්ත්වයයි. මෙම විශ්වාස භංග යෝජනාව ස්ථිර කළ අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) පවා ජීප් රථයක් ලබාගෙන තිබෙනවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
තවම ඒක එව්වේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
එහෙත් දැන් එතුමාට බල කඩදාසි ලැබී තිබෙනවා. මා ඒ ගැන වරදක් කියන්නේ නැහැ. කරුණු පරීක්ෂා කර බැලුවාම ඒ පැත්තේත් මේ පැත්තේත් විසිපස් දෙනකු තිස් දෙනකු පමණ පහසුකම් ලබාගෙන තිබෙන බව පෙනී යනවා. [බාධා කිරීමක්]. නම් ඉදිරිපත් කරන්නට වුවමනා නම් ඒවා පසුව ඉදිරිපත් කරන්නම්. මගේ තර්කයට නම් වුවමනා කරන්නේ නැහැ. දෙපැත්තේම සිටින ගරු මන්ත්‍රීවරුන් ආහාර නිෂ්පාදනය සඳහා යයි කියමින් මේ පහසුකම් ලබාගෙන තිබෙන බවයි, මගේ තර්කය. අක්කර 8 ක කුඹුරක් වගා කරන්නට තිබෙන බවත්, තන්තිරිමලේ පැත්තේ මධ්‍යම පන්ති ක්‍රමය යටතේ දෙන ලද අක්කර පණහක පමණ ඉඩමක් තිබෙන බවත්. කිරි පට්ටියක් හා කුකුළු පට්ටියක් ගරු මන්ත්‍රීතුමා ජීප් රථයක් ඉල්ලා තිබෙනවා. තවද, උත්තර මන්ත්‍රී ඔබේසේකර මහත්මයාත් තමන්ගේ පෞද්ගලික ඉඩමක ආහාර වගා කිරීමට අදහස් කරන බවත්, කිරි පට්ටියක් කුකුළු පට්ටියක් ඇති කිරීමට අදහස් කරන බවත් දන්වා රජයෙන් දෙන පහසුකම් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම ලංකා සමසමාජ පක්ෂයේ අනිල් මූණසිංහ මහත්මයාත් මේ සම්බන්ධයෙන් රජයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීමක්] බද්දේගම ගරු මන්ත්‍රීතුමාට (නීල් ද අල්විස් මයා.) මොකක්දෝ අමාරුවක් තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The hon. Member for Baddegama must not shout in this way. It is not fair. There is not much time left.

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)
Why is the Hon. Minister pointing at me ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
I do not think the Hon. Minister is pointing at the hon. Member.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
I did not know that the bemoans the fact that Mr. Anil Moonesinghe belongs to his party. When I say, සමසමාජ පක්ෂයේ he says, " Why are you pointing at me ? " Then which party am I to point to ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Kindly finish by——

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
I can finish, but the point is that they have raised so many questions.

I can go into all the details with regard to hon. Members on that side of the House as well as on this side of the House.

විශේෂ බදු ක්‍රමය යටතේ සමහරුන් රජයේ ඉඩම්වල හෝ තම තමන්ගේ පෞද්ගලික් ඉඩම්වල හෝ ආහාර වගා කිරීමට, සත්ව පාලනය කිරීමට ආණ්ඩුවෙන් රථවාහන හා මැෂින් ආදිය ලබාගෙන තිබෙනවා. විශේෂයෙන්ම විදේශ විනිමය ලබාගෙන තිබෙනවා. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

දොම්පේ ගරු මන්ත්‍රීතුමා කථා කෙළේ මෙම ආණ්ඩුව පාරාජිකා වන වැඩක් කළ හැටියටයි. ආණ්ඩුවේ මෙම වැඩ පිළිවෙළ දොම්පේ ගරු මන්ත්‍රීතුමාටත්, විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් ප්‍රයෝජනවත් වී තිබෙනවා. මුලින්ම දොම්පේ ගරු මන්ත්‍රීතුමාටත්, විරුද්ධ පාර්ශ්වයේ නායිකාවටත් වාහන දුන් බව කියමින් පුවත්පත් මගින් මට පහර ගසන ලද ආකාරය මට මතකයි. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට පසුගිය කාලයේ රජයේ ඉඩමක් අනුරාධපුරයෙන් ලැබුණා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

බද්දක් වශයෙන් අක්කරයක් ලැබුණා, නිවාසයක් සාදන්නට.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

රජයේ නිවාස හැදීම සඳහා ඉඩම් දුන්නාට කමක් නැහැ, ගොවිතැන සඳහා දෙන්නට එපායයි තමුන්නාන්සේලා කියනවා නම් එය එක්තරා විධියක තර්කයක් වශයෙන් අපට පිළිගන්නට පුළුවනි. තමුන්නාන්සේලා එවැනි තර්කයක් ඉදිරිපත් කරන්නේ නැහැ. අනුරාධපුරයේ ඉඩම් දුන්නාට කමක් නැහැ, වෙනත් තැන්වල දෙන්නට එපායයි තමුන්නාන්සේලා කියනවාද? නැහැ. චීනයේ ලංකා තානාපති රොබට් ගුණවර්ධන මහත්මයාගේ, "බඩේ බිජු තියාගෙන කථා කරන්නට එපා" යන කියමන මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. [බාධා කිරීම්] මේ ව්‍යාපාරය නිසා රජය මුදල් නාස්ති කළායයි මේ විශ්වාස භංග යෝජනාවෙන් අපට චෝදනාවක් එල්ල කර තිබෙනවා. එක් එක් කෙනාගේ පෞද්ගලික ඉඩම් දියුණු කිරීමට අප මුදල් දී නැහැ. විශේෂ බදු ක්‍රමය යටතේ බදු දුන් ඉඩම් දියුණු කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා වෙනත් දේ සඳහායි මේ මුදල් දී තිබෙන්නේ. රජයේ මුදල් නාස්ති වීම වළක්වා ගැනීමයි මෙහි පරමාර්ථය. යම් කෙනකු ඔවුන්ගේ පෞද්ගලික මුදල් මේ නිසා නාස්ති කර ගත්තා දැයි අප දන්නේ නැහැ. එසේ නාස්ති වුණා නම් ඒවා රජයේ මුදල් නොවෙයි.

ඊළඟට, මේ ඉඩම් ලැබූ අයට විදේශ විනිමය දීම ගැන මෙහි සඳහන් වෙනවා. ආහාර නිෂ්පාදනය විශේෂ කරුණක් වශයෙන් සලකා ඒ සඳහා අවශ්‍ය වාහන හෝ වෙනයම් යන්ත්‍ර සූත්‍රාදිය හෝ ලබා ගැනීමට විදේශ විනිමය බලපත්‍ර යම් යම් අයට දී තිබෙනවා. ඒ වාහන හා යන්ත්‍ර සූත්‍ර ඒ අය මුදල් ගෙවා ලබා ගන්නට ඕනෑ. එම වාහන ගොවිතැන් කටයුතුවලට හැර වෙනත් දේ සඳහා යොදතොත් එය බරපතල වරදක්. මා ඒ බව මෙම ගරු සභාවෙහිදී මීට කලිනුත් කියා තිබෙනවා. මේ ගරු සභාවෙන් පිට තදීත් මා එය කියනවා. එය අප නුරුස්සන දෙයක් නිසා ඊට ඉඩ දෙන්නටත් බැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ නිසා මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

කොමියුනිස්ට් ක්‍රමය සම්බන්ධයෙන් අද නොයෙක් රටවල සිදු වේගෙන යන දේවල් ගැන කල්පනා කර බලන විට කාට විරුද්ධව ඡන්දය දිය යුතුද යන්න තමුන්නාන්සේලාටම තේරුම් ගන්නට බැරිව තිබෙන බවයි අපට පෙනෙන්නේ. [බාධාකිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදි.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி.ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ගරු කථානායකතුමනි, තේ පානය සඳහා විසිර යන්නට පෙර, මෙම විවාදයේදී ඉදිරිපත් වුණු යම් යම් කරුණු සම්බන්ධයෙන් අදහස් රාශියක් මෙම ගරු සභාව ඉදිරියෙහි මා ප්‍රකාශ කළා. ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් ඒ විශේෂ බදු ක්‍රමය යටතේ ලබා ගත් ඉඩම්වලත් තම තමන්ගේ පෞද්ගලික ඉඩම්වලත් ආහාර නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වාහනත් යන්ත්‍ර සූත්‍රත් ලබා ගැනීමට විනිමය බලපත් ලබා ගෙන තිබෙන බවත් මා ප්‍රකාශ කළා. දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමාත් (වීරසේකර මයා.) තවත් මන්ත්‍රීවරුන් කීපදෙනෙකුත් එසේ විනිමය ලබා ගෙන තිබෙන බවත් මා පෙන්වා දුන්නා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඉඩම් ලබා ගැනීම ගැනත් අපට විශාල චෝදනාවක් එල්ල වී තිබෙනවා. එය අකටයුතු අන්දමින් කළ දෙයක්ය යන අදහසක් දොම්පේ ගරු මන්ත්‍රීතුමාත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා) තවත් ගරු මන්ත්‍රීවරුන් කීපදෙනකුත් ප්‍රකාශ කළා. එතුමා ඉඩම් ලබා ගැනීම පිණිස ඉල්ලුම් පත්‍රයක් යවා තිබෙන්නේ 1956 අගෝස්තු මාසයේ 29 වනදායි. ඒ කාලයේදී ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් එක්තරා චක්‍ර ලේඛනයක් නිකුත් කර තිබෙනවා. එවකට සිටි ඉඩම් කොමසාරිස් රාජේන්ද්‍ර මහත්මයාගේ අත්සන ඇතිව සෑම දිසාපතිවරයකුට ම එක් චක්‍ර ලේඛනයක් යවා තිබෙනවා :

"Restoration of Village Tanks by Private Enterprise

G.AA.

I have to invite your reference to paragraph 3 of my Circular No. OM/3406/A/3 of 24th February 1953 (Circular No. 6/1955).

2. At the time the scheme for the restoration of tanks by private enterprise was formulated, it was intended that the investigations on tanks to obtain the necessary information referred to in that paragraph should be done by the Divisional Irrigation Engineer of the area."

It is a long circular. I have given the number. In short, it says that private enterprise should be given tanks for restoration and the cultivation of lands thereunder. The technical work with regard to restoration should be done by the Irrigation Department at the expense of the Government. Those expenses should be borne by the Government. This circular No. 26 of 1956 issued by the Land Commissioner dated 29th August 1956 clarifies that position. In that circular attention was drawn to an earlier circular. This was done when the late Mr. S. W. R. D. Bandaranaike formed the Government. It shows that according to the policy of the S.L.F.P. or the M.E.P., at the time that Mr. Bandaranaike formed the Government, there was a place in their thinking for lands to be brought under cultivation by private enterprise—the restoration of tanks and the utilization of lands under those tanks, and the technical work in regard to the restoration of the tanks to be done by the Irrigation Department at the expense of the Government.

Another circular, No. 28 of 1956 was issued by the then Land Commissioner, Mr. M. Rajendra, on 24th September 1956, to all revenue officers.

"Restoration of Village Tanks by Private Enterprise."

It is stated here how the permits should be issued. I shall read out the important parts.

"It has been decided that during the period of the Original (Preliminary) lease of 1-3 years, Annual Permits should be issued by the Revenue Officers, until such tanks are restored within the specified period of 3 years.

2. As it will not be possible to give either the exact extents of irrigable land and highland or the exact boundaries without a proper survey, the approximate extents of irrigable and highland and rough boundaries should be stated in the Annual Permits ...... After the lands (irrigable and highland) are surveyed by the Surveyor-General prior to the issue of the long-term lease, if it is found that there are discrepancies in the extents and the boundaries, such extents as decided on by me on the recommendations of the Revenue Officers will be included in the long term lease.

3. Please take action accordingly."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

1956 අගෝස්තු මාසයේ නිකුත්වූ මේ චක්‍ර ලේඛනය යටතේ තමයි අපේ සෞඛ්‍ය ඇමතිතුමා ඉල්ලීමක් කර තිබෙන්නෙ. ඒ ඉල්ලුම් පත්‍රය අවලංගු කළේ නැහැ. ඒක තිබුණා. ඉන්පසු විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් දෙන විට එම ඉල්ලුම් පත්‍රය ඉස්මතු වී ඇවිත් එතුමා වෙනුවෙන් යම් ප්‍රදේශයකින් අක්කර ප්‍රමාණයක් වෙන් කළා. නමුත් ඒ ඉඩම් ලබා ගන්නට එතුමා කැමති වුණේ නැහැ. අවසානයේදී පසුව ගත් තීරණයකට අනුව ඒක එතුමාට අහිමි කළා. තත්ත්වය ඒකයි. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. අපි ලොකු ධනපතියන්ටත් කොම්පැනිකාරයින්ටත් ඉඩම් දුන්නාය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් උඩ පැන පැන බෙරිහන් දෙනවා. නමුත් මේ තියෙන්නෙ කලින් නිකුත් කළ චක්‍ර ලේඛන. වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වියදම් රජය විසින් දැරිය යුතුය කියා මෙහි සඳහන් කර තිබෙනවා. වැව් පරීක්ෂා කිරීමත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන් කළ යුතුයි. මේවා මණින විට, මේවායේ ගණන් හිලව් සාදන විට, ගම්මුන්ට වාරිමාර්ග පහසුකම් පිළියෙළ කර දෙන විට කොයි තරම් කාල සීමාවක් ගත වෙනවාද ? ඒ කටයුතු කිරීමේදී කොයි තරම් බාධා ඇති වෙනවාද ? ඔය ආදී ප්‍රශ්න ගැන තමුන්නාන්සේලා හොඳින් කල්පනා කර බලන්නට ඕනෑ. නමුත් මේ විශේෂ බදු ක්‍රමය යටතේ මැණුම් සම්බන්ධව පමණක් මැණුම් දෙපාර්තමේන්තුවට යන්නට වෙයි. එපමණයි. නටබුන් වූ පොඩි පොඩි වැව් තිබෙනවා නම් ඒවා ප්‍රතිසංස්කරණය කරන්නට රජයෙන් කිසිම මුදලක් වැය වන්නේ නැහැ. ඒ සෑම වියදමක්ම මේ ඉඩම් ලබා ගන්නා උදවිය දැරිය යුතුයි. ඒවාගේම බදු කාල සීමාවත් අප නියම කර තිබෙනවා. අවුරුදු 25 යි. ඒකත් තාවකාලික බදු ක්‍රමයක්. නමුත් මේ චක්‍ර ලේඛනයේ තිබෙන්නෙ දීර්ඝ කාලීන බදු ක්‍රමයක්. කාලසීමාව කොපමණද කියා මෙහි සඳහන් කර නැහැ. මා මේ චක්‍ර ලේඛනය ගරු සභාවට ඉදිරිපත් කරන්නට අදහස් කළේ අපේ ආණ්ඩුවෙන් පමණක් නොවෙයි කලිනුත් ගොවීන් නොවන අයට, මධ්‍යම පන්තියේ අයට, පෞද්ගලික අංශයේ උදවියට මුදල් හදල් යොදමින් වාරිමාර්ග කටයුතු කරමින් සංවර්ධනය කිරීම සඳහා ඉඩම් දී තිබෙන බව පෙන්නුම් කිරීමටයි. ඒ අනුව මේක ඒ කාලයේ සිටම තිබුණු දෙයක්. අමුතු දෙයක් නොවෙයි. නමුත් ඒක නොවෙයි අපේ තර්කය.

මේ කාලසීමාව තුළ ලඟි ලඟියේ හැකි තරම් ඉක්මණින් අද මේ රටට පිටරටින් ගෙන්වන ආහාර ද්‍රව්‍ය, විශේෂයෙන්ම අතිරේක ආහාර ද්‍රව්‍ය මේ රටේම වගා කර ඒ ද්‍රව්‍යවලින් රට ස්වයංපෝෂිත කිරීමයි අපේ බලාපොරොත්තුව. ඒ සෑම ආහාර වර්ගයක්ම මේ රටේ වගා කරන්නට පුළුවන් නම් වගා කළයුතුය යන්න දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන් තර්කයක් නැතිවම පිළිගන්නා කාරණයක්. එය කරන එක් මාර්ගයක් හැටියටයි අපි තාවකාලිකව මේ ක්‍රමය යොදා තිබෙන්නෙ. මා කලින් ප්‍රකාශ කළා වාගේ මේ කටයුත්තෙහි නියුක්ත වෙන්නට නොයෙක් උදවියගෙන් ඉල්ලුම් පත්‍ර ආවා. දැන්වීම ප්‍රසිද්ධ කළාම අපි මේ මේ විධියට ඉඩම් දියුණු කරන්නට බලාපොරොත්තු වෙනවාය කියා සඳහන් කරමින් ඉල්ලුම් පත්‍ර ආවා. ඉල්ලුම් පත්‍රවල සඳහන් කර තිබුණු අන්දමට ඒ උදවියට මුදල් හදල් තිබෙනවාද කියා විශේෂ බදු මණ්ඩලය බලන්නට ඕනෑ. රජයේ ආධාර දෙන්ට බලාපොරොත්තුව ඇතිව කළ දෙයක් නොවෙයි මේ කටයුත්ත. ඒ නිසා ඒ ඒ පුද්ගලයන්ගේ හා ආයතනවල මුදල් තත්ත්වය කොහොමද, බැංකු ගිනුම්වල තත්ත්වය කොහොමද, ආදායම් මාර්ග මොනවාද, ආදි වශයෙන් තොරතුරු සොයල බැලීමෙන් පසුවයි මේ ඉඩම් බෙදා දුන්නෙ. මේ ඉඩම් වලට යොමු කරවන්ට අදහස් කළේ ඒ ඒ පුද්ගලයන්ගේ හෝ ඒ ඒ ආයතනවල ධනයයි. ඒ නිසා යම්කිසි කොම්පැණියකට හෝ යම්කිසි පුද්ගලයන් පිරිසකට හෝ යම් ඉඩම් ප්‍රමාණයක් බෙදා දුන්න නම්, ඒ බෙදා දුන්නෙ මේ පරමාර්ථය උඩයි. තමන්ගේ මුදල් යොදවා මේ කටයුත්ත කරන්ට පුළුවන් පිරිසකට මේ ඉඩම් බෙදා දුන්නෙ ආහාර වගාව දියුණු කර ආහාර වර්ගවලින් මේ රට ස්වයංපෝෂිත කර ගැනීමේ අභිලාෂයෙනුයි. දැන් මෙතැනදී ප්‍රශ්නයක් උපදිනවා. එනම් මේ උදවිය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

සතුටුදායක වැඩ කොටසක් ඉටු කරල තිබෙනවද කියන එකයි. කොයි තරම් නීති රීති දැම්මත් සමහර උදවිය ඒ නීතිවල දුර්වල තැන් සොයාගෙන ඒවාට පිටුපාල ක්‍රියා කරනව. විනිමය පාලනය දිහා බලන්න. මිළ පාලන ක්‍රමය දිහා බලන්න. සමහර උදවිය නීතියේ රහැනට අසුවන අතර ඇතැම් අය අසු නොවී නොයෙක් අක්‍රමිකතාවල යෙදෙනව. මේ ඉඩම් දියුණු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ හා වාහන ආදිය ගෙන්වා ගැනීම සඳහා විදේශ විනිමය ලබා ගත් පිරිස අතරෙත් ඒ වගේ සුළු පිරිසක් ඉන්ට පුළුවනි. ඉන්නව, වෙන්ට ඕනෑ.

වාහන පාවිච්චිය සම්බන්ධයෙන් මම මේ ගරු සභාවේ කරුණු ඉදිරිපත් කළා. මෙතැනදී රජයට කරන්ට පුළුවන් මොකක්ද? කොයි රජයකට වුණත් කරන්ට පුළුවන් දෙයක් තේබනව. මා මතක් කළ හේතු නිසා මේ පරමාර්ථය ඉෂ්ට කර ගන්ට අපි අනුගමනය කළ ප්‍රතිපත්තිය සුදුසු එකක් කියන එකයි, මගේ විශ්වාසය. මේ යන්ත්‍රෝපකරණ ගෙන්වාගෙන එයින් අයුතු ප්‍රයෝජන ලබා ගැනීම වළක්වන්න යම්කිසි ප්‍රතිකර්මයක් යෙදිය යුතුයි. බොහෝ දෙනෙකුට ඉඩම් පවරා දෙන්න සකස් කළ බදු ඔප්පු ආදි ලිය කියමන් අවලංගු කර තිබෙන බව ඉඩම් ඇමතිතුමා ප්‍රකාශ කළා. මේ ඉඩම් ලබා ගත් උදවිය කොයි විදියේ වැඩ කොටසක් ඉටු කරනවාදැයි අපි නිතර සෝදිසි කර බලනව. ඒ සෝදිසි අනුව ඉඩම් අක්කර 11,000 ක් තරම මේ ඉඩම් ලබා ගත් පුද්ගලයන් විසින් වගා කර තිබෙන බව පෙනී යනව. ඒ ගණන් හිලව් ඉඩම් ඇමතිතුමාගෙන් කියවුණා. ඇතැම් ඉඩම් කොටස්වල මාස් කන්නයේ වී වගාව කර තිබෙන බවත් සඳහන් වුණා. මිරිස්, ලූනු, බඩ ඉරිඟු, ආදිය ඒ ඉඩම්වල වගා කර තිබෙනව.

ගරු කථානායකතුමනි, අපි විශේෂ බදු ක්‍රමය යටතේ මේ ඉඩම් බෙදා දී තිබෙන්නෙ අවුරුදු 5 කාලයක් තුළ වගාව ආරම්භ කිරීම සඳහායි. මේවායේ මූලික වැඩවල යෙදෙන්න සෑහෙන කාලයක් යනව. මෙම ඉඩම් ගම් නියම්ගම්වලින් බොහොම ඈත සථානවල පිහිටා තිබෙන නිසා කැලෑ එළි පෙහෙළි කිරීමටත්, ගොවිතැනෙහි යෙදවීමටත් කම්කරුවන් ඒ සථානවලට ගෙන්වාගෙන ඔවුන් පැලපදියම් කර ගැනීමේදී මූලික බාධක කරුණු රාශියකට මුහුණ දෙන්ට මේ ඉඩම් ලබා ගත් පිරිසට සිද්ධ වෙනව. ඒ බාධකත් මැඩ පවත්වාගෙන මේ ඉඩම් ලබා ගත් පිරිස සතුටුදායක වැඩ කොටසක් ඉටු කර තිබෙන බව තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්ට කැමතියි. සමහර උදවිය මේ ඉඩම්වල වැඩ කටයුතුවල යෙදිල තවම අවුරුද්දකට—අවුරුදු එකහමාරකට වඩා වැඩි නැහැ. ඉඩම් ලැබුණු වහාම කෙලින්ම ගිහින් ඉඩම් සුද්ද බුද්ද කරල ගොවිතැන්වල යෙදෙන්ට බොහෝ දෙනකුට පුළුවන්කමක් තිබුණෙ නැහැ. කැලෑ එළි කරල ගොවිතැනට බහින කාලයක් නොවුණොත් අනික් වාරයේ වැඩ පටන් ගන්න විට අවුරුද්දක් තරම ගත වෙනව.

ගරු කථානායකතුමනි, ගොවිතැන් දියුණු කර ගැනීම සඳහාය කියමින් විදේශ විනිමය වෙන් කරගෙන වාහන ගෙන්වා ගත් ඇතැම් උදවිය ගොවිතැන් කටයුතුවලට වඩා ඒ වාහන තමන්ගේ වෙනත් පුද්ගලික වැඩ කටයුතුවල යොදවන්ට කියන විශ්වාසයක් සමහරුන් තුළ තිබෙනව. ඒ විධියේ කිහිප දෙනකු සිටින බව අපට දැනගන්ට ලැබී තිබෙනව. හදිසි නීතිය යටතේ එවැනි වාහන නැවතත් ආපසු ලබා ගැනීමට නියෝග කර තිබෙනවා. අපට ලැබෙන ආරංචිවල හැටියට, අපේ පරීක්ෂණවලට අනුව අප ක්‍රියා කර ගෙන යනවා. තමුන්නාන්සේලාත් ඒවා ගැන කරුණු දන්නවා නම් ඉදිරිපත් කරන එකයි තියෙන්නේ. ජීප් රථ වැනි වාහන ආහාර වගාව සඳහා පමණක් නොවෙයි දෙන්නේ. ඒවා වතුකරයේ නොයෙකුත් වැඩ සඳහා ලැබෙනවා. ප්‍රවාහන ඇමතිතුමාගේ මාගීයෙන් එම වාහන ලබා ගැනීම සඳහා විනිමය බලපත්‍ර ලබා ගන්නවා. වතුවලට වුවමනා කරන වාහන ඉල්ලීමේ දී තේ පාලන අංශයේ නැතිනම් රබර් පාලන අංශයේ නිලධාරීන් විසින් දෙනු ලබන රෙකමදාරුවලට අනුව එම වාහන ලබා ගන්නවා, ප්‍රවාහන ඇමතිතුමාගේ මාර්ගයෙන්. ඒ හැරෙන්නට වෙනත් උදවියගේ වෙළහෙළඳාම් වැනි කටයුතු සඳහාත් වාහන ලැබෙනවා. එවැනි කටයුතු සඳහා ජීප් රථ නොලැබුණාට වෙනත් වාහන ලැබෙනවා. තමන්ගේ ඉඩම්වල ආහාර වගාව සම්බන්ධයෙන් මෙතරම් වැඩ කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

යුතු කරන්නට බලාපොරොත්තු වෙනවාය මෙතරම් වැඩ කටයුතු කර ගෙන යනවාය කියා ප්‍රකාශ කළ විට ඒ ගැන පරීක්ෂා කර බලා ඒ ඒ පළාත්වල සිටින දිසාපතිවරුන් වැනි අයගේ රෙකමදාරු අනුව අවශ්‍ය වාහන සහ වෙනත් යන්ත්‍රෝපකරණ ලබා දෙන්නට ක්‍රම සකස් වී තිබෙනවා. මෙවැනි කටයුතු සඳහා මෙම පාර්ලිමේන්තුවේ සිටින අයගෙනුත් කොතරම් ප්‍රමාණයක් වාහන ලබා ගෙන තිබෙනවාද යන්න ප්‍රකාශ වී තිබෙනවා. එවැනි අය විරුද්ධ පාර්ශ්වයේත් ආණ්ඩු පක්ෂයේත් සිටිනවා. මට පෙනෙන්නේ නැහැ, එහි වරදක් තිබෙනවාය කියා. එවැනි කටයුතු සඳහා ලබා ගන්නා වාහන නිසි පරිදි වැඩෙහි නොයොදා වෙන වෙනත් දේට යෙදවීමයි, වරද. එවැනි වාහන ලබා ගැනීම සඳහායි, අප අර විධියේ නියෝග නිකුත් කර තිබෙන්නේ.

වගාව සඳහාය කියා ලබා ගන්නා ලද ඉඩම් ආහාර නිෂ්පාදනය සඳහා නොයොදා වෙනත් කටයුතු සඳහා යොදාගෙන සිටිනවා නම් ඒවාත් කැන්සල් කරන්නට පුළුවනි. කැන්සල් කරලත් තිබෙනවා. ආහාර වගාව සඳහා ලබා ගන්නා ලද වාහන එම කටයුතු සඳහා යොදන්නේ නැති නම් එම වාහන ඔවුන්ට අහිමි කොට ආපසු ලබා ගන්නට මා මුලින් කී අන්දමේ නියෝග නිකුත් කිරීම ප්‍රමාණවත් වෙනවා. අවුරුදු එක හමාරක් පමණ කාලයක් —පහෙන් එකක පමණ—කර තිබෙන වගාවන් පිළිබඳව සිතා බලන විට ඉදිරි කාලයේදී මීට වඩා සීඝ්‍ර අන්දමේ දියුණුවක් ඇති වේයැයි කියන්නට පුළුවනි. මූලික කටයුතු අවසාන වූවායින් පසු එසේ වන බව පෙනී යනවා. දැන් තරමක් සතුටුදායක අන්දමේ ආහාර වගාවක් ඇති වී තිබෙන බව අප විසින් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මේ කර ගෙන යන වැඩ කටයුතු සම්බන්ධව විමසිල්ලෙන් යුතුව නොයෙකුත් පරීක්ෂණ ඇති කරමින් මෙම වැඩ කටයුතු තවතවත් දියුණු කිරීමට රජය නිතරම උත්සාහ දරනවා.

ගරු කථානායකතුමනි, අප ඉදිරියේ තිබෙන විශ්වාස භංග යෝජනාවේ සඳහන් වන අදහස්වල හැටියට, රජයේ ඉඩම් බදු දීමට මේ ආණ්ඩුව කල්පනා කළේ මොන හේතු නිසාදැයි මගේ කථාවේදී මා පැහැදිලි කර දෙන්නට උත්සාහ කළා. රජයේ ඉඩම් පෞද්ගලික අංශයේ අයට දීමට මා ඉදිරිපත් කළ අදහස 1956 අගෝස්තු මාසයේ සිට මේ රටේ කරගෙන ආ වැඩ කොටසක්. විරුද්ධ පාර්ශ්වයේ ගරු නායිකාවගේ ආණ්ඩුව පැවති කාලයේදීත් පෞද්ගලික අංශයට ඉඩම් බදු දීම සිදු වුණා. මධ්‍යම පංක්තියේ උදවියට ඉඩම් බදු දීමේ ක්‍රමය යටතේ හෝ වෙනත් යම් ක්‍රමයක් යටතේ හෝ අක්කර 50, 60, 70, නැත්නම් සමහර විට අක්කර 200 ආදී වශයෙන් ඇතැම් අයට ලැබුණා. ඒ ක්‍රමයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාටත් ඉඩම් ලැබුණා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණාය කියන්නට පුළුවන්කමක් නැහැ. පෞද්ගලික අංශයටත් මන්ත්‍රීතුමන්ලාටත් රජයේ ඉඩම් ලබාගැනීමට ඉඩ ලබා දීම මේ ආණ්ඩුවේ අමුතු ප්‍රතිපත්තියක් හැටියට තීරණය කළ දෙයකැයි කියන්නට පුළුවන්කමක් නැහැ. එය දිගටම ආ දෙයක්. එයින් රටට ප්‍රයෝජනයක් ලැබෙනු ඇතැයි එතුමන්ලා කල්පනා කළා වෙන්නට ඇති. එතුමන්ලා එසේ කල්පනා නොකළත් අපි නම් කල්පනා කරනවා. වෙනසක් හැටියට මෙතැන තිබෙන්නේ ආහාර වගා කිරීම සම්බන්ධයෙන් යම්කිසි කාල සීමාවක් සහ කොන්දේසි වගයක් දී තිබීමයි. ඒවා තාවකාලික බලපත්‍ර |වීම තවත් එක් වෙනසක්. එහෙත් මධ්‍යම ..ක්තියේ **ඉඩම්** වැඩ පිළිවෙළ දිගටම යනවා. කොන්දේසිවලට තිබෙන්නේ එහෙමයි. දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ කොපමණ කාලයක්දැයි කියන්නට දන්නේ නැහැ.

තවත් දයෙක් මෙහි තිබෙනවා. පෞද්ගලික අංශයේ හැම දනාටම දුන්නාය කියනවා. ඉල්ලුම් පත්‍ර බලා ඒ අනුවයි දුන්නේ. සමහර මන්ත්‍රීතුමන්ලා ඉල්ලුවේ නැහැ. එතුමන්ලා ඒ ගැන උනන්දුවක් නොදැක්වූවා වෙන්නට පුළුවනි. රථවාහනවලට විනිමය ඉල්ලුවේත් නැහැ. එසේ කළේ එතුමන්ලා වෙනත් වැඩ කෙරෙහි උනන්දුවක් දක්වමින් වෙනත් වැඩ කටයුතුවල යෙදුණු නිසා වෙන්නට ඇති. එසේ නැත්නම් මේක අපට වුවමනා කරන්නේ නැහැ කියා කල්පනා කළා විය හැකියි. සමහර උදවිය ඉල්ලුවා. ඒ අයට ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් හදල් නාස්ති කිරීමක් ගැනත් මෙහි සඳහන් වෙනවා. රජයෙන් මුදල් යට කිරීමක් මෙතැන නැහැ. යන්ත්‍රසූත්‍ර ආදිය සඳහා විනිමය වෙන් කරනවා. එය හිතුවක්කාර අන්දමට පාවිච්චි කළාද නැද්ද යන්නයි ප්‍රශ්නය. රජයෙන් ආධාර දීමක් වූ නමුත් මෙතැන මුදල් නාස්තියක් නැති බවයි මා ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වන්නේ.

ඉඩම්වල දැව කපා ගැනීම සම්බන්ධයෙන් මට පෙර කථා කළ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත්, ගරු ඇමතිතුමාත් සෑහෙන්නට කරුණු ප්‍රකාශ කර ඇතැයි මා හිතනවා. මොන මොන විධියට ඒවා කපා ගන්නට යෙදුණාද යන්නත්, මොන මොන විධියට ඒවායින් රජයට මුදල් ලැබුණාද යන්නත්, පැහැදිලි කර තිබෙනවා. ඒ ලී පාවිච්චි කිරීමෙන් රජයට ආදායමක් ලැබුණා. රජයේ ඉඩමක් ලැබුණාම එහි තිබෙන දැවවලින් කොටසක් ඒ ඉඩම්වල දියුණු කිරීමට යොදා ගන්නට පුළුවනි. ඉන් පිටස්තරව තිබෙන දැවවලින් යම් ප්‍රමාණයක් ගෙන යනවා නම් ඒ දැව ප්‍රමාණය වෙනුවෙන් රජයට යම් මුදලක් ගෙවන්නට සිදු වෙනවා. එය, දැව ප්‍රමාණය අනුව, කියුබික් අඩියක් මෙපමණයයි ඇති නියමයක් අනුව රජයට ගෙවිය යුතු මුදලක්. රජය ඒ මුදල ලබා ගන්නවා. එය රජයට ගෙවන්නට ඕනෑ. සමහර අය ඒ විධියට රජයට මුදල් ගෙවා යම් ප්‍රමාණයක් ගෙන ගොස් තිබෙනවා. කැලෑ දෙපාර්තමේන්තුවේ මිල ගණන් අනුව එය ගෙවා රිසිට් ලබාගෙන දැව පිට කර ගන්නට පුළුවනි. බොහෝ දෙනා මුදල් ගෙවා තිබෙනවා. දී තිබෙන ඉඩම්වල ඇති ගස් ගැන කැලෑ දෙපාර්තමේන්තුව සොයා බලනවා. පළමුවෙන්ම ලොකු ගස් අස් කර ගන්නවා. අඩි තුනක වට ප්‍රමාණයක් ඇති ගස් තමයි ඉතිරි කර තිබෙන්නේ. ඒ ප්‍රතිපත්තිය ගරු ඇමතිතුමා විසින් පැහැදිලි කර දෙන්නට යෙදුණා. ගරු මන්ත්‍රීන් ඇතැම් පුද්ගලයන් නීතියට පටහැණිව ක්‍රියා කළ බවක් කියා සිටියා. ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් නැතැයි කියා සිටියා. එහෙත් ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා තිබෙන බව මට කියන්නට පුළුවනි. ඉඩම් දීමෙනුත්, විනිමය වෙන් කර රථවාහන ගෙන්වා ගැනීමට පහසුකම් ලබා දීමෙනුත්, කර තිබෙන්නේ ආහාර වගා කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන අයට ධෛර්යය දීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මේ කටයුතුවල නිරත වන උදවිය තමන්ගේ උත්සාහය තව තවත් වැඩි කරන්නට ඉදිරිපත් වෙනවා. තමුන්නාන්සේලාගේ යටි හිතේ මොනවා තිබුණත්, තමුන්නාන්සේලා බලයට ආ ගමන්ම මෙසේ ඉඩම් දීම නතර කරන බව එළිපිට ප්‍රකාශ කළා. දුන් ඉඩම් ආපසු ගන්නා බවත් ප්‍රකාශ කළා. මෙවැනි තර්ජන කරන විට මොකක්ද සිදු වන්නේ. රජයේ වර්තමාන ක්‍රියා කලාපය නිසා තරමක් දුරටවත් සතුටුදායක ලෙස කරගෙන යන වගා ව්‍යාපාරය තමුන්නාන්සේලාගේ තර්ජන නිසා කඩාකප්පල් වන්නට බැරි නැහැ. ඒ අදහසින්ම තමුන්නාන්සේලා එවැනි තර්ජනාත්මක ප්‍රකාශ කරනවා යැයි හිතන්නටත් ඉඩ තිබෙනවා. කෘෂිකාර්මික ව්‍යාප්තිය උදෙසා මූලික වැඩ හුඟාක් අවසන් වෙමින්, වගා කටයුතු පුළුල් වෙමින් පවතින මෙවැනි අවධියක තමුන්නාන්සේලා කරන තර්ජනාත්මක ප්‍රකාශ නිසා, "අප මොකටද අත පුළුස්සා ගන්නේ" කියා ඒ වගා වැඩ කරන අයට හිතෙන්නට පුළුවනි. සමහරුන්ගේ අත් දැනටමත් පිළිස්සිලා.

ගොවිජනතාව මාර්ගයෙනුත්, මේ විධියට ඉඩම් බෙදා දීම මඟිනුත් කෘෂිකාර්මික ව්‍යාප්තියක් ඇති කරන්නට පුළුවන් වේ යැයි අප කල්පනා කරනවා. එමඟින් මේ රට ආහාර අතින් ස්වයම්පෝෂණය කරන්නට හැකි වේ යැයි අප අදහස් කරනවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) සමඟ අපේ තර්කයක් නැහැ. එතුමා කියන්නේ මොකක්ද? "රට ස්වයම්පෝෂිත කිරීම හොඳ අදහසක්, ඒ සඳහා හැම සහයෝගයක්ම දෙන්නට අපි සූදානම්, ඒ වුණත් රට ස්වයම්පෝෂණය කරන්නට පුළුවන්කම ලැබෙන්නේ මේ ක්‍රමයට නම් නොවෙයි" කියායි එතුමා කියන්නේ. මේ රට හැකි ඉක්මණින් ස්වයම්පෝෂණය කිරීම අපේ පරමාර්ථයයි. අප මේ විශේෂ බදු ක්‍රමය මඟින් ක්‍රියාත්මක කරන්නේ එහි එක් අංශයක් පමණයි. එය ඒ මුළු වැඩ පිළිවෙලම නොවෙයි, එය කොටසක් පමණයි. ගොවිජනතාව මඟින් වැඩි වැඩියෙන් ආහාර නිෂ්පාදනය කරවන අතර, ඊට අතිරේකව තවත් මාර්ගයක් වශයෙන් මේ ක්‍රමයත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

පාවිච්චි කරනවා. මේ විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර ඇති සෑම කරුණකටම පාහේ නිසි පිළිතුරු ලැබුණා යැයි මා හිතනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් හැම දෙනකුම පාහේ එම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දේවි. එහෙත් ඒ මාර්ගයෙන්, රට සවයම්පෝෂිත කිරීම සඳහා අප ගෙන යන වැඩ පිළිවෙල අඩපණ කරන්නට උත්සාහ කරනවා නම් එය වැරදියි. එහෙත් නමුන් නාන්සේලාගේ මේ යෝජනාව නිසා, රට සවයම්පෝෂණය කිරීමේ වැඩ කටයුතුවල අඩුවක් කරන්නට අප බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ වැඩ පිළිවෙල කෙරේ මහජනතාවට නිසි අවබෝධයක් තිබෙන බව කල්පනා කරන අතර, ඒ වැඩ පිළිවෙල මගින් නුදුරු අනාගතයේදීම සතුටු දායක ප්‍රතිඵල ලැබේ යැයි අප විශ්වාස කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව හමාර කරනවා.

* * * * *

---

[ඉතිරි වැඩ කටයුතු 1968 මාර්තු 25 වන සඳුදා නිල වාර්තාවෙන් බලාගත යුතුයි.]

[நிகழ்ச்சி தொடர்ச்சியை, 1968 மார்ச் 25, திங்கட்கிழமை அதிகார அறிக்கையிற் பார்க்க.]

[*For continuation of Proceedings, see* OFFICIAL REPORT *for Monday, 25th March 1968.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල ශුද්ධ කළ යුතු තැන් දක්වනු පිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි වැරදි හරිගස්සා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1968 අප්‍රේල් මස 1 වන සඳුදා

නොඉක්මවා ලැබෙනසේ එවිය යුතුයි.

---

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்ய விரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற் தெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை பிரதிநிதிகள் சபை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1968 ஏப்பிரல் 1, திங்கட்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

---

**NOTE**

Corrections which Members suggest for the final Print should be clearly marked in this Report, and *the copy containing the corrections must reach the* Editor of HANSARD, House of Representatives,

**not later than**

**Monday, 1st April 1968**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org